

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியம
EMPLOYEES' TRUST FUND BOARD

ENDURING STRENGTH

වාර්ෂික වාර්තාව 2022
வருடாந்த அறிக்கை 2022
ANNUAL REPORT 2022

Employees' Trust Fund Board
19 - 23 Floors,
"MEHEWARA PIYESA",
P.O.Box 807, Kirula Road,
Narahenpita, Colombo 05.
Tel: 011 7747201
Fax: 011 2503917
Email: finance@etfb.lk
Web: www.etfb.lk



EMPLOYEES' TRUST FUND BOARD
ANNUAL REPORT 2022

http://www.etfb.lk

ඔරොත්තු දීමේ ශක්තිය

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, පශ්චාත් වසංගත කාල පරිච්ඡේදය තුළ රටේ දෙවන විශාලතම විශ්‍රාමික අරමුදල ලෙස දිගු කාලීනව ඔරොත්තු දී සිටිය හැකි සිය අචල ශක්තිය සහතික වශයෙන් තහවුරු කරමින් ස්වකීය ස්ථාවරත්වය ඔප්පු කර පෙන්වී ය. ඕනෑම අහිතකර ආර්ථික තත්ත්වයක දී වුව ද, නොකඩවා ඉදිරියට ගමන් කළ හැකි තම ආයතනය සතු හැකියාව මණ්ඩලය විදහා දක්වා ඇත. අපගේ සේවයට කැපවූ කාර්ය මණ්ඩල කණ්ඩායම එක්වන්ව එකට එකතු වූ අතර, එහි සාමාජිකයින්ට සාර්ථකව සේවය කිරීමේ අරමුණ පෙරදැරිව නව විධි ක්‍රමවලට වේගයෙන් අනුගත වූයේ ය. මේ අතර, අභියෝග රැසක් මධ්‍යයේ වුව ද, අර්බුදකාරී කාල සීමාව තුළ ද අපි අපගේ ආයෝජන කටයුතු පවත්වාගෙන යමින් සිටින්නෙමු.

ජාතියේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස අපගේ තිරසර විශ්වාසය සහ ස්ථාවරත්වය නැවත වරක් අවධාරණය කරමින් අප සාමාජික සාමාජිකාවන් වෙත ගුණාත්මක සේවාවක් සාර්ථක ලෙස සලසා දීමට අපට හැකි විය.

අන්තර්ගතය

අපගේ 42 වැනි වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම	3
අප කවුරුන්ද යන වග	4
ප්‍රධාන මූල්‍ය තත්වයන්	5
ප්‍රධාන සන්ධිස්ථාන	6-7
අගය නිර්මාණය කිරීමේ මාදිලිය	8-9
ආයතනික සමාලෝචනය	10
මණ්ඩලයේ කොට්ඨාශ/ අංශ / ඒකකවල කාර්යයන්	11-12
කාර්ය සාධන සමාලෝචනය	13
සභාපතිවරයාගේ සමාලෝචනය	14-15
අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව	16
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ	17-33
අධ්‍යක්ෂක මණ්ඩලය	34-36
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	37-39
කළමනාකාරිත්ව කණ්ඩායම	40
ආයතනික පාලනය	41-44
අනු කමිටු	45-49
අවදානම් කළමනාකරණය	50-52

මූල්‍ය තොරතුරු

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	54
මූල්‍ය තත්ව ප්‍රකාශය	55
ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	56-57
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	58
භාණ්ඩාගාර බැඳුම්කර කළඹේ වෙළෙඳපොල අගය	59
ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොල අගය	60
ස්කන්ධ ආයෝජන ප්‍රකාශය	61-62
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති	63-91

අතිරේක තොරතුරු

විගණකාධිපති වාර්තාව 2022	92-102
විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලීය නිරීක්ෂණ	103-108
දස වසරක සංක්ෂිප්තය	318
මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය	319
සංඛ්‍යා ලේඛණ ඇමුණුම	320-321
අපේ ළඟාවීම්	322

අපගේ 42 වැනි වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම



EMPLOYEES' TRUST
FUND BOARD
ANNUAL REPORT 2022

වාර්තාවේ අන්තර්ගතය

මෙය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 42 වන වාර්ෂික වාර්තාව වන අතර මෙමගින් ආයතනය 2022 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දී ඇති ආකාරය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයයි.

2022 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. නවතම වාර්තාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතර ඒ සඳහා මෙම වාර්තාව පුරාම සංසන්දනාත්මක තොරතුරු ලබා දී ඇත. මෙම වාර්තාවේ අන්තර්ගතය සංවිධානයට මෙන්ම එහි ප්‍රධාන පාර්ශවකරුවන්ට ද වැදගත් වන කරුණු අවධාරණය කරමින් සංවර්ධනය කර ඇත.

වාර්තාවේ අරමුණ

අපගේ අනර්ඝ පාර්ශවකරුවන් සමඟ කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනම වටිනාකම් නිර්මානය කිරීමේ අද්විතීය කාර්යභාරය බෙදාහදා ගැනීම මෙම වාර්තාව ඉදිරිපත් කිරීමේ අරමුණයි. එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සංක්ෂිප්ත සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර එහි මූල්‍ය කාර්ය සාධනය සහ සංවිධානය විසින් නිර්මාණය කරන ලද සමාජමය මං සලකුණු අතර සම්බන්ධතාවයද පෙන්නුම් කරයි. වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වන අතර සැසඳීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි. මූල්‍ය ප්‍රකාශන සහ අදාළ සටහන් රජයේ විගණක විසින් විගණනය කරනු ලබන අතර සහතික කිරීමේ වාර්තාවද මෙම වාර්තාව තුළ ඇත.

වාර්තාවේ අනුකූලතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ හොඳම චර්යා ආචාර ධර්ම සංග්‍රහය හා 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත සමඟ ආයතනය අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව පාලන වාර්තාව සාකච්ඡා කරයි.

උපාය මාර්ගික දිශානතිය

වසර පුරා කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, මෙම වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ගේ අභිවෘධිය සඳහා මණ්ඩලයේ වත්මන් සහ අනාගත කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාදෙයි.

විමසීම් කලයුතු නිලධාරිවරයා

ජ ඒ එස් සුමනසේන මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
දුරකථන : 94117747250
ෆැක්ස් : 94117747209
විද්‍යුත් ලිපිනය : finance@etfb.lk

අප කවුරුන්ද යන වග

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරණ පනත යටතේ පිහිටුවන ලද අතර 1981 මාර්තු 1 වන දින සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී. එය කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලද අතර දැනට ක්‍රියාත්මක වන්නේ මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොමැති සියලුම රාජ්‍ය අංශයේ සේවකයින් සහ සියලුම පෞද්ගලික අංශයේ සේවකයින් මෙම අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ සේවා යෝජකයින් විසින් ඔවුන්ගේ සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 3% ක් මාසිකව අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. එබැවින් සේවක අර්ථසාධක අරමුදල මෙන් නොව, මෙයට සේවකයා/සාමාජිකයා වෙනුවෙන් දායකත්වය සපයන්නේ සේවායෝජකයා පමණක් වන අතර එබැවින් එය සාමාජිකයා දායක නොවන ප්‍රතිලාභයකි. ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ ස්වේච්ඡා සාමාජිකත්වය වැඩි කිරීම සඳහා විශේෂ අවධානය යොමු කෙරේ.

මණ්ඩලයේ අරමුණු
(1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 07 වගන්තිය අනුව)

(අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම;

(ආ) ව්‍යවසායයන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමනාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා විධි විධාන සැලැස්වීම: සහ

(ඈ) ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවැසි විය හැකි අන් සියලු ක්‍රියා හෝ දෑ ඉටු කිරීම.

අපගේ වගකීම්හි ප්‍රස්තුතය








ප්‍රධාන මූල්‍ය තත්වයන්

	2022	2021	වෙනස %
	රු. '000	රු. '000	%
මෙහෙයුම්			
මුළු ආදායම	46,121,938	35,489,895	29.96
මුළු පොළි ආදායම	46,316,209	34,095,154	35.84
මුළු වියදම්	2,694,206	2,330,399	15.61
මෙහෙයුම් වියදම්	1,648,344	1,539,849	7.05
බදුවලට පෙර ලාභය	43,427,732	33,159,496	30.97
බදු වියදම්	6,449,427	4,590,140	40.51
බදුවලට පසු ලාභය	36,978,305	28,569,356	29.43
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය			
මුදල් සහ මුදල් සමාන දෑ	584,266	578,758	0.95
FVTPL හි මූල්‍ය වත්කම්	2,887,168	3,622,159	(20.29)
FVTOCI හි මූල්‍ය වත්කම්	9,117,539	10,561,493	(13.67)
ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්	444,308,492	395,922,319	12.22
සාමාජික අරමුදල් සහ සංචිත	460,561,415	409,285,930	12.53
සාමාජික දෘෂ්ටි කෝණය			
සාමාජික අරමුදල	459,630,606	406,288,901	13.13
පොළී සහ ලාභාංශ	36,981,107	27,919,952	32.45
පොළී සහ ලාභාංශ (%)	8.75%	7.25%	20.69
සාමාජික ප්‍රතිලාභ	477,055	440,912	8.20
ආයෝජන මත ප්‍රතිලාභ	10.01%	8.58%	16.67
ස්කන්ධ මත ප්‍රතිලාභ	8.05%	6.98%	15.33
වත්කම් මත ප්‍රතිලාභ	7.95%	6.82%	16.57








ප්‍රධාන සන්දිස්ථාන







1997
- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නීතිය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූලාධාර : අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීම් වියදම් ප්‍රතිපූර්ණය • පස වසර ශිෂ්‍යත්ව
- හදවත් සැත්කම් සඳහා මූලාධාර කිරීම් වියදම් ප්‍රතිපූර්ණය • පස වසර ශිෂ්‍යත්ව
- "ඉඹ සුව රැකවරණ" රෝහල්ගතවීම් මෙවැය රක්ෂණ ක්‍රමය වසරකට රු. 25,000/- බැගින් • රු. 50,000/- ක උපරිමයක් දක්වා මුළු සේවා කාලය තුළදී

1994
- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නීතිය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූලාධාර
- අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීම් වියදම් ප්‍රතිපූර්ණය
- පස වසර ශිෂ්‍යත්ව 9,000

1992
- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නීතිය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූලාධාර : අභ්‍යන්තර අක්ෂි කාච බද්ධ කිරීම් වියදම් ප්‍රතිපූර්ණය : රු. 18,000/-

1991
- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නීතිය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදවත් සැත්කම් සඳහා මූලාධාර : රු. 300,000/-

1989
- මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නීතිය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය : රු. 200,000/-

1986
- 1986 - මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: රු. 100,000/-

2002

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- නිත්‍ය ඵලදායී ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදිසි සැත්කම් සඳහා මූල්‍යාධාර • අනපේක්ෂිත අකීකි තාව බැද්ම කිරීමේ ප්‍රතිපූර්ණය • පහ වසර ශීඝ්‍රතර
- "ගම සුව රැකවරණ" රෝහල් ගනුම්මේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය : • "වියත" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය

2006

මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය • නිත්‍ය ඵලදායී ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදිසි සැත්කම් සඳහා මූල්‍යාධාර
- අනපේක්ෂිත අකීකි තාව බැද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය
- පහ වසර ශීඝ්‍රතර
- "ගම සුව රැකවරණ" රෝහල් ගනුම්මේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- "වියත" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය : • වතුකඩු බැද්ධ කිරීම සඳහා මූල්‍යාධාර : රු. 300,000/-

2010


මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය • නිත්‍ය ඵලදායී ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදිසි සැත්කම් සඳහා මූල්‍යාධාර
- අනපේක්ෂිත අකීකි තාව බැද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය • පහ වසර ශීඝ්‍රතර
- "ගම සුව රැකවරණ" රෝහල් ගනුම්මේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- "වියත" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය
- වතුකඩු බැද්ධ කිරීම සඳහා මූල්‍යාධාර
- අ.පො.ස. (උ/පෙළ) සමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මූල්‍යාධාර : රු. 12,000/- ශිෂ්‍යත්ව 5000

2016


මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය • නිත්‍ය ඵලදායී ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- හදිසි සැත්කම් සඳහා මූල්‍යාධාර
- අනපේක්ෂිත අකීකි තාව බැද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය • පහ වසර ශීඝ්‍රතර
- "ගම සුව රැකවරණ" රෝහල් ගනුම්මේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය
- "වියත" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය • වතුකඩු බැද්ධ කිරීම සඳහා මූල්‍යාධාර : රු. 12,000/- ශිෂ්‍යත්ව 5000
- අ.පො.ස. (උ/පෙළ) සමත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මූල්‍යාධාර : රු. 30,000/-
- අනපේක්ෂිත අකීකිතාව බැද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූර්ණය : රු. 30,000/-


2022

2016 සියළු කාර්යාල අත්කර ගැනීම සහ
- නෑද සැත්කම් සඳහා මූල්‍යාධාරය - රු.350,000
- වතුකඩු බැද්ධ කිරීමේ මූල්‍යාධාරය - රු.350,000



අගය නිර්මාණය කිරීමේ මාදිලිය




නිර්මාණය කල වටිනාකම
(නිමැවුම්)
ආයෝජකයන්
සාමාජික අරමුදල බිලියන 460
අයෝජන මත ප්‍රතිලාභ 10.01%
සාමාජිකයන්
පොළිය 3%
ලාභාංශ 5.75%
සේවකයින්
පුද්ගල වියදම් බිලියන 1.4
පුහුණු හා සංවර්ධන
පිරිවැය මිලියන 4.2
සේවක පිරිවැටුම 5% ට අඩු
ප්‍රජාව
හිමිකම් ගෙවීම බිලියන 25
ලාභාංශ බිලියන 24
පොළි බිලියන 13
භෘද සැත්කම් මිලියන 98
මරණ ප්‍රතිලාභ මිලියන 149
වසර 5 ශිෂ්‍යත්වය මිලියන 87
උසස් අධ්‍යාපනික දීමනාව මිලියන 103
ග්‍රම සුව යෝජනා ක්‍රමය මිලියන 23
නිත්‍ය දුබලතා මිලියන 9
වකුගඩු බද්ධ කිරීම් මිලියන 4
අභ්‍යන්තර අක්ෂි කාච මිලියන 4

ආයතනික සමාලෝචනය

වර්තමානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට (ETFB) භාරකරුවෙකුගේ හෝ අත්භාරකරුවකුගේ භූමිකාව ඉටු කිරීම සඳහා සාම්ප්‍රදායික සංවිධාන ව්‍යුහයක් ඇති අතර අනාගතයේ දී සංවිධානය වඩාත් ශක්තිමත් මූල්‍ය සංවිධානයක් බවට පත් කිරීම කළමනාකාරිත්වයේ අපේක්ෂාවයි. පනත මගින් සංවිධානය ව්‍යුහය පිළිබඳව විස්තර නොකෙරේ. කෙසේ වෙතත්, 5 වන වගන්තිය යටතේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා රීති සම්පාදනය කිරීමට මණ්ඩලයට හැකිය.


අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා කළමනාකරණයේ සමස්ත වගකීම එහි අධ්‍යක්ෂ මණ්ඩලය සතුය. මණ්ඩලය සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් හතර දෙනෙකු අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. එක් සාමාජිකයෙකු මුදල් හා වෙළඳ විෂයයන් හාර අමාත්‍යවරුන් විසින් නම් කරනු ලැබේ. එක් සාමාජිකයෙකු ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින්ද සාමාජිකයින් දෙදෙනකු, සමාජිකයින් 100,000 වඩා සිටින වෘත්තීය සමිති විසින්ද පත් කරනු ලැබේ.

මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයාගේ අභිමතය පරිදි වන අතර ඔහු පනත මගින් සපයා ඇති පරිදි අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) ද වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මුලදී ව්‍යුහගත වූයේ මධ්‍යගත සංවිධානයක් ලෙස ය. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවා යෝජකයින්ගෙන් බහුතරයක් බස්නාහිර පළාතේ සංකේන්ද්‍රණය වී තිබීම ය. බොහෝ විභවයක් සහිත ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල විවෘත කිරීමත් සමඟ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් කිරීමෙන් පසු බලාත්මක කිරීමේ සහ නීතිමය කටයුතුවල වේගවත් සංවර්ධනයක් සිදු විය. පසුව සාමාජික සේවා ක්‍රියාකාරකම් වන හිමිකම් ඉල්ලුම්පත් භාර ගැනීම, හිමිකම් ගෙවීම්, සාමාජික දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය විමධ්‍යගත කරන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ක්‍රියාකාරී ක්ෂේත්‍ර පුළුල් ලෙස, මෙහෙයුම් සහ උපකාරක සේවා ලෙස බෙදිය හැකිය. මෙහෙයුම් ක්ෂේත්‍ර, එකතු කිරීම හා සේවායෝජක සබඳතා, සාමාජික සේවා සහ ආයෝජන ලෙස හඳුනාගෙන ඇත. පරිපාලන හා මානව සම්පත්, මූල්‍ය, තොරතුරු තාක්ෂණ හා අභ්‍යන්තර විගණනය යනාදිය උපකාරක සේවා ලෙස හඳුනාගෙන ඇත.

පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි සංවිධානයේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) ලෙස රාජකාරි ඉටු කිරීමට සභාපතිවරයාට බලය ඇත. සාමාන්‍යාධිකාරී සහ අතිරේක සාමාන්‍යාධිකාරී ප්‍රධාන විධායක නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. සෑම ක්‍රියාකාරී ප්‍රදේශයක්ම මෙහෙයවනු ලබන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (DGM) විසිනි.



මණ්ඩලයේ කොට්ඨාශ/අංශ /ඒකකවල කාර්යයන්

1 දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා කොට්ඨාශය

පුද්ගලික අංශයෙහි සහ විශ්‍රාම වැටුපක් නොගෙවන රාජ්‍ය ආයතනවල සේවයෙහි නිරත සේවකයන්ගේ දළ ඉපැයීම්වලින් 3%ක් වූ ප්‍රමාණයකින් දායක මුදල් ගෙවීම අදාළ සේවායෝජකයා විෂයෙහි අනිවාර්ය කරුණක් වන්නේ ය. එම සේවායෝජකයන් වෙතින් කලට වේලාවට දායක මුදල් රැස්කර ගැනීම, අධිභාර වෙතොත් ඒවා අයකර ගැනීම, ගෙවීම් පැහැර හරින්නන් හා දායක මුදල් නොගෙවන්නන් සොයා බැලීම සහ ගෙවීම් පැහැර හරින්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම යනාදිය දායක මුදල් රැස්කිරීමේ ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යන් සමහරකි. රැස්කිරීම් හා සේවායෝජක සබඳතා අංශය, මණ්ඩලය වෙත ලැබිය යුතු දායක මුදල් රැස්කර ගැනීමේ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් වගකීම උසුලයි.

2 ආයෝජන කොට්ඨාශය

අයෝජන කොට්ඨාශය මණ්ඩලයේ ආයෝජන කාර්ය භාරය කළමනාකරණය කිරීම අරඹයා පිහිටුවන ලද ආයතනයට අයත් දැඩිව සහබද්ධ වූ ව්‍යාපාරික ඒකකවලින් එකකි. මෙම ඒකකයෙහි ප්‍රමුඛ අරමුණ වනුයේ, ආයෝජන තුළින් හැකි උපරිම ලාභ සලසා ගන්නා අතරම ඒවායේ ආරක්ෂාව සහතික කරමින් ද්‍රවශීලතා මට්ටම පවත්වාගෙන යාමයි. ආයෝජන තීරණ වලට එළඹීම පිණිස වන්නා වූ සියලු කරුණු ග්‍රහණය කර සෑදූ ආයෝජන ප්‍රතිපත්තියක් ආයෝජන අංශය සතුය.

3 සාමාජික සේවා කොට්ඨාශය

මෙම කොට්ඨාශය අයත් ප්‍රධාන කර්තව්‍යයන්හිලා, සාමාජික ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම, සාමාජික පොදු ප්‍රතිලාභ (සාමාන්‍ය හා මරණ හිමිකම්) ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් ඉටුකිරීම සහ සක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් වෙනත් සුභසාධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම යනාදී කටයුතු අන්තර්ගත වේ. මෙම අංශයේ කටයුතු තවදුරටත් සවිමත් කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ පොදු කාර්ය යටිතල ව්‍යුහය සලසා දීම සඳහා ප්‍රමාණවත් පරිදි පියවර ගනු ලැබ තිබේ.

4 මුදල් කොට්ඨාශය

මුදල් කොට්ඨාශය හා සහබද්ධව පවත්නා කර්තව්‍යයන්හිලා, මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම, රජයේ බදු ඇතුළුව කාර්ය මණ්ඩලය හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම, රජයේ විගණන කටයුතු සම්බන්ධීකරණය කිරීම, ආයතනික සැලසුම් හා වෙනත් කළමනාකරණ තොරතුරු වාර්තා පිළියෙල කිරීම.

5 පරිපාලන හා මානව සම්පත් කොට්ඨාශය

වත්මන් තරඟකාරී ව්‍යාපාරික පරිසරය තුළ බෙහෙවින් වැදගත් වන්නාවූ නවීන මානව සම්පත් විධික්‍රම හා විශිෂ්ටතම කාර්යාල පරිචයන් සමඟ ගැළපෙමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ තිබේ. සේවා සපයන ආයතනයක් වශයෙන් කටයුතු කරන සේවා නියුක්තයන්ගේ හාර අරමුදල් මණ්ඩලය විෂයයෙහි ද ජනතාවගේ (සේවා නියුක්තයන්ගේ) සේවා අවශ්‍යතාවය මත රැඳෙමින් කටයුතු කිරීම ඉතා ඉහළ තලයක විය යුතු වන්නේය. එබැවින්, පාලන හා මානව සම්පත් කොට්ඨාශය විසින් ඉටු කරනු ලබන කාර්යයන් සංවර්ධනය කර වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ. ඒ අනුව, පාලන හා මානව සම්පත් අංශය විසින් පිළිපදිනු ලැබිය යුතු දැනටමත් පවත්නා ක්‍රම සහ කාර්ය පටිපාටි යාවත්කාලීන කර වැඩි දියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය වන්නාවූ පුහුණුවලබා දීම සඳහාත් විවිධ මුල පිරීමේ කාර්යයන් සිදු කර ඇත.

මණ්ඩලයේ කොට්ඨාශ/අංශ /ඒකකවල කාර්යයන්



තොරතුරු තාක්ෂණ කොට්ඨාශය

අරමුදලේ සාමාජික පාලන මෘදුකාංග පද්ධතිය කළමනාකරණය කරමින් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ කොට්ඨාශය ප්‍රධාන වශයෙන් වගකීම උසුලයි. ශ්‍රී ලංකා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා එක්ව ක්‍රියා කරමින් ආයතනයට අයත් තොරතුරු තාක්ෂණ පරිසරය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස වූ සියලු මූලාරම්භක කටයුතු ඉටු කරනු ලැබ තිබේ.

අභ්‍යන්තර විගණන කොට්ඨාශය

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ප්‍රමාණවත් පරිදි ස්ථාපනය කරනු ලැබ ඇති බවටත්, එම පද්ධති අඛණ්ඩව හා ප්‍රශස්ත මට්ටමකින් අනුගමනය කරනු ලබන බවටත් සහතික වීමේ වගකීම අභ්‍යන්තර විගණන අංශය උසුලයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) ප්‍රධාන විධායක නිලධාරී වරයා වෙත සෘජුවම වාර්තා කරනු ඇත. කළමනාකරණයේ මතය වනුයේ, අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රම හා කාර්ය පටිපාටිවල ප්‍රමාණවත්භාවය නැවත තක්සේරු කිරීම සඳහාත්, ආයතනයෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා අභ්‍යන්තර විගණනයේ කාර්ය භාරය ඵලදායි මෙවලමක් ලෙස ශක්තිමත් කිරීම සඳහාත් නිසි අධ්‍යයනයක් කළ යුතුය යන්න ය. කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යයනයක් සිදුකළ යුතු බව කළමනාකරණයේ මතයවේ.





නීති අංශය

මණ්ඩලයට අදාළ වන්නාවූ සියලුම නෛතික කටයුතු අරබයා උපදේශක සේවා ඒකකයක් ලෙස නීති අංශය ක්‍රියාත්මක වේ. අදාළ නෛතික කටයුතු ප්‍රාදේශීය කාර්යාල ජාල සේවය ව්‍යාප්ත කරනු ලැබීමත් සමඟ ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගත කරනු ලැබ තිබේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) අධීක්ෂණය යටතේ නීති අංශය ක්‍රියාත්මක වේ.

කාර්ය සාධන සමාලෝචනය

අගය එකතු කිරීමේ ප්‍රකාශය

මණ්ඩලයේ අගය නිර්මාණය පිළිබඳ විශ්ලේෂණයක් සහ සමූහයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර වෙන්කිරීම පහතින් දැක්වේ.

	2022 රු.මිලියන	2021 රු.මිලියන	වෙනස %
එකතුකල වටිනාකම			
ප්‍රධාන ව්‍යාපාරවලින් උපයන ලද ආදායම	45,677.35	35,201.80	29.76
සේවා පිරිවැය	(292.05)	(330.07)	11.52
ප්‍රධාන ව්‍යාපාරවලින් එකතුකල වටිනාකම	**45,385.29**	**34,871.73**	**30.15**
වෙනත් ආදායම්	44.59	288.09	54.32
ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණ අයකිරීම්	76.82	0.48	16,049.81
වටිනාකම එකතුකිරීම	**45,906.70**	**35,160.30**	**30.56**
වටිනාකම වෙන්කිරීම			
සේවකයන්ට			
වැටුප්, වේතන සහ වෙනත් ප්‍රතිලාභ	1,392.35	1,264.34	(10.13)
සාමාජිකයන්ට			
සාමාජිකයන්ට ගෙවූ පොළිය	12,679.22	11,808.66	7.37
සාමාජිකයන්ට ගෙවූ ලාභාංශ	24,301.89	16,366.67	48.48
රජයට			
බදු වියදම්	6,449.43	4,590.14	(10.51)
ප්‍රජාවට			
සාමාජික ප්‍රතිලාභ	477.05	440.91	8.20
ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා			
රඳවාගත් ලාභ	(2.80)	649.40	(100.43)
ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය	36.06	39.97	(9.78)
වෙන්කළ මුළු වටිනාකම	**45,333.20**	**35,160.30**	**28.93**

එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. එකතුකළ ආර්ථික වටිනාකම යනු සැලැකිය යුතු අවදානමට කොටස් හිමියන් සඳහා අවශ්‍ය අවම ප්‍රතිලාභ ඉක්මවායන හෝ අඩුකරන ඉපයීම් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවයි.

	2022 රු.මිලියන	2021 රු.මිලියන
ආයෝජිත ප්‍රාග්ධනය		
සාමාන්‍ය සාමාජික අරමුදල	432,959.75	390,752.19
එකතුකළා: ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම	86.47	9.65
	433,046.22	**390,761.84**
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
බදුකරණය පසු ලාභය	36,978.31	28,569.36
එකතුකළ ණය සහ වෙනත් අලාභ සඳහා සමුච්චිත හානිකරණ වෙන්කිරීම	76.82	0.48
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	**37,055.12**	**28,569.83**
අයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය	(108,218.25)	(24,618.00)
එකතුකළ ආර්ථික වටිනාකම්	**(71,163.13)**	**3,951.84**

2022 සාමාන්‍ය බරතබන ලද - 24.99% මාස 12 භාණ්ඩාගාර බිල්පත් මත පදනම්වී ගණනය කරන ලදී (2021 - 6.00%)



සභාපතිවරයාගේ සමාලෝචනය

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, පැවති අර්බුදය අතරතුර අඛණ්ඩ සේවාවක් සැපයූ අත්‍යවශ්‍ය නොවන රාජ්‍ය සේවා කිහිපයෙන් එකකි. අපගේ සේවයට කැපවූ කාර්ය මණ්ඩල කණ්ඩායම් එකට එකතුව කටයුතු කරමින් මණ්ඩල සාමාජිකයන් අතර ඔවුනට හිමි හිමිකම් අරමුදල් සාර්ථකව බෙදා දීම සඳහා උද්ගත වූ නව විධික්‍රමවලට වේගයෙන් අනුගත විය."

හිතවත් පාර්ශවකරුවනි

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, රටේ විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල්වලින් එකක් වන අතර, සාමාජිකයින් වෙත මෙන්ම සමාජය උදෙසා ද පිරිනමනු ලබන සිය අනුබලය අඛණ්ඩව පවත්වා ගනිමින් සිය කටයුතු මගින් එය සනාථ කළේ ය.

මෙම වසර පිළිබඳ වාර්තාවේ මෙවර තේමාව වන "ඔරොත්තු දීමේ ශක්තිය" යන්නෙන් පිළිබිඹු වන්නේ, සිය සාමාජිකයින් වෙත සහ රට උදෙසා ඉහළ ප්‍රතිලාභ ලබා දෙමින්, රට තුළ පවත්නා සියලුම අභියෝග මධ්‍යයේ වුව ද, ශක්තිමත්ව ඉවසා සිට එය කල් පවත්නා ලෙස දරා ගැනීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ඇති හැකියාවයි.

අභිතකර තත්ව යටතේ කාර්ය සාධනය ඉටු කිරීම

අස්ථායී දේශපාලන තත්ත්වය සහ තියුණු මුහුණුවරක් ගත් රාජ්‍ය මුදල්, විදේශ ගනුදෙනු හා මූල්‍ය යන අංශවල පැවති අසමතුලිතතා, 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම කෙරෙහි සැලකිය යුතු අවිනිශ්චිතතාවක් ඇති කළේ ය. 2022 වර්ෂයේ පළමු භාගය තුළ ආර්ථිකය 4.8% ක වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත අනුපාතයකින් හැකිලී ගියේ ය. මෙම බාධක බොහෝ ව්‍යාපාරවලට අහිතකර ලෙස බලපෑ අතර, ඒ හේතුවෙන් බොහෝ ව්‍යාපාර වැසීයාමේ ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට ලැබෙන දායකත්ව මුදල් ප්‍රමාණයෙහි ද අඩු වීමක් සිදු විය. මේ සියල්ල මධ්‍යයේ වුවද, අරමුදල ස්වකීය කළමනාකරණය යටතේ පවත්නා වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 464 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත් විය. අරමුදලේ ශුද්ධ වටිනාකම, ඉකුත් මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 409 හා සාපේක්ෂව, 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 460 ක් ලෙස වාර්තා කර ගනිමින්, 12.5% ක වර්ධනයක් අත්කර ගත්තේ ය.

උද්ධමනය යථා තත්ත්වයට පත් කිරීමේ පියවරක් ලෙස, මහ බැංකුව, 2022 වර්ෂයේ පළමු කාර්තුවේ දී එහි ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් ලකුණු 150 කින් සහ අප්‍රේල් මාසයේ දී පෙර නොවූ විරූ ලෙස පදනම් ලකුණු 700 කින් ඉහළ නැංවී ය. මෙම පොලී අනුපාත ඉහළ නැංවීම, සමාලෝචිත වර්ෂය සඳහා වන මණ්ඩලයේ ආදායම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේ ය. මණ්ඩලයේ මුළු ආදායම, රුපියල් බිලියන 46 ක් දක්වා 29% ක වැඩි වීමක් වාර්තා කිරීමට සමත් විය. වාර්තාගත සාමාන්‍ය උද්ධමනය 34% ක්ව පැවතියේ වුව ද, මණ්ඩලයේ මුළු වියදම ඉහළ ගියේ 16% ක් වූ ප්‍රමාණයකින් පමණි. වියදම් අඩුකර ගැනීම සඳහා වූ රජයේ මගපෙන්වීම යටතේ මණ්ඩලයේ වියදම් දැඩි ලෙස කළමනාකරණය කරන ලදී.

රුපියල් බිලියන 43.4 ක් වූ වසරේ බදු ගෙවීමට පෙර ලාභය ඉකුත් වසරට වඩා 30% ක වැඩිවීමක් නිරූපණය කරයි. මෙම කාර්ය ඵලය සහිතව, 8.75% ක් වූ ප්‍රතිලාභයක් තම සාමාජික සාමාජිකාවන් අතරේ බෙදා දීමට මණ්ඩලය සමත් විය.

පරිපාලිත සමාගම

සමාලෝචිත වර්ෂය තුළ, මණ්ඩලය තම පරිපාලිත ආයතනය වන ලංකා සෝල්ට් ලිමිටඩ් සමාගමෙහි නව අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයින් පත් කිරීම මගින් හා එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම මගින් ලංකා ලුණු සමාගමෙහි සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. පරිපාලිත සමාගම ඉහළ ලාභාංශයක් ජනනය කිරීම හරහා මණ්ඩලයේ කාර්ය සාධනයට දායක වෙමින් වසර තුළ කැපී පෙනෙන කාර්ය සාධනයක් ද විද්‍යාමාන කළේ ය.

ආර්ථික අර්බුදය තරණය කිරීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, පැවති අර්බුදය අතරතුර අඛණ්ඩ සේවාවක් සැපයූ අත්‍යවශ්‍ය නොවන රාජ්‍ය සේවා කිහිපයෙන් එකකි. අපගේ සේවයට කැපවූ කාර්ය මණ්ඩල කණ්ඩායම් එකට එකතුව කටයුතු කරමින් මණ්ඩල සාමාජිකයන් අතර ඔවුනට හිමි හිමිකම් අරමුදල් සාර්ථකව බෙදා දීම සඳහා උද්ගත වූ නව විධික්‍රමවලට වේගයෙන් අනුගත විය. අභියෝග රැසක් මධ්‍යයේ වුව ද, අර්බුදකාරී කාල පරිච්ඡේදය තුළ අපගේ ආයෝජන කටයුතු ද නොකඩවා පවත්වාගෙන යාමට අපට හැකි විය.

"නිවසේ සිට වැඩ කිරීම" යන සංකල්පය සහ ඉහළ සිට පහළ මට්ටම දක්වා වූ සේවකයින්ගේ නොපසුබස්නා උත්සාහය සහිතව මාරුවෙන් මාරුවට සේවයෙහි නිරත වන වැඩ කාල සටහන් විෂයයෙහි අනුගත වෙමින් මණ්ඩල සාමාජිකයන් වෙත ආයතනයේ සේවක මණ්ඩලය විසින් පිරිනමන ලද අඛණ්ඩ සේවය එහි සාර්ථකත්වයට මග පාදා දුන්නේ ය.

විද්‍යුත් ඊ - පාලනය

"ඩිජිටල් රජය" පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සමග පෙළගැසී කටයුතු කිරීම සඳහා, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, දැනටමත් එහි හරයාත්මක ව්‍යාපාර සහ උපකාරක සේවා ඩිජිටල්කරණය කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. රජයේ විද්‍යුත් පාලනය පිළිබඳ මූලාරම්භයට අනුකූලව, කඩදාසි රහිත වැඩ පරිසරයක් කරා දිවෙන දිගු කාලීන සංක්‍රමණය වීමක් මණ්ඩලය අපේක්ෂා කරයි. නව පද්ධතිය, සාමාජික කේන්ද්‍රීය තොරතුරු පද්ධතියක් සහ අන්තර්ජාල ද්වාරයක් වන අතර එමගින් සේවා යෝජකයාගේ

සභාපතිවරයාගේ සමාලෝචනය

දායකත්ව අරමුදල් ප්‍රමාණය, අරමුදල් ආපසු ගෙවීමේ හිමිකම් ඉල්ලුම් සහ ප්‍රතිලාභ හිමිකම් ඉල්ලා සිටීම් යනාදිය කාර්යක්ෂමව සැකසීමට පහසුකම් සැලසීම හරහා මණ්ඩල සාමාජික සාමාජිකාවන් අත් විඳින අත්දැකීම අති මහත් එකක් වනු ඇත. මෙය වලාකුළු පාදක සංවාත පරිගණක යෙදුමක් වන අතර අනාගතයේ දී ඇතිවිය හැකි ඕනෑම අභියෝගාත්මක තත්ත්වයන් ඔස්සේ වුව ද අදාළ සේවා මට්ටම් ඒ හරහා පවත්වා ගනිමින් දුරස්ථව පවා එහි වැඩ කිරීමට අපගේ සේවක මණ්ඩල වෙත අවශ්‍ය පහසුකම් ඉදිරියේ දී සැපයෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය දැනට එහි අවසන් අදියරෙහි පවතී. 2023 වසර අවසන් වන විට නව පද්ධතිය ක්‍රියාත්මක වනු ඇති අතර එය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ගමන් මග හා සම්බන්ධ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත. මෙම මහඟු කාර්යය සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් තාක්ෂණික සහ මූල්‍ය ආධාර ලබාගෙන ඇත.

මෙම සුවිශේෂී ගමන් මග අරබයා පහසුකම් සැලසීම සඳහා, 2022 දෙසැම්බර් මස පළ කරන ලද විශේෂ ගැසට් නිවේදනයක් මගින්, සේවක සේවිකාවන් 15 දෙනෙකුට වැඩි සේවා යෝජකයන් සඳහා විද්‍යුත් ඊ ගෙවීම් ක්‍රමය අනිවාර්ය කර ඇත.

අපගේ මානව සම්පත

රට තුළ පැවති සියලු අභියෝග මැද වුව ද, අප සාමාජික සාමාජිකාවන් වෙත අඛණ්ඩ සේවයක් ලබා දීමට හැකි වූයේ අන් කිසිවක් නිසා නොව අප මණ්ඩලීය ශ්‍රම බලකායේ ශක්තිය නිසා බව මහත් ආඩම්බරයෙන් ප්‍රකාශ කරමි.

ක්‍රියාවලි සංවර්ධනය කිරීම් හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් සහ පුනුණුව හා සංවර්ධනය තුළින් අපගේ දැනට සිටින සේවා කණ්ඩායම්වල දැනුම, කුසලතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අප විසින් පියවර ගනු ලැබ ඇත. අපගේ කණ්ඩායම් සවිබල ගැන්වීම සහ අමතර තාක්ෂණය ගෙනඒම ඔස්සේ අපගේ සේවා අත්දැකීම තවදුරටත් ඉහළ නැංවීමට හැකි වනු ඇත.

තිළිණ ප්‍රදාන හා සම්මාන

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව - 2020, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයීය හස්තය වන, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සමස්ත ජයග්‍රාහක සම්මාන තිළිණලාභියා ලෙස දෙවන වරට ද, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරි සහ කොමිෂන් සභා' අංශයේ රන් ජයග්‍රාහකයා ලෙස අඛණ්ඩව දෙවන වරට ද පිළිගැනීමට ලක්ව ඇත. මෙම සම්මානය තුළින් විනිවිදභාවය, වගවීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ අප සතුව පැවති අපගේ කැපවීම මනාව පිළිබිඹු වේ.

ඉදිරි ගමන් මාවත

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි අනාගත දිශානතිය, සම්පූර්ණ ඩිජිටල්කරණ ක්‍රියාවලියක් තුළින් මෙන්ම සිය සාමාජිකන් සමූහය වෙත කාර්යක්ෂම සේවයක් පිරිනැමීමේ අරමුණ පාදක වූ එහි ලාභදායිතාවයේ වර්ධනය තුළින් ද අපේක්ෂා කර ඇත. අපගේ දැක්ම වනුයේ, රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුබලයක් වන අතරම කාර්යක්ෂම කාර්යකරණ වැඩ පරිසරයක් පවත්වාගෙන යාමයි.

අපි අපගේ සාමාජික පිරිස වෙනුවෙන් කැපවී සිටින අතර, අපගේ පාර්ශවකරුවන්ට වටිනාකම් ලබා දීමට නොකඩවා කටයුතු කරන්නෙමු. අපගේ අරමුණු වන්නේ, මූල්‍ය සහ ආයෝජන සඳහා සහභාගිවීමෙන් සේවක හිමිකාරිත්වය, සුභසාධනය සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සහ සේවකයින්ට සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු දායක නොවන ප්‍රතිලාභ ලබා දීම ය.

සේවය ඇගයීම

අප සාමාජික සාමාජිකාවන්ගේ විශ්‍රාම අරමුදල් කළමනාකරණය කිරීමේ දී අප කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසය සහ භාරදූරත්වය පිළිබඳව මම ඔවුන්ට මගේ අවංක ප්‍රශංසාව පිරිනැමීමට මෙහිලා කැමැත්තෙමි. අපගේ කැපවූ සහ අභිප්‍රේරිත සේවා කණ්ඩායම ආදර්ශමත් සේවාවක් ලබා දීම සඳහා අභියෝග ඉදිරියේ නැගී සිටි අතර මම ඔවුන්ට ද නොමසුරුව මෙහි දී ස්තුතිවන්ත වෙමි. මණ්ඩලීය කළමනාකාරිත්ව කණ්ඩායමට සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට, ඔවුන්ගේ එක් එක් කාර්යය සඳහා ඔවුන් දැක් වූ දැඩි බැඳියාව සහ කැපවීම වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පළ කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අභියෝගාත්මක වසරක් සාර්ථකව තරණය කිරීම සඳහා අප වෙත දැක් වූ සහයෝගය වෙනුවෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති පිළිබඳ ගරු අමාත්‍යතුමාට ද, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ එතුමාගේ කාර්ය මණ්ඩලයට ද, රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එතුමාගේ කාර්ය මණ්ඩලයට ද මම මගේ අවංක ආදර ස්තුතිය මෙයින් පුද කර සිටිමි. අධ්‍යක්ෂ මණ්ඩලය හොබවමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ක්‍රමෝපායික දිශානතිය විෂයයෙහි දක්වන ලද සහය වෙනුවෙන් එහි සේවය කළ මගේ සොහොයුරු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ද මම මගේ කෘතඥතාව ප්‍රකාශ කරමි. අවසාන වශයෙන්, රටේ දෙවන විශාලතම විශ්‍රාමික අරමුදල වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලීය අරමුදලේ අපේක්ෂා සාර්ථකව ඉටු කිරීමට අප වෙත ඉඩ හසර සලසා දුන් සියලුම පාර්ශ්වකරුවන්ට ද මාගේ කෘතඥතාව මෙයින් හිමි වේ.

අත්සන් කළේ /
ඩී එල් පී රෝහණ අභයරත්න
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

> “සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2022 වසර තුළ දී නැවතත් ශක්තිමත් කාර්ය සාධනයක් සලසා දුන්නේ ය. අභියෝගාත්මක ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වයන් සහ දුර්වල සාර්ව ආර්ථික දැක්මක් පැවතියදීත්, මුළු ආදායම සහ ලාභය යන අංශ ද්විත්වයෙහිම 30% ක පමණ ඉහළයාමක් නිරූපණය වූයේ ය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි උපායමාර්ගික ඉලක්ක ඔස්සේ මනා ප්‍රගතියක් ලබා ඇති අතර සාමාජිකයින්ගේ අභිවෘද්ධිය සඳහා යෝග්‍යතම දේ අඛණ්ඩව ලබා දුන්නේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරන්නේ, සේවාලාභී තෘප්තිය සහ ප්‍රශස්ත ප්‍රතිලාභය, දිවයිනේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වීම පිණිස වන්නා වූ ගාමක බලවේග සහ ප්‍රමුඛස්ථම්භ බවයි.”

මෙහෙයුම් විශිෂ්ටත්වය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, අභ්‍යන්තර සහ බාහිර අභියෝග මධ්‍යයේ වුව ද, එහි සාමාජිකයින් වෙත සේවා තෘප්තිය ලඟා කර දීම කෙරෙහි අවධානය යොමු කළේ ය. බහුවිධ ක්ෂුද්‍ර හා සාර්ව ආර්ථික අස්ථාවර තත්ත්වයනට මුහුණ දුන් වර්ෂවල පසුබිම තුළ, සමාලෝචිත වර්ෂය දිවයින කරා අසාමාන්‍ය අභියෝග ගෙන ආවේ ය. කෙසේ වෙතත්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2022 වසර තුළ දී තම රට වෙනුවෙන් සිය කාර්ය කටයුතුවල මෙහෙවර අඛණ්ඩව ඉටු කරන අතරම ශක්තිමත් කාර්ය සාධනයක් ද පෙන්නුම් කළ බව වාර්තා කිරීම සතුටු විය යුතු කරුණකි.

2022 දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කාර්ය සාධනය, එහි ”ඔරොත්තු දීමේ ශක්තිය” යනුවෙන් නිර්වචනය කෙරෙනු ඇත. මූල්‍ය අර්බුද සහ අවපාත තත්ත්ව කළමනාකරණය කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය දශක හතරකට වැඩි අත්දැකීම් සමුදායකින් පෝෂණය ලබා ඇත. සෑම විපත්තිදායක කාල වකවානුවකදී ම ජයග්‍රාහකයින් වූයේ, සුදානමින් සිට ඉතා කඩිසරව ඒවාට මුහුණ දෙමින් තම කටයුතු කළ අයයි. පැවති වාතාවරණය, අප සෑම විටම නිරන්තර සූදානමක සිට අවදානම් සහ අර්බුද කළමනාකරණය කිරීමේ දී අනලස් ප්‍රවේශයක් ගනු ලබන බවට වග බලා ගැනෙන පිණිස අපට මග පාදා දෙනු ලැබ තිබේ. ප්‍රශස්ත මෙහෙයුම් කාර්යයක් සඳහා අභ්‍යන්තර කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන අතරම පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීම සඳහා මනාව කළමනාකරණය කරන ලද ආයෝජන සමුච්චයක් සහ ඩිජිටල්කරණ ක්‍රියාදාමයක් හරහා සාමාජිකයින්ට ආකර්ශනීය ආයෝජන ප්‍රතිලාභ ලබා දීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තමන්ට හැකි සෑම පියවරකට ම එළඹෙයි. අස්ථාවර පරිසරයක් තිබියදීත්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත මගින් නියම කර ඇති 3.00% ක් වූ අවම පොලී අනුපාතය 5.75% ක ලාභාංශයක් සලසා දෙනු පිණිස යම් යුක්ත පියවරක් තබමින් ශක්තිමත් කාර්ය සාධනයක් අත්කර ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සමත් විය. අපගේ ප්‍රතිඵලය, අප කාර්ය මණ්ඩලයේ කැපවීම සමග ඒකාබද්ධ වූ අපගේ උපාය මාර්ගවල සාර්ථකත්වයට සාක්ෂියක් වන අතර අපගේ සාමාජිකයින්ගේ යහපැවැත්ම සහ අනාගතය සඳහා අපට කළ හැකි හොඳම දේ සාක්ෂාත් කර ගැනීම සඳහා අප අපගේ දැක්ම මත පිටුබලය ලබා ඇත.

ආරම්භයේ සිටම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ආයෝජන කාර්යය, විනය ගරුක ප්‍රවේශයක් මගින් මෙහෙයවනු ලබන අතර, වෙළඳපොළේ අස්ථාවරත්වය නොතකා එහි විධි නියෝගය සපුරාලීමේ හැකියාව සහතික කරන අතරම අදාළ ආයෝජනයෙහි ප්‍රශස්ත බව සහතික කරයි. මේ අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ආයෝජන වත්කම්, මූලික වශයෙන් ඒවායේ සුරක්ෂිතතාව අරමුණු කර ගනිමින්, රජයේ සුරැකුම්පත් සඳහා වෙන් කරනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, තම සාමාජිකයින්ගේ විශ්‍රාම ඉතුරුම් ආරක්ෂා කිරීමට මුල් වන සෑම ආයෝජන තීරණයක්ම ගන්නා අතරම ඔවුන්ට ප්‍රශස්ත ප්‍රතිලාභයක් අත්කර දීමට ද කටයුතු කරයි.

ඩිජිටල්කරණය

2016 වර්ෂයේ දී ආරම්භ වූ ඩිජිටල් ගමනෙහි අවසානය ලඟාවී ඇති අතර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ඉතිහාසයේ පළමු වරට නව සාමාජික කේන්ද්‍රීය පද්ධතිය පිළිගැනීමට සූදානම් වන අතර එය 2023 වසරේ දී ක්‍රියාත්මක කර එළිදැක්වීමට සැලසුම් කර ඇත. මෙම පද්ධතිය, සේවාලාභීන් වෙත වඩා හොඳින් සේවය කිරීමේ අදහසින් සාමාජික කේන්ද්‍රීය පරිසරයක මෙහෙයවනු ලැබීමට සංකල්පනය කර ඇති ඉතා නවීන තත්වයේ ව්‍යාපාර සම්පත් සැලසුම්කරණයක් තුළ ක්‍රියාත්මක කිරීමට ව්‍යූහගත කර ඇත.

ත්‍යාග සහ සම්මානයට පාත්‍ර වීම

ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ කොමිෂන් සභා යන කාණ්ඩය සඳහා වන රන් සම්මානයෙන් ද, එම අංශයේ සමස්ත රන් සම්මානයෙන් ද පිදුම් ලැබී ය. මෙම තරගයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත සම්මාන හිමි වූයේ අඛණ්ඩව සිව්වන වසර සඳහායි. ආයතනික වාර්තාකරණ සහ මූල්‍ය හෙළිදරව් කිරීම් ක්ෂේත්‍රයේ විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් නිරූපණය කළ රාජ්‍ය අංශයේ ආයතන මෙම සම්මානයෙන් ඇගයීමට ලක් කෙරේ.

අනාගත ඉදිරි දැක්ම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එහි සියලුම සාමාජිකයින් සඳහා ගුණාත්මක විශ්‍රාම දිවියක් සලසා දීමේ වාතාවරණයක් නිර්මානය කිරීමේ සදාචාරාත්මක වගකීමක් ලෙස, එහි විධි නියෝගය හා සාරානුකූලව කටයුතු කරයි. වර්තමාන දෘශ්‍යතා මට්ටම මත පදනම්ව, 2023 වසර තුළ හරයාත්මක ව්‍යාපාර ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර ඊ - පාලනය වෙත ගමන් කිරීමට අපි අපේක්ෂා කරමු. අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන්ට ඔරොත්තු දීම සඳහා මණ්ඩලයේ උපාය මාර්ග නැවත නිර්වචනය කර අරුත් ගැන්වීම සඳහා මණ්ඩලය සාම්ප්‍රදායික පියවරෙන් ඔබ්බට ගමන් කරනු ඇත.

සේවා අගැයීම

ගුණාත්මක ජන ජීවිතය වැඩි දියුණු කිරීමේ අප සතු හැකියාව මුදා හැරීම තුළින් අපගේ සාමාජිකයින්ට සහ මණ්ඩලයට සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් සඳහා හවුල් වටිනාකම් නිර්මාණය කර දීමට අපි කැපවී සිටිමු. අපගේ විශ්වාසවන්ත සේවක පිරිස නොමැතිව අපට එය සාක්ෂාත් කරගත නොහැකි වන්නට නිබුණි. ශීඝ්‍රයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරයකට උපාය මාර්ගිකව ප්‍රතිචාර දැක්වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතු වෙහෙස නොබලා වැඩ කරන අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්ය මෙහෙවර පිළිබඳව අපි ඉතා ආඩම්බර වන්නෙමු. මෙම අභියෝගාත්මක වසර තුළ, සාමාජිකයින්ගේ අභිලාෂයන් විෂයයෙහි දක්වන ලද අසීමිත කැපවීම වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපතිතුමා වෙතත්, සාමාන්‍යාධිකාරි, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සියලුම කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙතත් අපි අපගේ ප්‍රණාමය මෙයින් පුද කර සිටින්නෙමු.

අත්සන් කළේ /
ඩී එල් පී රෝහණ අභයරත්න
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ


2022 වසර සැකෙවින්

සමාලෝචනයට භාජනය කරන ලද 2022 වසර, ආර්ථික අස්ථාවරත්වය, සමාජ නොසන්සුන්තාව සහ දේශපාලන අවිනිශ්චිතතාව මත පදනම් වූ සාධකවල සංකලනයෙන් සැදුම් ලත් අභියෝග මධ්‍යයේ ගත වූ කාල පරිච්ඡේදයකි. ශ්‍රී ලංකාව, 2022 වසර ආරම්භ කළේ කොවිඩ් වසංගත තත්ත්වයට සාර්ථකව මුහුණ දීමෙන් පසු ආර්ථිකයේ සෑම අංශයකම පෙර නොවූ විරූ දියුණුවක් කරා දිවෙන නැවුම් අපේක්ෂාවක් සහිතව ය. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති යොදා ගැනීමේ අසාර්ථකත්වයේ ප්‍රතිඵලයක් ලෙස, පසුගිය කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට නොහැකි විය. දුර්වල ආයෝජන වාතාවරණය, ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තිය සහ පරිපාලිත විනිමය අනුපාතිකය බාහිර අසමතුලිතතාවට දායක වී ඇත. 2019 වසරේ දී සිදු වූ බදු කපා හැරීම් සමඟ ඒකාබද්ධව අඩු ආදායම් එකතු කිරීම් මගින් මෙහෙයවන ලද කල් පවත්නා මූල්‍ය විෂමතා, ඉහළ මූල්‍ය හිඟයකට ද, අනිර ණය බරෙහි වේගවත් වර්ධනයකට ද දායක වී ඇත.

ණය ශ්‍රේණිගත කිරීම්හි පහත හෙළීම්වලින් පසු ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ වෙත ප්‍රවේශය අහිමි විය. වෙළඳපළ ප්‍රවේශයකින් තොරව, ශ්‍රී ලංකාව, සිය බාහිර ණය සේවා කිරීම සහ නිල සංචිත සහ බැංකු අංශයෙන් ලබාගත් ණය භාවිතා කරමින් ආනයන සඳහා ගෙවීම් නොකඩවා කරගෙන ගියේ ය. 2022 ජුනි මාසයේ දී නිල සංචිත ප්‍රමාණය (චීනය සමඟ සිදු කළ ඇමරිකානු ඩොලර් බිලියන 1.5 ට සමාන මුදල් හුවමාරුවක් හැර) ඇමරිකානු ඩොලර් මිලියන 400 ට වඩා අඩු විය. විදේශ විනිමය හිඟය උද්ගතව පැවතීමේ හේතුව මත, 2022 වසරේ දෙවන කාර්තුවේ සිට, ශ්‍රී ලංකාව ඉන්ධන, ඖෂධ, ඉවුම් පිහුම් ගෑස්, සහ ආර්ථික කටයුතු සඳහා අවශ්‍ය විවිධ යෙදවුම් යනාදියෙහි හිඟයකට ඇද වැටුණි. සංස්ථාපිත අංශය තම නිෂ්පාදන කාර්යය පවත්වාගෙන යාමේ දී විදේශ මුදල් හිඟය හේතුවෙන් සිය සැපයුම් දාම සම්බන්ධ අවහිරවීම්වලට මුහුණ දුන් අතර ගොවීන් පොහොර සහ ඉන්ධන හිඟයට මුහුණ දුන්හ. අවසානයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය 7.8% ක් වූ ප්‍රමාණයේ දරුණු හැකිලීමකට තල්ලු විය.

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය, 2022 අගෝස්තු මාසයේ දී පෙර නොවූ විරූ සියයට 64.3 ක් දක්වා වූ මට්ටමකට ළඟා වූ අතර ඊට බොහෝ දුරට හේතු වූයේ, සියයට 93.7 ක මට්ටමක් කරා ලඟා වූ ඉහළ ආහාර උද්ධමනයයි. ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම, රාජ්‍ය මූල්‍ය හිඟය පියවීම සඳහා මුදල් මුද්‍රණය කිරීම, මුදල් අවප්‍රමාණය වීම සහ සැපයුම් දාම අවහිර වීම යන තත්ත්වයන්හි බලපෑම මෙයින් පිළිබිඹු වේ. ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා නව අධිපතිවරයෙකු පත් කිරීමත් සමගම, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය දීමේ පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 13.50 සහ සියයට 14.50 දක්වා පදනම් ලකුණු 700 කින් වැඩි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය තීරණය කළේ ය. පසුව අධි උද්ධමනකාරී තත්ත්වය අවම කිරීමේ අරමුණින් මෙම අනුපාත තවත් පදනම් ලකුණු 100 කින් වැඩි කරන ලදී. දරාගත නොහැකි උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් තම පරිභෝජන හා වියදම් රටාව වෙනස් කිරීමට මහ ජනතාවට සිදුව ඇත. මෙම තත්ත්වය සමාගම්වල වෙළඳපළ පදනම් හැකිලීමට සෘජුවම බලපාන අතර අවසානයේ ඔවුන්ගේ විකුණුම් පරිමාවට සහ ආදායමට ද එමගින් බලපෑම් ඇති කරයි.

2022 වර්ෂයේදි උද්ධමන




මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.


පොලී අනුපාත

උද්ධමන පීඩනය සීමා කිරීම සඳහා ඉහළ ප්‍රතිපත්ති පොලී අනුපාත පවත්වාගෙන යාමේ ප්‍රතිඵලය, ප්‍රධාන වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ නැංවීමට බලපා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකුවලට අවසන් පිටුබලය වෙමින් ඒවාට ණය ලබා දෙන්නා වන අතර, 2022 වසර පුරා අඛණ්ඩව ඉහළ ගිය එකී ණය දීම්වලට අදාළ පොලී අනුපාතය (සාමාන්‍ය බර තැබූ ප්‍රාථමික ණය දීමේ අනුපාතය), වසර අවසානයේ දී එකී සාමාන්‍ය බර තැබූ ප්‍රාථමික ණය දීමේ අනුපාතය වූ 27.24% ක ප්‍රමාණය දක්වා ළඟා විය. මෙම ඉහළ පොලී තත්ත්‍රය, ව්‍යාපාරවලට ඔවුන්ගේ මූල්‍ය පිරිවැය කළමනාකරණය කිරීම කෙරෙහි පීඩනයක් ඇති කළේ ය. ණය ගැනීමේ පිරිවැය වැඩි වීම නිෂ්පාදන ක්‍රියාවලියේ මෙහෙයුම් පිරිවැය කෙරෙහි බලපෑම් ඇති කරන අතර එමගින් තවත් වටයක දී ඊට අදාළ මිල මට්ටම මත ඇති කරන පීඩනය ඉහළ දමයි. කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර සීමා කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට ඉන් බලපෑම් එල්ල කෙරිණි.

ශ්‍රී ලංකා මහ බැංකුව ගත් ඉහළ ප්‍රතිපත්ති අනුපාත පවත්වාගෙන යාමේ තීරණයේ ප්‍රතිඵලයක් ලෙස රට තුළ මුදල් සංසරණය අවම කිරීමට ඉඩ හරිමින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළේ ඵලදා අනුපාත ඉහළ ගියේ ය.




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව


ශ්‍රී ලංකාවේ ආර්ථිකය


ආර්ථිකය 2022 වර්ෂයේ පළමු භාගයේ දී සියයට 4.8 ක් වූ වාර්ෂික ලක්ෂ්‍යමය අනුපාතයකින් හැකිලී ගියේ ය. සියලුම ප්‍රධාන අංශ හැකිලී ගියේ යෙදවුම් හිඟය සහ සැපයුම් දාමයේ බාධා මධ්‍යයේ ය. 2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 9.2 ක පමණ ප්‍රමාණයක මූර්ත හැකිලීමකට තල්ලු විය. ඉහළ උද්ධමනය, විදුලි කප්පාදුව, ඉහළ පොලී අනුපාත, ඩොලර් හිඟය සහ ඉන්ධන හිඟය, පොහොර සහ සැපයුම් දාම බාධාවීම නිසා ආර්ථිකයට සිදු වූ බලපෑම හේතුවෙන් ආර්ථික අංශය සැදුම්ලත් කෘෂිකර්මාන්තය 4.6% කින් ද, කර්මාන්ත 16.0% කින් ද, සේවා 2.0% කින් ද, පහත වැටුණි.


ආයෝජන පරමාර්ථ

රටේ දෙවන විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල ආයෝජනවලට අදාළ සුරක්ෂිතභාවය, ප්‍රතිලාභදායීත්වය සහ ද්‍රවශීලතාව යන ප්‍රමුඛ තුන් වැදෑරුම් මූලධර්ම යටතේ ක්‍රියාත්මක වේ. අරමුදල ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ, මෙම මූලධර්මවලට අනුකූලව ඉස්තරම් මට්ටමේ විශ්වසනීයත්වයෙන් හෙබි සුරැකුම්පත් නියෝජනය වන්නා වූ ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත්වල ආයෝජන කෙරෙහි ය.

ආයෝජන ප්‍රතිපත්ති පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සෑම විටම ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල 94% කට නොඅඩු වත්කම් වෙන් කිරීමක් සහ කොටස් ආයෝජනවල 6% කට නොවැඩි වත්කම් වෙන් කිරීමක් පවත්වා ගෙන යා යුතු ය. සමාලෝචිත වර්ෂය තුළ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2022 දෙසැම්බර් මස 31 වන දිනට රුපියල් බිලියන 443.30 ක් වූ මුදලක් ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා ආයෝජනය කර ඇති අතර එය, 2021 වසරට සාපේක්ෂව මුළු ආයෝජනයෙන් 97.46% ක් වේ. එම ප්‍රමාණය, 12.26% ක වැඩිවීමක් වන අතර මණ්ඩලය කොටස් ආයෝජනය තුළ යොදවා ඇති රුපියල් බිලියන 11.53 ක් වූ මුදල එහි මුළු ආයෝජන කළඹෙන් 2.53% ක් වන අතර 2021 වසරට සාපේක්ෂව එය, 12.27% ක වැඩිවීමක් වන්නේ ය. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රාජ්‍ය සුරැකුම්පත් තුළ රුපියල් බිලියන 430.78 ක් වූ මුදලක් ආයෝජනය කර ඇති අතර එය, 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 352.54 ට සාපේක්ෂව 22.19% ක වර්ධනයකි.








ස්ථාවර වත්කම් ආයෝජන

ස්ථාවර ආදායම් ප්‍රභවයන්හි අරමුදල් ආයෝජනය 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මුළු අරමුදලෙන් 97.46% ක් වූ ප්‍රමාණයකට සමාන වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවීමත් සමග ස්ථාවර ආදායම් වෙළෙඳපොළේ පොලී අනුපාත, 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට ඉහළ යාමේ ප්‍රවණතාවක් අනුගමනය කළේ ය. මණ්ඩලයේ මුළු ආදායම ඉහළ නැංවීම සහ එහි වාසිය දිගු කාලයක් පවත්වා ගැනීම යන අරමුණින් යුතුව, විවිධ කාල සීමාවන් යටතේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල අරමුදල් ආයෝජනය කිරීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා නව අධිපතිවරයෙකු පත් කිරීමත් සමග ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවීමට එහි මුදල් මණ්ඩලය තීරණය කළ අතර, ඒ අනුව, නිත්‍ය තැන්පතු අනුපාතිකය සහ නිත්‍ය ණය දීමේ අනුපාතිකය පදනම් ලකුණු 700 කින් ඉහළ ගොස් නිත්‍ය තැන්පතු අනුපාතිකය 13.50% දක්වා සහ නිත්‍ය ණය අනුපාතිකය 14.50% දක්වා ඉහළ නැංවිණි. පසුව, තවත් වටයකින් ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් ලකුණු 100 කින් ඉහළ ගිය අතර ස්ථාවර තැන්පතු අනුපාතය 14.50% දක්වාත්, නිත්‍ය ණය අනුපාතිකය 15.50% දක්වාත් වැඩි කරන ලදී. සාමාන්‍ය බර තැබූ ප්‍රාථමික ණය දීමේ අනුපාතයෙහි මෙම නිරන්තර වැඩිවීමේ ප්‍රතිවිපාක 2022 වසර තුළ දැකිය හැකි විය.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ


මෙම අවස්ථාවෙහි දී, රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාත වසර තුළ ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේ ය. ඉහළ ඉපැයුම් සහිත තත්ත්වය මත මෙම ආයෝජනයේ සැබෑ ප්‍රතිලාභය ඉදිරි වසරවල දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට සාක්ෂාත් කරගත හැකි ය. 2022 වසර තුළ දී තම ස්ථාවර ආදායම, රුපියල් බිලියන 46.29 දක්වා 2021 වර්ෂයේ දී පැවති බිලියන 34.07 ක් වූ ප්‍රමාණයේ සිට වැඩි කර ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකි වී ඇති අතර එය, 2021 වසරට සාපේක්ෂව 35.87% ක් වූ කැපී පෙනෙන වර්ධනයක් වූයේ ය.



කොටස් ආයෝජනය

2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ එහි ඉහළම කාර්ය සාධන මට්ටම වාර්තා කළ අතර එහි දී සියලු කොටස් මිල දර්ශකය සහ ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පවර් SL 20 දර්ශකය පිළිවෙළින් 13,462.39 සහ 4,627.03 යන මට්ටම් දක්වා ළඟා වූ අතර එය කොළඹ කොටස් වෙළෙඳපොළ ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම වේ. 2022 වසරේ 1 වන කාර්තුවේ දී මෙම මට්ටමට වෙළඳපළ කාර්ය සාධනය ගෙන ඒම සඳහා දේශීය ආයෝජකයින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. පළමු කාර්තුවෙන් පසු, දැඩි සමාජ නොසන්සුන්තා සහිත ආර්ථික හා දේශපාලනික අවිනිශ්චිත තත්ත්වයන් සහිත අභියෝගාත්මක තත්ත්වයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු විය. මෙම තත්ත්වයත් සමග කොළඹ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය ද එහි බලපෑමට ලක් වූ අතර, ආයෝජකයින්ගේ මන්දෝත්සාහී ආකල්ප හේතුකොටගෙන දර්ශක දෙකම පහත වැටීමේ ප්‍රවණතාවක් අනුගමනය කළේ ය. සාමාන්‍යයෙන්, කොළඹ කොටස් වෙළෙඳපොළ කාර්ය සාධනය වසර පුරා නිරන්තර අස්ථාවර වෙළඳපොළක තත්ත්වය පිළිබිඹු කළේ ය.


සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට 2022 වසර අවසානයේ දී එහි මුළු අරමුදලින් 2.53% ක් වූ මට්ටමේ තම කොටස් මත ආයෝජනය පවත්වා ගැනීමට හැකි විය. කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම් බොහොමයක් සැපයුම් දාම අවහිරවීම් සහ ඉන්ධන හිඟය වැනි දුෂ්කරතා මධ්‍යයේ වුව ද හොඳින් ක්‍රියාත්මක විය. බොහෝ සමාගම් 2022 මූල්‍ය වර්ෂයේ දී ලාභාංශ ප්‍රකාශ කිරීමට සමත් විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට 2022 මූල්‍ය වර්ෂය සඳහා එහි කොටස් ආයෝජනයෙන් රුපියල් මිලියන 835.4 ක ආදායමක් උපයා ගැනීමට හැකි විය. කොටස් වෙළඳපොළේ පවතින ඉහළ අස්ථාවරත්වය සහ අවිනිශ්චිතතාව හේතුවෙන්, ඉහළට යන ඉහළ පොලී අනුපාත තන්ත්‍රය යටතේ විවිධ කාල සීමාවන්හි ස්ථාවර ආදායම් සහිත සුරැකුම්පත් මත ආයෝජනය කිරීම සඳහා අතිරික්ත අරමුදල් වෙන් කිරීම සඳහා වැඩි බරක් ලබා දීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය යොමු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය සමස්ත ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් අත් කර ගැනීමට සමත් විය.



ආයෝජන කළඹේ සංයුතිය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මුළු ආයෝජන කළඹ 2022 වසර අවසානයේ රුපියල් බිලියන 454 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 409 ට සාපේක්ෂව 11.00% ක වැඩිවීමකි.

ආර්ථික වශයෙන් සහ දේශපාලනික වශයෙන් අභියෝගාත්මක තත්වයක් අත්විඳින අතරම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් ඉහළ ඉපැයුමක් ලබා දෙන ආයෝජන කාණ්ඩ මත සිය අරමුදල් ආයෝජනය කෙරෙහි අවධානය යොමු කළේ ය. සමානුපාතිකව වෙනස් වූ ආයෝජන මිශ්‍රණය විවිධ කාල සීමාවන් සහ කළඹ කාණ්ඩ මත ව්‍යාප්ත වෙමින් පවතින අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රයත්නය වනුයේ ඉදිරි වසරවල දී තිරසාර ආයෝජන කළඹ තත්වයක් පවත්වා ගැනීමයි.



ඉදිරි දැක්ම

2023 වසර තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය 4.2% ක හැකිලීමක් අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පිරිනමනු ලබන ඔවුන්ගේ මූල්‍ය ණය පහසුකම තුළ ඔවුන් අපේක්ෂා කරන අවශ්‍යතා හා සම්පාත වන විධිවිධාන සමග ශ්‍රී ලංකාවේ ස්ථාවර ආදායම් වෙළඳපොළේ අභියෝගාත්මක තත්වයක් ඇති වෙතැයි පුරෝකථනය කළ හැකි ය. ඉදිරි කාලය තුළ අඩු පොලී ක්‍රමයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මූල්‍ය අධිකාරිය කටයුතු සම්පාදනය කරනු ඇත. මෙම තත්ත්වයට අනුකූලව ස්ථාවර ආදායම් සුරැකුම්පත් වෙළෙඳපොළේ අඩු ඉපැයුමක් සහිත පොලී අනුපාත පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාත පහත හෙළීමට මුදල් මණ්ඩලය තීරණය කරනු ඇත. රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම තත්ත්වය යටතේ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන අරමුදල් සහ මූල්‍ය ආයතනවල ස්ථාවර තැන්පතු මත දැඩි ප්‍රතිවිපාක බලපානු ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයේ හැකිලීමත් සමග ව්‍යාපාරික ප්‍රජාවට හිතකර වාතාවරණයක් අපේක්ෂා කළ නොහැකි අතර දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ආයතනික අංශයේ කාර්ය සාධනය අඩාල කරනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාජික දායකත්වයෙන් ජනනය වන මුදල් ප්‍රවාහයන් පහත වැටීමේ සහ සාමාජිකයින්ගේ මුදල් ආපසු ගෙවීම් ඉහළ යාමේ හැකියාවක් පවතින අතර එය ඉදිරි වසරවල දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල ආයෝජනවල වර්ධනයට අහිතකර ලෙස බලපානු ඇත.

කළමනාකරණ සාකච්ජාව සහ විශ්ලේෂණ

දායක මුදල් රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා

දායක මුදල් රැස්කිරීම් සහ සේවා යෝජක සබඳතා අංශය, සේවායෝජකයාගේ දායක මුදල් නියමිත වේලාවට එකතු කිරීම, ප්‍රමාද වූ දායක මුදල් සඳහා අධිභාර අය කිරීම සහ එකතු කිරීම ඇතුළු අනුකූලතා කාර්යයන් සඳහා වගකීම උසුලයි. සේවායෝජකයින් දැනුවත් කිරීමේ කටයුතු සහ ස්වයං රැකියාලාභීන් අතර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සාමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම ද මෙම අංශයේ වගකීම වේ. මෙම අංශය, ප්‍රාදේශිය වශයෙන් පිහිටි ශාඛා වලට අයත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල ජාලය සමඟ එක්ව ඉලක්කවලට අනුව සහ පහත සඳහන් ප්‍රධාන කාර්ය සාධන දර්ශක සපුරා ගැනීම පිණිස ක්‍රියාත්මක වේ:

	2021 දෙසැ. 31	2022 තුළ නවක	2022 ඉවත්ව ගිය	2022 දෙසැ. 31	%
සේවා යෝජකයන්					
සක්‍රිය සේවා යෝජකයන්	69,094	2,471	7,539	64,026	(7%)
සේ.නි.හා.අ.සාමාජිකයින්					
සාමාජිකයින් (සක්‍රිය හා දායක මුදල් ගෙවන සේවායෝජකයන්ගෙන් නියෝජනය වන)	2,430,091	679,313	663,795	2,445,609	0.63%
ස්වයං රැකියාවල නියුතු සාමාජිකයින්	41,517	474	878	41,113	(0.97%)
සංක්‍රමණික සේවක සාමාජිකයින්	228	16	3	241	5.7%

• අනුකූලතාව දක්වන සේවා යෝජකයන්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ශ්‍රී ලංකාවේ සමස්ත රැකියා නියුක්ත ජනගහනය ආවරණය කිරීම සඳහා පැහැදිලි උපාය මාර්ගයක් සහිතව ක්‍රියා කරයි. මහ බැංකුවේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව, රැකියාවන්හි නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව සහ ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ සේවායෝජකයින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත දායක මුදල් ගෙවීමට යටත් කර සිටින පුද්ගලයින් සංඛ්‍යාව අතර පැහැදිලි විෂමතාවයක් පවතී. මෙම පරතරය පියවා දැමිය හැක්කේ සියලුම සේවා යෝජකයන් ලියාපදිංචි කිරීමෙන් පමණි. 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ විධිවිධානවලට අනුව, සේවා යෝජකයින් විසින් ස්ථීර සේවක සේවිකාවන් වෙනුවෙන් පමණක් නොව අනියම් සේවකයන්, කොන්ත්‍රාත් සේවකයන්, කෑලි මිලට ගෙවන සේවකයන් සහ දෛනික වැටුප් ලබන සේවකයන් හා කම්කරුවන් වෙනුවෙන් ද ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 3 ක මුදලක් දායක කර රට අදාළ පද්ධතියට ඇතුළත් කර ගනු ලැබිය යුතු වන්නේ ය.

• දායක මුදල් ගෙවන සේවා යෝජකයන් අතර අනුකූලතා අනුපාතය

සේවකයින් වෙත සාමාජිකත්ව ප්‍රතිලාභ ලබා දෙන්නේ මාස 12 ක කාලයක් තුළ ඔවුනට අදාළ සේවා යෝජකයින් ඔවුන් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත අඛණ්ඩව දායක වූ අයවලුන් සඳහා පමණි. එබැවින්, සේවා යෝජකයින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල දායකත්වය අඛණ්ඩව සිදු කිරීම සහතික කිරීම සඳහා වන අපගේ කාර්යභාරය එවැන්නන් හඳුනා ගැනීමේ කාර්යයෙන් ඔබ්බට විහිදෙ යයි.

• ශාඛා අය ප්‍රතිසාධන කාර්ය

මෙය, වසංගතයට පෙර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් නොගෙවා සිට කල් ඉකුත් වූ, පැහැර හරින ලද හෝ දායක මුදල් නොගෙවන ලද සේවා යෝජකයින් වෙතින් මණ්ඩලය අයකර ගන්නා ගෙවීම්හි මට්ටම්වලට යොමුගත වේ. සුදුසුකම් ලත් සේවායෝජකයින් ලියාපදිංචි කිරීම සඳහාත්, දැනටමත් ලියාපදිංචි සේවායෝජකයින් විසින් දක්වනු ලබන ඔවුන්ගේ අනුකූලතාව පිළිබඳව සහතික වීම සඳහාත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ස්වකීය ශාඛා ජාලය මගින් සේවායෝජකයින් වෙත කෙරෙන චාරිකා 40,000 සිට 45,000 ක් දක්වා වූ ප්‍රමාණයක් සිදු කර ඇත. සාමාන්‍යයෙන්, මෙයින් සියයට 70 ක් පමණ ගෙවීම් පැහැර හැර ඇති සේවායෝජකයන් වෙත කෙරුනු චාරිකා ය. සෑම වසරකම නව සේවා යෝජකයින් 3,000 ක් පමණ ලියාපදිංචි වේ. 2020 දී සහ 2021 දී පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වයත්, 2022 දී පැවති ආර්ථික පිරිහීමත් අදාළ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි ලෙස අහිතකරව බලපා ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර කීපය හා සසඳන විට ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීමේ දුෂ්කරතා හේතුවෙන් පැහැර හැරීම් හඳුනා ගැනීමේ කටයුතුවල පහත වැටීමක් සිදුව ඇත. කෙසේ වෙතත්, නිත්‍ය ක්‍රියා පටිපාටිවලට අනුගත වෙමින් විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුම්වලින් සහ ගෙවීම් ඇණවුම් යැවීමෙන් ගෙවීම් ඉකුත්ව කල් ගිය සේවායෝජකයාගේ දායක මුදල් අයකර ගැනීම පිණිස අපි වෙසෙසා කටයුතු කළෙමු.

තමන් විසින් පුද්ගලිකව කෙරෙන කාර්යාල කරා පැමිණීම් හා ගමන් බිමන් සඳහා ඇති අවශ්‍යතාවය ඉන්ධන හිඟය යනාදී දුෂ්කරතා මැද ඉවත් කිරීම සඳහා විද්‍යුත් යාන්ත්‍රණයකට මාරු වන ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සිය සාමාජික සාමාජිකාවන් වෙතින් ඉල්ලා සිටි අතර එමඟින් සාමාජිකත්වයේ 65% ක් වූ විශාල අංශයක් විද්‍යුත් මාදිලිය කරා අනුගත කර ගත හැකි වී ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි ක්ලවුඩ් පාදක සංවෘත ගෙවීම් යාන්ත්‍රණයට පිවිසීමට අකමැති සේවාදායකයෙකු සඳහා සෘජු හර පහසුකමක් මණ්ඩලය විසින් දියත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකු ජාලයක් හරහා මෙම ක්‍රමය මගින් ගෙවීම් සිදු කළ හැකි ය, කොවිඩ් වසංගත කාලය තුළ ප්‍රමාද හේතුවෙන් දායක මුදල් ගෙවීමට නොහැකි වූ විට ඒවා ගෙවීම සඳහා සහන කාලයක් ද ලබා දෙන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල ස්වකීය සාමාජික සාමාජිකාවන් වෙත මූල්‍ය ආරක්ෂණ ජාලයක් සලසා දෙනු ලබන හෙයින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි සමාජ ආරක්ෂණය වත්මන් වාතාවරණය තුළ අතිශයින්ම වැදගත් වේ.

සෑම සේවා යෝජකයෙකුටම තම රැකියාවේ අවම වශයෙන් සේවකයින් පහළොවක් (15) ක් සිටී නම්, අන්තර්ජාල ගෙවීම් ක්‍රමය හරහා ගෙවීම් කිරීම අනිවාර්ය කරමින් 2023.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි, 2022 දෙසැම්බර් මාසයේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යවරයා විසින් අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. මෙම නව සංවර්ධනයත් සමඟ, සියලුම විශාල කාණ්ඩයේ සේවා යෝජකයන් මෙම සමාලෝචිත වර්ෂයේ සිට ඉලෙක්ට්‍රොනික බැංකු පද්ධති වෙත මාරු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සාමාජික සේවා අංශය

සාමාජික හිමිකම් ඉල්ලීම් සැකසීම සහ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 ක් ක්‍රියාත්මක කිරීම විෂයයෙහි සාමාජික සේවා අංශය වගකීම දරයි. සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම, වාර්ෂික සාමාජික ප්‍රකාශ නිකුත් කිරීම සහ මුදල් වෙන් නොකළ සාමාජික ගිණුම් නිෂ්කාශනය කිරීම යන කාර්යයන්හි වගකීම ද මෙම අංශයට පැවරේ.

• සාමාජික හිමිකම් ඉල්ලීම් සැකසීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 2022 වසරේ දී මරණ හිමිකම් ඇතුළුව මුදල් ආපසු ගෙවීමේ හිමිකම් ඉල්ලා සිටීම් 195,212 ක් සකස් කර ඇති අතර එහි මුළු මුදල ලෙස රුපියල් බිලියන 25 ක් ගෙවා ඇත. ඊට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 20.1 ක ගෙවීමක් ද සමඟ ආපසු ගෙවීමේ හිමිකම් 149,019 ක් විය.

	2022 31 දෙසැ.	2021 31 දෙසැ.	2022 තුළ වෙනස
ආපසු ගෙවන හිමිකම්			
සකසන ලද සාමාජික හිමිකම් ඉල්ලීම්	195,212	149,019	31.00%
ගණන ගෙවන ලද මුදල (රු. බි.)	25	20.1	24.38%

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

- **සාමාජික ප්‍රතිලාභ**

අපගේ සාමාජිකයින්ගේ සුභසාධනය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අප හට ඉහළ ප්‍රමුඛතාවයක් වන්නේ ය. 1986 සිට අප අපගේ සාමාජිකයින් සඳහා විවිධ ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ ඔවුන් වෙත ලඟා කර දී ඇත. වර්තමානය වන විට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකයෝ තමන් වෙත මූල්‍ය ආධාර සලසා දෙන, මුදල් ආපසු ගෙවනු ලබන හිමිකම් ලබා ගනිමින් ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 ක ප්‍රතිලාභ භුක්ති විඳිති.

හෘද සැත්කම්, වකුගඩු බද්ධ කිරීම් හා අභ්‍යන්තර අක්ෂි කාච සඳහා වූ වියදම් ප්‍රතිපූරණය කිරීම සහ සදාකාලික ආබාධිතභාවය හා මරණ සඳහා ප්‍රතිලාභ මෙන්ම ශ්‍රමසුව රැකවරණ යටතේ වන ප්‍රතිලාභ ද වෙනුවෙන් 2022 වසරේ දී රුපියල් මිලියන 287 ක් දක්වා වූ මුදල් නොවන සානුබලයක් සාමාජික සාමාජිකාවන් වෙත සලසා දී ඇත.

- තනි පුද්ගල වශයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකයින්ට සෘජුවම ලබා දෙන ප්‍රතිලාභ වලට අමතරව, අපි අපගේ සාමාජිකයින්ගේ දරුවන් සඳහා ද ප්‍රතිලාභ ලබා දෙන්නෙමු. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සහ සමත් වන සාමාජික දරු දැරියන් විසින් එහි දී අත්කර ගනු ලබන ඔවුන්ගේ අධ්‍යාපනික ජයග්‍රහණ වෙනුවෙන් වාර්ෂික පදනමකින් යුතුව මූල්‍යාධාර සලසා දෙමින් අපි ඔවුන් හා එක්ව එහි සතුට සමරන්නෙමු

- **සාමාජික ගිණුම් පවත්වාගෙන යාම**

වසර අවසානයේ දී අරමුදල සමඟ පවතින සක්‍රීය සහ අක්‍රීය ගිණුම් සංඛ්‍යාව දළ වශයෙන් මිලියන 17.04 ක් වූ අතර එම සාමාජික ගිණුම්වලින් සියයට 98 ක් 2022 වසර අවසන් වන විට යාවත්කාලීන කර ඇත. මෙම සාමාජික ගිණුම් අතරින් මිලියන 14.06 ක් වූ ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ අක්‍රීය වශයෙන් පවතින්නේය යනුවෙන් වූ අතර සාමාජික ගිණුම් මිලියන 2.44 ක් වූ ප්‍රමාණයක් සක්‍රීයව පවතී. සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී ගිණුම් සඳහා වාර්ෂික සාමාජික ප්‍රකාශ ඔවුන්ගේ අදාළ සේවායෝජකයන් වෙත නිකුත් කර ඇත. ස්වකීය අරමුදල සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, හිතෛෂී සාමාජික නැඹුරුවක් සහිත අන්තර්ජාල පරිගණක ද්වාරයක් දියත් කිරීමේ ක්‍රියාවලියක මේ වන විට නිරතව සිටී.

(අදාළ විස්තර තොරතුරු තාක්ෂණ අංශය යටතේ දක්වා ඇත)

සේ.නි.භා.අ. සාමාජිකයන් සඳහා ව්‍යවස්ථාපිත නොවන ප්‍රතිලාභ යෝජනා ක්‍රම		
ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (ආරම්භක වර්ෂය)	**2022 ප්‍රතිලාභීන් ගණන (රු.'000)**	**2021 ප්‍රතිලාභීන් ගණන (රු.'000)**
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (1986)	සාමාජිකයන් 1,502 149,236	සාමාජිකයන් 1,014 100,536
නිත්‍ය දුබලතා රක්ෂණ යෝජනා ක්‍රමය (1989)	සාමාජිකයන් 52 8,761	සාමාජිකයන් 67 10,777
හෘද සැත්කම් සඳහා මූල්‍ය ආධාර (1991)	සාමාජිකයන් 359 98,048	සාමාජිකයන් 457 122,480
අභ්‍යන්තර අක්ෂි කාච පිරිවැය ප්‍රතිපූරණය කිරීම (1992)	සාමාජිකයන් 294 4,230	සාමාජිකයන් 257 3,480
පහ වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය (1994) නිත්‍ය දුබලතා හේතුවෙන් සේවය අවසන් කරන ලද සාමාජිකයින්ගේ දරුවන් ද ඇතුළත්ව (2010)	සාමාජිකයන් 2,131 31,965	සාමාජිකයන් 6,039 90,585
"ශ්‍රමසුව රැකවරණ" රෝහල්ගත කිරීමේ වෛද්‍ය යෝජනා ක්‍රමය (1997)	සාමාජිකයන් 1,365 23,477	සාමාජිකයන් 1,293 11,742
වියන නිවාස ණය යෝජනා ක්‍රමය (2002 ජූනි)	-	-
වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් සඳහා මූල්‍ය ආධාර (2006)	සාමාජිකයන් 13 3,646	සාමාජිකයන් 17 4,454
අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව (2010 සිට)	සාමාජිකයන් 6,337 76,044	සිසුන් 3,859 46,308
ගෙවන ලද මුළු ව්‍යවස්ථාපිත නොවන සාමාජික ප්‍රතිලාභ	**395,409**	**390,364**

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

අපගේ සේවක පිරිස

විශ්‍රාම යෑම් සහ ඉල්ලා අස්වීම් හේතුවෙන් 2021 වර්ෂයේ 968 ක්ව සිටි සේවක සංඛ්‍යාවේ සුළු වෙනසක් සහිතව 2022 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතුව සේවකයන් 924 දෙනෙකු සිටි.

මට්ටම	රැකියා ශ්‍රේණිය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජ්‍යෙෂ්ඨ	සාමාන්‍යාධිකාරී	1	-	1
	අතිරේක සාමාන්‍යාධිකාරී	-	-	-
	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	2	1	3
	සහකාර සාමාන්‍යාධිකාරී	5	2	7
	කළමනාකරු	25	16	41
	එකතුව	33	19	52
තෘතියික	කණිෂ්ඨ කළමනාකරු	33	31	64
	කළමනාකරණ සහකාර	81	118	199
	එකතුව	114	149	263
ද්විතියික	කළමනාකරණ සහකාර 2-2	-	1	1
	කළමනාකරණ සහකාර 1-2	172	284	456
	එකතුව	172	285	457
ප්‍රාථමික	ප්‍රාථමික මට්ටම	126	26	152
	එකතුව	126	26	152
මුළු එකතුව		**445**	**479**	**924**

සේවක පිරිස වයස අනුව

සේවක පිරිස වයස අනුව (2021.12.31දිනට) වයස පරාසය (අවුරුදු)	එකතුව	
21-25	13	1%
26-30	107	12%
31-35	141	15%
36-40	160	17%
41-45	102	11%
46-50	117	13%
51-55	167	18%
55 වැඩි	117	13%
එකතුව	**924**	**100%**

සේවක පිරිස රැකියා ශ්‍රේණිය අනුව

	රැකියා ශ්‍රේණිය	එකතුව	ප්‍රතිශතය
ජ්‍යෙෂ්ඨ	සාමාන්‍යාධිකාරී	1	0.10%
	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	3	0.41%
	සහකාර සාමාන්‍යාධිකාරී	7	0.72%
	කළමනාකරු	41	4.44%
	එකතුව	52	5.67%
තෘතියික	කණිෂ්ඨ කළමනාකරු	64	7.75%
	කළමනාකරණ සහකාර 4	199	21.90%
	එකතුව	263	29.65%
ද්විතියික	කළමනාකරණ සහකාර 2-2	1	10.10%
	කළමනාකරණ සහකාර 1-2	456	48.04%
	එකතුව	457	48.14%
ප්‍රාථමික	ප්‍රාථමික මට්ටම	152	16.53%
	එකතුව	152	16.53%
මුළු එකතුව		**924**	**100.00%**

සේවකයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක පුරුෂ හා කාන්තා අනුපාතය 2022 අවසානයේ දී 51:49 ක් ලෙස පැවතුනි.

පුරුෂ	ස්ත්‍රී	මුළු එකතුව
467	457	924
51%	49%	100%

සේවක පිරිස වයස අනුව

ප්‍රධාන කාර්යාලය	519
ශාඛා කාර්යාල	405
එකතුව	924

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් 924 දෙනාගෙන් 519 දෙනෙක් ප්‍රධාන කාර්යාලයේ සිටින අතර 405 දෙනෙක් ශාඛා ජාලය පුරා විසිරී සිටිති.

විස්තර	විධායක	විධායක නොවන	එකතුව
විශ්‍රාම ගැනීම	2	19	21

සේවකයන් සේවයේ නිරත වී සිටීම

සේවකයින්ගේ ඉල්ලීම් මත ඔවුන්ගේ පහසුව සඳහා වසර තුළ කරන ලද ස්ථාන මාරු කිහිපයක් විය.

වැටුප් හා ප්‍රතිලාභ

මණ්ඩලයේ සියලුම සේවකයන් ස්ථිර තනතුරු දරයි. ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයන් වශයෙන් ඔවුන් තම මූලික වැටුපට අමතරව ප්‍රතිලාභ රැසක් සඳහා සුදුසුකම් ලබයි.

	2022 රු'000	2021 රු'000	වෙනස් %
වැටුප්	598,118	552,333	8%
ජීවන වියදම් දීමනාව	87,785	90,864	-3%
ආහාර දීමනාව	13,649	9,754	40%
අතිකාල දීමනාව	21,587	20,455	6%
නිවාඩු වැටුප්	9,546	8,561	12%
එකතුව	**730,685**	**681,967**	**7%**

ප්‍රතිලාභ

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවක සේවිකාවන්, සේවකයින් වෙත පිරිනැමෙන ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබයි. ඒවාට ශ්‍රේණි අනුව ලබා දෙන දිරිගැන්වීම්, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ පහසුකම්, වාර්ෂික ප්‍රසාදී දීමනා සහ විවිධ ණය, උපස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වැටුප් වර්ධක සහ සේවකයාගේ ස්ථිර ආබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් පිරිනැමෙන වන්දි යනාදිය ඇතුළත් වේ.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

	2022 රු '000	2021 රු '000	වෙනසේ %
දිරි දීමනා	137,573	112,304	23%
නිල ඇඳුම් සහ මැහුම් වියදම්	17,664	17,253	2%
විශේෂ විශ්‍රාමික ප්‍රසාද දීමනා	1,406	6,040	-77%
තේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සුබසාධන වියදම්	10,241	9,576	7%
නිවාඩු දින වෙනුවෙන් මුදල් ගෙවීම	33,775	23,766	42%
වාර්ෂික ප්‍රසාද දීමනා	103,408	106,165	-3%
වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම	119,713	95,618	25%
නිවාස ණය සඳහා පොලිය	9,805	10,678	-8%
පොලී පිරිවැය	24,872	22,929	8%
වත්මන් සේවා පිරිවැය	46,018	10,639	333%
සේ.අ.අ.	97,249	102,252	-5%
සේ.නි.හා.අ.	19,450	20,414	-5%
දුරකථන බිල්පත් ප්‍රතිපූරණය කිරීම	4,187	5,652	-26%
එකතුව	**625,361**	**543,286**	**15%**

දිරි දීමනා

ශ්‍රේණි අනුව ලබා දෙන දිරි දීමනාවලට මාසික පදනමින් ගෙවනු ලබන පැමිණීමේ සහ කාර්ය සාධන දිරි දීමනා ඇතුළත් වේ.

වෛද්‍ය පහසුකම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල සේවකයින්ගේ වෛද්‍ය පහසුකම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- එක් සේවකයෙකුට රු. 60,000.00 ක් දක්වා වූ වාර්ෂික බාහිර රෝගී සත්කාර වෛද්‍ය ප්‍රතිපූර්ණය.
- එක් සේවකයෙකුට වාර්ෂිකව රු.100,000.00 ක් දක්වා වූ රෝහල් ගතව ප්‍රතිකාර ලබා ගැනීමේ වියදම් ප්‍රතිපර්ණය.

සේවකයාගේ ස්ථිර අබාධිත භාවය හෝ මරණය වෙනුවෙන් වන්දි

සිද්ධිය	ශ්‍රේණිය / තනතුර	වන්දි ප්‍රමාණය
මේ ශ්‍රේණියේ සේවකයාගේ මරණය	සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ	1,500,000.00
	ඉහළ කළමනාකරණය (2-1), (1-3),(1-1)	1,450,000.00
	මධ්‍යම කළමනාකරණය (1-3)	1,350,000.00
	කණිෂ්ඨ කළමනාකරු(1-1)	1,250,000.00
	කළමනාකරණ සහකාර (4)	1,125,000.00
	කළමනාකරණ සහකාර (2-2), (1-2)	1,000,000.00
	ප්‍රාථමික මට්ටම (1),(2),(3)	875,000.00

සිද්ධිය	ශ්‍රේණිය / තනතුර	වන්දි ප්‍රමාණය
නිසිය ඌනතාව	සභාපති/ක්‍රියාකාරී අධ්‍යක්ෂ	1,750,000.00
	ඉහළ කළමනාකරණය (2-1), (1-3),(1-1)	1,700,000.00
	මධ්‍යම කළමනාකරණය (1-3)	1,650,000.00
	කළමනාකරණ සහකාර(1-1)	1,500,000.00
	කළමනාකරණ සහකාර (4)	1,350,000.00
	කළමනාකරණ සහකාර (2-2), (1-2)	1,200,000.00
	ප්‍රාථමික මට්ටම(1),(2),(3)	1,050,000.00

වාර්ෂික ප්‍රසාද දීමනා

දෙසැම්බර් මාසයේ දී ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාව, ජීවන වියදම් දීමනාව සහිත මාස දෙකක මූලික වැටුපට සමාන වේ.

ණය

විශේෂ ණය වගුව

ණය මුදල	රු. 100,000.00
ප්‍රතිසාධන කාල සීමාව	60 වාරික
පොලිය	4.2% වාර්ෂික

නිවාස ණය

ණය මුදල	රු 3,000,000.00
ප්‍රතිසාධන කාල සීමාව	අවුරුදු 25 හෝ වයස අවු. 60 සම්පූර්ණ වීම පොලිය
	1 වන රු. 2,000,000 සඳහා වසරකට 4.2% ශේෂ රු. 1,000,000 සඳහා වසරකට 7.0%

වාහන ණය

ඕනෑම සේවකයෙකුට පා පැදි ණය සමග මෝටර් වාහන, ත්‍රිරෝද රථ සහ මෝටර් සයිකල් යන ණය කාණ්ඩවලින් එක් ණයක් ලබා ගත හැකි ය.

මෝටර් රථ ණය	ණය මුදල	රු. 1,250,000.00 (M A 1-2 සහ ඊට පහළ) රු. 2,500,000.00 (M A 4 සහ ඊට ඉහළ)
	ප්‍රතිසාධන කාල සීමාව	වසර 15
	පොලිය	වාර්ෂික 4.2%
ත්‍රිරෝද රථ ණය	ණය මුදල	රු 900,000.00
	ප්‍රතිසාධන කාල සීමාව	වසර 15
	පොලිය	වාර්ෂික 4.2%
යතුරු පැදිය ණය	ණය මුදල	රු. 500,000.00
	ප්‍රතිසාධන කාල සීමාව	වසර 10
	පොලිය	වාර්ෂික 4.2%
පාපැදි ණය	ණය මුදල	රු. 25,000.00
	ප්‍රතිසාධන කාල සීමාව	වාරික 36
	පොලිය	වාර්ෂික 4.2%

2022/3 චක්‍රලේඛය අනුව ඉහත ණය යෝජනා ක්‍රම තාවකාලික අත්හිටුවා ඇත

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ආපදා ණය

ණය මුදල	රු. 250,000/-
ප්‍රතිසාධන කාල සීමාව	වාරික 120
පොලිය	වාර්ෂික 4.2%

අතිරේක වැටුප් වර්ධක - උසස් අධ්‍යාපන සුදුසුකම්

උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීම සඳහා අමතර වැටුප් වර්ධක වාසි ප්‍රදානය කරනු ලබන්නේ රැකියා ශ්‍රේණිය සහ ලබාගත් සුදුසුකම් මත පදනම්ව ය.

රැකියා කාණ්ඩය	සුදුසුකම	විශේෂ වැටුප් වර්ධක ගණන
කළමනාකරණ සහකාර (1-2) සහ (4)	ඩිප්ලෝමා	01
	උපාධිය	02
	මාස්ටර් උපාධිය	03
ඕනෑම ශ්‍රේණියක් සඳහා	මාස්ටර් උපාධිය	03

උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වියදම් ප්‍රතිපූරණය

විෂයක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන ආයතනයක් මගින් නිශ්චිත නියම සහ කොන්දේසි සහිතව රු. 400,000/- දක්වා ප්‍රතිපූරණය කරනු ලැබේ.

(රු.)	2022	2021	2020
උසස් අධ්‍යාපන සුදුසුකම් සඳහා වියදම් ප්‍රතිපූරණය	3,515,594	2,358,826	1,582,375

මානව සම්පත් කටයුතු

පහත සඳහන් දෑ ඇතුළුව, 2022 වසර තුළ අපි අපගේ එදිනෙදා සාමාන්‍ය මානව සම්පත් ක්‍රියාකාරකම් කිහිපයක් නොකඩවා කරගෙන ගියෙමු:

- සේවකයින් සඳහා කාර්ය මණ්ඩල ණය ලබා දීම;
- වෛද්‍ය ප්‍රතිපූරණ පහසුකම්;
- මණ්ඩලයේ වාර්ෂික වත්කම් සත්‍යාපනය සාමාන්‍ය පරිදි සිදු කර ඇත;
- වැරදි කරන සේවකයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත.

පුහුණුව සහ සංවර්ධනය

කාර්ය සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා ධාරිතා වර්ධනය කිරීමේ අරමුණින් 2022 වසරේ දී සැලසුම් කර ඇති පුහුණු වැඩසටහන්, පිරිවැය අඩු කිරීමේ චක්‍රලේඛ හේතුවෙන් නොපැවැත්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ රුපියල් 963,952.50 ට සාපේක්ෂව 2022 දී පුහුණු හා සංවර්ධන ආයෝජනය රුපියල් 425,222.50 ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, භෞතික සහ මාර්ගගත අන්තර්ජාල වේදිකා හරහා සීමිත පුහුණු සැසි සංඛ්‍යාවක් පවත්වන ලදී. සාමාජික කේන්ද්‍රීය පද්ධතියට සංක්‍රමණය වීමට පහසුකම් සැලසීම සඳහා ඉක්ටා තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ව්‍යාපෘති පුහුණු වැඩසටහන නියමිත පරිදි පවත්වන ලදී. බාහිර පුහුණු වැඩසටහන් කිහිපයකට ද කාර්ය මණ්ඩලය සහභාගී විය.

පුහුණු වැඩසටහන	සහභාගිවූ ගණන	සහභාගිවූ අය	පුහුණු දිනය	ගෙවන මුදල
කළමනාකරු පුහුණුව	30	සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්	19.01.2022	20,812.50
සුළු මුදල් මාර්ගගත පුහුණුව	30	සියලු ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ සුළු මුදල් ඒකකය	31.01.2022	-
කොවිඩ් 19 සඳහා ආනයනය	100	මණ්ඩල සහ කම්කරු දෙපාර්තමේන්තු සාමාජිකයන්	23.02.2022	22,000.00
රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන පටිපාටිවල මූලධර්ම	7	අභ්‍යන්තර විගණන සාමාජික	23.03.2022 සහ 24.03.2022	49,000.00
නීතිඥ සංගමයේ නීති පුහුණුව සහ විභව හා වත්මන් ආයෝජකයින් සඳහා කොටස් වෙළඳාම	1 7	නීති නිලධාරි පරිපාලනසහ මානව සම්පත් ආයෝජන සාමාජික	04.03.2022 (සති 6 ක් පුරා සෑම සෙනසුරාදාවකම)	13,500.00 35,000.00
අතථ්‍ය මාර්ගගත වැඩමුළුව (ඵලදායිතාව)	1	ටී.එච්.සී.පී. කුමාර	13.07.2022 to 15.07.2022	නොමිලේ
අතථ්‍ය මාර්ගගත වැඩමුළුව (ඵලදායිතාව)	1	චන්දිම පතිරණ	08.08.2022 to 10.08.2022	නොමිලේ
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන	68	සියලුම කළමනාකරුවන්	15.08.2022	53,720.00
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන	68	සියලුම කළමනාකරුවන්	23.08.2022	53,720.00
ඉහළ කාර්යාල කළමනාකරණ පුහුණුව	19	සියලුම ඉහළ කාර්යාල කළමනාකරුවන්	26.08.2022	-
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන	70	සියලුම කළමනාකරුවන්	05.09.2022	45,100.00
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන	68	සියලුම කළමනාකරුවන්	08.09.2022	41,280.00
තොරතුරු හා සංනිවේදන තාක්ෂණ වැඩසටහන	53	සියලුම කළමනාකරුවන්	28.09.2022	42,800.00
රියදුරු විනය	27	සියලුම රියදුරන්	24.10.2022	16,790.00
තිරසර සැපයුම් දාම විසඳුම්	1	සැපයුම් කළමනාකරු - ටී.එම්.අයි. අම්ඩොන්	24.10.2022	6,000.00
මානව සම්පත් තොරතුරු පද්ධති පුහුණු වැඩසටහන්	82	මණ්ඩල සාමාජිකයින්	21.11.2022	-
ඩිජිටල් පරිවර්තන සැසිය	42	මණ්ඩල වෙනස කළමනාකරණ කණ්ඩායම	24.11.2022	13,000.00
වැටුප් ලේඛන පිළිබඳව පරීක්ෂණ පුහුණුව	12	මූල්‍ය හා මානව සම්පත් සාමාජික	29.11.2022	-
ඩිජිටල් පරිවර්තන සැසිය	32	මණ්ඩල වෙනස කළමනාකරණ කණ්ඩායම	22.12.2022	12,500.00
එකතුව	**719**			**425,222.50**

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ආගමික වතාවත් සමග ජනවාරි මස 1 වන දින වැඩ ඇරඹූ ආකාරය





කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ





ලේ දන්දීමේ කඳවුර

කළමනාකරණ සාකච්ඡාවේ සහ විශ්ලේෂණ

මාසික බණ දෙසුම



කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ





කොළඹ 02 පිහිටි
උප කාර්යාලය විවෘත කිරීම

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ප්‍රාදේශිය කළමනාකරුවන්ගේ රැස්වීම



කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

තොරතුරු තාක්ෂණය හා යටිතල පහසුකම් මත ආයෝජනය

1. මණ්ඩලයේ භරයාත්මක පද්ධතීන්හි වෙනස ඉල්ලුම් සංවර්ධනය කිරීම

වෙනස ඉල්ලුම් - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල මූලික පද්ධතියේ සංවර්ධනය කිරීම අවසන් වුවද, තත්ත්ව සහතික ක්‍රියාවලියේ දී හඳුනාගත් දෝෂ කිහිපයක් තිබූ බැවින්, සැලසුම් කළ පරිශීලක පිළිගැනුම් පරීක්ෂණ සැසිය පැවැත්වීමට පෙර ඒවා නිවැරදි කිරීමට අමතර කාලයක් අවශ්‍ය වූ අතර, එය, ව්‍යාපෘති කාල සීමාවන් සති 2 කින් පසුගාමී කළේ ය. පරිශීලක පිළිගැනුම් පරීක්ෂණ සැසි 2023 ජනවාරි මස 5 වන දින අවසන් කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත ලැබුණු යෝජනා අනුව, ලේඛන කළමනාකරණ ඒකක මොඩියුලයේ ප්‍රතිදාන වාර්තාවේ කුඩා වෙනසක් එමගින් සිදු කෙරිණි.

දත්ත සංක්‍රමණ අතුරු මුහුණත සහ "ලංකා පේ" ගෙවුම් ද්වාරය ඒකාබද්ධ කිරීම සඳහා වෙනස ඉල්ලුම් - සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් වෙනස ඉල්ලුම් සංවර්ධනය පිළිබඳව තහවුරු කිරීමක් ලබා දී ඇති අතර එම වෙනස ඉල්ලුම් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුතුව ඇත.

සම්පූර්ණ තත්ත්ව සහතිකය - ආරම්භක පරීක්ෂණ පිළිගැනුම් පරීක්ෂණ 2021 අගෝස්තු මාසයේ දී (මාස 16 කට වඩා වැඩි) සිදු කරන ලද බැවින් සහ පසුව, වෙනස ඉල්ලුම් 11 ක් 2023 ජනවාරි 05 වන දින සම්පූර්ණ කරන ලද බැවින්, පද්ධතියෙහි කිසිදු දෝෂයක් නොමැති බවට වග බලා ගනු පිණිස සේවා සපයන්නා විසින් සම්පූර්ණ තත්ත්ව සහතික වටයක් සිදු කරන ලදී. මෙම තත්ත්ව සහතික වටය 2023 ජනවාරි මස 31 වන දින විට අවසන් කරන ලදී.

2. භරයාත්මක පද්ධතියේ දෘඪාංග උපකරණ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කෙරිණි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූලික පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා අත්‍යවශ්‍ය යැයි හඳුනා ගෙන ඇති තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ දෘඪාංග ලබා ගැනීම සඳහා විශේෂ අනුමැතියක් ලබා දෙන ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා සිටි අතර ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇති අතර 2023 මැයි මාසයේ දී එය අවසන් කිරීමට සැලසුම් කර ඇත.

අවශ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර පහත පරිදි වේ;

	අයිතමයේ නම	ප්‍රමාණය
1	නෝට්බුක් පරිගණක	124 nos.
2	ADF ස්කෑනර් යන්ත්‍ර	35 nos.
3	QR කේත ස්කෑනර් යන්ත්‍ර	45 nos.
4	QR කේත මුද්‍රණ යන්ත්‍ර	21 nos.
5	පුද්ගලික පරිගණක	10 nos.

3. මානව සම්පත් තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම

මානව සම්පත් ක්‍රියාවලිය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තුළ සම්පූර්ණයෙන්ම මිනිස් අතින් සිදු වන ක්‍රියාවලියක් වූ අතර, ඉහළ දත්ත පරිමාව සහ මිනිස් අතින් එය සිදු වන ක්‍රියාවලිය හේතුවෙන් පරිගණකගත මානව සම්පත් යෙදුමක ප්‍රමුඛ අවශ්‍යතාවයක් එහි පැවතියේ ය.

මානව සම්පත් තොරතුරු පද්ධතියේ පරීක්ෂණ පිළිගැනුම් පරීක්ෂණ පුහුණුව සාර්ථකව නිම කරන ලද අතර 2022 දී මානව සම්පත් තොරතුරු පද්ධතියේ පරීක්ෂණ පිළිගැනුම් පරීක්ෂණ අවසන් කරන ලදී. මානව සම්පත් තොරතුරු පද්ධතියේ පළමු අදියර මත ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා පරීක්ෂණ පුහුණුව සම්පූර්ණ කෙරිණි.

ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් පරිදි වේ:

- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය පද්ධතියට තාක්ෂණිකව සහ ක්‍රියාකාරීව අනුකූල වන ඩිජිටල් මානව සම්පත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මානව සම්පත් අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සඵලතාවය වැඩි දියුණු කිරීම.

4 වසර තුළ වෙනත් තොරතුරු තාක්ෂණ ආයෝජන

	ප්‍රමාණය	පිරිවැය (රු.)
ඩොට් මැට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍රය	11	2,551,636
පුද්ගලික පරිගණක	17	3,143,550
ලැප්ටොප් පරිගණක	205	41,566,380
ADF ස්කෑනර් යන්ත්‍ර	17	9,674,000
UPS –අඛණ්ඩ බල සැපයුම් රැහැන් අන්තර් ක්‍රියාකාරිත්වය 2 KVA	2	134,000

ආරක්ෂාව

සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතියෙහි ආරක්ෂාව ශක්තිමත් කිරීම

ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් පරිදි වේ:

රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබා ගත හැකි බව සලසා දීම සඳහා තොරතුරු සහ සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතිය වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම, භාවිතය, හෙළිදරව් කිරීම්, බාධා කිරීම්, වෙනස් කිරීම් හෝ විනාශ කිරීම් යනාදියෙන් ආරක්ෂා කිරීම.

පුහුණු කටයුතු

පද්ධතිය සහ වෙනස කළමනාකරණය පිළිබඳ පුහුණුව

2023 දී ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇති නව ක්‍රමය පිළිගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සූදානම් විය යුතු ය. මේ කාර්යය සඳහා, විසඳුම් සහිතව අදාළ කර්තව්‍යය සැලසුම් කිරීම මගින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි නව විසඳුම සමග සම්බන්ධ වීමට ඉතා වැදගත් සහකරුවෙකු හෝ සවියක් විය යුත්තේ, කාර්ය මණ්ඩලයට සහ සාමාජිකයින්ට මෙන්ම පොදුවේ සේවා යෝජකයන්ට ද විශාල වශයෙන් බලපාන විවිධ ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරන ව්‍යුහගත සහ එකිනෙක පෙළගැස්වූ වෙනස කළමණාකරණය පිළිබඳ සැලැස්මකි. අදාළ වෙනස කළමනාකාරිත්වයේ අභ්‍යන්තර සහ බාහිර උපාය මාර්ග අනුමත කිරීමෙන් පසුව, එය ක්‍රියාත්මක කිරීම සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මෙහෙයුම් කමිටුව", වෙනස කළමණාකරණ කණ්ඩායම සමග සමීපව කටයුතු කරයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ භරයාත්මක පද්ධතිය සංවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූලික පද්ධතිය පිළිබඳ දැනුම ලබා දීමේ ක්‍රමයක් අත්‍යවශ්‍ය බව වටහා ගන්නා ලදී. යෝජිත ක්‍රමය ක්‍රියාත්මක කර 2023 දී සජීවී වීමට සැලසුම් කර ඇති බැවින්, මණ්ඩලය තුළ වෙනස කළමණාකරණ සංකල්ප හඳුන්වා දීමේ අවශ්‍යතාවය අත්‍යවශ්‍ය වේ. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලීය කාර්ය මණ්ඩලය සඳහා ඉතා ඵලදායී විය.

(ICTA) තොරතුරු සංනිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ භරයාත්මක පද්ධති වෙනස කළමනාකරණ මෙහෙයුම් කමිටුව සඳහා ඩිජිටල් පරිවර්තන පුහුණුව

මෙම සැසිය භෞතික සැසියක් ලෙස පවත්වන ලදී. අපගේ නව වෙනස්කම් කළමනාකරණය සහ ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සඳහා මෙම සැසිය ඉතා ප්‍රයෝජනවත් විය. මෙම සැසිවාරයට වෙනස කළමනාකරණ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින් සහභාගී විය.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

වෙනත් පුහුණු කටයුතු

- තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා ෆයර්වෝල් පුහුණු වැඩසටහන,
- MS 365 පුහුණු වැඩසටහන
- පුහුණු වැඩසටහන.
- පරිශීලක පිළිගැනුම් පරීක්ෂණ පුහුණුව සහ මානව සම්පත් තොරතුරු පද්ධතිය සඳහා පරිශීලක පුහුණුව.

ඉදිරි සැලසුම්

නව සාමාජික කේන්ද්‍රීය තොරතුරු පද්ධතිය

නව සාමාජික-කේන්ද්‍රීය තොරතුරු පද්ධතියේ (මූලික පද්ධතිය) පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ සාර්ථකව නිම කරන ලදී. පුනරාවර්තන 2 සංවර්ධනයේ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ තුළ සැලකිය යුතු නව වෙනස ඉල්ලා සිටීම් ප්‍රමාණයක් හඳුනා ගෙන ඇත. වෙනස ඉල්ලා සිටීම් වල අවසාන ලැයිස්තුව සහ වෙනස ඉල්ලා සිටීම් සංවර්ධනය කිරීම අවසන් කර ඇති බැවින්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, වෙනස් කිරීමේ ඉල්ලීම් 11 ක් පමණක් සලකා බලයි. පරිශීලක පුහුණුව සහ මෙහෙයුම් පිළිගැනීමේ පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් පසුව, 2023 වර්ෂය වන විට අදාළ පද්ධතිය සජීවීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙහෙවර පියසෙහි Wi-Fi ජාල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

ඉක්ටා නියෝජිතායතන මූලික පද්ධතිය වෙබ් පාදක විසඳුමක් වන අතර, එය, 2023 දී සජීවී තත්ත්වයට ගෙන ඒමට සැලසුම් කර ඇති බැවින් ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලය සම්බන්ධ ගැටලු වහා නිරාකරණය කර ගත යුතු ය. සේවාලාභීන් 30 දෙනෙකුට වඩා වැඩි ගණනක් ප්‍රවේශ ස්ථානයක් වෙත සම්බන්ධ වේ නම්, එම ස්ථානය අධි ඝනත්ව පරිසරයක් ලෙස හඳුනා ගත හැකි ය. ප්‍රධාන කාර්යාල ජාලය අධි ඝනත්ව පරිසරයක් ලෙස හඳුනා ගෙන ඇත. අධි ඝනත්ව රැහැන් රහිත සම්බන්ධනය කෙරෙහි සහය දැක්වීම සඳහා, ව්‍යවසාය මට්ටමේ ප්‍රවේශ ස්ථාන, ගුවන් විදුලි සංඛ්‍යාත පරාසය අධීක්ෂණය සඳහා කැප වූ ගුවන් විදුලි බලය සමග ගොඩනගා ඇති අතර, එමගින් ප්‍රවේශ ස්ථානයට ඉහළ ඝනත්ව පරිසර හැසිරවීමට ඉඩ සලසා දෙයි. ව්‍යවසාය මට්ටමේ ප්‍රවේශ ලක්ෂ, ජාල කාර්ය සාධනය අවබෝධ කර ගැනීමට සෘජුවම බැඳී ඇති ජාලයට දෘශ්‍යතාව ලබා දෙන අතර සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ජාලයේ ගමනාගමනයේ හැසිරීම පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට ඉඩ සලසයි, එමගින් අදාළ ජාලයේ කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ඒවා භාවිතා කළ හැකි ය.

පුර පැතුරුම් ජාලයක් ක්‍රියාත්මක කිරීම

ඉක්ටා නියෝජිතායතන මූලික පද්ධතිය වෙබ් පාදක විසඳුමක් වන බැවින්, ප්‍රධාන කාර්යාල ජාලය සහ ප්‍රාදේශීය කාර්යාල ජාල අන්තර් සම්බන්ධනය කිරීම සඳහා මෘදුකාංග නිර්වචනය කළ පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාලයක් (SD-WAN) හරහා එය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාලයක් (SD-WAN) ක්‍රියාත්මක කිරීම මගින්, ෆයර්වෝල් ආරක්ෂාව සහ මධ්‍යගතව කළමනාකරණය කළ හැකි ප්‍රතිපත්ති ප්‍රාදේශීය කාර්යාලවලට ද යොදා ගත හැක. පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාලයක් (SD-WAN) හඳුන්වා දීමෙන් අධික වියදම් සහිත අතථ්‍ය පුද්ගලික ජාල (VPN) සම්බන්ධතා අඩු වියදම් අන්තර්ජාල සම්බන්ධතා සමග ප්‍රතිස්ථාපනය කළ හැකි ය. පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාලයක් (SD-WAN), ප්‍රවාහන ජාල මාර්ගගත කිරීමේ තීරණ සමග බහු සම්බන්ධතා වර්ග සඳහා සහය වනු පිණිස හොඳින් ස්ථානගත වී ඇති බැවින්, 3G/4G/5G සහ බ්‍රෝඩ්බෑන්ඩ් තෝරා ගැනීමේ කොන්දේසි අර්ථවත් වන අදාළ ජාල සේවා ගමනාගමනය කරවීමේ උපකාරකයක් බවට පත්වේ. පවතින හොඳම සම්බන්ධතාව මත රඳා පවතිමින් ශේෂය පූරණය කිරීමට හෝ බෙදා ගැනීමට ඊට හැකියාව ඇත. මෘදුකාංග පාලනයේ ස්වභාවය යන්නෙන් අදහස් කෙරෙනුයේ, ව්‍යාපාරය ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම සඳහා යෙදුම් සහ / හෝ පරිශීලක වර්ගවලට ප්‍රමුඛත්වය දෙන ආපදා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කළ හැකි ය න්න ය. පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාල සේවා (SD-WAN) සපයන්නන් අදාළ යෙදුම් සහ පරිශීලක හැසිරීම් පිළිබඳ දත්ත පහසුවෙන් තේරුම් ගත හැකි කැටිති සමග වෙන කවරදාටත් වඩා ජාලය වෙත වැඩි දෘශ්‍යතාවක් ලබා දෙයි.

ක්‍රියාකාරී නාමාවලියක් සහ වසම් පාලකයක් ක්‍රියාත්මක කිරීම

බොහෝ ව්‍යවසාය මට්ටමේ ජාල ක්‍රියාත්මක වන්නේ සක්‍රීය නාමාවලියක් හරහා ය. ක්‍රියාකාරී නාමාවලියක් උසස් ආරක්ෂාව, උසස් කළමනාකරණ මෙවලම් සහ තොරතුරු වෙත වේගවත් ප්‍රවේශය වැනි විශේෂාංග සපයයි. අපගේ අවශ්‍යතා අනුව, අප ආයතනයේ දත්ත සංවිධානය කිරීමට, කළමනාකරණය කිරීමට හා සැලසුම් කිරීමට අවශ්‍ය ආකාරය, සේවාලාභී රුචිකරණයට අනුව හැඩගැස්වනු පිණිස ක්‍රියාකාරී නාමාවලිය අප හට ඉඩ හසර සලසයි.

ප්‍රාදේශීය කාර්යාලවල ජාලයේ ගැටලු විසඳීම

මධ්‍යගත කළමනාකරණය කළ හැකි ජාලයක් නොමැති අතර ප්‍රාදේශීය කාර්යාලවල ෆයර්වෝල් ආරක්ෂණය ක්‍රියාත්මක කර නොමැත. එබැවින් අනවශ්‍ය අන්තර්ජාල ප්‍රවේශය අවහිර කිරීම සහ ආරක්ෂක තර්ජන පාලනය කිරීම ප්‍රාදේශීය කාර්යාලවල ජාලය තුළ සිදු කළ නොහැක. ඉක්ටා නියෝජිතායතන මූලික පද්ධතිය 2023 දී ක්‍රියාත්මක කිරීමට නියමිත අතර එම අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රාදේශීය කාර්යාලවල ජාල දැනට ප්‍රමාණවත් නොවේ.

ප්‍රාදේශීය කාර්යාලවල අන්තර්ජාල සම්බන්ධතා ව්‍යවසාය මට්ටමේ පුළුල් පරාසබ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා දක්වා වැඩි දියුණු කළ යුතු ය.

ප්‍රාදේශීය කාර්යාල ජාල සේවා, මෘදුකාංග නිර්වචනය කළ පුළුල් ප්‍රදේශ පුර පැතුරුම් ජාලයක් (SD-WAN) හරහා ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ කළ යුතු ය.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

මූල්‍ය අංශය

2022 දෙසැම්බර් මස 02 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ රාජ්‍ය අංශයීය හස්තය වන, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ 2020 සඳහා වූ වාර්ෂික වාර්තා සම්මාන තරගය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ජයග්‍රහණය කළේ ය. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත වාර්ෂික වාර්තා අංශයේ සමස්ත රන් සම්මානය සහ ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාර සහ කොමිෂන් සභා යන කාණ්ඩය සඳහා වන රන් සම්මානය ද පිරිනමන ලදී. මෙම තරගයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත මෙම සම්මානය හිමි වූයේ අඛණ්ඩව සිව්වන වසරටයි. ආයතනික වාර්තාකරණය සහ මූල්‍ය හෙළිදරව් කිරීම් යන ක්ෂේත්‍රයේ විනිවිදභාවය, වගවීම, සමාජ වගකීම සහ ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් නිරූපණය කළ රාජ්‍ය අංශයේ ආයතන මෙම සම්මානයෙන් ඇගයීමට ලක් කෙරේ.





කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

නීති අංශය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ නීති අංශය, මණ්ඩලයේ සියලුම නීතිමය කටයුතු සඳහා උපදේශක සේවා ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන අතර 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන සේවා යෝජකයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනී. නීති අංශය, වර්තමානයේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) / (වැඩ ආවරණ) වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර සහකාර සාමාන්‍යාධිකාරි (නීති), නීති කළමනාකරුවන් සහ නීති නිලධාරීන් යන අයවළුන්ගෙන් ද, එහි සහායක කාර්ය මණ්ඩලයෙන් ද සමන්විත වේ. නීති අංශය සෘජුවම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි. ප්‍රාදේශීය කාර්යාල ජාලය ස්ථාපනය කිරීමෙන් පසුව, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධ නීතිමය ක්‍රියාදාමයන් ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කර ඇත.

නීති අංශයේ ප්‍රධාන අරමුණක් වන්නේ, අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සොයා ගනු ලබන සමුච්චිත දායක මුදල් / අධිභාර පැහැර හරින සේවා යෝජකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හරහා අදාළ හිඟ මුදල් අයකර ගැනීම සහතික කිරීමයි. නීති අංශය විසින්, මණ්ඩලීය කාර්ය මණ්ඩලයේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා නීතියේ මූලික මූලධර්ම සහ කම්කරු නීතියේ නව ප්‍රවණතා පිළිබඳ පුහුණු සැසි සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වනු ලැබේ.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු කළමනාකරණය වෙත කෙරෙන සේවාවක් ලෙස ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා පවත්නා සංවිධානය තුළ වූ ස්වාධීන තක්සේරුමය කාර්යයකි. එය, සංවිධානයක් තුළ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දායකත්වය ලබා දෙන කාර්යයක් ලෙස අභ්‍යන්තර පාලන, මූල්‍ය සහ වෙනත් කරුණුවල සඵලතාවය මැනීම, ඇගයීම සහ වාර්තා කිරීම පාලනය කරන්නා වූ විධි ක්‍රමයකි. විගණන සහ සහතිකකරණ අංශයේ ප්‍රධානියා ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හරහා මණ්ඩලයට වාර්තා කරන අතර සියලුම පරිපාලන කටයුතු සඳහා ඔහු වාර්තා කරන්නේ මණ්ඩලයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාට පමණි. ප්‍රමුඛතා කාර්යයන් සකසා නියම කිරීමටත්, විගණන සැලැස්මක් සකස් කිරීමටත්, සොයා ගනු ලබන ප්‍රධාන අනාවරණ හා තොරතුරු නිවැරදිව හා කාලෝචිත ලෙස විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට සැපයීමටත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) විගණන කමිටුව හා එක්ව කටයුතු කරයි.

යම් සංවිධානයක් තුළ ස්ථාවර වූ ද, කාර්යක්ෂම වූ ද පද්ධති සහ පාලන විධි ඇති බව සහතික කිරීම කළමනාකරණයේ වගකීම වේ. අදාළ කළමනාකරණය විසින් එහි වත්කම් සහ ආයෝජන ආරක්ෂා කිරීම, වාර්තා වල විශ්වසනීයත්වය සහතික කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රතිපත්ති, රෙගුලාසි, කොන්ත්‍රාත්තු සහ නියෝග පිළිපැදීම අධීක්ෂණය කිරීම යන කරුණු උදෙසා ස්ථාපිත කරනු ලබන මූල්‍ය සහ වෙනත් ආකාර යන දෙඅංශයෙන්ම හෙබි පාලන ක්‍රමවලට අයත් සමස්ත පද්ධතියම අභ්‍යන්තර පාලනය තුළ සමන්විත වේ.

අධ්‍යක්ෂක මණ්ඩලය



ඩී එල් පී රෝහණ අභයරත්න මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි (වැ. ඛ.)
(පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් නම් කරන ලද සහ පනතේ 5 (2) වගන්තිය අනුව පත්කරන ලද)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) (වාණිජ හා කළමනාකරණ) උපාධිය
- කැළණි විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය
- ජාත්‍යන්තර සබඳතා පිලිබඳ ඩිප්ලෝමාව

පසුගිය පත්කිරීම්

- ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- ජාතික ඉතිරිකිරීමේ බැංකු කළමනාකරණ අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පති (ශ්‍රී ලංකා පරිපාලන සේවා - විශේෂ ශ්‍රේණිය)
- අපනයන කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්
- ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ යටතේ පැවති කලාපීය ගැටුම් හා බලපෑම්වලට ලක්වූවන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ (ADB) විශේෂඥයා
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංචාරක)
- ශ්‍රී ලංකා ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් මිනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම්
- නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති සම්බන්ධීකරණ හා අධීක්ෂණ)
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක (ආගමන හා විගමන)

වෙනත් පත්කිරීම්

- ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
- පීඨ මණ්ඩල සාමාජික - කැළණි විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ පීඨය
- කැළණි විශ්වවිද්‍යාලයේ වාණිජ හා මූල්‍ය කළමනාකරණ උපදේශක කමිටුවේ බාහිර සාමාජික
- කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ ආයතනයේ බාහිර කථිකාචාර්ය



නීල් උමගිලිය මහතා
අධ්‍යක්ෂ
පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- එක්සත් ජනපදයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ අධි සාමාජික
- බ්‍රිතාන්‍ය කළමනාකරණය ආයතනයේ සාමාජික

පසුගිය පත්කිරීම්

- ඩයල් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ
- ලංකා බැංකු සභාපති
- ශ්‍රී ලංකා මුදල් මණ්ඩල සාමාජික
- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (ICTA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- NCED හි සාමාජික
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ආරියසේන ගාල්ලගේ මයා
අධ්‍යක්ෂ
පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ අමාත්‍යාවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කොළඹ විශ්ව විද්‍යාලයේ එල්එල්බී (LLB) උපාධිය
- අවුරුදු 28කට වැඩි පළපුරුද්ද සමඟ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් ලෙස කටයුතු කිරීම

පසුගිය පත්කිරීම්

- මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂ
- උතුරු මැද පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති
- ජනතා පොහොර සමාගමේ අධ්‍යක්ෂ
- පොල් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක

වෙනත් පත්කිරීම්

- පොලොන්නරුව දිස්ත්‍රික් සීමාසහිත සමූපකාර ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂක මණ්ඩලය



කේ එස් දයාරත්න මෙනවිය
අධ්‍යක්ෂක
පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන පිළිබඳ උපාධිය
- කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.
- ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික

පසුගිය පත්කිරීම්

- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වැඩබලන සභාපතිනිය
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සභාපති
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩල අධ්‍යක්ෂ

වෙනත් පත්කිරීම්

- භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
- ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ජූඩ් ඩිනාල් පීරිස් මහතා
අධ්‍යක්ෂ
පනතේ 5 (1) (ඇ) වගන්තිය යටතේ ලංකා සේවායෝජකයින්ගේ සම්මේලනය විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- යාන්ත්‍රික ඉංජිනේරු
- එක්සත් රාජධානියේ ලන්ඩන් ව්‍යාපාර පාසලෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය

පසුගිය පත්කිරීම්

- ලංකා හාම්පුතුන්ගේ සංගමයේ සභා සාමාජික
- ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවන සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු



ඊ ඒ ඒකනායක මහත්මිය
අධ්‍යක්ෂ
පනතේ 5 (1) (ඇ) වගන්තිය යටතේ වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදි (ව්‍යාපාර හා සංඛ්‍යා ලේඛණ) පිළිබඳ ශාස්ත්‍ර වේදි උපාධිය
- කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිලිබඳ විද්‍යාපති උපාධිය
- මොරටුව විශ්ව විද්‍යාලයේ විද්‍යාපති (මෙහෙයුම් පර්යේෂණ) උපාධිය

පසුගිය පත්කිරීම්

- කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ

වෙනත් පත්කිරීම්

- වෙළෙඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම්

අධ්‍යක්ෂක මණ්ඩලය



එල් එස් දේවෙන්ද්‍ර මහතා

අධ්‍යක්ෂ

පනතේ 5(1) (ඉ) වගන්තිය යටතේ වෘත්තීය සමිති නියෝජිතයෙකු ලෙස අමාත්‍යවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- නීති උපාධිය
- එක්සත් රාජධානියේ කාර්මික සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාව
- කම්කරු ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කම්කරු සංගමය - ජිනීවා)
- පුහුණු ක්‍රමවේදය පිලිබඳ ඩිප්ලෝමාව (ජාත්‍යන්තර කම්කරු සංගමය - ටියුරින්)

පසුගිය පත්කිරීම්

- ජාතික ගෙවීම් කොමිෂන් සභාවේ සාමාජික
- ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ
- ජාතික පුවත් සභාවේ සාමාජික
- ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික
- ශ්‍රී ලංකා පදනම් ආයතනයේ සාමාජික

වෙනත් පත්කිරීම්

- ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ මහා ලේකම්
- ජාත්‍යන්තර ප්‍රවාහන සේවකයින්ගේ සංගමයේ විධායක මණ්ඩලයේ සාමාජික
- දකුණු ආසියා කලාපීය වෘත්තීය සංගමයේ උප සභාපති

වෙනත් ජයග්‍රහනයන්

- ජනාධිපති ජාතික සම්මානයේදී දේශබන්දු සම්මානයෙන් පිදුම් ලැබීය



ඩබ්ලිව් එම් තුරාජිත් සිං මහතා

අධ්‍යක්ෂ

පනතේ 5(1) (ඉ) වගන්තිය යටතේ වෘත්තීය සමිති නියෝජිතයෙකු ලෙස අමාත්‍යවරයා විසින් නම් කරන ලදි

වර්තමාන පත්කිරීම්

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ප්‍රධාන කාර්යාලය) නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු (ආවරණ)
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- ශ්‍රී ලංකා පොදුජන ප්‍රවාහන සේවක සංගමයේ සභාපති



උදේශ් අයි ඩබ්ලිව් සෙනෙවිරත්න මයා

අධ්‍යක්ෂ

පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කරන ලදි

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- භෞතික විද්‍යා උපාධිය
- ජාත්‍යන්තර සබඳතා, ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය කළමනාකරණ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- කළමනාකරණය සහ තොරතුරු විද්‍යාව පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය

පසුගිය පත්කිරීම්

- අගමැති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)
- ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (නැගෙනහිර ආසියානු හා පැසිෆික් කලාපීය)
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (දකුණු ආසියානු සහ සාර්ක් කලාපීය)
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ)
- ශ්‍රී ලංකා කොන්සෝල ජෙනරාල් ෆෑන්ක්ෆර්ට් ජර්මනිය
- ජනාධිපති ලේකම් කාර්යාලයේ සභාපති සහකාර ලේකම්
- ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අංශයේ ජනාධිපති සහකාර ලේකම්
- කර්මාන්ත අමාත්‍යාංශයේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ සහ කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහකාර අධ්‍යක්ෂ
- කර්මාන්ත සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂක (ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන)

වෙනත් පත්කිරීම්

- මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (ITMD) අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් (ප්‍රතිපත්ති සහ සංවර්ධන)
- ශ්‍රී ලංකා රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිතායතනයේ (NAPPP) ප්‍රධාන විධායක නිලධාරි

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය (31/12/2022 දිනට)



ඩී පී ජී ප්‍රනාන්දු මහතා
සාමාන්‍යාධිකාරී

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන (විශේෂ ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය (FCA)
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික (FCMA)
- ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ අධි සාමාජික (FACS)
- බ්‍රිටිෂ් පරිගණක සමාජයේ අධි සාමාජික (FBCS)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ අධි සාමාජික
- වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික (UK) (Finalist ACCAA)



ජී ඒ එස් සුමනසේන මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය (විශේෂ) විද්‍යාවේදී උපාධිය
- එක්සත් රාජධානියේ කාර්ඩිෆ්ට් මෙට්‍රොපොලිටන් වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය (FCA)
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික (FCMA)



ඩබ්ලිව් ජී කේ රත්නායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය (FCA)
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික (FCMA)
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ දෙවන අදියර නිමකර ඇත.



කේ එස් වැලිවිට මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික ගිණුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය (**FCA**)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන (මූල්‍ය) විද්‍යාපති උපාධිය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය (31/12/2022 දිනට)



එම් ඒ කේ අළුත්ගමගේ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන) - වැඩ ආවරණ

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය
- කැලණිය විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජික
- ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සාමාජික



පේ කේ පි රංජිත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (කළාප 1)
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රැස්කිරීම් හා සේවායෝජක සබඳතා) 2021.10.11 දින සිට

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජික
- පොත් තබන්නන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජික
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර නිමකර ඇත
- (CBA) හි සාමාජිකත්වය
- CGMA (USA) හි සාමාජිකත්වය



එච් එම් ඒ ජයන්ත කුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) වැඩ ආවරණ සහ මණ්ඩලීය ලේකම්

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ජේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- කොළඹ විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් LLM
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් LLB උපාධිය
- ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ
- ප්‍රසිද්ධ නොතාරිස් හා දිවුරුම් කොමසාරිස්
- ලියාපදිංචි සමාගම් ලේකම්



කේ ජී එන් රත්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(පරිපාලන හා මානව සම්පත්)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිය
- පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනයේ සහය සාමාජික

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය (31/12/2022 දිනට)



වී එන් ජයරත්න මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම් සහ අධිභාර)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කැලණි විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධි
- ඔස්ට්‍රේලියාවේ කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පාසලේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (MBA) උපාධිය
- ඔස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගිණුම් පිළිබඳ ආයතනයේ සාමාජික (CMA)



පුෂ්පරංග වීරසේකර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධිය (විශේෂිකරණය: පරිගණක ඉංජිනේරු විද්‍යාව)
- එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (**IESL**) සහය සාමාජික
- බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජික **(UK)**
- වෘත්තීය ඉංජිනේරු වරයෙක් ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සලයේ ලියාපදිංචි වී ඇත **(ECSL)**
- කෘතිම බුද්ධි **(AI)** පද්ධති වැඩසටහන් පිළිබඳ ඩිප්ලෝමාව
- **JAVA** වැඩසටහන් සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව



පී එල් අයි සී පී අල්විස් මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී (කළාප III)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී (පළමු පෙළ) උපාධිය
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධිය (විශේෂිකරණය වාහනාක්ෂණ විද්‍යාව)
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය



එච් ජී ඩී එන් ප්‍රසන්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (සාමාජික සේවා) වැඩබලන අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්

- රුහුණු විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- චීනයේ වූහාන් හි හස්ටි විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය

කළමනාකාරිත්ව කණ්ඩායම
(2022.12.31 දිනට)

ප්‍රධාන කාර්යාලය

දායක මුදල් රැස්කිරීම් හා සේවායෝජක සබඳතා

01. කේ එම් ඩි ඒ යු ගුණවර්ධන මෙනවිය
මූල්‍ය කළමනාකරු (දායක මුදල් රැස්කිරීම්)

02. ඒ විදානපතිරණ මහත්මිය
කළමනාකරු (අධිභාර)

03. ඒ ජේ ආර් අනුර මහතා
කළමනාකරු (ස්වයංරැකියා සහ සංක්‍රමික සේවා)

අභ්‍යන්තර විගණන අංශය

15. එන්. ජී. බිමන්ත මහතා
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

16. ඩී. එල්. සී. ඩී. කුමාර මහතා
කළමනාකරු (අභ්‍යන්තර විගණන)

පරිපාලන හා මානව සම්පත්

17. ටී එම් අයි අම්ඩොන් මහතා
කළමනාකරු (ප්‍රසම්පාදන)

18. ටී එච් සි පී කුමාර මහතා
කළමනාකරු (ඵලදායිතා)

19. බී සරත් මහතා
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

20. එස් වීරසිංහ මහත්මිය
කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්)

සාමාජික සේවා

04. එම් රාහුල්ඩින් මහතා
කළමනාකරු (සාමාජික ගිණුම්)

05. අයි විජේතුංග මහත්මිය
කළමනාකරු (සාමාජික ගිණුම් - කුඩා කාණ්ඩය)

06. ඒ එච් එන් ප්‍රියන්ති මහත්මිය
මූල්‍ය කළමනාකරු (ප්‍රතිලාභ ගෙවීම්)

07. එච් කේ කේ පී පුෂ්පකුමාර මහතා
කළමනාකරු (ප්‍රතිලාභ)

08. එස් ආර් නන්දසීලි මහත්මිය
කළමනාකරු (ප්‍රතිලාභ තීරණය කිරීම)

09. සුරාජ් ඩිලන්ත මහතා
කළමනාකරු (ප්‍රතිලාභ පරිපාලන - වැ.බ.)

තොරතුරු තාක්ෂණ

21. ආර් වී ඩබ්ලිව් එම් ජී එම් ද කොස්තා
මහත්මිය කළමනාකරු (පද්ධති පාලන)
2022.12.31 දින විශ්‍රාම යනලදී)

22. බී ඩී වඩුගේ මහතා
කළමනාකරු (තොරතුරු තාක්ෂණ)

ආයෝජන

10. එන් ආර් එන් ප්‍රනාන්දු මහත්මිය
මූල්‍ය කළමනාකරු

11. එච් එම් සි දමයන්ති මහත්මිය
මූල්‍ය කළමනාකරු

12. එන් ගෞතමන් කළමනාකරු (ආයෝජන පරියේෂණ හා මෙහෙයුම්)
(2022.08.20 වන දින විශ්‍රාම යන ලදි)

මුදල් අංශය

13. එම් ඒ වී කුමුදිනි මෙනවිය
මූල්‍ය කළමනාකරු (මුදල්)

14. ආර් ටී වික්‍රමරත්න මහතා
මූල්‍ය කළමනාකරු (මුදල්)

නීති

23. එස් ආර් එස් පුංචිහේවා මිය
කළමනාකරු (නීති)

24. එස් පී රාජපක්ෂ
කළමනාකරු (නීති)

ප්‍රාදේශිය කාර්යාල

01. එච් පී පෙරේරා මහතා
ප්‍රාදේශිය කළමනාකරු (වැ.බ.)
(කොළඹ දිස්ත්‍රික් කාර්යාලය)

02. බී බී සුදුබණ්ඩා මහතා
ප්‍රාදේශිය කළමනාකරු (නුවර එළිය)
2023.01.31 දින විශ්‍රාම යන ලදි

03. එන් කේ යු කේ නාගසිංහ මහතා
ප්‍රාදේශිය කළමනාකරු (බදුල්ල)

04. එච් එම් අනුරකුමාර මහතා
ප්‍රාදේශිය කළමනාකරු (කළුතර)
(2022.12.31 දින විශ්‍රාම යන ලදි)

05. එම් ඒ චන්ද්‍රසේන මහතා
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 1 - 7)

06. ඩී ඩී කුලරත්න මහතා
ප්‍රාදේශිය කළමනාකරු (රත්නපුර)

07. ඊ එම් එස් කේ ඒකනායක මහතා
ප්‍රාදේශිය කළමනාකරු (කුරුණෑගල)

8. ඩී කේ එස් එස් දිසානායක මහතා
ප්‍රාදේශිය කළමනාකරු (හම්බන්තොට)

9. ඩී එම් කේ ජී ඒ දිසානායක මහතා
ප්‍රාදේශිය කළමනාකරු (මහනුවර)

10. ඒ කේ එන් ප්‍රසංගනී මහත්මිය
කළමනාකරු - නීති (මහනුවර)

11. ජේ එම් එස් බී තෙන්නකෝන් මහත්මිය
ප්‍රාදේශිය කළමනාකරු (කෑගල්ල)

12. සාගර හේවාගම මහතා
ප්‍රාදේශිය කළමනාකරු (ගම්පහ)

13. සී අබේගුණසේකර මහත්මිය
ප්‍රාදේශිය කළමනාකරු (මාතර)

14. කේ එම් එන් එස් අධිකාරි මහත්මිය
කළමනාකරු - නීති (මාතර)
(2023.02.04 දින සේවයෙන් ඉවත්වන ලදි)

15. කේ එන් අශෝක මහතා
ප්‍රාදේශිය කළමනාකරු (කොළඹ 8 -15)

16. එච් පී චන්දිම මහතා
ප්‍රාදේශිය කළමනාකරු (අනුරාධපුර)

17. ජේ තම්ල්ලාගන් මහතා
ප්‍රාදේශිය කළමනාකරු (යාපනය)

18. ඒ ජී ජී ගුණේන්ද්‍ර මහතා
ප්‍රාදේශිය කළමනාකරු (ගාල්ල)

19. එස් එම් ගුණසිංහ මහත්මිය
ප්‍රාදේශිය කළමනාකරු (වව්නියා)

20 ජේ සී ජයසිංහආරච්චි මෙනවිය
ප්‍රාදේශිය කළමනාකරු (අම්පාර) වැ.බ.


ආයතනික පාලනය

යහපත් ආයතනික පාලනය, ඉහළ ප්‍රමුඛතා කාර්ය භාරයක් සේ සලකන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අර්ධ රාජ්‍ය ආයතනයක් වන්නේ ය. ස්වකීය සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු හරහා ව්‍යාප්ත වන පරිදි අදාළ ව්‍යවස්ථාමය හා නියාමනීය විධිවිධානවලට අනුකූලතාව දක්වමින් කටයුතු කරනු පිණිස මණ්ඩලය බැඳී සිටින්නේ ය. ස්වකීය පාලන කාර්ය භාරයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා මණ්ඩලය මෙහෙයවනු ලබන ප්‍රධාන මාර්ගෝපදේශ වනුයේ, විනිවිද භාවය, විශ්වාසදායක භාවය හා අනුකූලතාව දැක්වීම යන තෙවැදෑරුම් ප්‍රතිපත්තියයි.

ආයතනික පාලනයේ කාර්ය රාමුව

මණ්ඩලයේ පාලන ව්‍යුහය ග්‍රැෆික් චිත්‍රමය කව අනුසාරයෙන් පහත දක්වා ඇත:

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ආයතනික පාලන ව්‍යුහය, විශේෂිත භූමිකා හා වගකීම් සහිතව පැහැදිලි වාර්තාකරණමය මාර්ග ද සමග බහු ස්ථරවලින් සැදුම් ලත් පාලන ආයතන වලින් සමන්විත වේ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් සිය අධීක්ෂණමය මෙහෙවර සලසා දෙන අතරම එහි උපාය මාර්ගික දිශානතිය, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන් කර දීම සහ අවදානම් නැඹුරුව යන කරුණු පිළිබඳව මණ්ඩලයේ ඉහළ කළමනාකරණ පාලනාධිකාරිය සමග නිරන්තර සංකථනයේ යෙදෙයි.



ආයතනික පාලනය

ආයතනික පාලනයේ ඉහළම මට්ටමේ සම්මත ප්‍රමිති පවත්වාගෙන යමින් ඒ අනුව කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ යුතුකම හා වගකීම බව මෙම වාර්තාව තුළින් අවධාරණය කෙරේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, යහපත් පාලන ව්‍යුහ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිපත්ති රාමු සකස් කිරීම යන කාර්යභාරය විෂයයෙහි ඉතා ඉහළ වගකීමක් දරන අතර මණ්ඩලයේ කාර්යය හා කර්තව්‍යය උදෙසා වන උසස්ම තලයේ පන්නරය ඵලදායි ලෙස ඔවුන් විසින් සලසා දෙනු ලැබිය යුතු ය. නියාමන වෙනස්කම් ද, උද්ගත විය හැකි අවදානම් හා අවස්ථා මෙන්ම අභ්‍යන්තර වෙනස්කම් යනාදිය ද පිළිබිඹු වනු පිණිස පාලන භාවිතා හා චර්යා සමාලෝචනයට හසු කර නිරන්තරව යාවත්කාලීන කෙරේ.

මණ්ඩලයේ පාලන කාර්ය රාමුව පහත ලැයිස්තු ගත කර ඇති පරිදි බාහිර සහ අභ්‍යන්තරික මෙහෙයුම් හා සබැඳි මෙවලම් කිපයකට සාරානුකූල වන ආකාරයෙන් සකසා ඇත:

- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් අරමුදල් පනත;
- මුදල් රෙගුලාසි (රජය);
- රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- විශිෂ්ට භාවිත හා චර්යා සංග්‍රහය (රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව);
- ප්‍රධාන පාර්ශවකාර කණ්ඩායම්වල අයිතිවාසිකම් සපුරාලන අතරම සංස්ථාපිත ආයතන ක්‍රියා කළ යුතු ආකාරය ආමන්ත්‍රණය කෙරෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ට චර්යා සංග්‍රහය;
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත;
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය;
- සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වන 1954 අංක 19 දරන සාජ්පු සහ කාර්යාල සේවක පනත හා ඊට සිදු කරන ලද සංශෝධන;
- මුදල් එකතු කර ගන්නා නියෝජිතයන් සඳහා බදු අධිකාරීන් විසින් නිකුත් කරන ලද පනත්, චක්‍රලේඛ සහ ගැසට් නිවේදන.
- රජයේ අදාළ චක්‍රලේඛ (මහ භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)

1. අධ්‍යක්ෂ මණ්ඩලය

1.1. මණ්ඩලය

රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් අරමුදලේ භාරකාරත්වයෙහිලා ව්‍යවස්ථාපිත වගකීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි කළමනාකාරිත්වය, කාර්යක්ෂම මෙහෙයුම් කටයුතු අරභයා සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීම විෂයයෙහි සහතික වන්නා වූ ඵලදායී අභ්‍යන්තර පාලන විධි පද්ධතියක් පවත්වාගෙන යන බවට වග බලාගනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙසෙසා කටයුතු කරයි.

1.2 අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම

අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබ ඇත්තේ ඉහළ විවිධත්වයක් ආරෝපණය වන අයුරින් පුළුල් සමාජ හරස්කඩක් සහිත පසුබිම් මට්ටමකින් (මූල්‍ය, වෙළඳ, හාම්පුතුන්ගේ සම්මේලනය හා ව්‍යෘත්තීය සමිති යනාදිය) තෝරා ගැනීමෙන් පසුව ය. මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කෙරෙන කරුණු සම්බන්ධයෙන් ස්වාධීන මතයක් ගෙන හැර දැක්වීමට ඔවුන්ට හැකියාව ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාජිකයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය:

- අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් සිව්දෙනෙකු;
- මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- වෙළඳ විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;
- සාමාජිකයන් 100,000 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සිටින එක් එක් ව්‍යෘත්තීය සමිතිවල කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු.

1.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පොදු ජනතාව සතු සම්පත්වල භාරකරු ලෙස තම අධිකාරියට යටත් කර ඇති අයිතිවාසිකම් සහ වගකීම් අවංකව සහ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය. තමන් විසින් නිසි සැලසුමකින් තොරව ගනු ලබන යම් තීරණ හා ඉටු කරනු ලබන ක්‍රියා හේතුවෙන් උද්ගතවන ප්‍රතිඵලය අවසානයේ දී දැරීමට සිදුවන්නේ පොදු මහජනතාවට වන හෙයින් මණ්ඩලය සෑම විටම සිය භාරදූර වගකීම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විමසුමට භාජනය විය යුතු කරුණු හා ගැටලු පහත දක්වා ඇත:

අවසානයේ මහජනතාව විසින් දරනු ලැබේ. මණ්ඩලයේදී විසඳිය යුතු කරුණු සහ ගැටළු රැස්වීම්:-

- ප්‍රතිපත්ති සකස් කිරීම;
- අරමුදලේ කාර්යකරණය අධීක්ෂණය කිරීම හා ඇගයීම;
- උසස්තම සදාචාරාත්මක ප්‍රමිතීන් සහිත ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් සහතික කරන අතරම පරිපාලිත සමාගම්වල, ආශ්‍රය සමාගම්වල හා වෙනත් ආයෝජනවල අරමුණු පිළිබඳ කාර්ය සාධනය අධීක්ෂණය සහ ඇගයීම;
- වාර්ෂික කාර්ය සාධනය සමාලෝචනය කිරීම;
- කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම;
- කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්ය සාධන වාර්තා විශ්ලේෂණය කිරීම සහ ප්‍රගමනීය ක්‍රියාමාර්ග ගැනීම.

1.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

මණ්ඩලය සාමාන්‍යයෙන් මාසික කාල විරාමයක් සහිතව සහ අවශ්‍ය වන අවස්ථාවල දී රැස්වේ. මණ්ඩලය වසර තුළ අවස්ථා 14 ක දී රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරබයා ඊට අදාළ මණ්ඩල පත්‍රිකා යෝග්‍ය කාල වේලාවක් සහිතව යටත් පිරිසෙයින් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර බෙදා හරිනු ලැබේ. 2022 වසරේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට එහි සාමාජිකයන්ගේ පැමිණීම පහත දැක්වෙන අයුරින් පැවතියේ ය.

නම	සහභාගිවූ රැස්වීම් ගණන	2022 මූල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් ගණන	සහභාගී වූ රැස්වීම්වල ප්‍රතිශතය %
වෛද්‍ය නිහාල් ජයතිලක මහතා	12	14	100%
ඒ ආර් දේශප්‍රිය මහතා	02*		
නීල් උමගිලිය මහතා	12	14	86%
උදේශ් අයි ඩබ්ලිව් සෙනවිරත්න මහතා	02**	14	14%
කේ එස් දයාරත්න මෙනවිය	11	14	79%
ජූඩ් ඩිනාල් පීරිස් මහතා	06	14	43%
එල් එස් දේවෙන්ද්‍ර මහතා	13	14	93%
ඊ ඒ ඒකනායක මිය	14	14	100%
ආරියසේන ගාල්ලගේ මහතා	13	14	93%
ඩබ්ලිව් එම් නුරාජිත් සිංහ මහතා	13	14	93%

*2022.11.14 දින පත් කරන ලදී

**2022.11.18 දින පත් කරන ලදී

ආයතනික පාලනය

1.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාව

ආයතනය ඵලදායී ලෙස කළමනාකරණය කර එය, යහපාලනයේ ඉහළතම ප්‍රමිතීන් කරා මෙහෙයවමින් ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය වන්නා වූ විශේෂඥ දැනුම, කුසලතාව සහ පළපුරුද්ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සතුව පවතී. ඔවුහු ඉදිරි දැක්ම, නායකත්ව ලක්ෂණ, සාධිත නිපුණතාව සහ ඍජු අවංකභාවය යනාදී ගුණාංගවලින් හෙබි තැනැත්තන් වන්නා හ. මණ්ඩලීය සාමාජිකයින්ගේ පෞද්ගලික වෘත්තීක විස්තර මෙම වාර්තාවේ 11 පිටුවෙහි ගෙනහැර දක්වා ඇත.

1.6 ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ප්‍රමාණවත් කාල වෙලාව

සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මාසික කාල විරාමයක් සහිතව රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා වැය වන සාමාන්‍ය කාලය පැය 03 ක් පමණ වන්නේ ය. අදාළ මණ්ඩල පත්‍රිකා පරිශීලනය කර අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් කාල වේලාවක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීම සහතික වනු පිණිස ඒවා සාමාන්‍යයෙන් වැඩ කරන දින තුනකට නොඅඩු කාලයකට පෙර ඔවුන් අතර බෙදා හරිනු ලැබේ.

2. මණ්ඩලීය ලේකම්

නියමිත කාර්ය පටිපාටි, අණපනත් හා වෙනත් අදාළ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූලතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දීම සහ මණ්ඩලය වෙත කලට වේලාවට විශ්වාසදායක සහ අදාළ වන්නා වූ තොරතුරු සැපයීම අරබයා මණ්ඩලයට වගකිව යුතු වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් ආයතනික ලේකම් වරයෙකුගේ උපදෙස් හා සේවා සලසා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ඉඩ ප්‍රස්ථාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ කාර්ය පටිපාටි අනුගමනය කෙරෙන බවට මණ්ඩලීය ලේකම් වගබලා ගත යුතු අතර මණ්ඩලයට ඵලදායක ලෙස ඔවුන්ගේ කාර්යයන් ඉටු කරනු පිණිස මණ්ඩල පත්‍රිකා කලට වේලාවට බෙදා හැරිය යුතු ය.

2.1 මණ්ඩලීය ලේකම්ගේ කාර්යභාරය

මණ්ඩලීය ලේකම්, සම්මත අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පරිපාටි නිසි අයුරින් අනුගමනය කෙරෙන බවට වගබලා ගත යුතු අතර මණ්ඩල රැස්වීම් කටයුතු හා සම්බන්ධ නෛතික නියමයන් පිළිබඳ මාර්ගෝපදේශ ලබාදිය යුතු ය. ඊට අමතර වශයෙන්, පහත සඳහන් කටයුතු ද ලේකම්වරයාගේ කාර්යභාරයෙහිලා ගැනේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම් දීම්, රැස්වීම් වාර්තා හා මණ්ඩල පත්‍රිකා අනෙකුත් අදාළ ලිපිලේඛන සමග දන්වා යැවීමට සැලැස්වීම;
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු ඉටු කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර තොරතුරු සපයා දීමෙන් ඔවුන්ට සහය සැලසීම'

3. සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

සමස්ත ආයතනික පාලන තන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, සැලසුම් හා වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුතු වන්නේ ය.

3.1 සභාපති වරයාගේ පත්කිරීම්

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා වනුයේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ය. සභාපති වරයා පත්කරනු ලබන්නේ අමාත්‍යතුමා විසිනි.

3.2 සභාපති වරයාගේ වගකීම්

සමස්ත ආයතනික පාලනතන්ත්‍ර ව්‍යුහයේ වැදගත්ම පුරුක වන සභාපතිවරයා / ප්‍රධාන විධායක නිලධාරී වරයා ස්වකීය සේවා කණ්ඩායම සහ ආයතනය නිවැරදි උපාය මාර්ගික දිශානතියක් වෙත මෙහෙයවීම සඳහා නායකත්වය ගෙන ක්‍රියා කරයි. කලින් නිශ්චය කරනු ලැබූ අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස ප්‍රධාන කර්තව්‍යයන්ට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහාත්, උපාය මාර්ගික සැලසුම් හා මූලාරම්භක වැඩ සටහන් සැකසීම සඳහාත් ඔහු වගකිව යුතු වන්නේ ය.

3.3 උපායමාර්ගික සහ මෙහෙයුම් කටයුතුවල සමබරතාවය

භූමිකාවන්හි පැහැදිලි බව සහ වගකීම් ඵලදායී ලෙස වෙන් කිරීම තුළින් සුදුසු බල තුලනය සහතික කෙරේ. සභාපතිවරයාගේ කාර්යභාරය සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයෙන් වෙන්ව පවතී. සභාපති විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. සාමාන්‍යාධිකාරීවරයා මෙහෙයුම් කටයුතුවලට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ තනතුරක් දරන්නේ නැත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධාන භූමිකාවන් / වගකීම් පහත දැක්වේ:

සභාපති

- අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත උපාය මාර්ගික දැක්ම
- ඉහළ මට්ටමේදි උපායමාර්ගික හැසිරීම් සකස් කිරීම
- සියළුම උපාය මාර්ගික දිශානතින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිත්වය
- ශ්‍රී ලංකා රජය ඇතුළුව සියලුම පාර්ශවකරුවන් සමග ඵලදායී සන්නිවේදනය පවත්වා ගැනීම
- ප්‍රමාණවත් තොරතුරු සියළුම අධ්‍යක්ෂවරුන්ට ලබාගත හැකි බව සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාදාචාර හැසිරීම ස්ථාපිත කිරීම

සාමාන්‍යාධිකාරි

- දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පරමාර්ථ සකස් කරමින් උපයා මාර්ගික දැක්ම ක්‍රියාවට නැංවීම
- ආයතනික සැලැස්මේ දක්වා ඇති කාර්ය සාධන අරමුණු අත්කර ගැනීම
- ඉලක්ක පිළිබඳ නිරන්තර නියාමනය සහ ඒවායේ අත්කරගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීම
- මණ්ඩලය අනුමත අවදානම් රුචිය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනය තුළ ක්‍රියාත්මක වන බව සහතික කිරීම
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණයට මෙහෙයුම් නායකත්වය ලබාදීම

ආයතනික පාලනය

4 ගණන් දීම හා විගණනය

4.1 මූල්‍ය වාර්තාකරණය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ද, එමෙන්ම, ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩල පනත ප්‍රකාරව ද පිළියෙළ කර ඉදිරිපත් කෙරෙනු ඇත.

4.1.1 ව්‍යවස්ථාමය හා නියාමනය වාර්තාකරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වන වගන්තියට අනුකූලව විගණකාධිපතිවරයා මණ්ඩලයේ විගණක වරයා ලෙස කටයුතු කළ යුතු වන්නේ ය.

4.1.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණක වරයාගේ වගකීම

පිටු අංක 93 හි යාකර ඇති විගණකාධිපති වාර්තාව පරිශීලනය කරන්න.

4.1.3 කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ගැඹුරු ලෙස විස්තර කෙරෙන පිටු අංක 17 සිට 33 දක්වා සපයා ඇති කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය බලන්න.

4.2 අභ්‍යන්තර පාලනය

4.2.1 අභ්‍යන්තර විගණන කෘත්‍යය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට තමන් සතු අභ්‍යන්තර විගණන අංශයක් ඇත. එය, විගණන කමිටුව හරහා මණ්ඩලයට ඉදිරිපත් කරන අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කරයි.

4.2.2. අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාව පිළිබඳ විගණන කමිටු සමාලෝචනය

අභ්‍යන්තර විගණන අංශය, මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව පිළිබඳව විගණන කමිටුව වෙත අඛණ්ඩ පදනමක් මත වාර්තා කරයි. එහිලා මූල්‍ය වාර්තාකරණය පිළබඳ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ සමාලෝචනයක් ද ඇතුළත් වේ.

අනු කමිටු

විගණන කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ
සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

සභාපති
කේ.එස්. දයාරත්න මහත්මිය
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/
භාණ්ඩාගාර නියෝජිත

සාමාජිකයින්
නීල් උමගිලිය මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

ඊ.ඒ. ඒකනායක මහත්මිය
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කමිටු ලේකම්
කේ.එස්. වැලිවිට මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)

රැස්වීම්වලට සහභාගි වීම

රැස්වීම්

නම	සහභාගි වූ රැස්වීම් ගණන
කේ.එස්. දයාරත්න මෙනවිය	4/4
නීල් උමගිලිය මහතා	4/4
ඊ.ඒ. ඒකනායක මහත්මිය	4/4

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී සහ මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයින් ලෙස රැස්වීම් සඳහා සහභාගි වූ අතර සාමාන්‍යාධිකාරීවරයා සහ සියලුම අංශ ප්‍රධානීන් ඔවුන් වෙත කරනු ලබන ආරාධනය අනුව රැස්වීම්වලට සහභාගි විය.

අරමුණ

රජය සතු ව්‍යවසාය සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ මගින් කමිටුවේ අරමුණ පැහැදිලිව නිර්වචනය කර ඇත.

විගණන කමිටුව ස්වකීය වගකීම පහත සඳහන් කරුණු ද ඇතුළත්ව ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය සලසා දෙයි:

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව සහතික කිරීම;
- මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සහ මූල්‍ය වාර්තාකරණයට අදාළ අනෙකුත් රෙගුලාසි හා නියමයන් විෂයයෙහි අනුකූලතාව දැක්වීම;
- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල නියමයන් සපුරාලීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන විධි ප්‍රමාණවත් බවට වග බලා ගැනීමේ ක්‍රියාවලි ඉටු කිරීම;
- අභ්‍යන්තර විගණන කර්තව්‍යයේ කාර්ය සාධනය සහතික කිරීම;
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ප්‍රධාන කළමනාකාරිත්වයෙහි සේවයෙහි නිරත තැනැත්තන් හා සම්බන්ධ අදාළ පාර්ශවකාර ගනුදෙනු වාර්තා කිරීම.

මූල්‍ය වාර්තාකරණයේ ක්‍රමය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ගිණුම් වාර්තා මත පදනම්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල නියම කර දක්වා ඇති අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ අනුගමනය කරනු ලබන මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සමාලෝචනය කිරීම මගින් ද, ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවා ඉදිරිපත් කිරීම මගින් ද, මූල්‍ය ප්‍රකාශ තුළ අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා ප්‍රමාණවත් පරිදි ඉටු කර ඇති බවට වග බලා ගැනීම මගින් ද, මූල්‍ය ප්‍රකාශවලට වැදගත් වන්නා වූ සැලකිය යුතු ඇස්තමේන්තු සහ නිශ්චයමතීන් යොදා ගැනීම මගින් ද එම කටයුතුවලට අදාළ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය සඳහා සමාලෝචිත වසර තුළ කමිටුව සිය සහය සලසා දුන්නේ ය.

අභ්‍යන්තර විගණනය

විගණන කමිටුව, අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වාධීනත්වය, විෂයානුබද්ධතාව හා එහි කාර්ය සාධනය, අවදානම පදනම් වූ සැලසුම් ක්‍රමවේදය මත පිළියෙළ කරන ලද වාර්ෂික විගණන සැලැස්ම, සම්පූර්ණ කරන ලද අභ්‍යන්තර විගණනවල සැලකිය යුතු සොයාගැනීම් සහ නිර්දේශ සමාලෝචනය කරන ලද අතර අභ්‍යන්තර විගණන අංශයේ සම්පත් අවශ්‍යතා සම්බන්ධ තක්සේරුවක් ද කරන ලදී.
අභ්‍යන්තර විගණන වාර්තාවල විශේෂිතව ගෙන හැර දක්වා ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා ඉතා ගැඹුරු ලෙස විමර්ශනය කරනු ලබන අතර විගණන නිර්දේශ මත කළමනාකාරිත්වය විසින් ගනු ලබන පසු විපරම් ක්‍රියාමාර්ග සමාලෝචනයට භාජනය කිරීම සඳහා ද කමිටුව කටයුතු කරයි.

අනු කමිටු

බාහිර විගණනය

නියාමන විධිවිධානවලට අනුකූලව විගණන සේවා සඳහා බාහිර විගණකවරයා සම්බන්ධ කර ගැනීමට විගණන කමිටුව මණ්ඩලයට සහාය වූ අතර විගණකාධිපති වාර්තාව, එහි ප්‍රධාන සොයාගැනීම් සහ ඒ අනුව මතු වූ ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් කළමනාකරණය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග සමාලෝචනයට ලක් කිරීම මෙන්ම ඒ සඳහා වූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග අවැසි අවස්ථාවල දී ඒවා නිර්දේශ කිරීම ද සිදු කරන ලදී.

අවදානම සහ අභ්‍යන්තර පාලනය

මණ්ඩලයේ වත්කම් සුරක්ෂිතව ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් පාලන විධි සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මකවේ ද යන්න කමිටුව විසින් ඇගයීමට ලක් කරයි. කමිටුව, අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව සහ නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් ද, ගිණුම්කරණය සහ අනෙකුත් මෙහෙයුම් ප්‍රතිපත්තිවලට අනුකූලතාව දැක්වීම පිළිබඳව ද සමාලෝචනය කරන ලදී.

විගණන කමිටු රැස්වීම්වල දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රවල හා ඒවායේ නිගමනවල සාරාංශය සමාලෝචිත වර්ෂය තුළ, පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කරමින්, නිසි ලෙස සලකා බලන ලදී.

වංචා සිදු වීම අවම කිරීම සඳහා සාමාජික හිමිකම් ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර පාලන විධි, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය මත රාජකාරි වෙන් කිරීම, වෙන් නොකළ ලදුපත්, සමීක්ෂණ මණ්ඩලය, තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය, කොටියාශ ප්‍රඥප්ති, අවිනිශ්චිත ගිණුම්, අභ්‍යන්තර හා බාහිර විගණන නිරීක්ෂණ යනාදිය ඊට අයත් විය. කමිටුවේ සඵලතාවය පිළිබඳව ස්වයං ඇගයීම් කර එහි ප්‍රතිඵල මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

විගණන කමිටුව වෙනුවෙන්,
කේ.එස්. දයාරත්න මෙනවිය
සභාපතිනි
විගණන කමිටුව

අනු කමිටු

මණ්ඩලීය අවදානම් කළමනාකරණ කමිටුව

සංයුතිය
අංශ ප්‍රධානීන්, සාමාන්‍යාධිකාරී / අතිරේක සාමාන්‍යාධිකාරී යන අයවළුන් සමග සාමූහිකව කටයුතු කර අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ගන්නා අතර පවතින ඒකක අවදානම් පැතිකඩ හා ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීම සහ නව අවදානම්, ඒවා සිදුවන විට, හඳුනා ගැනීම ඇතුළුව ඔවුන්ගේ මෙහෙයුම් ක්ෂේත්‍රය තුළ පවත්නා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතු ය.

රැස්වීම්
වර්ෂය තුළ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි.
අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය:
මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ කමිටුවේ කාර්යයන් සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කර ඇත.

ප්‍රධාන උපායමාර්ගික සහ මෙහෙයුම් තීරණ ගැනීමේ දී අවදානම් කළමනාකරණ කමිටුව සිය වගකීමේ කොටසක් ලෙස අවදානම් කළමනාකරණය ප්‍රමාණවත් ලෙස සිදු කර ඇති බව සහතික කිරීම සඳහා සභාපති / ප්‍රධාන විධායක නිලධාරියාට සහාය වේ.

කමිටුවේ ප්‍රධාන වගකීම්

- අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සඳහා සැලකිය යුතු යෝජිත වෙනස්කම් නිර්දේශ කිරීම හෝ ඒ පිළිබඳව උපදෙස් දීම.

- අනෙකුත් කමිටු, කළමනාකාරිත්වය හා විගණකවරුන් සමග එක්ව පවතින යම් සැලකිය යුතු අවදානම් සහ නිරාවරණයන් සමාලෝචනය කරන අතර එවැනි අවදානම් අවම කිරීමට කළමනාකරණය ගෙන ඇති පියවර තක්සේරු කරයි.

වසර තුළ ප්‍රධාන අවදානම් දර්ශක සාරාංශය

අංකය	අවදානම	බලපෑම			වියහැකි බව			අවම කිරීමේ උපාය මාර්ගය
		අඩු	මැදි	ඉහළ	අඩු	මැදි	ඉහළ	
01	සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය - රාජකාරී වෙන්කර නියම කිරීම		✓				✓	විගණන පද්ධති AS 400 සඳහා කෙරෙන වෙනස්කම්
02	හිමිකම් ඉල්ලුම් ගෙවීමේ ක්‍රියාවලිය		✓				✓	ශක්තිමත් මුරපද පාලනය, ප්‍රධාන සාමාජික ගොනු දත්ත වලට වෙනස් කිරීම් සීමා කිරීම්, වැඩ පත්‍රිකාවට දත්ත ඇතුළත් කිරීම සීමා කිරීම, ගෙවුම් පත්‍රිකා උපලේඛනවලට සාමාජික ජාතික හැඳුනුම්පත් අංකය එක් කිරීම.
03	තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් නොමැතිකම			✓			✓	නව තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
04	වෙන් නොකළ ලදුපත්			✓		✓		දිගු කාලීනව හිඟ හිට ඇති ශේෂ අවහිර කිරීම
05	සාමාජිකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සාමාජික ගිණුම්		✓			✓		නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සියලු සාමාජික ගිණුම් අවහිර කිරීම
06	ස්වයං සාමාජික හිමිකම් ඉල්ලුම් ගෙවීම - සංක්‍රමණික සේවකයන්		✓			✓		සංක්‍රමණික ස්වයං සාමාජික හිමිකම් ඉල්ලුම් පරිගණකගත කිරීම
07	සම්ක්ෂණ මණ්ඩලය		✓			✓		නව ප්‍රාග්ධනීකරණය හඳුන්වා දීම
08	ව්‍යාජ සේවා යෝජක ගිණුම්			✓		✓		දිගු කාලීනව හිඟ හිට ඇති ව්‍යාජ සේවා යෝජක ගිණුම් අවහිර කිරීම

අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්,

කේ.එස්. වැලිවිට
අවදානම් කළමනාකරණ සම්බන්ධීකාරක

අනු කමිටු

ආයෝජන කමිටු වාර්තාව

සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

කේ.එස්. දයාරත්න මෙනවිය	මණ්ඩල අධ්‍යක්ෂ
ඩී.වී.සී. දිල්රුක්ෂි මිය	භාණ්ඩාගාර නියෝජිත
ඩී.පී.ජී. ප්‍රනාන්දු මහතා	සාමාන්‍යාධිකාරී
ඩබ්ලිව්.ඒ.ඩී.යූ.කේ. වික්‍රමනායක මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයෝජන)
ජී.ඒ.එස්. සුමනසේන මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
කේ.එස්. වැලිවිට මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන), නිරීක්ෂක

රැස්වීම්

නම	සහභාගි වූ රැස්වීම් ගණන*
කේ.එස්. දයාරත්න මෙනවිය	1/10
ඩී.වී.සී. දිල්රුක්ෂි මිය	10/10
ඩී.පී.ජී. ප්‍රනාන්දු මහතා	09/10
ඩබ්ලිව්.ඒ.ඩී.යූ.කේ. වික්‍රමනායක මහතා	10/10
ජී.ඒ.එස්. සුමනසේන මිය	10/10
කේ.එස්. වැලිවිට මහතා	10/10

*මාර්ගගතව සහ පෞද්ගලිකව යන දෙආකාරයෙන්ම

ආයෝජන කමිටුව නිසි පරිදි අදාළ අභ්‍යන්තර සාමාජිකයින්ගෙන් සහ රේඛීය අමාත්‍යාංශයේ සාමාජිකයින්ගෙන් සමන්විත වේ. අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන පිළිබඳ අදහස් සහ මතය දැන ගැනීම සඳහා කමිටුව අවම වශයෙන් මසකට වරක් රැස්වේ.

ආයෝජන සම්බන්ධයෙන් මණ්ඩලයේ මූලික පරමාර්ථය වන්නේ, මූල්‍ය බැඳීම් සපුරාලීම සඳහා ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරතුර අදාළ ආයෝජිත මුල් මුදල ආරක්ෂා කර ගැනීම වන අතර අනුදත් ආයෝජනය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් උපරිම ආයෝජන ප්‍රතිලාභ ඊට ලබා දීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මණ්ඩලය පහත සඳහන් තෙවැදෑරුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමට උත්සාහ කරයි.

(අ) සුරක්ෂිතභාවය

ආයෝජන මූල ධනයේ ආරක්ෂාව සලසා ගැනීම මණ්ඩලයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේ ය. මෙම මූල ධනයේ ආරක්ෂාව තහවුරු කිරීම අරබයා කටයුතු කිරීම පිණිස මණ්ඩලය ස්වකීය ආයෝජන සමුච්චයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අතිශය සුරක්ෂිත රජයේ ස්ථිර සුරැකුම්පත්වල ආයෝජනය කරයි.

(ආ) ද්‍රවශීලතාව

යුක්ති සහගත ලෙස ඉදිරියේ දී අපේක්ෂා කළ හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීම මණ්ඩලයට පහසු කරනු පිණිස මණ්ඩලයේ ආයෝජන කාර්යභාරය මුදල් කළ හැකි ද්‍රවශීලතා මට්ටමකින් පැවතිය යුතු වන්නේ ය.

(ඇ) ආයෝජන මත ප්‍රතිලාභ

ලබාගත හැකි ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන සමුච්චය සැලසුම් කළ යුතු වන්නේ ගිණුම් අවරෝධ හා මුදල් ප්‍රවාහ අවශ්‍යතා සැලකිල්ලට ගෙන ය.

අනු කමිටු

කළමනාකරණ කමිටු වාර්තාව

සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන් පරිදි විය:

සභාපති, සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

අරමුදලට අයත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම සභාපතිවරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ පාලනය යටතට පැවරී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ වගකීම ඔවුහු දරන්නාහ. මනා විමසුම් සහගත තීරණවලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් ලබා දීමේ කාර්යයෙහි සභාපති වරයා හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම නියැලෙයි. ඔවුහු මණ්ඩලයේ ඉලක්ක හා අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කරන අතරම එහි කාර්යක්ෂම කළමනාකරණය උදෙසා වූ සැලසුම්, අයවැය ලේඛන, පිළිගත් පද්ධති, ක්‍රියාපටිපාටි හා පාලන විධි සැකසීමෙහි ද නිරතව සිටිති.

එබැවින්, මණ්ඩලයේ වාරමය ප්‍රගති පිරික්සුමෙහි මුඛ්‍යාංගයක් ලෙස කළමනාකරණ කමිටුව ක්‍රියා කරයි. කමිටුවේ විශේෂ අවධානය යොමුවන කරුණු පහත දැක්වේ:

- මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති මීට පෙර රැස්වීම්වල දී ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
- ඉලක්ක දිශාභිමුඛ කාර්ය සාධන ක්‍රියාදාමයෙහි ඇතිවන පරතර හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහිතව විධිමත් පිළිවෙත්වලින් බැහැරව කටයුතු කිරීමේ යුක්ති සහගත භාවය හඳුනා ගැනීම.
- ඉදිරි කාර්තු සඳහා වන මුදල් ප්‍රවාහයේ ආකාරය හා ඉලක්ක ගත අවශ්‍යතා අතිශය තීක්ෂණ අයුරින් ඇගයීම.
- ණය සහ මුදල් කළමනාකරණය.
- හදිසි මිලදී ගැනීම් වළක්වනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි ප්‍රමාදවීම් ඇත්නම් ඒවා පිළිබඳව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම.
- සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා බදු යනාදී ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත පරිදි සිදු වන බවට වගබලා ගැනීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසුවනු පිණිස යුක්ති සහගත හේතු මත අවශ්‍ය උසස් තාක්ෂණමය උත්ශ්‍රේණිගත කිරීම් සලසා ගැනීම.
- විවිධ මාධ්‍ය ඔස්සේ පළවන පැමිණිලි ඇතුළුව ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය / අතෘප්තිමත්භාවය පිළිබඳ පසු විපරම් කටයුතු කරමින් ඒවා වැඩි දියුණු කිරීම / නිවැරදි කිරීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ප්‍රතිශෝධිත ආයතනික සැලැස්ම තුළ ඇතුළත් කළ යුතු යම් යම් නව යෝජනා වේ නම් ඒවා ඉදිරිපත් කිරීම.
- පරිපාලනමය හා ආයතනික කාර්යයන්ට අදාළ සියලු කටයුතු.
- මෙහෙයුම් කාර්යයන් අළලා එදිනෙදා උද්ගත වන වෙනත් යම් ගැටලු.

අවදානම් කළමනාකරණය

පසුබිම

මනා අයුරින් පාලනය වන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සිය කාර්ය නිරාවරණය තුළ යම් අධිකාරීත්වයක් දරමින් අවදානමට මුහුණ දෙන්නේ ව්‍යාපාරික අවස්ථාවක් ලෙස ය. එමෙන්ම, ව්‍යාපාරික අරමුණු යන නිර්වචනයෙන් ආරම්භ වන අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස අවදානම් පාලනය සැලකිල්ලට භාජනය කරයි. ඉන් අනතුරුව විමසා බැලෙනුයේ, උපකල්පනය කළ හැකි, කළ යුතු හෝ නොකළ යුතු ව්‍යාපාරික නිරාවරණයන් පිළිබඳ ප්‍රතිපත්ති පිළිපැදීම, අවදානම් සාධක හඳුනා ගැනීම හා තක්සේරු කිරීම මෙන්ම ස්වකීය ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් කළමනාකරණය සඳහා වන ක්‍රම සහ විධි සූක්ෂම අයුරින් යොදා ගැනීම යන කරුණු කාරණායි.

සෑම සංවිධානයක්ම එහි සාර්ථකත්වයට තර්ජනයක් වන අවදානම් වලට මුහුණ දෙයි. කම්පන හෝ ස්වභාවික සිදුවීම්, වසංගත අර්බුද හා පාරිසරික / සමාජීය / පාලනමය ගැටලු ජාතික මෙන්ම ගෝලීය ආර්ථිකයට පවා අහිතකර ලෙස බලපෑම් එල්ල කළ හැකි සංසිද්ධීන් ය. කොවිඩ් - 19 වසංගතය සියලු කර්මාන්ත සිසාරා විශාල ජන ජීවිත කඩා වැටීමක් අවිනිශ්චිතතාව සහිත අර්බුදකාරී වාතාවරණයක් සමග ඇති කළේ ය. තාක්ෂණය අපේ ජීවිතයේ අනිවාර්ය අංගයක් වී ඇති නමුත් නව තාක්ෂණයේ දියුණුව, ආර්ථික වර්ධනය උපදවන ඵලදායිතා මට්ටම් ඉහළට ඔසවා තැබීම දුර්මුඛ කර තිබේ.

කෙසේ වෙතත්, ෆින්ටෙක් (Fintech) හා රෙග්ටෙක් (Regtech), ක්‍රිප්ටොඇසෙස්ට්ස් (Cryptoasset), මූල්‍ය අපරාධ, සයිබර් සෙකියුරිටි (Cyber Security) සහ ඩේටා සෙකියුරිටි (Data Security) යනාදී අනර්ථකාරී නවෝත්පාදනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය විෂයයෙහි උද්ගතව ඇති හිතකර නොවන සලකා බැලීම් වන්නේ ය.


ඵලදායී ප්‍රතිපත්ති කරා දිවෙන මාවත

පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන කෙටි යෙදුම වඩා ඉහළ පිළිගැනීමක් සහිත පාඨයක් වන අතර එකී අංගයන්, වත්මන් ව්‍යවසායන් තම ව්‍යාපාර කාර්යයන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරන නව ආකාරයේ පිළිබිඹුවක් බවට පත් කර ගෙන ඇත. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ද පාලනය, අවදානම සහ අනුකූලතාව හෙවත් 'GRC' යන පාඨය හැකි උපරිම ආකාරයෙන් තම ව්‍යවසාය වර්ධනය පිණිස ඉවහල් කර ගත හැකි මහාර්ඝ ආදර්ශයකි.

අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය, අවදානම් කළමනාකරණය පිළිබඳ කාර්යභාරයේ බලය අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරයි.

සියලු වර්ගවල අවදානම් හඳුනා ගැනීම, මානනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම යන කටයුතු ස්වාධීනව සමාලෝචනයට හසු කිරීම අරබයා අවදානම් කළමනාකරණ කමිටුව වගකීම උසුලයි. තව ද, අවදානම් කළමනාකරණ කමිටුව, ආයතනයේ ව්‍යාපාරික උපාය මාර්ගවලට අනුකූලව අනුමත කරනු ලැබීම සඳහා විචක්ෂණශීලී අවදානමක් සහිත මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි. අවදානම අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා අවදානම් විශ්ලේෂණය කිරීම, මානනය කිරීම සහ කළමනාකරණය කිරීම යන අවස්ථාවල දී වැදගත් කාර්යභාරයක් ඉටු කරන ආරක්ෂක මාදිලියේ තෙවැදෑරුම් රේඛා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් අනුගමනය කරනු ලැබ ඇත.



අවදානම් සැසඳුම

අනෙකුත් සියලු අංශ

සේ.නි.හා.අ.

ගෝලීය අවදානම් වර්ණාවලිය

උපාය මාර්ගික සහ මෙහෙයුම්

ණය, ද්‍රවශීලිතාවය, වෙළඳපොළ ආයෝජනය

අභ්‍යන්තර අවදානම් ධාවක	අවදානම් සාධක	අවම කිරීමේ උපාය මාර්ගය:
උපායමාර්ගික අවදානම	ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම් හා අහිතකර ව්‍යාපාරික තීරණ නිසාත්, තීරණ නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හෝ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ඌනතාවය හේතුවෙන් පැන නගින ඉපැයීම්වලට සහ ප්‍රාග්ධනය වෙත එල්ල වන වත්මන් හෝ අනාගත අවදානම.	අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීමෙන් ද, මුළු මහත් ආයතනය සඳහා ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම කල්තියා සකස් කර ගැනීමෙන් ද, විචලනයන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමෙන් ද අභ්‍යන්තර හා බාහිර උපායමාර්ගික අවදානම අවම කර ගැනේ.
මෙහෙයුම් අවදානම	ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන් හේතුවෙන් ද, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ද ඇති වන අලාභයේ අවදානම.	පාලන විධි, රක්ෂණය හා පද්ධති විගණනය යොදා ගැනීමෙන් සහ නිතිපතා තොරතුරු තාක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීමෙන් ද, ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් හා ආපදා ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි, තොරතුරු සහ සයිබර් ආරක්ෂාව මෙන්ම භෞතික ආරක්ෂාව සම්බන්ධ අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණුව යනාදිය මගින් ද මෙහෙයුම් අවදානම අවම කර ගැනේ.
ණය අවදානම	තම වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රති පාර්ශවය හෝ නිකුත් කරන්නා විසින් ගනු ලබන පියවර හේතුවන් සිදු වන අලාභයේ අවදානම.	ගිවිසුම් අත්සන් කිරීම, ණය සීමා පවත්වා ගැනීම හා ඒවා අධීක්ෂණය මගින් ද, ඇපකර ලබා ගැනීම මගින් ද ණය අවදානම අවම කර ඇත.
වෙළඳපළ අවදානම	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ, දේශීය මූල්‍ය වෙළඳපොළේ මුදල් ආයෝජනය කිරීමෙන් ප්‍රතිලාභ උත්පාදනය කර ගැනීම වන අතර එහි ස්වභාවය මිල අවිනිශ්චිතතාවය මත පදනම් වේ. මූල්‍ය සාධන පත්වල අගයයෙහි සිදු වන වෙනස්වීම් හේතුවෙන් අලාභ උද්ගත වනු ඇත.	අති සුවිශේෂී ආයෝජන පවත්වා ගෙන යාමේ විධි හා මෙවලම් යෙදීම හරහා අස්ථායී අවදානම් වෙළඳපළ තුළ ද්‍රවශීලතා අවදානම් පොලී අනුපාත අවදානම සහ කොටස් මිල අවදානම සලකා බැලීම මගින් වෙළඳපළ අවදානම අවම කර ඇත.
ආයෝජන අවදානම	ආයෝජනය යනු වර්තමාන සම්පත් භාවිතය අත්හැරීමේ තීරණයයි. ඒ වෙනුවට, ඒවායේ වත්මන් අගයන්හි ආයෝජන අවදානමට වඩා වැඩි අනාගත ප්‍රතිලාභ ලැබීමට ඒවා භාවිතා කළ හැකිවේය යන විශ්වාසය තුළ මෙම අනාගත ප්‍රතිලාභ ක්‍රියාත්මක නොවීම හෝ අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවීම අවදානමක් වේ.	පාරිසරික, සමාජීය හා පාලනමය සාධක හරහා වගකිව යුතු ආයෝජන පිළිබඳ සංකල්පය සලකා බැලීමෙන් ආයෝජන ප්‍රතිපත්තියට අනුගත වීම ඔස්සේ ආයෝජන අවදානම් අවම කර ගැනීම සිදු කර ඇත.

දුවශීලතා අවදානම	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයෙහි දුවශීලතාවය රඳා පවතින්නේ, වෙනත් දේ අතර, සාමාජික හිමිකම් ගෙවීම සඳහා එහි ක්ෂණික මුදල් අවශ්‍යතාවය, දැනට එහි ඇති මුදල් ප්‍රමාණය සහ එහි ආයෝජන වත්කම් කෙතරම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි ද යන කරුණු මත ය.	කල්පිරීමේ හිනිපෙත ඉදිකිරීම, සත්‍ය සහ ගිවිසුම්ගත මුදල් ලැබීම් විශ්ලේෂණය කිරීම, 'රිපෝ' වැනි ප්‍රති මිලදී ගැනුම් දුව වත්කම්වල ආයෝජනය, විවිධාංගීකරණය වූ අලෙවි කළ හැකි කොටස් වෙළෙඳපොළ තුළ ආයෝජනය යනාදිය මගින් දුවශීලතා අවදානම් අවම කර ඇත.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම හඳුනාගෙන විවිධ හේතූන් යටතේ වර්ගීකරණය කර ඇත: ක්‍රියාවලි, පුද්ගලයින්, පද්ධති සහ බාහිර සිදුවීම් නිසා සේ නි භාර අරමුදල් මණ්ඩලය මුහුණ දෙන විවිධ මෙහෙයුම් අවදානම් තක්සේරු කර, පසුව මෙහෙයුම් අවදානමේ ප්‍රතිවිපාක අවදානම අවම කිරීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙල තීරණය කිරීම සඳහා අවදානම් ශ්‍රේණිගත කර, අවදානම් ලේඛනයක් ඉදිකර ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

	කොට්ඨාසය / අංශය / කමිටුව			වෙළෙඳපළ අවදානම් පාලනය - 2 වන පෙළ සුරක්ෂිතතාව						
	ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර	ක්‍රියාකාරකම හෝ විශේෂ අවදානම	අවදානම් හිමියා	බලපෑම / අවදානමේ දැඩිබව			සිදු වීමේ සම්භාවිතාව / විය හැකි බව			අවදානම් සමනය කිරීමේ උපායමාර්ගය
				අඩු	මධ්‍යම	ඉහළ	අඩු	මධ්‍යම	ඉහළ	
1	සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා			X	X			රාජකාරී වෙන්කර නියම කිරීම
2	මුරපද පාලනය	සවලනා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි මුරපද සහ විකල්ප අයථා ලෙස භාවිතා කිරීම	සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ			X			X	i. තොරතුරු තාක්ෂණ දත්ත ගබඩාව නඩත්තු කිරීම ii. වඩාත් සංකීර්ණ මුරපද
3	තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය	මෙහෙයුම් අවදානම	සහකාර සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ			X			X	i. විස්තීරණ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ii. තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය කිරීම
4	සාමාජික ප්‍රධාන ගොනු දත්තවලට සිදු වන වෙනස්කම්	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා			X	X			i. සාමාජික ප්‍රධාන ගොනු දත්ත වෙනස් කිරීම් සඳහා සීමිතව අවසර දීම සහ අධිගාමී පහසුකම් ලබා දීම
5	හිමිකම් ඉල්ලුම් ක්‍රියාවලිය - පත්‍රිකා මගින් කෙරෙන ගෙවීම්	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා			X				සවලනා විශ්ලේෂණ ආධාරක පද්ධතියෙහි ඇති සාමාජික ජාතික හැඳුනුම්පත් /ගමන් බලපත්‍ර අංක බැංකු පත්‍රිකා ගෙවුම් පද්ධතියට ඒකාබද්ධ කිරීම
6	හිමිකම් ඉල්ලුම් ක්‍රියාවලිය - වැඩ පත් සකස් කිරීම	වංචා කිරීමේ අවදානම	සහකාර සාමාන්‍යාධිකාරී -තොරතුරු තාක්ෂණ			X		X		තොරතුරු තාක්ෂණ පද්ධතිය පාලනය කිරීම
7	වෙන් නොකළ ලදුපත්	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා			X			X	2015 වර්ෂය දක්වා අවහිර කිරීම
8	සාමාජිකයාගේ නම සහ හැඳුනුම්පත් අංකය නොමැති සාමාජික ගිණුම්	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සාමාජික සේවා			X			X	i සංක්‍රමණික ගිණුම් අවහිර කිරීම ii. 2015 වර්ෂයට පෙර ගිණුම් අවහිර කිරීම iii. 2015 වර්ෂයේ සිට ගිණුම් යාවත්කාලීන කර කමිටුව වෙත මාසිකව ප්‍රගතිය ඉදිරිපත් කිරීම
9	සවලනා විශ්ලේෂණ ආධාරක පී පද්ධති ප්‍රවේශ ලොගය පවත්වා ගෙන යාම	වංචා කිරීමේ අවදානම	සහකාර සාමාන්‍යාධිකාරී -තොරතුරු තාක්ෂණ			X	X			උපස්ථ දත්ත වසර 3 ක් දක්වා දිරිය කිරීම
10	ඉකුත් ජාතික හැඳුනුම්පත මකා දැමීමේ දී	i. වංචා කිරීමේ අවදානම ii. ද්විත්ව ගෙවුම් අවදානම iii. දත්ත නැතිවීම	සහකාර සාමාන්‍යාධිකාරී -තොරතුරු තාක්ෂණ			X	X			බලාත් ප්‍රවේශය හඳුනා ගැනීම
11	නව ජාතික හැඳුනුම්පත ඇතුළත් කිරීම	i. ආදායම් අහිමි වීම ii. ණය අවදානම iii. ගෙවීම් පැහැර හැරීමේ අවදානම iv. වන්දි අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත්			X	X			i,ii,iii. නිසි අධීක්ෂණය සහ ණය කළමනාකරණය සඳ. වලංගු සහ බැඳී පවත්නා ද්විපාර්ශ්වික ගිවිසුම්
12	නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය - බලාත්මක කිරීමේ ලිපිගොනු	i. අනුකූලතා අවදානම ii. වංචා කිරීමේ අවදානම iii. නෛතික අවදානම iv. ආදායම් අහිමි වීම	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දායක මුදල් රැස් කිරීම් හා සේවා යෝජක සබඳතා			X	X			i, නිසි අධීක්ෂණය සහ එය ක්‍රමිකව ඉහළ නැංවීමේ ක්‍රියාවලිය
13	වට්ටෝරු බඩු තොග කළමනාකරණය කිරී	i. වත්කම් අයථා පරිහරණය ii. වත්කම් අහිමි වීම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්			X	X			i. සම්මේලන මණ්ඩලය ii. වට්ටෝරු බඩු තොග කළමනාකරණය
14	ගෙවා ඇති නමුත් නොගෙවූ ලෙස සවලනා විශ්ලේෂණ ආධාරක MASS පද්ධතියෙහි පෙන්වන සාමාජික ගිණුම්	වංචා කිරීමේ අවදානම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සාමාජික සේවා /සහකාර සාමාන්‍යාධිකාරී -තොරතුරු තාක්ෂණ			X	X			i. සියලු අනුපත් ගිණුම් හඳුනා ගෙන අවහිර කිරීම
15	අඩුවෙන් තක්සේරු කළ මෝටර් වාහන රක්ෂණ	අනපේක්ෂිත අලාභ	සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන හා මානව සම්පත්			X	X			සියලුම වාහන පවතින වෙළඳපල වටිනාකමට රක්ෂණය කිරීම

නිමාව

ස්වකීය ආයතනය වර්තමානයේ දී නිරාවරණය වීමට ඉඩකඩක් ඇති විභවයක් සහිත පුළුල් පරාසයක් තුළ පවතින අවදානම් සහ එක් එක් ආකාරයේ නිහඬ ගාමක බලවේග පිළිබඳ අවබෝධයක් ලබා ගත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, එය මුහුණ දෙන සැබෑ අවදානම් කළමනාකරණය කළ හැකි විවිධ ක්‍රම පිළිබඳව අවධානය යොමු කළේ ය. එක් එක් ආකාර අවදානම් වර්ගවල අවදානම් ලේඛනයක් සම්පාදනය කර භාවිතා කරන ලද අතර එමගින්, අදාළ අවදානම් සහ ඒ ආශ්‍රිත සමනමය ක්‍රියා සහ පාලන විධි පිළිබඳව අවබෝධ කර ගැනීමටත්, ඒවා පිළිගැනුමට හා අධීක්ෂණයට ලක් කිරීමටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට හැකිවී තිබේ.

FINANCIAL INFORMATION



ලාභ හෝ අලාභ ගිණුම සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		සමූහය		මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට *ප්‍රතිප්‍රකාශිත	2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට *ප්‍රතිප්‍රකාශිත
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
මුළු ආදායම					
පොළි ආදායම	5	46,442,799	34,121,505	46,316,209	34,095,154
ශුද්ධ වෙළඳ කටයුතු ආදායම	6	1,296,862	286,766	–	–
ලාභාංශ ආදායම	7	736,919	556,112	736,919	556,112
ලාභ/අලාභ ගිණුම් මත මූලික වත්කම් සාධාරණ අගයට ගැළපීමෙන් ලද ලාභ/(අලාභ)	8	(1,375,782)	550,535	(1,375,782)	550,535
වෙනත් ආදායම්	9	473,899	323,589	444,592	288,094
		47,574,697	35,838,507	**46,121,938**	35,489,895
මුළු මෙහෙයුම් වියදම්					
සේවක මණ්ඩල වියදම්	10	1,690,272	1,422,359	1,392,354	1,264,336
පරිපාලන වියදම්	11	346,572	318,975	252,293	271,857
මූල්‍ය වියදම්	12	4,314	6,151	3,697	3,656
සාමාජික වියදම්	13	577,743	496,881	574,568	494,523
ක්ෂයවීම් හා ක්‍රමක්ෂයවීම්	14	56,103	58,511	36,063	39,973
ප්‍රවර්තන වර්ෂයේ සාමාජිකයන් වෙත ගෙවන ලද පොළි		358,411	255,578	358,411	255,578
කොටස් නිමිකම් ආයෝජනයන්හි වත්කම් හානිකරණය	15	76,820	476	76,820	476
වෙනත් වියදම්	16	121,030	80,964	–	–
		3,231,266	2,639,893	**2,694,206**	2,330,399
බදු වලට පෙර ලාභය		44,343,431	33,198,613	43,427,732	33,159,496
අදායම් බදු වියදම	17	(6,663,194)	(4,603,284)	(6,449,427)	(4,590,140)
බදු වලට පසු ලාභය		**37,680,237**	28,595,330	**36,978,305**	28,569,356
ලාභය ආරෝපනය:					
සමාගම් කොටස් හිමියන්		37,610,044	28,592,732	36,978,305	28,569,356
පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන්		70,193	2,597	–	–
වර්ෂය සඳහා ලාභය		**37,680,237**	28,595,330	**36,978,305**	28,569,356
අනෙකුත් විස්තීර්ණ ආදායම					
විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය කළ හෝ කළ හැකි අයිතිය					
වෙනත් විස්තීර්ණ සංචිත (කොටස්) තුළින් සාධාරණ අගයට මාරු කිරීම		(2,151,584)	477,451	(2,151,584)	477,451
වෙනත් විස්තීර්ණ සංචිත (ඒකක) තුළින් සාධාරණ අගයට මාරු කිරීම		(39,196)	55,287	(39,196)	55,287
විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණය නොකළ අයිතම					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයු ගණක ලාභය/(අලාභය)		55,129	44,997	55,129	44,997
වර්ෂය සඳහාවූ බදු පසු වෙනත් මුළු විස්තීර්ණ අදායම		(2,135,651)	577,735	(2,135,651)	577,735
වර්ෂය සඳහාවූ බදු පසු මුළු විස්තීර්ණ ආදායම		**35,544,586**	29,173,065	**34,842,654**	29,147,092
විභජනය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම					
සමාගමේ කොටස් නිමිකම් හිමියන්		35,474,393	29,170,468	34,842,654	29,147,092
පාලනයට ප්‍රමාණවත් නොවන අයිතීන්		70,193	2,597	–	–
බදුවලට පසු වර්ෂය සඳහාවූ මුළු ශුද්ධ විස්තීර්ණ ආදායම		**35,544,586**	29,173,065	**34,842,654**	29,147,092
ඉ/ගෙ රඳවාගත් ලාභය		5,230,602	4,160,201	4,732,140	3,685,116
ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තියේ වෙනස් වීමේ බලපෑම		–	(9,097)	–	(9,097)
අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගය යටතේ නිශ්චය කරන ලද වත්කම් මත ශුද්ධ ලාභය/ (අලාභය)		83,102	406,717	83,102	406,717
විසර්ජනය සඳහා වූ ලාභය		37,680,237	28,595,330	36,978,305	28,569,356
විසර්ජනය සඳහා වූ මුළු ලාභය		**42,993,941**	33,153,151	**41,793,547**	32,652,092
අඩුකළා: යෝජිත විසර්ජනය – ලාභාංශ 5.75% (2021 – 4.25%)		(24,301,886)	(16,366,867)	(24,301,886)	(16,366,867)
පොළි ආදායම – 3.0%		(12,679,221)	(11,553,085)	(12,679,221)	(11,553,085)
අඩුකළා: ලාභාංශ - ලංකා ලුණු සමාගම		(14,175)	–	–	–
අඩුකළා: පාලන නොවන අයිතිය		(70,193)	(2,597)	–	–
විසර්ජනයෙන් පසු ලාභය		**5,928,466**	5,230,602	**4,812,440**	4,732,140

මූල්‍ය තත්ව ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 දිනට		සමූහය			මණ්ඩලය		
		2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට *ප්‍රතිප්‍රකාශිත	2021 ජනවාරි 01 දිනට *ප්‍රතිප්‍රකාශිත	2022 දෙසැම්බර් 31 දිනට	2021 දෙසැම්බර් 31 දිනට *ප්‍රතිප්‍රකාශිත	2021 ජනවාරි 01 දිනට *ප්‍රතිප්‍රකාශිත
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
වත්කම්							
මුදල් හා මුදල් සමානයන්		760,157	678,419	707,573	584,266	578,758	680,784
ලාභ හා අලාභ ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	18	2,887,168	3,622,159	2,930,900	2,887,168	3,622,159	2,930,900
පරිපාලන සමාගමෙහි ආයෝජන	19	-	-	-	470,961	470,961	470,961
වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නිශ්චය කරන ලද මූල්‍ය වත්කම්	20	8,646,578	10,561,493	7,638,149	8,646,578	10,561,493	7,638,149
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්	21	445,527,175	396,441,984	361,008,932	444,308,492	395,922,319	360,695,932
අනෙකුත් වත්කම්	22	3,843,321	3,409,892	3,166,007	3,206,136	3,119,825	2,621,831
දේපළ, පිරියත සහ උපකරණ	23	973,832	973,974	1,081,908	297,256	253,610	297,503
කල්බදු දේපළ	24	1,394	2,091	2,788	-	-	-
අස්පෘශ්‍ය වත්කම්	25	9,017	4,238	743	9,017	4,238	743
ආයෝජන දේපල	26	4,587,406	4,587,406	4,587,406	4,587,406	4,587,406	4,587,406
මුළු වත්කම්		**467,236,049**	420,281,655	381,124,407	**464,997,280**	419,120,768	379,924,210
බැරකම්							
පොළි දරණ ණය සහ ණය ගැනුම්	27	11,049	4,904	76,771	-	-	-
ප්‍රදාන හා සහනාධාර	28	36,134	33,335	28,074	4,512	-	-
නිශ්චිත ප්‍රතිලාභ බැරකම	29	466,499	476,249	513,974	215,479	236,877	286,616
ප්‍රවර්තන බදු බැරකම	30	3,828,019	2,349,898	2,596,843	3,701,367	2,349,898	2,596,843
අනෙකුත් බැරකම්	31	542,592	7,148,941	398,432	107,206	6,930,925	161,922
විලම්බිත බදු වගකීම්	32	90,684	59,085	51,283	-		
ප්‍රතිපාදන	33	407,301	328,007	301,945	407,301	328,007	301,945
මුළු බැරකම්		**5,382,277**	10,400,418	3,967,320	**4,435,866**	9,845,707	3,347,325
කොටස් හිමිකම්		**461,853,773**	409,881,237	377,157,087	**460,561,415**	409,275,061	376,576,885
සාමාජික අරමුදල	34	459,630,606	406,288,900	375,215,484	459,630,606	406,288,900	375,215,484
සංචිත		2,046,835	3,484,622	1,836,486	930,809	2,986,160	1,361,400
පාලන නොවන අයිතිය		176,332	107,714	105,116	-	-	-
සාමාජිකයින්ට අයත්වන ශුද්ධ වත්කම්/ පාලනය නොවන අයිතිය		**461,853,772**	409,881,236	377,157,087	**460,561,415**	409,275,061	376,576,885

* ස්ථාවර වත්කම් ප්‍රතිපත්ති වෙනස් කිරීමේ බලපෑම පිළිබිඹු කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 හා 2021 ජනවාරි 01 දිනට සංසන්දනාත්මක තොරතුරු නැවත ලබාදී ඇත. (සටහන් අංක 03 බලන්න)

පිටු අංක 63 සිට 91 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල මුඛ්‍ය කොටසක් වේ.

නිවැරදිබවට සහතික කළේ:

එම් ඒ වී කුමුදිනි
මූල්‍ය කළමනාකරු

ආර් ටී වික්‍රමරත්න
මූල්‍ය කළමනාකරු

පී ඒ එස් සුමනසේන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

ඩී පී පී ප්‍රනාන්දු
සාමාන්‍යාධිකාරී

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර අත්සන් කරන ලදී

ඩී එල් පී රෝහණ අභයරත්න
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

සමූහය 2022 දෙසැම්බර් මස 31 වන දිනට	මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු				පශ්චාත් අත්කර ගැනීමේ සංචිත	පාලනය නොවන පොලිය	එකතුව
	රඳවාගත් ලාභය රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය රු. '000	වෙනත් සංචිත රු. '000	ලාභාංශ සමකාර සංචිත අරමුදල රු. '000	රු. '000	රු. '000	රු. '000
2020.01.01 දිනට ශේෂය	**3,214,003**	**(1,786,902)**	**(69,234)**	**142,000**	**466,714**	**104,186**	**2,070,766**
ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තියෙහි වෙනස් වීම මත සිදු වන බලපෑම	(1,772)	–	–	–	–	–	(1,772)
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)	–	(563,978)	–	–	–	–	(563,978)
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(10,422,652)	–	–	–	–	–	(10,422,652)
ලාභාංශ 5%	(17,371,087)	–	–	–	–	–	(17,371,087)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය	28,007,331	–	–	–	–	930	28,008,262
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	259,293	–	–	–	–	–	259,293
ආයු ගණක ලාභය / (අලාභය)	–	–	(45,601)	–	–	–	(45,601)
පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ	–	–	–	–	–	–	–
උපයෝගී කොටස් හිමිකම් සංචලනය	–	–	–	–	8,372	–	8,372
2020.12.31 දිනට ශේෂය	**3,685,116**	**(2,350,880)**	**(114,835)**	**142,000**	**475,086**	**105,116**	**1,941,602**
2021.01.01 දිනට ශේෂය	3,685,116	(2,350,880)	(114,835)	142,000	475,086	105,116	1,941,602
ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තියෙහි වෙනස් වීම මත සිදු වන බලපෑම	(9,097)	–	–	–	–	–	(9,097)
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)	–	532,738	–	–	–	–	532,738
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(11,553,085)	–	–	–	–	–	(11,553,085)
ලාභාංශ 4.25%	(16,366,867)	–	–	–	–	–	(16,366,867)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය	28,569,356	–	–	–	–	2,597	28,571,954
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	406,717	–	–	–	–	–	406,717
ආයු ගණක ලාභය / (අලාභය)	–	–	44,997	–	–	–	44,997
පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ	–	–	–	–	–	–	–
උපයෝගී කොටස් හිමිකම් සංචලනය	–	–	–	–	23,376	–	23,376
2021.12.31 දිනට ශේෂය	**4,732,140**	**(1,818,142)**	**(69,838)**	**142,000**	**498,462**	**107,714**	**3,592,336**
2022.01.01 දිනට ශේෂය	4,732,140	(1,818,142)	(69,838)	142,000	498,462	107,714	3,592,336
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)	–	(2,190,780)	–	–	–	–	(2,190,780)
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(12,679,221)	–	–	–	–	–	(12,679,221)
ලාභාංශ 5.75%	(24,301,886)	–	–	–	–	–	(24,301,886)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය	36,978,305	–	–	–	–	70,193	37,048,498
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	83,102	–	–	–	–	–	83,102
ආයු ගණක ලාභය / (අලාභය)	–	–	55,129	–	–	–	55,129
පරිපාලිතය විසින් ගෙවන ලද ලාභාංශ	–	–	–	–	–	(1,575)	(1,575)
උපයෝගී කොටස් හිමිකම් සංචලනය	–	–	–	–	617,564	–	617,564
2022.12.31 දිනට ශේෂය	**4,812,440**	**(4,008,922)**	**(14,709)**	**142,000**	**1,116,026**	**176,332**	**2,223,167**

සේනිභාඅම 2022 දෙසැම්බර් මස 31 වන දිනට	මණ්ඩලයේ සාමාජිකයන්ට ආරෝපනය කළ යුතු				එකතුව රු. '000
	රඳවාගත් ලාභය රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය රු. '000	වෙනත් සංචිත රු. '000	ලාභාංශ සමකාර සංචිත අරමුදල රු. '000	
2020.01.01 දිනට ශේෂය	**3,214,003**	**(1,786,902)**	**(69,234)**	**142,000**	**1,499,866**
ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තියෙහි වෙනස් වීම මත සිදු වන බලපෑම	(1,772)	-	-	-	(1,772)
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/(අලාභය)	-	(563,978)	-	-	(563,978)
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(10,422,652)	-	-	-	(10,422,652)
ලාභාංශ 5%	(17,371,087)	-	-	-	(17,371,087)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය	28,007,331	-	-	-	28,007,331
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	259,293	-	-	-	259,293
ආයු ගණක ලාභය / (අලාභය)	-	-	(45,601)	-	(45,601)
2020.12.31 දිනට ශේෂය	**3,685,116**	**(2,350,880)**	**(114,835)**	**142,000**	**1,361,400**
2021.01.01 දිනට ශේෂය	3,685,116	(2,350,880)	(114,835)	142,000	1,361,400
ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තියෙහි වෙනස් වීම මත සිදු වන බලපෑම	(9,097)	-	-	-	(9,097)
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය)	-	532,738	-	-	532,738
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(11,553,085)	-	-	-	(11,553,085)
ලාභාංශ 4.25%	(16,366,867)	-	-	-	(16,366,867)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය - අවදානමේ වටිනාකම	28,569,356	-	-	-	28,569,356
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	406,717	-	-	-	406,717
ආයු ගණක ලාභය / (අලාභය)	-	-	44,997	-	44,997
2021.12.31 දිනට ශේෂය	**4,732,140**	**(1,818,142)**	**(69,838)**	**142,000**	**2,986,160**
2022.01.01 දිනට ශේෂය	4,732,140	(1,818,142)	(69,838)	142,000	2,986,160
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය අනුව මනිනු ලබන ප්‍රතිමානන මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය / (අලාභය)	-	(2,190,780)	-	-	(2,190,780)
සාමාජික අරමුදල් ශේෂය මත පොලිය 3%	(12,679,221)	-	-	-	(12,679,221)
ලාභාංශ 5.75%	(24,301,886)	-	-	-	(24,301,886)
වර්ෂය සඳහා සමුච්චිත ලාභය	36,978,305	-	-	-	36,978,305
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත එල්ලේ සාධාරණ අගය යටතේ නම් කරනු ලබන මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ලාභය / (අලාභය)	83,102	-	-	-	83,102
ආයු ගණක ලාභය / (අලාභය)	-	-	55,129	-	55,129
2022.12.31 දිනට ශේෂය	**4,812,440**	**(4,008,922)**	**(14,709)**	**142,000**	**930,809**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක අලෙවියෙන් ලත් මුදල	247,354	2,162,528	247,354	2,162,528
කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරකවල කල් පිරීම්	52,955,675	71,450,196	52,955,675	71,450,196
ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරකවල කල් පිරීම්	155,571	231,548	155,571	231,548
FVTPL ලෙස නියම කළ මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම	(999,321)	(4,651,461)	(999,321)	(4,651,461)
කල් පිරෙන තෙක් රඳවාගත් මූල්‍ය උපකාරක මිලදී ගැනීම් සඳහා ගෙවීම	(103,095,316)	(110,469,070)	(103,095,316)	(110,469,070)
අත්පත්කරගැනීම් සඳහා ලබාදුන් ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකාරක	(140,816)	(195,916)	(140,816)	(195,916)
පාරිභෝගිකයින්ගෙන් ලත් මුදල්	2,942	1,613	-	-
සැපයුම්කරුවන්ට ගෙවූ මුදල්	(2,176)	(1,206)	-	-
ලැබූ පොළිය	47,878,326	37,745,650	47,878,326	37,745,650
ලැබූ ලාභාංශ	820,045	808,390	820,045	808,390
ලැබූ වෙනත් ආදායම්	415,942	248,311	415,942	248,311
ගෙවූ මෙහෙයුම් වියදම්	(4,581,441)	(1,414,991)	(4,581,441)	(1,414,991)
ගෙවූ සාමාජික වියදම්	(291,969)	(261,445)	(291,969)	(261,445)
ගෙවන ලද ආදායම් බදු	(2,241,332)	(4,837,084)	(2,241,332)	(4,837,084)
ගෙවූ පොළිය	(358,412)	(255,580)	(358,411)	(255,578)
ගෙවූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	(4)	(5)	-	-
ප්‍රාදේශීය ලේකම් කාර්‍යාල වෙත ගෙවූ බිම් කුලිය	(13)	(16)	-	-
5 වසර ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම්	(31,966)	(112,096)	(31,966)	(112,096)
උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම්/ නැවත මුදල් ගෙවීම්	(76,044)	(46,200)	(76,044)	(46,200)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(9,342,955)**	(9,596,836)	**(9,343,703)**	(9,597,220)
ආයෝජන කටයුතු				
දේපළ සහ උපකරණ මිලදී ගැනීම	(135)	(24,446)	(87)	(24,408)
දේපළ සහ උපකරණ අලෙවියෙන් උත්පාදිතයන්	244	1	242	-
අයෝජන අත්පත්කර ගැනීම්	(648)	(207)	-	-
ලැබූ පොළිය	116	24	-	-
කාර්ය මණ්ඩල ණය නැවත ගෙවීම්/ ශුද්ධ ප්‍රදාන	(51)	0	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(474)**	(24,627)	**155**	(24,408)
මූල්‍ය කටයුතු				
ලැබුණු දායකත්වය	34,372,190	29,315,885	34,372,190	29,315,885
නැවත මුදල් ලබාදීම්	(25,019,500)	(19,794,145)	(25,019,500)	(19,794,145)
ගෙවූ මූල්‍ය වියදම්	(3,635)	(2,139)	(3,635)	(2,139)
ගෙවූ ලාභාංශ	(52)	(18)	-	-
පොළී දරන ණය සහ ණය ගැනුම් නැවත ගෙවීම	-	-	-	-
මූල්‍ය කල්බදු බැරකම් යටතේ මූලික ගෙවීම	(2)	(5)	-	-
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**9,349,002**	9,519,578	**9,349,055**	9,519,601
මුදල් සහ මුදලට සමාන දේවල් ශුද්ධ වැඩි වීම	5,573	(101,886)	5,508	(102,026)
ජනවාරි 01 වනදා වන විට මුදල් හා මුදල් සමාන දෑ	578,857	680,740	578,758	680,784
දෙසැම්බර් 31 වන දා වන විට මුදල් හා මුදල් සමාන දෑ	**584,431**	578,854	**584,266**	578,758

2022/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළඳපොළ අගය	ක්‍රමක්ෂය පිරිවැය
2022	-	-	-	-
2023	34,040,648	37,457,608	31,769,017	35,471,396
2024	21,001,181	20,832,265	16,404,389	21,494,867
2025	52,195,884	49,142,455	40,133,810	51,043,772
2026	40,215,741	37,902,717	27,696,424	39,755,815
2027	37,099,783	37,599,688	23,006,589	38,161,667
2028	70,020,619	66,849,538	46,668,033	70,199,856
2029	13,964,368	12,888,801	10,629,317	13,617,796
2030	10,177,461	10,764,475	5,545,790	10,812,077
2031	49,655,898	48,648,974	28,030,281	49,722,282
2032	45,540,515	31,479,362	32,458,369	35,206,107
2033	30,236,118	29,089,105	16,235,646	30,698,625
2034	2,825,000	2,816,447	1,373,196	2,902,915
2035	1,426,190	1,522,598	778,253	1,562,245
2039	7,600,000	7,676,208	3,729,996	7,977,305
එකතුව	415,999,406	394,670,241	284,459,110	408,626,726

2021/12/31 දිනට භාණ්ඩාගාර බැදුම්කර කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළඳපොළ අගය	ක්‍රමක්ෂය පිරිවැය
2022	69,732,096	74,848,201	73,292,287	73,047,479
2023	34,040,648	37,457,608	35,825,220	36,017,307
2024	21,001,181	20,832,265	21,197,484	21,474,601
2025	29,360,884	29,613,683	30,876,916	30,488,423
2026	33,876,059	32,710,455	34,306,379	34,240,939
2027	34,274,783	35,531,579	35,218,441	36,151,642
2028	47,088,588	48,938,131	46,815,595	50,384,352
2029	6,825,000	7,329,674	7,559,739	7,391,906
2030	10,177,461	10,764,475	10,100,825	10,854,945
2031	23,594,874	25,136,554	23,786,865	25,892,220
2032	8,514,087	8,464,858	7,341,876	8,653,907
2033	5,126,118	5,247,410	5,272,592	5,499,397
2034	2,825,000	2,816,447	2,625,829	2,902,667
2035	1,426,190	1,522,598	1,443,269	1,565,540
2039	7,600,000	7,676,208	7,145,087	7,978,666
එකතුව	335,462,969	348,890,145	342,808,403	352,543,991

භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල අගය

2022/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළඳපොළ අගය	ක්‍රමක්ෂය පිරිවැය
2023	23,300,000	21,547,877	22,160,993	22,152,226

2021/12/31 දිනට භාණ්ඩාගාර බිල්පත් කළඹේ වෙළෙඳපොල වටිනාකම

(රු. '000)

වර්ෂය	ප්‍රකාශිත අගය	මිලදී ගැනීමේ පිරිවැය	වෙළඳපොළ අගය	ක්‍රමක්ෂය පිරිවැය
2023	-	-	-	-

රජයේ සුරැකුම්පත්වල සාධාරණ අගය මහ බැංකුව විසින් ප්‍රකාශිත පිළිවෙලින් 2021 සහ 2022 දෙසැම්බර් 31 දිනට මිලදී ගැනීමේ හා විකිණීමේ මිළගණන්වල සාමාන්‍යයන් මත පදනම්වයි.

ලැයිස්තුගත ණයකර කළඹේ වෙළෙඳපොළ අගය

2022.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළඳපොළ අගය

සමාගමේ නම	මිලදීගත් දිනය	නිදහස් කරගත් දිනය	ණයකර		වෙළඳපොල වටිනාකම			ක්‍රමක්ෂය පිරිවැය රු.'000
			ගණන	පිරිවැය රු.'000	විකුණුම් කරයකට	රු.'000	අනුපාතය (වාර්ෂිකව)	
හැටන් නැෂනල් බැංකුව	01.11.2016	01.11.2023	547,100	54,710	107.25	58,676	13.00%p a	55,899
පිපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී	18.04.2018	18.04.2023	5,000,000	500,000	98.00	490,000	12.80%p a	545,238
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	23.07.2018	22.07.2023	1,859,700	185,970	100.00	185,970	12.00%p a	195,936
සම්පත් බැංකුව පීඑල්සී	28.02.2019	28.02.2024	1,750,000	175,000	100.50	175,875	13.90%p a	195,460
ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	28.03.2019	28.03.2024	7,500,000	750,000	100.00	750,000	13.50%p a	827,394
ජාතික ඉතිරිකිරිමේ බැංකුව	10.09.2019	10.09.2024	13,500,000	1,350,000	100.00	1,350,000	11.25%p a	1,397,019
හැටන් නැෂනල් බැංකුව	23.09.2019	22.09.2024	3,500,000	350,000	74.00	259,000	12.30%p a	361,795
ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී	25.09.2020	24.09.2025	4,750,000	475,000	100.00	475,000	09.50%p a	487,116
ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	23.10.2020	23.10.2025	5,000,000	500,000	100.00	500,000	09.00%p a	508,630
සම්පත් බැංකුව පීඑල්සී	12.04.2021	12.04.2028	6,000,000	600,000	100.00	600,000	09.00%p a	639,058
ලංකා විදුලිබල මණ්ඩලය	16.04.2021	15.04.2026	20,000,000	2,000,000	88.61	1,772,200	9.35%p a	2,133,205
සිංගර් ෆිනෑන්ස් (ලංකා පීඑල්සී)	25.06.2021	25.06.2026	1,750,000	175,000	100.00	175,000	09.25%p a	183,426
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී	09.07.2021	09.07.2026	8,000,000	800,000	100.00	800,000	09.15%p a	835,296
පිපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී	05.08.2021	05.08.2026	10,000,000	1,000,000	100.00	1,000,000	09.00%p a	1,036,740
එකතුව				**8,915,680**		**8,591,721**		**9,402,211**

ලැයිස්තුගත කර ඇති ආයතනික ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2022 දෙසැම්බර් 31 දිනට මිලගණන් මත පදනම්වේ.

2021.12.31 දිනට ලැයිස්තුගත ණයකර කළඹේ වෙළඳපොළ අගය

සමාගමේ නම	මිලදීගත් දිනය	නිදහස් කරගත් දිනය	ණයකර		වෙළඳපොල වටිනාකම			ක්‍රමක්ෂය පිරිවැය රු.'000
			ගණන	පිරිවැය රු.'000	විකුණුම් කරයකට	රු.'000	අනුපාතය (වාර්ෂිකව)	
හැටන් නැෂනල් බැංකුව	01.11.2016	01.11.2023	547,100	54,710	107.25	58,676	13.00%	55,899
පිපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී	18.04.2018	18.04.2023	5,000,000	500,000	100.00	500,000	12.80%	545,238
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්	23.07.2018	22.07.2023	1,859,700	185,970	100.00	185,970	12.00%	195,936
සම්පත් බැංකුව පීඑල්සී	28.02.2019	28.02.2024	1,750,000	175,000	114.32	200,060	13.90%	195,460
ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	28.03.2019	28.03.2024	7,500,000	750,000	100.00	750,000	13.50%	827,394
ජාතික ඉතිරිකිරිමේ බැංකුව	10.09.2019	10.09.2024	13,500,000	1,350,000	100.00	1,350,000	11.25%	1,397,019
හැටන් නැෂනල් බැංකුව	23.09.2019	22.09.2024	3,500,000	350,000	100.00	350,000	12.30%	361,795
ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී	24.09.2021	24.09.2025	4,750,000	475,000	100.00	475,000	9.50%	487,116
ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී	23.10.2021	23.10.2025	5,000,000	500,000	100.00	500,000	9.00%	508,630
සම්පත් බැංකුව පීඑල්සී	12.04.2021	12.04.2028	6,000,000	600,000	100.00	600,000	9.00%	639,058
ලංකා විදුලිබල මණ්ඩලය	16.04.2021	16.04.2026	20,000,000	2,000,000	88.61	1,772,200	9.35%	2,132,693
සිංගර් ෆිනෑන්ස් (ලංකා පීඑල්සී)	25.06.2021	25.06.2026	1,750,000	175,000	100.00	175,000	9.25%	183,426
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී	09.07.2021	09.07.2026	800,000	80,000	100.00	80,000	9.15%	835,296
පිපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී	05.08.2021	05.08.2026	10,000,000	1,000,000	100.00	1,000,000	9.00%	1,036,740
එකතුව				**8,395,680**		**8,196,906**		**9,603,167**

ලැයිස්තුගත කර ඇති ආයතකින ණයකරවල ප්‍රකාශිත අගය කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශිත 2021 දෙසැම්බර් 31 දිනට මිලගණන මත පදනම්වේ.

ස්කන්ධ ආයෝජන ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 දිනට වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය මත නැවත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් වෙළඳපොළ

	ආයෝජන සමාගමේ නම	සත්‍ය පිරිවැය (රු. '000)	සාධාරණ අගය (රු. '000)	වෙළඳපොළ අගය (රු. '000)
1	AHOT දේපල සමාගම	58,213	33,769	26,938
2	එයිටිකන් ස්පෙන්ස් සමාගම	381,225	217,615	340,843
3	එයිටිකන් ස්පෙන්ස් හෝටලය	206,275	101,466	119,721
4	ආසිරි රෝහල	129,516	138,412	110,388
5	ආසිරි සර්ජිකල් රෝහල	66,124	77,195	57,444
6	බහිරා ෆාම්ස්	206,974	241,770	149,358
7	කාසන් කම්බර්බැච් පිඵල්සි	16,147	11,085	9,749
8	සෙන්ට්‍රල් ෆිනෑන්ස	199,653	169,832	114,504
9	සිලෝන් ඉන්වෙස්මන්ට්	8,575	3,757	2,223
10	සිලෝන් ගාඩියන් ඉන්වෙස්මන්ට්	143,302	51,064	30,000
11	සිලෝන් ග්‍රේන් ඉලිවේටර්	204,860	187,512	125,994
12	සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස්	92,966	169,021	47,668
13	සිඅයිසි හෝල්ඩිංග්ස්	118,893	151,647	198,308
14	කලම්බු ෆෝට්ලන්ඩ්	55,327	17,571	19,881
15	කොමර්ෂල් බැංකුව	1,196,030	717,159	458,249
	කොමර්ෂල් බැංකුව (X)	498,325	297,997	170,687
16	ඩිඑෆ්සීසී බැංකුව	673,587	263,891	141,316
17	ඩොක්යාඩ්	437,865	137,891	102,463
18	ඩයලොග් ආසියාටා	355,601	332,581	256,994
19	ඩිප් ප්‍රොඩක්ට්ස්	78,476	77,483	47,041
20	ඒඩන් හෝටලය	75,885	53,470	27,684
21	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස්	11,733	281,266	659,327
22	හැටන් නැෂනල් බැංකුව	28,784	30,417	17,971
	හැටන් නැෂනල් බැංකුව (X)	153,101	131,341	75,300
23	එච්එන්බී ඇෂුවරන්ස්	202,920	190,051	165,604
24	හේලිස් ෆැබ්රික්ස්	118,443	137,144	75,451
25	හේකාබ් පිඵල්සි	77,441	77,441	60,242
26	ජෝන් කීල්ස්	15,800	11,678	11,066
27	ජේකේඑච්	2,836,575	2,589,885	2,336,059
28	කැළණි කේබල්ස්	14,561	56,980	30,205
29	කැළණි ටයර්ස්	246,394	280,276	164,467
30	කීල්ස් ෆූඩ්ස්	7,847	7,888	7,961
31	ලන්කෙම් සිලෝන්	16,823	3,933	7,693
32	ලංකා අයිඕසී	14,746	59,580	165,002
33	ලංකා මිල්ක් ෆූඩ්ස්	97,757	153,303	71,973
34	ලංකා ටයිල්ස්	8,247	17,371	7,311
35	ලංකා වෝල්ටයිල්ස්	19,329	25,208	12,692
36	ලාෆ් ගෑස්	780	1,058	688
37	ලාෆ් ෆවර්ස්	815	484	415
38	ජාතික සංවර්ධන බැංකුව	1,405,873	889,127	412,564
39	නවලෝක රෝහල	68,652	70,377	55,601
40	ඕවසීස් රියලිටි	151,227	188,337	145,558
41	පීපල්ස් ලීසිං	182,879	132,436	65,249
42	පීපල්ස් ඉන්ෂුවරන්ස්	54,022	72,894	42,504
43	පිජිපි ග්ලාස් පිඵල්සී	55,314	56,089	40,881
45	රේණුකා හොල්ඩිංග්ස්	115,698	58,869	41,982
46	රිසර්ස් එනර්ජි	47,018	63,868	20,442
47	රිචඩ් පීරිස් කොම්පැනි	115,544	142,261	138,671
48	සම්පත් බැංකුව	416,926	369,326	243,387
49	සෙලාන් බැංකුව	381,582	214,376	148,534
	සෙලාන් බැංකුව (X)	82,770	56,029	26,923
50	සිංගර් ෆිනෑන්ස්	23,608	20,464	11,927
51	ශ්‍රී ලංකා ටෙලිකොම්	110,326	130,106	224,219
52	ටීජේ ලංකා	115,357	117,545	86,485
53	ට්‍රාන්ස් ඒෂියා	37,073	31,457	25,737
54	ටොකියෝ සිමෙන්ට් පිඵල්සි	230,758	210,892	116,966
55	වැලිබල් ෆවර්	83,752	83,519	61,035
56	වින්ඩ්ෆෝස් පිඵල්ස	701	701	537
57	වින්ඩ්ෆෝස් පිඵල්සි	131,660	127,115	104,067
	එකතුව	**12,886,657**	**10,543,284**	**8,440,150**

ලැයිස්තුගත නොවන සමාගම් වල කොටස්

1	ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස්	5	45	-

ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් පිඵල්සී 2022 ඔක්තෝම්බර් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැයිස්තු ගත කර ඇත.

ස්කන්ධ ආයෝජන ප්‍රකාශය

2022.12.31 දිනට අනුබද්ධිත සමාගම්වල ආයෝජන

	සමාගමේ නම	පිරිවැය (රු. '000)
1	ලංකා ලුණු සමාගම	470,961
	එකතුව	**470,961**

2022.12.31 දිනට ලාභ හෝ අලාභ තුළින් සාධාරන අගය මත වර්ගීකරණය කරන ලද ලැයිස්තුගත කොටස් ආයෝජනය

	සමාගමේ නම	සත්‍ය පිරිවැය (රු. '000)	සාධාරණ අගය (රු. '000)	වෙළඳපොළ අගය (රු. '000)
1	ඇක්සස් ඉන්ජිනියරින්	51,441	53,257	17,905
2	ඒසිඑල් කේබල්ස් පිඑල්සි	32,969	32,969	24,692
3	කොමර්ෂල් බැංකුව	1,440,530	892,811	570,486
	කොමර්ෂල් බැංකුව (X)	159,012	108,906	62,379
4	ඩයලොග් ආසියාටා	225,457	216,694	167,445
5	ඩිප් ප්‍රොඩක්ට්ස්	219,258	198,011	114,350
6	හැටන් නැෂනල් බැංකුව	523,420	396,684	234,369
	හැටන් නැෂනල් බැංකුව (X)	68,870	61,718	35,384
7	හේකාඩ් පිඑල්සි	10,145	10,145	9,641
8	හේලීස් ෆැබ්‍රික්ස්	40,766	41,127	26,412
9	ජේකේඑච්	177,625	194,349	175,302
10	ලංකා අයිඕසි	38,612	77,415	214,397
11	ලංකා ටයිල් පිඑල්සි	121,425	121,425	60,878
12	ලංකා වෝල්ටයිල්	256,940	288,289	157,548
13	ලාෆ් ෆවර්ස	3,196	1,672	1,433
14	පිපල්ස් ලීසිං	82,549	68,960	33,975
15	පිපල්ස් ඉන්ෂුවරන්ස්	57,882	59,773	34,853
16	පීජීපී ග්ලාස් කොම්පැනි	40,073	46,081	39,747
17	රිචර්ඩ පීරිස් කොම්පැනි	64,590	92,619	91,490
18	රිසර්ස් එනර්ජි පිඑල්සි	29,828	29,828	13,849
19	රෝයල් සෙරමික්	254,428	271,957	132,197
20	සම්පත් බැංකුව	1,037,398	801,284	528,049
21	සෙලාන් බැංකුව	84,110	51,987	36,020
	සෙලාන් බැංකුව (X)	82,804	61,254	29,433
22	සීරා කේබල්ස් පිඑල්සි	34,477	34,477	21,567
23	සිංගර් ෆිනෑන්ස්	48,443	39,752	23,170
24	සන්ෂයින් හෝල්ඩිංග්ස්	33,185	33,185	30,198
	එකතුව	**5,219,433**	**4,286,627**	**2,887,168**

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
2022.12.31 දිනට ලැයිස්තුගත ඒකක භාර

	වර්ගය	සත්‍ය පිරිවැය (රු. '000)	සාධාරණ අගය (රු. '000)	වෙළඳපොළ 2022.12.31 (රු. '000)
1	කොමිට්‍රස්ට් කොටස් අරමුදල	14,261	39,806	34,770
2	නැෂනල් ස්කන්ධ අරමුදල	41,681	167,161	136,736
3	නාමල් වර්ධන අරමුදල	2,250	34,705	30,970
	එකතුව	**58,192**	**241,671**	**202,475**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

1 සාංගමික තොරතුරු

1.1 නීත්‍ය පදිංචි හා නෛතික ආකෘතිය

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය රජය සතු ව්‍යවසායකි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ලංකා සෝල්ට් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා ලුණු සමාගම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත කරනු ලැබ නීත්‍ය පදිංචිය සහිත පොදු සීමිත සමාගමකි. මෙම සමාගමේ ලියා පදිංචි කරන ලද කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හම්බන්තොට මහලේවාය යන ස්ථානයෙහි පිහිටා ඇත.

1.2. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

2022 දෙසැම්බර් මස 31 වන දිනට සහ අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට, මණ්ඩලය (පරිවාරිත) සහ එහි පූර්ණ හිමිකාරිත්වය දරන පරිපාලිත ආයතනය (එක්ව කියැවෙන කල්හි, "සමූහය" ලෙස හඳුන්වනු ලබන) ඇතුළත් වේ. 2022 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලයේ පරිපාලිත සමාගම වූයේ, ලංකා සෝල්ට් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, සමූහයේ අත්‍යන්ත ආයතනය වන්නේ ය.

මණ්ඩලයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශ විෂයයෙහි සෑම වසරකම දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. "මණ්ඩලයේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශ, සෑම වසරකම දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වන මාස 12 ක් වූ කාල පරිච්ඡේදය සඳහා සකස් කර ඇත.

1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

වර්ෂය තුළ, මෙම මූල්‍ය ප්‍රකාශ තුළ සිටිමින් මෙහෙයවන ලද සමාගමට හා එහි අනුබද්ධිත සමාගම්වලට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන පරිදි වූයේ ය.

ආයතනයේ නම	ව්‍යාපාරයේ ස්වභාවය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන සියලුම රාජ්‍ය සේවක සේවිකාවන් හා පෞද්ගලික අංශට අයත් සියලුම සේවා නියුක්තයන් මෙම අරමුදලෙහි සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි ඔවුන්ගේ සේවා යෝජකයින් එකී සේවකයන්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් වූ ප්‍රමාණයක් මෙම අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වන්නේ ය. මෙම අරමුදලට විගමනික ශ්‍රමිකයන් සහ ස්වයං රැකියා ක්ෂේත්‍රවල නියුතු සේවකයන්ද අන්තර්ගත වේ. මෙම අංශය තවදුරටත් ඉදිරියේදී වඩාත් ප්‍රසාරණය වීමට නියමිතය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, මෙම අරමුදල කළමනාකරණය කිරීමට අමතර වශයෙන් ස්වකීය සේවා නියුක්තයන්ගේ සේවා කාලය තුළ ඔවුන් වෙත සමාජීය හා සුභසාධන ප්‍රතිලාභ ගණනාවක් සලසා දීමේ කාර්යයෙහි ද නිරතව සිටී.
ලංකා ලුණු සමාගම	මෙම සමාගමෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ ලුණු නිෂ්පාදනය කර බෙදා හැරීමයි.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සහ සංශෝධිත පනතේ විධිවිධාන හා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති (LKAS/SLFR) අනුව සමූහයේ සහ මණ්ඩලයේ මූල්‍ය ප්‍රමිති සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතු වගකීමකි.

1.5. නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ 2023 පෙබරවාරි මස 27 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව නිකුත් කරනු ලැබීම සඳහා බලය පවරන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සම්පිණ්ඩනය

2.1. පොදු ප්‍රතිපත්ති

2.1.1. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලැබ ඇති ව්‍යාපාර ආයතනය සතු වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව නිරූපිත වන අයුරින් ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් ඇති කරන උද්ධමනීය සාධකයන් සඳහා ගැළපුම් කිසිවක් සිදුකර නොමැත. රපෝර්තු දිනයේ සිට මාස 12 ක් ඇතුළත සහ මාස 12 කට වැඩි කාලයකින් පසුව ආපසු අයකර ගනු ලැබීම් හෝ බේරුම් කරනු ලැබීම් පිළිබඳ විශ්ලේෂණයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ තිබේ. (ස්ථාවර වත්කම් ප්‍රතිපත්තිවල සිදුව ඇති වෙනසෙහි බලපෑම පිළිබිඹු කිරීම සඳහා 2021 දෙසැම්බර් මස 31 වන දිනයෙන් සහ 2021 ජනවාරි මස1 වන දිනයෙන් අවසන් වූ වර්ෂ සඳහා වූ සංසන්දනාත්මක තොරතුරු නැවත සඳහන් කර ඇත.)

2.1.2 අනුකූලතාව දැක්වීමේ ප්‍රකාශය

2022 දෙසැම්බර් මස 31 වන දින වන විට හා එදිනට අවසන් වර්ෂය සඳහා වන සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශය, කොටස් හිමිකම් හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාව දක්වන අයුරිනි.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා අනුකූල වන පරිදි පිළියෙළ කරනු ලැබ තිබේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතෙහි දක්වා ඇති නියමයන් හා අනුකූල වේ.

2.1.3 වැදගත් ගිණුම් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

මණ්ඩලය ස්වකීය අනාගතය සම්බන්ධයෙන් ඇතැම් ඇස්තමේන්තු වලට හා උපකල්පන වලට එළැඹේ. එකී ඇස්තමේන්තු හා විනිශ්චයන් ඓතිහාසික පරිචය හා අනාගත අපේක්ෂා ද ඇතුලත් වෙනත් සාධකයන් මත අබණ්ඩව ඇගයුමට ලක් කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍ය පරිමානයේ ව්‍යාපාර ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූලතාව දක්වෙන පරිදි සැකසීම සඳහා ඇතැම් සුවිශේෂී ගිණුම් ඇස්තමේන්තු භාවිතය අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ නිශ්චයමතියක් හෝ සංකීර්ණතා වයක් සම්බන්ධ වන්නා වූ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි උපකල්පනයන් හා ඇස්තමේන්තු වැදගත් වන්නා වූ ක්ෂේත්‍ර පහත සඳහන් පරිදි හෙළිදරව් කර ඇත.

තීන්දු

විලම්බිත බදු වත්කම්:

සියලු ආභාවිත බදු අලාභ වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ, අලාභ උපයෝජනය කොටගත හැකි බදු අයකර ගත හැකි අලාභ එල්ලේ ඒවා පවතිනු ලැබෙතැයි අනුමාන කෙරෙන තාක් දුරකට ය. හඳුනා ගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම්වල ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස ඉදිරි බදු සැලසුම්කරණ යෙහි මූලෝපායන් ද සහිත අනාගත බදු අයකර ගත හැකි ලාභ ප්‍රමාණ උද්ගත විය හැකි කාල නිර්ණය හා ඒවායේ මට්ටම මත පදනම් වූ වැදගත් කළමනාකරණ නිශ්චයමතියක් අවශ්‍ය වේ.

2.1.4 මානනය කිරීමේ පදනම

ඇතැම් වත්කම් හා බැරකම් හැරුණු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික සම්මුතිය යටතේ සාධාරණ අගය මත පිළියෙළ කරනු ලැබ ඇත.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමක් මත පිළියෙළ කරනු ලැබ තිබේ.

2.1.5 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් ඒකකය

සමාගමේ ක්‍රියාකාරී ව්‍යාවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලැබ ඇත. සියලු මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් අනුසාරයෙන් ඉදිරිපත් කර තිබේ.

2.1.6 වැටයීම

මුළ්‍ය ප්‍රකාශනවල ප්‍රමාණයන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (LKAS 1) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 විසින් අවසරදී ඇති පරිදි සඳහන් කර ඇති අවස්ථා හැර ආසන්න රුපියල් දහසට වටයා ඇත.

2.1.7 හිලව් කිරීම

ගිනුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපනයක් (IFR) අර්ථ නිරූපන කමිටුව සහ ප්‍රමිති අර්ථ නිරූපන කමිටුව විසින් නිකුත් කළ) විසින් අවශ්‍යනම් හෝ අවසරදී ඇතිනම් මිස, ආදායම් සහ වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් නොකෙරේ. හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතිව බලාත්මක අයිතියක් ඇත්නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත නිරවුල් කිරීමට හෝ එකවර වත්කම් මුදාහැර වගකීම් නිරවුල් කිරීමේ අභිප්‍රායක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ ප්‍රමාණය SOFP හි වාර්තා කරයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමූහනය

සමාන අයිතමවල එක් එක් වැදගත් පන්තිය මූලය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරිත්වය පිළිබඳ අයිතම LKAS 1 විසින් සහ 2016 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ අනාවරණ මුල්පිරීම පිළිබඳ LKAS 1 ට සංශෝධන විසින් අවසරදී ඇති පරිදි ඒවා වැදගත් නොවන්නේනම් මිස වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.9 ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

නුදුරු ආනගත කාලය තුළ ක්‍රියාත්මක ව්‍යාපාරයක් වශයෙන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට ඊට ඇති හැකියාව සම්බන්ධයෙන් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය තක්සේරුවක් කර ඇති අතර ස්වකීය මෙහෙයුම් කටයුතු නොකඩවා සිදුකර ගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව පවතින බවට මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යා හැකි මණ්ඩලයේ හැකියාව සම්බන්ධයෙන් වැදගත් සැක සංකා මතු කෙරෙන යම් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතීදැයි කළමනාරණය දැනුවත් නොමැත. එහෙයින්, සමාගම ක්‍රියාත්මක තත්වයේ ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම නොකඩවා සිදු කෙරේ.

සීමාසහිත ලංකා ලුණු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම සමාගම ක්‍රියාත්මක ව්‍යාපාර තත්වයෙන් පවත්වාගෙන යාමේ ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර සමාගම සතු ව්‍යාපාරය ඈවර කිරීමට හෝ එහි වෙළඳ කටයුතු නවතා දැමීමට හෝ ඔවුහු අපේක්ෂා නොකරති.

2.1.10 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම් ප්‍රතිපත්ති සුසංගත අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරට අදාළ ගිණුම් ප්‍රතිපත්ති සමඟ ද සාරානුකූල වේ. පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇති අතර වඩා හොඳ ඉදිරිපත් කිරීමකට අදාළ වන අතර වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳිය හැකිය.

2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

(අ) ඒකාබද්ධ කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ, 2022 දෙසැම්බර් මස 31 වන දිනට අයත් සමාගමේ සහ එහි පාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශ අන්තර්ගත වේ. පාලිත සමාගම, එය සමාගමට අත්කර ගත් දිනයේ සිට එනම්, සමූහය එහි පාලනය ලබාගත් දිනයේ සිට ඒකාබද්ධ කරනු ලැබ ඇති අතර එකී පාලනය නතර කෙරෙන දිනය දක්වා එසේ ඒකාබද්ධව පැවතීම අඛණ්ඩව සිදුවනු ඇත. පාලිත සමාගමට අයත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබනුයේ ද එහි මව් සමාගමට අදාළ සමාන රපෝර්තු කාල පරිච්ඡේදයට අනුව ය.

එසේ වුවද, මෙම ආයතන දෙකෙහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් වන අතර ඒවා සමූහයට අයත් ගිණුම් ප්‍රතිපත්ති තුළ ඉස්මතු කර දක්වා ඇත.

(ආ) පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු, ඡන්දය දීමේ අයිතිවාසිකම් වලට අයත් එක් අර්ධයකට වැඩි ප්‍රමාණයේ කොටස් හිමිකාරීත්වයක් පොදුවේ දරනු ලබන්නාවූ ද, අදාළ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති සෘජුව හෝ වක්‍රව පාලනය කළ හැකි වන පරිදි සමාගම සතුව බලය පවතින්නා වූ ද සියලුම ව්‍යාපාරික ආයතන වන්නේ ය. දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්ත්‍ය සේ සැලකෙන ඡන්දය දීමේ අයිතිවාසිකම් පැවතීම හෝ ඒවායින් සිදුවිය හැකි බලපෑම, සමූහය විසින් වෙනත් ව්‍යාපාර ආයතනයක් පාලනය කරනු ලබන්නේ ද යනුවෙන් තක්සේරුවකට එළැඹීමේදි සලකා බැලෙනු ඇත. පාලනය සමූහය වෙත පවරා දෙනු ලබන දිනයේ සිට පරිපාලිත සමාගම් පූර්ණ වශයෙන් ඒකාබද්ධ කෙරේ. එකී පාලනය නතර කෙරෙන දිනයේ සිට ඒවායේ ඒකාබද්ධ කිරීම් අත් හැරේ.

ඒකාබද්ධ කිරීමේදි සමාගමට සහ එහි පාලිත සමාගම් වලට අයත් වර්ෂය වෙනුවෙන් ඇතුළත් කරන ලද මුළු ලාභ හෝ අලාභ ප්‍රමාණ සහ ඒකාබද්ධ කිරීමේදි අන්තර්ගත කළ සමාගමට සහ එහි පාලිත සමාගම්වලට අයත් මුළු වත්කම් හා බැරකම් ප්‍රමාණ, ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිවෙළින් දක්වා ඇත.

(ඇ) රපෝර්තු දිනය

පාලිත සමාගම් හී මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබන්නේ පොදු වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය වන දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නා වූ දොළොස් මසක කාල සීමාවක් සඳහාය.

2.3 ලාභ සහ අලාභ මානනය කිරීමේ පදනම

2.3.1 ආදායම

ආදායම හඳුනා ගැනෙනුයේ එමගින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකිතාක් දුරකටය. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරා ලිය යුතු වන්නේ ය.

2.3.2 පොලී සහ සමාන ආදායම් සහ වියදම්

සියලුම මූල්‍ය උපකරණයන් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. පොලිය දරන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ගිණුම් හරහා විකිණීම සඳහා පවත්නා මූල්‍ය වත්කම් ලෙස සාධාරණ අගය අනුව වර්ගීකරණය කරනු ලබන අතර පොලී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාත භාවිතයට ගනිමින් වාර්තා කරනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් වල ඇස්තමේන්තු කළ ආදළ පරිදි වන්නාවූ අපේක්ෂිත ආයු කාලයක් හෝ ඊට අඩු කාලයක් තුළ මූල්‍ය වත්කමෙහි හෝ මුදල් බැරකමෙහි හෝ ශුද්ධ ධාරණ වටිනාකම වේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

එම ගණනය මගින් මූල්‍ය මෙවලමෙහි දක්වෙන සියලුම ගිවිසුම්ගත කොන්දේසි (නිදසුනක් වශයෙන් පෙර ගෙවුම් විකල්ප) සලකා බලනු ලබන අතර අදාළ මූල්‍ය මෙවලමට සෘජුවම ආරෝපනය කළ හැකි සුළු පොලී අනුපාතයේ ද මුඛ්‍යාංගයක් වන එහෙත් අනාගත ණය අලාභ නොවන යම් ගාස්තු හෝ වර්ධක පිරිවැය එකී ගණනයෙහිලා අන්තර්ගත වේ. පොලී ආදායම තුළ කුපන් ආදායම සහ වට්ටම් ක්‍රමක්ෂය කිරීම හෝ මෙවලම් අධි මිල කිරීම මත ලැබූ යම් ලාභ හෝ අලාභ සමන්විත වේ.
දුබලතා අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ වත්කම් සමූහයක වාර්තා කරන ලද වටිනාකම අඩු කරනු ලැබ ඇති කල්හි දුබලතා අලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා ඉදිරි මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස යොදා ගැණුනු මුල් පොලී අනුපාතය භාවිතයට ගනිමින් පොලී ආදායම හඳුනා ගැනීම නොකඩවා සිදු කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 22 වන වගන්තියට අනුව පොලී වියදම හඳුනා ගැනේ. ඉන් කියැවෙනුයේ, "අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍ය වරයා සහ මුදල් විෂය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයක සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතුය" යනුවෙනි.

(අ) **භාණ්ඩ විකිණීම**
සාමාන්‍යයෙන් විකිණීම සඳහා භාණ්ඩ පිටත් කරනු ලැබීම මත භාණ්ඩවලට ආවේනික සුවිශේෂී අවදානම් සහ භාණ්ඩවල හිමිකාරිත්වය සතු ප්‍රතිලාභ ඒවා මිලදී ගනු ලබන්නා වෙත පවරා දෙනු ලැබ ඇති කල්හි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනේ.

(ආ) **සේවා ඉටු කිරීම**
එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත කරන ලද මුළු මිනිස් ශ්‍රම පැය ගණනේ ප්‍රතිශතයක් ලෙස වත්මන් දිනය දක්වා වැය කළ මුළු මිනිස් ශ්‍රම පැය ගණන සැලකිල්ලට ගනිමින් නිශ්චය කරන ලබන අදාළ කාර්යයන් නිමකළ අදියරට සැදිහුම් දක්වමින් සේවා ඉටු කිරීම මඟින් ලබා ගන්නා ආදායම හඳුනා ගැනේ. අදාළ කොන්ත්‍රාත් කාර්යයෙහි ප්‍රතිඵලය විශ්වාසදායක ලෙස මිණිය නොහැකි විට ආපසු අයකර ගත හැකි දරන ලද වියදම් ප්‍රමාණය දක්වා වූ දුරකට පමණක් ආදායම හඳුනා ගැනේ.

(ඇ) **පොලිය**
වත්කම් මත සුළු පොලී අනුපාතය ගණනය කිරීමේ කාල අනුපාතික පදනමක් මත ආදායම හඳුනා ගැනේ.

(ඈ) **වෙනත්**
වෙනත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගනී

2.3.3 ලාභාංශ ආදායම් හා වියදම්

ලාභාංශ ආදායමට අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි ලාභාංශ ආදායම හඳුනා ගැනේ. ලාභාංශ වියදම් හඳුනා ගැනෙනුයේ, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තිය අනුවය. ඉන් කියැවෙනුයේ, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතුය යනුවෙනි.

2.3.4 වෙනත් ආදායම්

සේවකයන්ගේ සේවා කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරනු ලබන සේවක මණ්ඩල ණය මුදල්හි සාධාරණ අගය මානනය කිරීම මත ලැබෙන පොලී ආදායම හැරුණු විට, වෙනත් අදාළ ගෙවීම් ලබා ගැනීමේ ව්‍යාපාරික ආයතනය සතු අයිතිය තහවුරු වූ කල්හි වෙනත් ආදායම් හඳුනා ගැනේ.

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙනුයේ, භාණ්ඩ විකිණීම සඳහා පිටත් කර යවනු ලැබ එහි අයිතිය පවරා දෙනු ලැබ ඇති කල්හි ය. වට්ටම් සහ අලෙවි කටයුතු ආශ්‍රිතව රජය වෙනුවෙන් රැස් කරනු ලබන බදු මුදල් රහිත වූ ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දක්වෙන විශේෂිත හඳුනා ගැනීමේ නිර්නායක ද සපුරාලිය යුතු වන්නේ ය.

2.4 බදුකරණය

2.4.1 ප්‍රවර්තන බදු

රපොර්තු දිනට පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද බදු අනුපාතික සහ ඉකුත් වසරට අදාළව ගෙවිය යුතු බදු සඳහා වන යම් ගැළපුම් යොදා ගනිමින් වර්ෂය සඳහා බදුවන අදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු වන්නා වූ අපේක්ෂිත බදු ප්‍රවර්තන බදු වන්නේ ය.
ක්‍රමක්ෂය ලාභය සහ ආදායම් බදු වියදම පිළිබඳව යුක්ති සහගත මතයක් ලබා ගැනීමේ අරමුණින් යුතුව එය ක්‍රමක්ෂය ලාභ ගිණුමට ආපසු එකතු කරනු ලැබීමේ අටියෙන් වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත ඉපැයූ ආදායමට අදාළ රඳවා ගැනීමේ බද්දෙහි ප්‍රමාණය හඳුනා ගනු පිණිස මණ්ඩලය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කළේය.

ගෙවිය යුතු ප්‍රවර්තන බද්ද පදනම්වී ඇත්තේ වර්ෂය සඳහා බදුවන ලාභය මතය. ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදනය පදනම්වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි සහ දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ආගණනය කර ඇති පරිදි වන්නා වූ අදායම් හා වියදම් මූලාංග මත පිහිටා ය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.4.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු ප්‍රතිපාදනය කරනු ලබනුයේ, වත්කම්වල හා බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදය සඳහා වූ ඒවායේ ධාරණ අගයන් අතර ශේෂ පත්‍රයේ දිනට පවත්නා සියලුම තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමය භාවිතයට යොදා ගනිමිනි.

අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි ඉහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැර හඳුනා ගැනේ. අනාගතයේදී බදු ගෙවිය යුතු වන ලාභයෙහි පහළ යාමක් අපේක්ෂිත සියලුම තාවකාලික වෙනස්කම් වෙනුවෙන් ද, යම් අප්‍රයෝජිත බදු අලාභ හෝ අප්‍රයෝජිත බදු බැර සඳහා ද විලම්බිත බදු බැර හඳුනා ගැනේ. ආපසු අයකර නොගැනීමේ වැඩි හැකියාවක් ඇති ඉහළම මුදල් ප්‍රමාණයට, ප්‍රවර්තන හෝ ඇස්තමේන්තුගත අනාගත බදුවන ලාභය පදනම් කරගෙන, විලම්බිත බදු මානනය කෙරේ.

සෑම රපෝර්තු දිනයකදී ම විලම්බිත බදු වත්කම්වල ශුද්ධ ධාරණ අගය සමාලෝචනයට හසු කෙරන අතර අනාගතයේදී බදු මත ලාභවල ප්‍රවර්තන තක්සේරුව නිරූපණය වනු පිණිස ගළපනු ලැබේ. යම් ගැළපුමක් වෙතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ.

විලම්බිත බදු ගණනය කෙරෙනුයේ, විලම්බිත බදු වත්කම උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන කාල පරිච්ඡේදයට අයත් බදු මත ලභය (බදු ආලභය) කෙරෙහි අදාළ වීමට අපේක්ෂිත බදු අනු ප්‍රමාණ හෝ බේරුම් කළ යුතු වන්නාවූ විලම්බිත බදු බැරකම් අනුව, රපෝර්තු කාල පරිච්ඡේදය අවසානය වන විට පනවා ඇති හෝ ප්‍රමාණවත් ලෙස පනවනු ලැබ ඇති බදු අනු ප්‍රමාණවල පදනම මත පිහිටා ය.

2.5 විදේශ ව්‍යාවහාර මුදල් පරිවර්තනය

සමාගමේ කෘත්‍යාත්මක හා ඉදිරිපත් කරනු ලැබීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල අනුසාරයෙන් මූල්‍ය ප්‍රකාශ පිලිගන්වනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් වලින් සිදු කෙරෙන ගනුදෙනු, අදාළ ගනුදෙනුව සිදුවන දිනයේ පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකකය මත මූලික වශයෙන් වාර්තා කරනු ලැබේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් නාමනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍රයේ දිනට පාලනය වන කෘත්‍යාත්මක මුදල් ඒකක විනිමය අනුපාතය අනුව නැවත පරිවර්තනය කෙරේ. සිදුවන සියලු වෙනස්කම් ලාභය හෝ අලාභය වෙත උකහා ගැනේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක අනුසාරයෙන් ඓතිහාසික පිරිවැය ප්‍රකාරව මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම, අදාළ මූලික ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයක් අනුසාරයෙන් සාධාරණ අගය මත මානනය කරනු ලබන මුදල්මය නොවන අයිතම අදාළ සාධරණ අගය නිශ්චය කළ දිනට පැවති විනිමය අනුපාත යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

2.6 ආයෝජන හා වෙනත් මූල්‍ය වත්කම්

2.6.1 වර්ගීකරණය

2018 ජනවාරි 1 දින සිට, මණ්ඩලය එහි මූල්‍ය වත්කම් පහත සඳහන් මැනීම් වර්ගීකරණ තුළ වර්ගීකරණය කරයි

- සාධාරණ අගයට (අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් හෝ ලාභය හෝ අලාභය තුළින්) පසුකාලීනව මනිනු ලබන මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්

මෙම වර්ගකීකරණය රඳා පවතින්නේ ආයතනයේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් මතවේ.

සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වතක්ම් සඳහා, ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කරනු ලැබේ. වෙළඳාම සඳහා තබා නොමැති ස්කන්ධ උපකරණවල අයෝජන සඳහා, අරමුදල අනෙකුත් විස්තරාත්මක අදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ ආයෝජනය සඳහා ගණනය කිරීම සඳහා මුලින් හඳුනා ගන්නා අවස්ථාවේදි වෙනස් නොකලහැකි තේරීමක් සිදු කර ඇත යන පදනම මත රඳා පවතී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ ඉදිරිපත් කරන ප්‍රමාණය පසුකාලිනව ආදායම් ප්‍රකාශනයට මාරු නොකෙරේ. එවැනි ආයෝජන මත ලාභාංශ අදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී. අරමුදල ණය ආයෝජන වර්ගීකරණය කරන්නේ එවැනි වත්කම් කළමනාකරණය කිරීම සඳහා එහි ව්‍යාපාර මාදිලිය වෙනස්වන විට පමණක්වේ.

2.6.2 හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම් නිත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම්, වත්කම් මිලදී ගැනිමට හෝ විකිණිම කළ දිනය අනුව වෙළෙඳ දිනට හඳුනා ගනී. මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත්වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ අරමුදල විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා නොගනී.

2.6.3 මැණුම්කරණය

මූලික හඳුනාගැනිමේදී, අරමුදල මූල්‍ය වත්කම් එහි සාධාරණ වටිනාකම සමඟ, ලාභ හෝ අලාභ (FVTPL) හරහා සාධාරණ වටිනාකමක් නොලබන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත්කර ගැනිම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය මනිනු ලබයි. FVTPL ට ගෙන යන මූල්‍ය වත්කම්වල ගණුදෙණු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. බද්ධවූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේදි මූලික මුදලත් පොළිය පමණක් සලකා බලනු ලැබේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

FVTPL ට ගෙන යන මූල්‍ය වත්කම්වල ගණුදෙණු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. බද්ධවූ ව්‍යුත්පන්න සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේදී මූලික මුදලත් පොළිය පමණක් සලකා බලනු ලැබේ.

2.6.3.1. ණය උපකරණ

ණය උපකරණවල පසුකාලීන මැණුම්කරණය, වත්කම කළමනාකරණය තරමට අරමුදලේ ව්‍යාපාර මාදිලිය සහ වත්කමේ මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ මත රඳා පවතී. අරමුදල ණය උපකරණ වර්ගීකරණය කරන මිණුම්කරණ තුනක් ඇත

ක්‍රමක්ෂය කළ පිරිවැය: ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා දරාගෙන සිටින වත්කම්වල එම මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි. මෙම මූල්‍ය වත්කම්වලින් පොළි ආදායම ඵලදායී පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය ආදායම තුළ ඇතුලත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන යම් ලාභ හෝ අලාභ සෘජුවම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර විදේශ විනිමය ලාභ සහ අලාභ සමඟ එක්ව වෙන් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කෙරේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශනය තුල වෙනම තිරුවක ඉදිරිපත් කෙරේ.

වෙනත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය (FVTOCI): ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා දරාගෙන සිටින වත්කම්, එම වත්කම්වල මුදල් ප්‍රවාහ මුල් මුදල සහ පොළිය ගෙවීම් පමණක් නියෝජනය කර අවස්ථාවක, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබයි. ධාරණ අගය තුළ වෙනස්වීම් අදායම් ප්‍රකාශය තුළ හඳුනාගන්නා හානිකරණ ලාභ හෝ අලාභ, පොළි ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනාගැනීම හැර අනෙකුත් විස්තරාත්මක ආදායම් තුළින් ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගන්නා විට, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ මෙයට පරෙ හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධවල සිට ලාභය හෝ අලාභ දක්වා නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/ (අලාභ) තුළි හඳුනා ගනී. මෙම මූල්‍ය වත්කම්වලින් පොළි ආදායම ඵලදායී පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් මූල්‍ය අදායම තුළ ඇතුළත් කෙරේ. විදේශ විනිමය ලාභ සහ අලාභ වෙනත් ලාභ/ (අලාභ) තුළ ඉදිරිපත් කරන අතර හානිකරණ වියදම් ආදායම් ප්‍රකාශනය තුළ වෙනම තීරුවක ඉදිරිපත් කෙරේ.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය :
FVTPL ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගය සඳහා නිර්නායක නොසපුරන වත්කම් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පසුකාලීනව මනින ණය උපකරණයක් මත ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර ලාභ/ (අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

2.6.3.2. කොටස් හිමිකම් සාධන පත්‍ර

අරමුදල සිය සියලු කොටස් හිමිකම් ආයෝජන සාධාරණ අගයට අනුව පසු කාලීනව මානනය කරයි. අරමුදල් කළමනාකරණය විසින් වෙනත් විස්තිරණ ආදායම් තුළ කොටස් හිමිකම් ආයෝජන මත සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ ඉදිරිපත් කරනු ලැබීමට තෝරා ගනු ලැබ ඇති අවස්ථාවක දී, අදාළ ආයෝජනය හඳුනා නොගැනීම මත සිදුවන සාධාරණ අගය සහිත ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ කරා පසු කාලීනව ප්‍රතිවර්ගීක රණයට යටත් නොවේ. ගෙවීම් ලබා ගැනීම පිළිබඳ වූ අරමුදලට අයත් ස්වකීය අයිතිය තහවුරු වූ කල්හි ලාභ හෝ අලාභ තුළ එම ආයෝජන වෙතින් උත්පාදනය වන ලාභාංශ වෙනත් විස්තිරණ ආදායම් වශයෙන් හඳුනා ගැනීම නොකඩවා සිදු වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය වත්කම්හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම්, අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ වෙනත් ලාභ / (අලාභ) යටතේ හඳුනා ගැනේ. වෙනත් විස්තිරණ ආදායම් ඔස්සේ මානනය කරන ලද කොටස් හිමිකම් ආයොජන මත සිදුවන අපහායන අලාභ (සහ අපහායන අලාභ වල ප්‍රත්‍යාවර්තනය) සාධාරණ අගය විෂයෙහි සිදුවන වෙනස්කම් වලින් වෙන් කරනු ලැබ වාර්තා නොකෙරේ.

මූල්‍ය බැරකම්
අලෙවිය සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් රඳවාගත් මුල්‍ය වත්කම්, ණය සහ ලැබීම් නියමිත සහ විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම් යනුවෙන් මුල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. මූලික හඳුනා ගැනීමේ අවස්ථාවේදී සමාගම ස්වකීය මූල්‍ය වත්කම් පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

ණය සහ ලැබීම් නියමිත
ණය ලැබීම් නියමිතවලට මුදල් හා කෙටිකාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ වෙනත් ලැබීම් නියමිත ඇතුළත්වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය අනුව ගණනය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හැරුණු විට, සියළුම මූල්‍ය මෙවලම් ආරම්භක අවස්ථා දී මානනය කරනු ලබන්නේ ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත සාධාරණ අගයට අනුවය.

ණය සහ ලැබීම් නියමිත වනුයේ සක්‍රිය වෙළඳපළක් තුළ මිල ප්‍රකාශ නොවූ ස්ථාවර හෝ නිශ්චයාත්මක ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුම්කරණයෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. දුබලතා හේතුවෙන් උද්ගතවන අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය වත්කම් හානියට පත් වීම

මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට කිසියම් ආත්මානුරූපික වූ සාක්ෂි තිබේ ද යනුවෙන් සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදී ම තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හානියට පත්ව ඇති බවට සලකනු ලබන්නේ, අදාළ වත්කම විෂයයෙහි එම දුබලතා මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ එක් සිදුවීමක හෝ ඊට වැඩි සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ බවට ආත්මානුරූපික වූ සාක්ෂි ඇත්නම් සහ එම අලාභ සිදුවීම, විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් ඇති කරන්නේ නම් පමණක් ම වන්නේ ය. ණයගැතියන් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවලට හෝ පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම්වලට හෝ ඒවා ගෙවීමෙන් වැළැකී සිටීම්වලට මුහුණ දෙමින් සිටින බවට පිළිබිඹු වන කරුණු ද, ඔවුන් බංකොලොත් භාවයට පත් වීමේ හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව යන කරුණු ද, හිඟ හිට ඇති මුදල්වල වෙනස්වීම් හෝ මුදල් ගෙවීම් පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ අගයෙහි මැනිය හැකි යම් අඩුවීමක් ඇති බව දත්ත මගින් නිරීක්ෂණය වන කරුණු ද වත්කම් හානියට පත් වීම පිළිබඳව හඟවන සළකුණුවලට අන්තර්ගත විය හැකි ය.

මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ කොන්ත්‍රාත්තුමය ගිවිසුමේ හරය සහ මූල්‍ය බැරකම්වල අර්ථකථනය අනුව ලාභය හෝ අලාභය හරහා හෝ වෙනත් මූල්‍ය බැරකම් හරහා සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය බැරකම් වශයෙනි.

ලාභය හෝ අලාභය හරහා ගණනය කරනු ලැබ සටහන් කරනු ලබන මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු විට, සියලුම මූල්‍ය මෙවලම් ආරම්භයේදී මානනය කරනු ලබන්නේ ගණුදෙනු කිරීමේ පිරිවැය සහිත ඒවායේ සාධාරණ අගයට අනුවය.

පොලී දරන ණය සහ ණය ගැනුම් ද, වෙනත් මූල්‍ය බැරකම්ද (වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිත) ඇතුළු මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී මානනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් කෙරහි සෘජුවම ආරෝපනය කළ හැකි ගණුදෙනු කිරීමේ පිරිවැය අඩුකරන ලද සාධාරණ අගය අනුව වන අතර ඒවා පසුකාලීනව සඵල පොලී අනුපාත ක්‍රමය යොදාගනිමින් ක්‍රමක්ෂිත පිරිවැය අනුව මානනය කෙරේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුව මත වන්නාවූ යම් වට්ටම් හෝ අධිමිල සහ සඵල පොලී අනුපාතයේ මුඛ්‍යාංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය බැරකමක් හඳුනා නොගනු ලබන්නේ, බැරකම යටතේ පවත්නා බැඳියාව නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන හෝ කල්ඉකුත් වන කල්හීය. දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් සැලැකිය යුතු අයුරින් වෙනස් කම් දක්වන නියමයන් මත එකම පාර්ශවකරුවා විසින් ඉදිරිපත්කරනු ලබන වෙනත් මූල්‍ය බැරකමකින් ප්‍රතිස්ථාපනය කෙරෙන්නේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක නියමයන් ප්‍රමාණවත් පරිදි වෙනස් කෙරෙන්නේ නම් එබඳු හුවමාරුවක් හෝ අමුතු කිරීමක් මුල් බැරකම නොපිලිගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලබන්නේය. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය සහ ගෙවනු ලබන ප්‍රතිඵාවය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

2.7. දේපළ, පිරියත හා උපකරණ

2.7.1. හඳුනා ගැනීමේ පදනම

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ. 2022 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි මණ්ඩලය විසින් සම්මත කරන ලද නව ප්‍රතිපත්තිය වන්නේ, රු.10,000.00 ට අඩු අයිතමයක ඒකකයක පිරිවැය (අනුයාත පිරිවැය ඇතුළුව) දේපලක්, පිරියතක් සහ උපකරණයක් ලෙස හඳුනා නොගැනීමත්, එම අයිතමය වියදමක් ලෙස පිළිගනු ලැබීමත් ය. මෙම ක්‍රමය අතීතානුයෝගී පදනමින් අනුගමනය කෙරේ. රු.මිලියන 10.9 ක මූල්‍ය බලපෑම, 2022 ජනවාරි මස 1 වන දිනට රඳවා ගත් ඉපැයීම්වලට අයගත කර ඇත. කෙසේ වෙතත්, රුපියල් 10,000.00 ක් වූ ඒකක සීමාව නොසලකා ඉඩම්, ගොඩනැගිලි සහ වාහනවල පිරිවැය (අනුයාත පිරිවැය ඇතුළුව) ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

2.7.2. මානනය කිරීමේ පදනම

නිරවුල් ඉඩම් හැර වෙනත් දේපල, පිරියත සහ උපකරණ අයිතම, පිරිවැය ඌණ සමුච්චිත ක්ෂය වීම් එල්ලේ සහ යම් දුබලතා අලාභ කිසිවක් වේ නම් එවා එල්ලේ මනිනු ලැබේ.

ප්‍රති තක්සේරු කිරීමේ සහ ද්‍රව්‍යමය භාවයේ පවත්නා ප්‍රායෝගික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2022 ජනවාරි මස 01 වන දිනට වත්කම්වල මූලික පිරිවැය ලෙස දැනට ඇති වත්කම්වල අගය අඩු කළ වටිනාකම ගණනය කරනු ලැබ ඇත.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ස්වයං නිර්මිත වත්කම්වල පිරිවැය, ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමයෙන් ද, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් යම් වියදම් වලින් ද, අයිතම වල කොටස් ගැලවීමට හා ඉවත් කිරීමට සහ ඒවා පවතින අඩවිය ප්‍රතිස්ථාපනය කිරීමට දරන්නා වූ දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවලට අයත් කොටස්වල විවිධ ප්‍රයෝජ්‍ය ආයු කාල ඇති විට, ඒවා දේපල, පිරියත සහ උපකරණ යන වෙනම අයිතම ලෙස ගිණුම්හි ගණනය කරනු ලැබේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.7.3. තදනන්තර පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණයෙන් හඳුනා ගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි රැගෙන යන ධාරණ වටිනාකමේ ප්‍රමාණය හඳුනා ගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා කිරීම් සඳහා වන වියදම් එවායේ වැය දැරීමට සිදු වන අවස්ථාවේදී දරනු ලැබේ.

2.7.4. ක්ෂය වීම

2022 ජනවාරි මස 01 වන දිනට පෙර අවකරණ සමතුලිත කිරීමේ ක්‍රමය භාවිතා කර ක්ෂය වීම් ගණනය කරන ලද අතර 2022 ජනවාරි මස 01 වන දින සිට ක්ෂය වීම පදනම් වන්නේ, වත්කමක අවශේෂ වටිනාකම ලියා අඩු කළ පිරිවැය මත ය. තනි වත්කම්වල පවත්නා සැලකිය යුතු අංගෝපාංග තක්සේරු කරනු ලබන අතර, එම වත්කමේ ඉතිරි වන කොටසට වඩා වෙනස් වූ ප්‍රයෝජ්‍ය කාලයක් අංගෝපාංගයකට තිබේ නම්, එම අංගෝපාංගය වෙන වෙනම ක්ෂය කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමයක එක් එක් අංගෝපාංගයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ සරල රේඛා පදනමක් මත, ලාභය හෝ අලාභය තුළ ක්ෂය වීම් හඳුනා ගැනේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කමක ක්ෂය වීම ආරම්භ වන්නේ, එය භාවිතය පිණිස තබනු කල්හි වන අතර එම වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කරන ලද දිනය සහ වත්කම හඳුනා ගනු නොලබන දිනය යන දෙකින් කලින් එළඹෙන දිනයක දී වත්කමක ක්ෂය වීම නතර වේ.

වාර්තා කරන දිනයේ දී ක්ෂය වීම් ක්‍රම, ප්‍රයෝජ්‍ය ආයු කාල, අවශේෂ අගයන් යනාදිය තක්සේරු කර, සුදුසු වේ නම්, අවශ්‍ය ගැළපුම් ඊට සිදු කරනු ලැබේ.

2.7.5. දේපල, පිරියත හා උපකරණ හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් සහ මුලින් හඳුනාගත් කිසියම් සැලකිය යුතු කොටසක් බැහැර කිරීමේ දී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන කල්හි හෝ හඳුනා ගනු නොලැබේ. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන යම්කිසි ලාභයක් හෝ අලාභයක්, එම වත්කම හඳුනා ගනු නොලබන කල්හි ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

දේපල, පිරියත සහ උපකරණවල අවශේෂ අගයන්, ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂය වීමේ ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර, සුදුසු වන්නේ නම්, භවිත්‍ය ලෙස ඊට අවශ්‍ය ගැළපුම් සිදු කරනු ලැබේ.

වත්කම්වල ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ, එවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ ඒවායේ පිරිවැය වෙන් කර දෙනු ලැබීම සඳහා පහත සඳහන් ආකාරයට සරල රේඛා ක්‍රමය භාවිතා කරමිනි

	වසර ගණන (ප්‍රයෝජ්‍ය ආයු කාලය)		ක්ෂය වීමේ අනුපාතය	
	2021 දෙසැම්බර් 31 දිනට පෙර	2022 ජනවාරි 01 දිනට පසු	2021 දෙසැම්බර් 31 දිනට පෙර	2022 ජනවාරි 01 දිනට පසු
ගොඩනැගිලි	අවුරුදු 15	අවුරුදු 40	6.67%	2.5%
මෝටර් වාහන	අවුරුදු 4	අවුරුදු 5	25%	20%
පරිගණක උපකරණ	අවුරුදු 5	අවුරුදු 5	20%	20%
ගෘහ භාණ්ඩ	අවුරුදු 6 2/3	අවුරුදු 10	15%	10%
සවි කිරීම් සහ වැද්දුම්	අවුරුදු 3	අවුරුදු 10	33.33%	10%
වෙනත් උපකරණ	අවුරුදු 5	අවුරුදු 5	20%	20%

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතම සම්මුච්චිත ක්ෂය සහ යම් දුබලතා අලාභ වෙතොත් ඒවා අඩුකරන ලද ඓතිහාසික පිරිවැයට අනුව මානනය කෙරේ. ක්ෂය විමි සඳහා අය කෙරෙනුයේ වාර්ෂික අනුප්‍රමාණ අඩු කළ වත්කම්හි පිරිවැය වෙන්කර දෙනු ලැබිය හැකි අයුරින් වන අතර පහත දැක්වෙන දේපළ, පිරියත හා උපකරණ ක්ෂය විමි සඳහා එය යොදා ගැනේ.

ගොඩනැගිලි හා සින්නක්කර ඉඩම්	2.5%
පිරියත හා යන්ත්‍රෝපකරණ	10%
උපකරණ	10%
ලීබඩු සහ සවිකිරිම්	10%
මොටර් වාහන	
- මහ මාර්ග වාහන	10%
- ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	20%
සංවර්ධන වැඩ	20%
වැඩුනු වතුවගා - පොල්	2%

වත්කමක ක්ෂය අනුපාතය, ප්‍රයෝජන ආයු කාලය හෝ අවශේෂ අගය තුළ සැලකිය යුතු වෙනස්කම් කිසිවක් විද්‍යාමාන වේ නම් එම වත්කම ආශ්‍රිත ශේෂය නව අරමුණු පිළිබිඹු වනු පිණිස ඉදිරියට බලාත්මක වෙන පරිදි ප්‍රතිශෝධනය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ආශ්‍රිත අයිතමයක් ඒවායේ ව්‍යාපහරණය මත හෝ එහි භාවිතයෙන් හෝ ව්‍යාපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීමක් සිදු නොකෙරේ. එසේ වත්කම හඳුනා නොගැනීම නිසා උද්ගත වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ව්‍යාපහරණ මුදල හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරන ලද) එකී වත්කම පිළිනොගැනෙන වර්ෂය තුළ ලාභයෙහි හෝ අලාභයෙහි අන්තරගත කරනු ලැබේ.

ජෛවවත්කම්

ජෛව වත්කම්, පරිණත වූ ජෛව වත්කම් සහ පරිණත නොවූ ජෛව වත්කම් යනුවෙන් වර්ග දෙකකට බෙදේ. පරිණත වූ ජෛව වත්කම් වනුයේ, අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් වූ හෝ නිරතුරුව අස්වනු දැරිය හැකි හෝ වත්කම් වර්ගයෝයි. පරිණත නොවූ ජෛව වත්කම් වනුයේ, මේ වන විටත් අස්වනු ලබා ගත හැකි අයුරින් විශේෂිතත්වයට පත් නොවූ වත්කම් වර්ගයෝයි. පොල් වගා සහ පැල තවාන් ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. ධාරක ජෛව වත්කම්වලට, විකිණීමට හෝ අස්වනු නෙලා ගැනීමට අදහස් නොකරන එහෙත්, කෘෂි නිෂ්පාදන ලෙස අස්වනු ලබා ගැනීම පිණිස යොදා නොගැනෙන ජෛව වත්කම් ඇතුළත් වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ වත්කම් හා බැඳී පවත්නා අනාගත ආර්ථික ප්‍රතිලාභ තමන් වෙත ගලා එනු ඇතැයි සහ එම වත්කම්වල සාධාරණ අගය හෝ පිරිවැය විශ්වාසදායක ලෙස මානනය කරනු ලැබිය හැකි වෙතැයි අස්ථිත්වය විසින් අනුමාන කරනු ලබන කල්හී සහ එම අස්ථිත්වය එකී අදාළ වත්කම් පාලනය කරනු ලබන අවස්ථාවක දී පමණක් එම අස්ථිත්වය තම ජෛව වත්කම් හඳුනා ගනියි. ජෛව වත්කම් විෂයයෙහි සිදුවන ස්ථීර හායනයවීම් පූර්ණ වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයන් හී අයගත කරනු ලැබ, අදාළ අලාභය නිශ්චය වශයෙන් දැන ගැනීමෙන් පසුව, එකී අලාභය සිදුවූ වසර තුළදී එම වත්කම් වලට අයත් ශුද්ධ ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණවලට අවකරණය කරනු ලැබේ.

- **ධාරක ජෛවවත්කම්**

ධාරක ජෛව වත්කම්, අංක 16 දරන ලංකා ගිණුම් ප්‍රමිත - දේපළ, පිරියත සහ උපකරණ අනුව, ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හායන අලාභ ඇත්නම් ඒවා ද අඩු කරන ලද පිරිවැය මත, මනිනු ලැබේ.පැල සිටුවීම සහ අස්වනු නෙලීම (පැල රෝපණය කරන ලද ප්‍රදේශය මෝරා වැඩුනු අවස්ථාව වන විට) අතර කාලය තුළ සිදුවූ ඉඩම් පිළියෙළ කිරීම, පුනරුත්ථාපනය, අභිනවයෙන් පැල සිටුවීම, නැවත පැල සිටුවීම, හෝග විවිධාංගීකරණය, අතුරු පැල සිටුවීම සහ පොහොර යෙදීම යනාදිය සඳහා වූ පිරිවැය පරිණත නොවූ වගාවන් ලෙස වර්ගීකරණය කෙරේ. මෙම පරිණත නොවූ වගාවන්, එකී පරිණත නොවූ වගාවන් සඳහා මූල්‍යනය සලසනු පිණිස යොදා ගැනුනු දිගු කාලීන ණය මුදල්වලට ආරෝපණය වන පොලී ප්‍රමාණ ද ඇතුළු අනෙකුත් ආරෝපිත වන්නා වූ පොදු කාර්ය වියදම් සහිත වූ සෘජු පිරිවැයට අනුව ගෙන හැර දක්වනු ලැබේ. වසර තුළදී ඵල දරන ධාරක ජෛව වත්කම්(පොල්)මත දරනු ලබන වියදම්, පරිණත වූ වගාවන් වෙත මාරු කෙරේ.

2.8. ආයෝජන දේපළ

ආයෝජන දේපළ, ඒවායේ ගණුදෙනු කිරීමේ පිරිවැයද ඇතුළුව ආරම්භක අවස්ථාවේදි පිරිවැයට මානනය කෙරේ. මුල් හඳුනාගැනිමෙන් අනතුරුව, වාර්තාකරණ දිනයට අදාල වෙළඳපොළ තත්වය පිළිබිඹු කෙරෙන සාධාරණ අගයට අනුව ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපලවල සාධාරණ වටිනාකම තුළ සිදුවන වෙනස්කම් නිසා උද්ගතවන යම් ලාභ හෝ අලාභ ඒවා පැනනගින කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි අන්තර්ගත කරනු ලැබේ.

මණ්ඩලය සතු ආයෝජන සෑම තෙවසරකට ම වරක් විවෘත වෙළඳපොළ තුළ පවත්නා අගය අනුව එහි ධාරණ අගයක් වෙතොත් එහි වෙනසද සමග විස්තීර්ණ අදායම් ගිණුමෙහි හඳුනාගනු ලැබ ප්‍රත්‍යාගණනය කළ යුතු වන්නේය. ලැබිය යුතු කුලිය ඒවායේ කල්බදු කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විහිදුවා හැරිය යුතුය. යම් කුලී නිවැසියෙකුට කිසියම් දිරිගැන්වීමක් (කුලී රහිත කාල සීමාවක් වැනි) ලබා දෙන්නේ නම්, අදාළ ආයෝජන දේපළෙහි ධාරණ අගයෙන් මෙම පදනම මත කුලී ආදායම් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනමම වත්කමක් සේ වාර්තාවූ මුදල් ප්‍රමාණ කිසිවක් බැහැර විය යුතු වන්නේය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

මණ්ඩලය සතුව කොළඹ 02, නවම් මාවතෙහි පිහිටි අක්කර 2 රූඩ් 1 පර්චස් 28 ක වපසරියකින් යුත් ඉඩමක් පවතින අතර එය, රජයේ තක්සේරුකරු විසින් 2022 ඔක්තෝම්බර් මස 11 වන දින තක්සේරු කරන ලද්දේ ය. රජයේ තක්සේරුකරුගේ වාර්තාවට අනුව, එම ඉඩමෙහි සාධාරණ අගය රු.4,587,406.450/- ක් වූ ප්‍රමාණයක් දක්වා ඉහළ ගොස් තිබේ.

2.8.1. (අ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - ප්‍රමාණය සහ පිහිටි ස්ථානය

පිහිටි ස්ථානය	ප්‍රමාණය (පර්චස්)	ආයෝජන දේපළෙහි සාධාරණ අගය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02.	388	රු. 4,566,000,000.00

පිහිටි ස්ථානය	ගොඩනැගිලි (වර්ග අඩි)	ආයෝජන දේපළෙහි සාධාරණ අගය
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, නවම් මාවත, කොළඹ 02.	19,319	රු. 21,406,450.00

2.8.2. (ආ) මණ්ඩලය සතු ආයෝජන දේපළවල තොරතුරු - තක්සේරු

වෘත්තීය තක්සේරුකරුගේ නම / පිහිටි ස්ථානය හා ලිපිනය	තක්සේරු කිරීමේ ක්‍රමය සහ සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම්	නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් සඳහා වන ඇස්තමේන්තු පරාසය රු.	ආයෝජන දේපළෙහි සාධාරණ අගය රු.
රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, "තක්සේරු මන්දිරය", අංක 748, මරදාන පාර, කොළඹ 10.	වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය ■ පර්චස් එකක මිල ■ වර්ග අඩියක මිල	පර්චස් එකක් 11,823,212.50 බැගින් වර්ග අඩියක් 625 - 1955 බැගින්	4,566,000,000.00 21,406,450.00

2.8.3. (ඇ) සමූහය සතු ආයෝජන දේපළවල සාධාරණ අගය මානනය කිරීමේ තක්සේරු ශිල්ප ක්‍රම හා එහි සංවේදකතාවය

තක්සේරු ශිල්ප ක්‍රමය	සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහෙන තක්සේරු යෙදවුම්	යෙදවුම් එල්ලේ සාධාරණ අගය මානනය කිරීමේ සංවේදකතාවය
වෙළඳපළ සංසන්දනාත්මක ක්‍රමය - ප්‍රතිතක්සේරු කිරීමට භාජනය වන දේපළවල සාධාරණ වටිනාකම තීරණය කිරීමේ දී, ඒ හා සමාන දේපළක යුක්ත සහගත නුදුරු කාල පරිච්ඡේදයක් තුළ පැවති විකුණුම් මිල මෙම ක්‍රමය මගින් සලකා බැලේ. මෙයට සමාන වත්කම්වල පැවති මෑත කාලීන සක්‍රීය වෙළඳපළ මිල තක්සේරු කිරීම මීට අදාළ කර ගනු ලබන අතර එකී නිශ්චිත දේපළෙහි ප්‍රමාණය, ස්වභාවය, ස්ථානීය පිහිටීම සහ තත්ත්වය යනාදියෙහි වෙනස්කම් සඳහා සුදුසු ගැළපීම් කිරීම ද එහි දී සිදු වේ.	■ පර්චස් එකක මිල ■ වර්ග අඩියක මිල	- පර්චස් එකක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්; - වර්ග අඩියක මිල වැඩි වන්නේ / (අඩු වන්නේ) නම්.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.9. අස්පෘෂ්‍ය වත්කම්

2.9.1. බාහිර වශයෙන් අත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

ෂවෙන් වෙන්ව අත්කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී පිරිවැයට අනුව මානනය කෙරේ. එසේ ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘෂ්‍ය වත්කම් ඉදිරියට ගෙන යනු ලබන්නේ, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැයට අනුවය. අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය නියත හෝ අනියත වශයෙන් තක්සේරු කරනු ලැබේ.

නියත ආයු කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍ය ආර්ථික ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර අදාළ අස්පෘෂ්‍ය වත්කම දුබලත්වයට පත්ව ඇති බවක් විද්‍යමාන වන කල්හි ඒවායේ දුබලතා එල්ලේද තක්සේරු කිරිමක් කරනු ලැබේ. යටත් පිරිසෙයින් එක් වාර්තකරණ කාල පරිච්ඡේදයක් අවසානයේදී, නියත ප්‍රයෝජ්‍ය ආයු කලයක් සහිත අස්පෘෂ්‍ය වත්කමක් සඳහාවූ ක්‍රමක්ෂය කිරිමේ කාල පරිච්ඡේදය සහ අදාළ ක්‍රමක්ෂය කිරිමේ ක්‍රමය සමාලෝචනයට භාජනය කෙරේ. වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ හෝ වත්කම තුළ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව තුළ සිදුවන වෙනස්කම් සුදුසු පරිදි ක්‍රමක්ෂය කිරිමේ කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් සලකා බලනු ලබන අතර ගිණුම් ඇස්තමේන්තු තුළ සිදුවන වෙනස්කම් ලෙස සලකනු ලබන්නේය. නියත ආයු කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් මත සිදුවන ක්‍රමක්ෂය වියදම් අදාළ අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රියාකාරිත්වය හා අනුකූල වන පරිදි වියදම් කාණ්ඩය තුළ අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගතව වන ලාභ හෝ අලාභ, ශුද්ධ ව්‍යපහරණ මුදල සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස මානනය කරනු ලබන අතර එකී වත්කම නොපිලිගැනෙන අවස්ථාවේදී,එය අදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

2.9.2. පරිගණක මෘදුකාංග පැකේජ

පරිගණක මෘදුකාංග පැකේජ අත්කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අවස්ථාවේදී දරනුලබන මුදල අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර වසර තුනක කාල සීමාවක් ඔස්සේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.10. කල්බදු දේපළ

දේපළ, පිරියත හා උපකරණ යටතේ කලින් වර්ගීකරණය කර තක්සේරුව අනුව සටහන් කරන ලද ඉඩම් පරිහරණය පිළිබඳ අයිතිවාසිකම් ඇතුළත් කල්බදුකර දේපළ, "කල්බදුකර දේපළ" ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබ තිබේ. හම්බන්තොට පිහිටි ඉඩම සඳහා ගෙවන ලද කල්බදු මුදල වසර 30ක් වූ කල්බදු කාල සීමාවක් මුළුල්ලේ ප්‍රාග්ධනීකරණය කර ක්‍රමක්ෂය කරනු ලැබ ඇත.

2.10.1 මෙහෙයුම් කල්බදු

හිමිකාරිත්වය කෙරෙහි ආනුෂංගික වන්නාවූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් පරිදි මණ්ඩලය වෙත (මෙහෙයුම් කල්බදු) මාරු කරනු නොලබන අවස්ථාවේදී, බදුකරය යටතේ ගෙවිය යුතුවන්නාවූ මුළුකුලී මුදල් ප්‍රමාණ බදු කාලසීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ.

2.11 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. එසේ ගණනය කරනු ලබන්නේ අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදිමෙන් පසුවය.

අභාවිත හා මන්දගාමීව චලනය වන වට්ටෝරු භාණ්ඩවලට නියමිත පරිදි අවශ්‍ය ඉඩ සලසාදිමෙන් පසු එකී වට්ටෝරු භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන මුදලින් අඩු අගයට ගණනය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිකාම යනු, සාමන්‍ය වෙළෙඳ ක්‍රියා මාර්ගය තුළ අදාළ වට්ටෝරු භාණ්ඩ විකුණුම සම්පූර්ණ කිරීම පිණිස ඇස්තමේනතුගත පිරිවැය හා අදාළ විකුණුම් සිදුකිරිම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද එය විකුණනු ලැබිය හැකි මිලය.

පහත දැක්වෙන පිරිවැය විධික්‍රම උපයෝගී කර ගනිමින්, අදාළ වට්ටෝරු භාණ්ඩ ඒවායේ වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා වැය කරන ලද වියදම ගණනය කරනු ලැබේ.

අමුද්‍රව්‍ය	-	පළමුව පැමිණ පළමුව පිටවන පිරිවැය පදනම මතවූ ගැනුම් වියදම
අනුව නිමි භාණ්ඩ	-	සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සුදුසු ප්‍රාදේශිය නිෂ්පාදන පොදු කාර්ය වියදම්වල අනුපාතයන් සඳහාවූ වියදම අනුව
කෙරෙමින් පවත්නා වැඩ	-	ඝනත්වයේ 12 වන මට්ටමට සහ ඉන් ඉහළට තැන්පත්ව පැවති ලුණුවල ගණනය කරන ලද ප්‍රමාණයට අනුව විභජනය කරන ලද පසුගිය අස්වනු වාරයේදී පැවති කරදිය සංසරණය සහ ලුණු ලියැදි සැකසිමේ වියදමින් 25% ක්වූ ප්‍රමාණයට අනු
පරිභෝජ්‍ය ද්‍රව්‍යභා අමතර කොටස්	-	පළමුව පැමිණ පළමුව පිටවන පදනම මත ගැනුම් පිරිවැය අනුව

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ක්‍රියා මාර්ගය තුළ විකුණුම් සම්පූර්ණ කිරිමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකුණුම් සිදු කිරිම සඳහා අවශ්‍ය වන්නාවූ ඇස්තමේන්තුගත පිරිවැය අඩුකරන ලද

2.12. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

2.12.1. සේවක ප්‍රතිලාභ

සමාගම සන්තකයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන දෙවර්ගය ම පවතී. නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, සමාගම විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවනු ලැබීමක් යටතේ ක්‍රියාත්මක වන විශ්‍රාම සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් මගින්, සේවකයා ස්වකීය සේවයෙන් විශ්‍රාම ගැනිමේදි තමාගේ සේවා කාලය හා ඊට අදාළ වන්දි මුදල මත පදනම්ව ලබා ගන්නා විශ්‍රාම වැටුප් මුදලකි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.12.2. නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරව සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේදායකත්වයට සුදුසුකම් ලැබේ. මණ්ඩලය විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

පවත්නා ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාරවසියලුම සේවක සේවිකාවන්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුකතයන්ගේ භාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලැබේ.සමාගම විසින් සේවක සේවිකාවන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% ක් සහ 3% ක් වනසේ පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

2.12.3. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවක ප්‍රතිලාභ නැමති ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිත අංක 19 අනුව සියළුම සේවක සේවිකාවන් සඳහා ඔවුන්ගේ සේවා කාලයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂිත ලබාගනු පිණිස ප්‍රතිපාදන සලසා දෙනු ලැබ ඇත. එසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකුට එලෙස පාරිතෝෂිත මුදල් ගෙවීමේ වගකීම උද්ගත වන්නේය. මෙම වගකීම් දැරීම බාහිර වශයෙන් මූල්‍යයනය කෙරෙන්නක් නොවේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු, නිශ්චිත දායකත්ව සැලැස්මක් නොව පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලස්මකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් මත ආයතනයේ ශුද්ධ බැදියාව, ප්‍රවර්තන හා පූර්ව සේවා කාල පර්චිඡේදයන් සඳහා සේවක සේවිකාවන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම මගින් ගණනය කරනු ලබන අතර එම ප්‍රතිලාභය අදාළ වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා වට්ටම් කරනු ලැබේ. යම් හඳුනානොගත් පූර්ව සේවා පිරිවැයක් වෙතොත් ඒවා අවකරණය කරනු ලැබේ.

ආයතනය සතු බැඳියාවන් හි නියමයන් සමඟ සන්නිකර්ෂනීය වන්නාවූ කල්පිරීමේ දිනයන් ඇත්තාවූ ද, අදාළ ප්‍රතිලාභ ගෙවනු ලැබීම අපේක්ෂිත එක හා සමාන ව්‍යාවහාර මුදල් ඒකක අනුව නාමනය කරනු ලැබ ඇත්තාවුද රපෝර්තු දිනට පවත්නා උසස් තත්වයේ සංස්ථාපිත බැඳුම්කරවල ඵලදාව වට්ටම් අනුපාතය වන්නේය. අදාළ ගණනය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගනිමින් සුදුසුකම් ලත් ආයුගණක විශේෂඥයෙකු ලවා වාර්ෂිකව ඉටු කරවා ගනු ලැබේ.

සැලසුමක අඩංගු ප්‍රතිලාභ වැඩි දියුණු වන කල්හි සේවක සේවිකාවන් විසින් ඉටු කරන ලද අතීත සේවයට අදාළ ඉහළ ප්‍රතිලාභවලට අයත් කොටස, එකි ප්‍රතිලාභ පවරා දෙනු ලබන තෙක්වූ සාමාන්‍ය කාල සීමාව මුළුල්ලේ සරල මාර්ග පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් උද්ගතවන සියලු ජීවගණක ලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ ආයතනය විසින් හඳුනා ගනු ලැබේ.

සේවක සේවිකාවන්ගේ සේවා කාලය මත හා ඔවුන් විසින් දැනට ලබන මාසික වැටුප්හි ප්‍රතිශතය මත අදාළ ප්‍රතිලාභ පදනම්වී ඇති කල්හි තම සියලුම නිත්‍ය සේවක සේවිකාවන් ආවරණය කරමින් සැදුම්ලත් අරමුදල් නොසැපයූ දායකත්ව නොවන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සමාගම සතුව පවතී. අදාළ වගකීමෙහි වටිනාකම ගණනය කිරීමෙහිලා ඇස්තමේන්තුගත අනාගත වැටුප් වැඩිවීම්වල සරල කිරීම්ද, වත්මන් සේවක සේවිකාවන්ගේ අනාගත සේවා කාලද, වත්මන් සේවක සේවිකාවන්ගේ සේවාස්ථ මර්ත්‍යතාව ද 28.19 වගන්තිය ප්‍රකාරව උපයෝගි කරගනු ලැබ තිබේ. පාරිතෝෂිකයට අදාළ වගකීම සම්බන්ධයෙන් අරමුදල් සපයනු ලැබ නොමැති අතර එය ආයුගණක වශයෙන් අගයනු ලැබද නොමැත.

2.13. සම කොටස් හිමිකම

2.13.1. සාමාජික අරමුදල

වර්ෂය තුළ සාමාජික සාමාජිකවන් වෙත ගෙවන ලද ආපසු ගෙවිය යුතු අරමුදල් අඩුකරන ලද සාමාජික සාමාජිකාවන් වෙතින් ලද හා ලැබිය යුතු දායක මුදල් ඊට ඔවුන් වෙවෙන් උපචිත වන්නාවූ පොලි හා ලාභාංශද සමඟ සාමාජික අරමුදල සමන්විත වන්නේය.

2.13.2. ලාභාංශ

ලාභාංශ හඳුනාගනු ලබනුයේ, ඒවා ලැබගැනිමේ අරමුදල සතු අයිතිය තහවුරු වූ කල්හිය.

2.13.3. සංචිත

ප්‍රත්‍යාගණන සංචිතය, සින්නක්කර ඉඩමෙහි හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයට අදාළ වන අතර අදාළ ප්‍රත්‍යාගණන දිනයට පවත්නා ඉඩම් හා ගොනැගිලිවල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉන් නියෝජනය කරයි. ඒ අනුව, නවම් මාවතේ පිහිටි ඉඩමේ ගැණුම් පිරිවැය ඉක්මවූ වෙළඳපොළ වටිනාකමේ ඉහළ යාම අනුව සංචිතය ගොඩ නැගී ඇත.

රඳවාගත් ඉපැයුම් ගිණුමෙන් ලාභාංශ හා පොලි ගෙවීමෙන් පසුව උද්ගතවන අතිරික්ත ලාභය මණ්ඩලය විසින් ලාභාංශ සමකිරීමේ සංචිත ගිණුමට මාරුකරනු ලබයි. මෙම සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ, මතු අපේක්ෂිත ලාභාංශ ගෙවීම් සපුරාලීමත්, රඳවාගත් ඉපැයුම් වෙතින් මුදල් විගලනය අඩුකිරීමත් යන කරුණුය.

වත්කම් හඳුනා නොගැනීම හෝ ඒවා දුබලතාවයටපත්-වන තෙක් විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජනවල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස විකුණුම් සඳහා පවත්නා සංචිතය තුළ සමන්විතවේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.14. ප්‍රතිපාදන

ඔඅවිනිශ්චිත කාල නිර්ණ සහ මුදල් ප්‍රමාණ හා බැඳි බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබ ඇත. රපෝර්තු දිනය වන විට අදාළ බැඳියාව නිරවුල් කරනු පිණිස අවශ්‍ය වන්නාවූ වියදමෙහි ප්‍රශස්තම වියදම් ඇස්තමේන්තුව මත ප්‍රතිපාදනය මනිනු ලැබ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොල තක්සේරුව මත සහ අදාළ බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් පිළිබිඹු වන බඳු පූර්ව අනුප්‍රමාණයක් මත එය වට්ටම් ගත කරනු ලැබේ.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සමාගම සතුව වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් පවත්නා විට ද, අදාළ බැඳියාව නිරවුල් කිරීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පවරාදීමක් අවශ්‍ය වේදැයි යනුවෙන් හෝ අදාළ මුදල විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කළ හැකි වේදැයි යනුවෙන් අනුමානයක් පවතින කල්හිද නෛතික හිමිකම් ඉල්ලා සිටීම සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

අදාළ මුදලෙහි කාල වටිනාකම හා බැඳි වර්තමාන වෙළඳපොළ තක්සේරුව සහ එකී බැඳියාවට අදාළ වන්නා වූ විශේෂිත අවදානම් පිළිබිඹු වන බඳු පූර්ව අනුප්‍රමාණයක් යොදා ගනිමින් එම බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍යවන්නාවූ අනාගත මුදල් ප්‍රමාණයෙහි වර්තමාන වටිනාකම මත ප්‍රතිපාදනය මනිනු ලැබේ. කල්ගතවීම නිසා ප්‍රතිපාදනයෙහි සිදුවන වැඩිවීම් පොලි වියදමක් ලෙස හඳුනා ගනු ඇත.

2.15. වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

බොහොමයක් විකුණුම් සිදු කෙරෙනුයේ සාමාන්‍ය ණය කොන්දේසි පදනමක් මතය. ඊට අදාළ ලැබීම් නියමිත තුළ පොලී නොදරේ. සාමාන්‍ය ණය කොන්දේසි ඉක්මවා යමින් ණය විස්තාරණයක් සිදුවන අවස්ථාවකදී සජීව පොලී අනුපාතය උපයෝගි කර ගනිමින් ලැබීම් නියමිත ගණනය කෙරෙනුයේ ක්‍රමක්ෂිත පිරිවැයට අනුවය. එක් එක් රපෝර්තු කාල පරිච්ඡේදය අවසානයේදී වෙළඳ හා වෙනත් ලැබීම් නියමිතවල ධාරණ අගය, අදාළ මුදල් ප්‍රමාණ ආපසු අයකර ගත නොහැකි වෙතැයි යනුවෙන් යම් විෂය නිශ්‍රිත සාක්ෂි පවතීදැයි නිශ්චය කරනු පිණිස සමාලෝචනයට භාජනය කරනු ලැබේ. එසේ පවතීනම්, වහාම ලාභය හෝ අලාභය තුළ දුබලතා අලාභයක් හඳුනා ගනු ඇත.

2.16. වෙළඳ ගෙවීම් නියමිත

වෙළඳ ගෙවීම් නියමිත යනු සාමාන්‍ය ණය කොන්දේසි මත වන්නාවූ බැඳීම් වන අතර, ඒ සඳහා පොලී නොදරේ. විදේශ ව්‍යාවහාර මුදල් ඒකකයකින් නාමනය කරන ලද වෙළඳ ගෙවීම් නියමිත රපෝර්තු දිනය වන විට පවත්නා විනිමය අනුපාතය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යාවහාර මුදල් විනිමය ලාභ හෝ අලාභ වෙනත් ආදායම තුළ හෝ වෙනත් වියදම් තුළ අන්තර්ගතවේ.

2.17. මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ යනු දන්නා මුදල් අගයන්ට යුහුසුළුව පරිවර්තනය කළහැකි සහ වටිනාකම හා බැඳි වෙනස්කම්වල සැලකිය නොහෙන අවදානමකට යටත් අතැති මුදල් ද, ඒක්ෂණ තැන්පතු ද, කෙටිකාලීනවූ අතිශය ද්‍රවශීල ආයෝජනද වන්නේය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා, මුදල් හා මුදලට සමාන දෑ තුළ පරිශේෂව පවත්නා බැංකු අයිරා අඩුකරන ලද අතැති මුදලද, බැංකුවෙහි ඇති තැන්පතුද අඩංගු වන්නේය. කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන එනම්, ඒවා අත්කරගත් දින සිට තෙමසක් හෝ ඊට අඩු ආයෝජනයන්ද සැලකෙනුයේ මුදලට සමාන දෑ ලෙසය.

2.18. ප්‍රදාන සහ සහනාධාර

ප්‍රදාන ලැබෙය යනුවෙන් හා සියලුම සම්බන්ධිත කොන්දේසි අනුව කටයුතු කර ඇතැයි යනුවෙන් යුක්ති සහගත සහතිකයක් පවත්නා අවස්ථාවකදී ප්‍රදාන හඳුනා ගනු ලැබේ. ප්‍රදානය යම් වියදම් අයිතමයකට අදාළ වන කල්හී අදාළ ප්‍රදානය ක්‍රමවත් පදනමක් මත වන්දි ගෙවනු පිණිස අදහස් කරන පිරිවැය හා ගැළපීම සඳහා අවශ්‍ය වන්නාවූ කාල පරිච්ඡේදය මුළුල්ලේ පවත්නා ආදායමක් ලෙස හඳුනා ගනු ලබනවා ඇත. ප්‍රදානය යම් වත්කමකට අදාළ වන කල්හි එය විලම්බිත ආදයමක් ලෙස ස්ථාපනය කෙරේ. මුදල්මය නොවන ප්‍රදාන සමාගම විසින් ලබා ගන්නා අවස්ථාවකදී අදාළ වත්කම හා එම ප්‍රදානය නාමික මුදල් වටිනාකම් මත සටහන් කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි සමාන වාරික කොටස් මගින් අදාළ වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය වෙත එය මුදා හරිනු ඇත.
ලද ප්‍රදාන ප්‍රතිවර්තන ගිණුමකට බැර කරනු ලබන අතර පහත දැක්වෙන පරිදි ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

අයඩිකරණ පිරියත සඳහා ප්‍රදානය	10%
ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය	2.5%
පොම්පාගාරය සඳහා ප්‍රදානය	2.5%

සේවක වන්දි සඳහාවූ ප්‍රදානය - ගෙවූ වන්දි මුදලින් අඩු කෙරේ.

2.19. වත්කම් අපහායනය

2.19.1. මූල්‍ය වත්කම් අපහායනය

SLFRS 9 අනුව ණයකර ආයෝජන සහ ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලබන වෙනත් මූල්‍ය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු සඳහා මණ්ඩලය ප්‍රතිභාගයන් වාර්තා කරයි.

දැක්මක් සහිත අවස්ථා ඇතුළත් කිරීම

දරණ ලද අලාභ ආකෘතියට ප්‍රති විරුද්ධව, අනාගත අපේක්ෂිත අලාභ SLFRS 9 විසින් හඳුන්වා දෙන ලද අපේක්ෂිත ණය අලාභ ආදර්ශය යටතේ තක්සේරු කිරීමට අවශ්‍යවේ. එයට ඉදිරිය දකින සාර්ව ආර්ථික දත්ත සහ ආයතනයට සෘජුව සම්බන්ධ නොවන උපකල්පන භාවිතය අවශ්‍ය වේ. මෙය ආර්ථික සාධක ගැලපීම හරහා හානිකරණය ගණනය කිරීම තුලට ඇතුළත් කෙරේ.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

ණය සුරැකුම්පත් තුළ අයෝජනය සඳහා අපහායන එළඹුම (FVTPL නොවන)

බාහිර ණය ශ්‍රේණිගතකරණ දත්ත වෙන්කිරීම් ස්ථාපිත කිරීමට භාවිතා කළ හැකිය. තවද, ණය ශ්‍රේණිගතකරණය පිරිහීම, ප්‍රකාශිත මූල්‍ය සහ වෙනත් තොරතුරු ණය අවාදනම තුළ සැලකියුතු වැඩිකිරීම් තක්සේරු කිරීමට සහ ජීවකාල වෙන්කිරීමක් සිදු කිරීම පිණිස උපකරණ ආයෝජන ශ්‍රේණියක්ද යන්න සමාලෝචනය කළ යුතුව ඇත. බාහිර ශ්‍රේණිගතකරණ දත්ත නොමැතිකම තුළ, පැහැර හැරී අනුපාත අපේක්ෂිත ණය අලාභ ස්ථාපිත කිරීම පිණිස ව්‍යුහගත ක්‍රම/ ණය විසිරීම්/ ණය ලකුණු භාවිතා කරමින් ස්ථාපිත කළ යුතුව ඇත.

අපේක්ෂිත ණය පාඩුවල මූලික සංරචක

- **ගෙවීම් පැහර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම**
  ණයකර, ස්ථාවර තැන්පතු සහ ණය සහ ලැබිය යුතුදේ සඳහා ඓතිහාසික ගෙවීම් පැහැර හැරීමේ දත්ත නොතිබූ හෙයින් S & P Global Ratings විසින් ප්‍රකාශයට පත්කළ 2018 Annual Gloval Corporate Default Study and Rating Transitions හි දත්ත භාවිතා කරන ලදි.

- **පාඩු ඇති කරන පැහැරහැරීම (LGD) තක්සේරු කිරීම**
  ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් SLFRS 9 අදාළ කර ගැනීම සම්බන්ධව බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව, දත්ත හෝ ආදාන මඳවීම නිසා බලපත්‍රලාභී බැංකුවකට පාඩු ඇති කරන පැහැර හැරීම් ගණනය කරගැනීමට නොහැකිවූ විට, එවැනි බැංකුවක් එවැනි නිරාවරණයක් සඳහා අවම වශයෙන් සියයට 45 ක පාඩු ඇති කරන පැහැර හැරීම් තක්සේරුවක් යොදාගත යුතුය.

- **ගෙවීම් පැහැර හැරීම් නිරාවරණය (EAD) තක්සේරු කිරීම**
  අපේක්ෂිත ණය අලාභ ආයතනය ණය අලාභයට නිරාවරණය වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී වන කාලසීමාව පුරා මනිනු ලබයි. පැහැර හැරීමේදී නිරාවරණය යනු ණය අලාභයට නිරාවරණය වන සමහර මූල්‍ය උපකරණවල අයෝජනය කරන මුදලේ ප්‍රමාණයයි.

  2019 ජනවාරි 1 දින සිට, ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට ගෙන යන ණය උපකරණ හා බැඳුණු අපේක්ෂිත ණය අලාභ (ECL) අනාගතය දකින පදනමකින් අරමුදල තක්සේරු කරයි. යොදා ගන්නා හානිකරණ ක්‍රමවේදය ණය අලාභවල සැලැකිය යුතු වැඩිවීමක් තිබේද යන්න රඳා පවතී.

  මණ්ඩලය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොමනින ලද පහත සඳහන් මූල්‍ය උපකරණ මත අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා අලාභ දීමනා හඳුනා ගනී.

- ලැයිස්තුගත - ණයකර
- ස්ථාවර තැන්පතු
- රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව සමඟ ණය යෝජනා ක්‍රම තැන්පතුව
- ජාතික සංවර්ධන බැංකුව සමඟ ණයයෝජනා ක්‍රමය

2.19.2. මූල්‍ය නොවන වත්කම් දුබලතාවයට පත්වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වීමේ ලක්ෂණ පහළවී තිබේදැයි යනුවෙන් සෑම රපෝර්තු දිනකම මණ්ඩලය තක්සේරු කර බලයි. ඒ පිළිබඳව හඟවන යම් කරුණු වේ නම් හෝ කිසියම් වත්කමක් විෂයෙහි වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වේ නම් අදාළ වත්කමෙහි ආපසු අයකර ගතහැකි වටිනාකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. වත්කමක ආපසු අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගයෙහි හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම ආපසු අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලතාවයට පත්වූ ලෙස සලකා එහි ආපසු අයකර ගත හැකි වටිනාකම ලියා දක්වනු ලැබේ.

භාවිත වටිනාකම තක්සේරු කිරීමෙහිලා ඇස්තමේන්තු කළඅනාගත මුදල් ප්‍රවාහ, අදාළ මුදලෙහි කාලානුරූප වටිනාකමෙහි ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව හා අදාළ වත්කමට විශේෂිත වන්නා වූ අවදානම් ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරුව පිළිඹිඹු වන බඳු පූර්ව වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ ප්‍රවර්තන අගය අනුව වට්ටම් ගත කෙරේ. සාධාරණ අගයෙන් අඩු කළ විකුණුම් පිරිවැය නිශ්චය කිරීමෙහිලා ප්‍රශස්ත තක්සේරු කිරීමේ ආකෘතියක් යොදාගනු ලැබේ. මෙම ආගනනයන්, තක්සේරුවල බහුවිධ ක්‍රම, ප්‍රසිද්ධ වෙළඳ සමාගම් වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා වෙනත් සාධාරණ අගය දැක්වීමේ දර්ශක මගින් තහවුරු කෙරේ.

වත්කම් සඳහා පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද දුබලතා අලාභ තව දුරටත් නොපවතින්නේද නැතහොත් අඩුවී තිබේද යන්න පිළිබඳව තක්සේරුවක් සෑම රපෝර්තු දිනයකදීම සිදු කරනු ලැබේ. එබඳු දැනවුමක් පවතී නම්, අදාළ වත්කමෙහි හෝ මූල්‍ය උත්පාදන ඒකකයෙහි ආපසු අයකරගත හැකි වටිනාකම මණ්ඩලය විසින් ඇස්තමේන්තු කරනු ලැබේ. අවසන් දුබලතා අලාභය හඳුනා ගන්නා ලද අවස්ථාවේ වත්කමෙහි ආපසු අයකර ගත හැකි වටිනාකම නිර්ණය කිරීමට භාවිතා කරන ලද උපකල්පනයන් හි වෙනසක් පවතින්නේ නම් පමණක් පූර්ව වශයෙන් හඳුනාගන්නා ලද දුබලතා අලාභය අවලංගු කෙරේ. වත්කම සඳහා පූර්ව වර්ෂ තුළ අදාළ දුබලතා ආලාභ කිසිවක් හඳුනාගෙන නොතිබියේ නම්, ක්ෂය වීම් අඩු කළ වත්කමෙහි ධාරණ වටිනාකම එහි ආපසු අයකරගත හැකි මුදල ඉක්මවා නොයන අයුරින් හෝ නිශ්චය කරනු ලැබිය යුතුව තිබූ ඊට අදාළ ධාරණ අගය ඉක්මවා නොයන අයුරින් එකී අවලංගු කිරීම සීමා කරනු ලැබේ. එබඳු අවලංගුකිරීම් ආදයම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

2.20. ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

2.20.1. ආයෝජනමය දේපළ තක්සේරු කිරීම

ස්වකීය ආයෝජනමය දේපළවල සාධාරණ අගය නිශ්චය කර ගැනීම පිණිස ආයතනය බාහිර තක්සේරු කරුවෙකු ලවා ඒවා හා සම්බන්ධ තක්සේරු කිරීම් ඉටුකරවා ගනියි. මෙම තක්සේරු කිරීම්, අනාගත කුලී ආදායම්, අපේක්ෂිත නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන වියදම් සහ ප්‍රශස්ත වට්ටම් අනුපාත ඇතුළු උපකල්පන මත පදනම්වී ඇත. මෙහිලා තක්සේරු කරුවා මේ හා සමාන දේපළවල ගණුදෙනු කිරීමේ මිල ගණන් ආශ්‍රිත වෙළඳ පොළ සාක්ෂි පිළිබඳවද අවධානය යොමු කරයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.20.2. මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම භාවිතයට ගනිමින් මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය මෙවලම්හි සාධාරණ අගය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි. වට්ටම් අනුපාත සහ අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු ඇතුළුව යොදාගනු ලැබ ඇති උපකල්පන මගින් එබඳු ශිල්ප ක්‍රම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කරයි. එම කාරණයෙහිලා, එලෙස ලබා ගන්නා සාධාරණ අගය පිළිබඳ ඇස්තමේන්තු ස්වාධීන වෙළඳපළ තත්වයන් සමඟ සංසන්දනය කිරීම මගින් සෑම විටම සනාථ කළ නොහෙන අතර බොහෝ අවස්ථාවලදී ඒවා වහා උපලබ්ධි කර ගැනීමේ හැකියාවක්ද නොමැති විය හැකිය.

2.20.3. දේපළ, පිරියත හා උපකරණ සඳහා ප්‍රශස්ත ප්‍රයෝජ්‍ය ආයුකාල සහ අවශේෂ අගය

ආයතනය ස්වකීය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කරමින් ඉහත අයිතමවල ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ඒවායේ අවශේෂ වටිනාකම් වල ඇස්තමේන්තු ප්‍රශස්තව පවතින්ේන්දැයි වාර්ෂිකව පරීක්ෂා කර බලයි.

2.20.4. ව්‍යාපාර සංකලන සහ පාලනමය නොවන සබැඳියා අත්කර ගැනීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1997 වර්ෂයේදී සීමාසහිත ලංකා ලුණු සමාගමේ කොටස් වලින් 90% ක්වූ ප්‍රමාණයක් අත්කරගෙන ඇත. ඒ හා බැඳි කීර්තිනාමයෙහි වටිනාකම රුපියල් 378,926,440 ක් වශයෙන් ගණනය වන අතර එලෙස එම කොටස් අත්කරගත් දිනයේ සිට බලපැවැත්වෙන ගිණුම් පරිචයන් මත පදනම්ව අදාළ අත්කරගත් දිනයේ සිට ආරම්භ වන 05 අවුරුදු කාලසීමාවක් මුළුල්ලේ එකී කොටස් වටිනාකම ක්‍රමක්ෂය වන බව හඟිනු ලැබ ඇත.

3. ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

පහත ගෙන හැර දක්වා ඇති පරිදි ස්ථාවර වත්කම් ප්‍රතිපත්ති වෙනස් වීමෙන් පැන නගින වෙනස්කම් හැර, මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශවල ගෙනහැර දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සුසංගත ලෙස අදාළ කර යොදා ගෙන ඇත.

3.1. නව ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තිය අනුගමනය කිරීම

3.1.1. පිරිවැය

අ. "ගෘහ භාණ්ඩ හා වැද්දුම්", "වෙනත් වත්කම්" සහ "පරිගණක උපකරණ" යන ස්ථාවර වත්කම් කාණ්ඩවලට ඇතුළත් කිරීම සඳහා සලකා බලනු ලබන නිශ්චිත ආර්ථික වටිනාකමක් හෝ ඊට වැඩි වටිනාකමක් සහිත වත්කමකට අයත් ඒකක අගයයෙහි නිරවද්‍යතාවය.

ආ. ඉහත "අ" විෂයාංකයේ සඳහන් පරිදි කාණ්ඩ තුනෙන් බැහැර කිරීම සඳහා සලකා බලනු ලබන නිශ්චිත ආර්ථික අගයකට වඩා අඩු වත්කමකට අයත් ඒකක අගයේ නිරවද්‍යතාවය.

ඇ. රුපියල් මිලියන 36.7 ක මුදලක් ලෙස ගණනය වන දේපල, පිරියත සහ උපකරණවලට අයත් එක් එක් කාණ්ඩය යටතේ කළමනාකාරීත්වය විසින් තක්සේරු කර නිශ්චය කරනු ලැබ ඇති ඉහත 'ආ' විෂයාංකයේ ප්‍රතිඵලයක් ලෙස වටිනාකම අනුව ඇති කෙරෙන බලපෑමේ නිරවද්‍යතාවය. එහි දක්වා ඇති ආකෘතිය අතීතානුයෝගීව බලපැවැත්වීම නියෝජනය කරන අතර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශවල අංක 22 දරන සටහනෙහි එය හෙළිදරවු කර ඇත.

මෙම ව්‍යාපාර සංකනය පිළිබඳ විස්තර පහත දක්වේ

	සමූහය	
	රු.	රු.
පවරන ලද ප්‍රතිඵලය		470,960,938
හඳුනාගත් ශුද්ධ වත්කම් වල පිළිගන්නා ලද වටිනාකමෙහි සමානුපාතික කොටස		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	31,500,000	
සංචිත	60,534,498	
		92,034,498
කීර්ති නාමය		378,926,440

කීර්ති නාමය පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරනු ලැබ තිබූ හෙයින්, සමාලෝචනයට භාජනය වන වසර තුළ ගිණුම් ද්වයම වෙනුවෙන් ගැළපුම් කිසිවක් නොවීය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

3.1.2 නව ක්ෂයවීම් ක්‍රමයක් අනුගමනය කිරීම

3.1.3 සමුච්චිත ක්ෂය වීම

ඈ. ප්‍රාග්ධනීකරණ පරිසීමාව ලෙස අදාළ කර ගන්නා ලද අගයට වඩා පහළින් සපයා ඇති හා එක් එක් වත්කම එල්ලේ සඳහන් කර ඇති ක්ෂය වීම් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 25.9 ක මුදලෙහි තහවුරු කර ගන්නා ලද වටිනාකමෙහි නිරවද්‍යතාවය.

3.1.4 ගිණුම්කරණයේ සටහන්

ඉ. ඉහත 'ඇ' සහ 'ඈ' යන විෂයාංකවල දක්වා ඇති පරිදි යෝක්ත අගයන් සමග අනුරූප වන තක්සේරු කරන ලද බලපෑමේ අදාළ අගයන් 2022 වර්ෂය තුළ මණ්ඩලයේ ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට නියමිත ය. අගයන් තීරණය කිරීම සඳහා අදාළ කර ගන්නා ලද මිනුම්, "ලංකා ගිණුම් ප්‍රමිති - 8 : ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ වැරදි" සමග අනුකූල වේ.

2022 ජනවාරි මස 1 වන දින සිට දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අදාළ ගිණුම් ඇතුළත් කිරීම් පහත දැක්වෙන පරිදි වේ;

	හර (Rs.)	බැර(Rs.)
01. 2022-01-01 දිනට රඳවාගත් ලාභය		36,778,682
ගෘහ භාණ්ඩ සහ වැද්දුම්	28,835,561	
පරිගණක උපකරණ	7,943,121	
(ඉකුත් වසරේ ප්‍රාග්ධනීකරණය කර ඇති කාර්යාල උපකරණ සහ පරිගණක උපකරණ අයිතම හඳුනා නොගැනීම සඳහා ඊට ගැළපුම් අවශ්‍ය වේ.)		
02. ගෘහ භාණ්ඩ සහ වැද්දුම්	22,507,762	
ගෘහ භාණ්ඩ සහ වැද්දුම්	3,402,380	
2022-01-01 දිනට රඳවාගත් ලාභය		25,910,142
(ඉකුත් වසරේ ප්‍රාග්ධනීකරණය කර ඇති කාර්යාල උපකරණ සහ පරිගණක උපකරණ අයිතම මත ක්ෂය වීම් හඳුනා නොගැනීම සඳහා ඊට ගැළපුම් අවශ්‍ය වේ.)		

3.1.5 ක්ෂය වීමේ ක්‍රමයෙහි වෙනස

ඊ. නව ක්ෂයවීම් ක්‍රමයකට, එනම්, අවකරණ ශේෂ ක්‍රමයේ සිට සරල රේඛා ක්‍රමයට සංක්‍රමණය වීමේ ප්‍රතිඵලයක් ලෙස, 2022 ජනවාරි 01 දිනට ප්‍රකාශිත පරිදි දේපල, පිරියත සහ උපකරණ වල ලියා අඩු කළ අගය මත පදනම්ව 2020 වර්ෂය සඳහා වූ ක්ෂයවීම් ගණනය කිරීම සිදු කළ යුතු ය. එසේම, සම්මත කරන ලද නව ගිණුම්කරණ ප්‍රතිපත්තියේ දක්වා ඇති වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාල සීමාවන් (2.7 වන සටහන බලන්න) 2022 ජනවාරි මස 01 වන දිනට ලියා අඩු කළ අගයන් මත පදනම්ව, 2022 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ කර ගනු ලැබේ.

4 සාමාජික අරමුදලට කළ ගැළපුම්

4.1 2022 සාමාජික අරමුදලට කළ ගැළපුම්

ගැළපුමෙහි ස්වභාවය	රුපියල් '000
සසඳන ලද දායකත්ව මුදල්	(66.64)
වැඩිපුර ගෙවීම් ආපසු ගෙවීම	(2,189.60)
සාමාජික අරමුදලේ ලාභාංශ	6,738,389.35
ප්‍රතිලාභ ආපසු ගෙවීම (චෙක්පත්)	50.18
ප්‍රතිලාභ ආපසු ගෙවීම (පත්‍රිකා)	279.70
මුළු ගැළපුම	6,737,462.99

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
		රු. '000	රු. '000	රු. '000	රු. '000
5 පොළි ආදායම					
පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන	5.1	46,442,799	34,121,505	46,316,209	34,095,154
		46,442,799	34,121,505	**46,316,209**	34,095,154
5.1 පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන					
ස්ථාවර තැන්පත් පොළි		243,624	2,151,225	119,880	2,124,874
ණයකර පොළි		948,986	840,747	948,986	840,747
භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිලාභ		42,701,855	30,803,220	42,701,855	30,803,220
භාණ්ඩාගාර බිල්පත් මත ආන්තිකය		2,017,212	–	2,017,212	–
ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් පොළි		430,393	179,432	430,393	179,432
මුදල් වෙළඳපොළ පොළි		4,080	1,228	4,080	1,228
විදුලි බල ව්‍යාපෘති බැඳුම්කර පොළී		–	32,683	–	32,683
වියන නිවාස ණය පොළි		71,527	88,376	71,527	88,376
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළි		9,440	7,984	9,440	7,984
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතුව මත පොළි		398	162	398	162
සේවක ණය					
විශේෂ ණය මත පොළිය		598	621	598	621
වාහන ණය මත පොළිය		5,550	7,961	5,550	7,961
විශේෂ ආපදා ණය මත පොළිය		8,741	7,121	5,896	7,121
විශේෂ උත්සව ණය මත පොළිය		180	200	180	200
විශේෂ අත්තිකාරම් මත පොළිය		215	544	215	544
		46,442,799	34,121,505	**46,316,209**	34,095,154
6 ශුද්ධ වෙළඳ ආදායම					
ශුද්ධ ආදායම	6.1	2,652,579	1,438,761	–	–
(–) විකුණුම් පිරිවැය		(1,355,717)	(1,151,995)	–	–
		1,296,862	286,766	–	–
6.1 ශුද්ධ ආදායම					
දළ ආදායම		2,983,285	1,553,862	–	–
(–) එකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද		(330,707)	(115,101)	–	–
		2,652,579	1,438,761	–	–
7 ලාභාංශ ආදායම					
කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත		722,744	524,624	722,744	524,624
ඒකක මත ලාභාංශ - ලැයිස්තුගත		–	721		721
කොටස් මත ලාභාංශ - ලැයිස්තුගත නොවන		14,175	30,768	14,175	30,768
		736,919	556,112	**736,919**	556,112
8 ලාභ හෝ අලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/ (අලාභ)					
මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ		23,677	385,604	23,677	385,604
කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම		(1,399,459)	164,931	(1,399,459)	164,931
		(1,375,782)	550,535	**(1,375,782)**	550,535
9 වෙනත් ආදායම					
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම		3,969	1,238	2,256	–
කුලී ආදායම		1,900	1,344	363	260
ලිබඩු සහ උපකරණ විකිනීම් මත ලාභය		1,544	915	105	(31)
අධිභාර		373,436	201,782	373,436	201,782
සේවක ණය ආදායම		26,531	37,615	26,531	37,615
විවිධ ආදායම		15,391	33,610	5,790	9,300
රථගාලෙන් ලද ලාභය/ (පාඩුව) නවම් මාවත		38,926	42,456	38,926	42,456
නිවාඩු නිකේතනයෙන් ලද ලාභය/ (අලාභය)		(2,813)	(3,287)	(2,813)	(3,287)
ප්‍රවාහන අයකිරීම්		15,015	7,917	–	–
		473,899	323,589	**444,592**	288,094

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
10 කාර්ය මණ්ඩල වියදම්	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
වැටුප් හා වේතන	10.1	794,868	740,943	732,254	683,399
කොටිකාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ	10.2	698,484	514,478	472,424	424,703
නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම	10.3	72,895	36,440	70,890	33,568
වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ	10.4	124,025	130,498	116,786	122,666
		1,690,272	1,422,359	**1,392,354**	1,264,336
10.1 වැටුප් හා වේතන					
සේවක පිරිවැය (අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු ඇතුළුව)					
වැටුප්		655,532	605,968	598,118	552,333
අධ්‍යක්ෂක ගාස්තු		3,157	2,158	1,569	1,433
ජීවන වියදම් දීමනාව		87,785	90,864	87,785	90,864
ආහාර දීමනාව		13,649	9,754	13,649	9,754
අතිකාල		25,200	23,638	21,587	20,455
නිවාඩු දින ගෙවීම්		9,546	8,561	9,546	8,561
		794,868	740,943	**732,254**	683,399
10.2 කෙටි කාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ					
පුහුණු සහ සංවර්ධන වියදම්		4,215	3,851	4,215	3,797
බඳවා ගැනීමේ වියදම්		–	1,025	–	1,025
සේවක සුභසාධනය		57,961	47,364	37,285	32,869
දිරිදීමනා		137,707	112,601	137,573	112,304
ලබානොගත් නිවාඩු සඳහා ගෙවීම්		33,775	23,766	33,775	23,766
ප්‍රසාද දීමනා		307,984	180,382	103,408	106,165
වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය		120,385	97,197	119,713	96,484
සේවක ණය පිරිවැය		26,531	37,615	26,531	37,615
නිවාස ණය මත පොළ		9,805	10,678	9,805	10,678
සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය		120	–	120	–
		698,484	514,478	472,424	424,703
10.3 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම					
පොළි පිරිවැය		24,872	22,929	24,872	22,929
වර්තමාන සේවා පිරිවැය		48,023	13,511	46,018	10,639
		72,895	36,440	**70,890**	33,568
10.4 වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ					
සේවක අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ දායකත්වය		103,040	108,517	97,249	102,252
සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ දායකත්වය		20,898	21,981	19,450	20,414
විශ්‍රාම අරමුදල් දායකත්වය		88	–	88	–
		124,025	130,498	**116,786**	122,666
11 පරිපාලන වියදම්					
ගොඩනැගිලි කුලී		161,497	173,088	145,347	162,591
වරිපනම්		614	829	16	377
විදුලි ගාස්තු		24,002	19,840	15,535	13,658
දුරකථන ගාස්තු		10,539	12,504	9,047	10,968
ජල ගාස්තු		1,212	1,174	1,212	1,174
උපදේශන ගාස්තු		6,248	2,447	748	430
විගණන ගාස්තු		3,133	4,980	1,849	1,566
ආරක්ෂක වියදම්		4,837	5,594	4,837	5,594
නීති ගාස්තු		876	519	528	174
කුලී ගාස්තු		4,199	12,358	4,199	12,358
ලේකම් වියදම්		120	120	120	120
තැපැල් ගාස්තු හා විදුලි පණිවිඩ		2,078	1,456	1,532	1,139
ගමන් වියදම් සහ සංයුක්ත දීමනාව		252	247	252	247
මුද්‍රණය හා ලිපිද්‍රව්‍ය		3,282	2,981	2,840	2,595
මාධ්‍ය හා ප්‍රචාරණය		1,499	892	–	
වෙළඳ දැන්වීම් සහ පුවත් දැන්වීම්		3,975	2,015	3,975	2,015
වාහන රක්ෂණාවර හා බලපත්‍ර ගාස්ත		2,273	1,964	2,273	1,964
පුවත්පත් හා සඟරා		630	398	505	309
පරිත්‍යාග		72	–	–	–
වෙනත් රක්ෂණ		22	18	22	18
කාර්යාල නඩත්තුව සහ අවශ්‍යතා		3,640	2,126	192	210
සේවක වන්දි ගෙවීම		33,445	417	–	–
මුද්දර ගාස්තු සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු		46	166	46	166
විවිධ වියදම්		5,712	14,869	5,712	14,869
පරිභෝජනය කල හැකි		792	–	792	–
සේවක අයකිරීම් කපා හැරීම		–	1,431	–	1,431
වාහන අලුත්වැඩියාවන් සහ නඩත්තුව		28,037	23,888	7,294	5,669
ඉන්ධන ගාස්ත		17,461	8,298	17,461	8,298
ගොඩනැගිලි නඩත්තුව		21,449	20,435	21,449	20,435
යන්ත්‍ර, ලීබඩු හා උපකරණ නඩත්තුව		4,632	3,919	4,510	3,482
		346,572	318,975	**252,293**	271,857

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
12 මූල්‍ය වියදම්					
භාරකාර ගාස්තු		1,539	1,517	1,539	1,517
බැංකු ගාස්තු		2,647	2,300	2,158	2,138
පොළි වියදම්		128	2,334	-	-
		4,314	6,151	**3,697**	3,656
13 සාමාජික වියදම්					
සාමාජික ප්‍රතිලාභ	13.1	477,055	440,912	477,055	440,912
සාමාජික සේවා	13.2	47,609	31,190	44,434	28,832
තොරතුරු තාක්ෂණ සේවා	13.3	53,079	24,778	53,079	24,778
		577,743	496,881	**574,568**	494,523
13.1 සාමාජික ප්‍රතිලාභ					
මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය		149,236	100,537	149,236	100,537
නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය		8,762	10,777	8,762	10,777
අක්ෂි කාච බද්ධ කිරීම සඳහා වන යෝජනා ක්‍රමය		4,231	3,481	4,231	3,481
ශ්‍රමසුව රැකවරණ යෝජනා ක්‍රමය		23,477	11,742	23,477	11,742
හෘද සැත්කම් යෝජනා ක්‍රමය		98,048	122,480	98,048	122,480
වකුගඩු බද්ධ කිරීමේ යෝජනා ක්‍රමය		3,646	4,455	3,646	4,455
5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය		86,670	129,405	86,670	129,405
සස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය		102,984	58,035	102,984	58,035
		477,055	440,912	**477,055**	440,912
13.2 සාමාජික සේවා					
තැපැල් ගාස්තු හා විදුලි පණිවිඩ		15,485	10,732	15,485	10,732
ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ ගාස්තු		25,664	16,677	25,664	16,677
සාමාජික ආශ්‍රිත වියදම්		109	98	109	98
සේවකයන් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය		-	8	-	8
ගමන් වියදම් හා සංයුක්ත දිමනා		6,315	3,054	3,140	696
මාධ්‍ය හා ප්‍රචාරන		35	425	35	425
ශිෂ්‍යත්ව වියදම්		1	196	1	196
		47,609	31,190	**44,434**	28,832
13.3 තොරතුරු තාක්ෂණ සේවා					
දෘඩාංග නඩත්තුව		3,289	2,433	3,289	2,433
මෘදුකාංග නඩත්තුව		8,549	882	8,549	882
ක්ෂය කිරීම්		23,703	13,703	23,703	13,703
රක්ෂණ		372	-	372	-
කල්බදු සම්බන්ධතා මත කුලිය		17,165	7,760	17,165	7,760
		53,079	24,778	**53,079**	24,778
14 ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂය					
දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම		54,125	57,192	36,063	39,973
කල්බදු ඉඩම් හා සංවර්ධන කටයුතු ප්‍රාද්ධනීකරණය කිරීම්		875	875	-	-
ජෙවය වත්කම් මත ක්ෂය වීම/ ක්‍රමක්ෂය		1,103	443	-	-
		56,103	58,511	**36,063**	39,973
15 අපහායනය අයකිරීම/ ප්‍රතිවර්ථනය					
ණයකර මත අපහායනය		75,155	717	75,155	717
රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ තැන්පතු මත අපහායනය		931	(79)	931	(79)
එන් ඩි බි තැන්පතු මත අපහායනය		438	(162)	438	(162)
ස්ථාවර තැනපතු මත අපහායනය		295	-	-	295
		76,820	476	**76,820**	476

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා			ලංකා ලුණු සමාගම	
			2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
			රු. '000	රු. '000
16 වෙනත් වියදම්				
අලෙවි ප්‍රවර්ධන වියදම්			30,048	15,156
ජාතිය ගොඩනැගීමේ බදු වියදම්			21,318	37
මුදල් වංචා සඳහා අලාභ වෙන්කිරීම්			–	–
දඩුවම් සහ අධිභාර			–	4
ජෛව විද්‍යාත්මක වත්කම්වල වියදම්			4,165	3,237
ජංගම නොවන අයිතමවල වියදම්			–	–
පාරිසරික වැඩ			16,469	18,911
සංචාරක බංගලාව නඩත්තුව			7,947	10,014
ලුණු කෞතුකාගාර වියදම්			2,735	1,681
සනීපාරක්ෂණ සේවා			13,751	14,261
ඉවත දැමිය හැකි වත්කම් සඳහා පාඩු			–	–
ආර්ටිමිය (Artimea) වියදම්			746	2,537
සේවාස්ථාන වියදම්			9,153	7,573
බණිජ බදු වියදම්			14,697	7,554
			121,030	80,964

			සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
			2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
			රු. '000	රු. '000
17 ආදායම් බදු වියදම්				
බදුගෙවීමට පෙර ගිණුම් කරණ ලාභ/ (අලාභ)			43,419,857	33,159,496
නිදහස් කිරීම සහ වෙනත් ආදායම් මූලාශ්‍ර			1,217,350	(695,338)
අනුමත කලනොහැකි වියදම්			1,042,212	368,655
අවසරලත් වියදම්			(37,159)	(38,309)
ආයෝජනයෙන් තක්සේරු කළහැකි ආදායම			**45,642,259**	32,794,503
දළ ආදායම් බදු වියදම @ 14%			6,389,916	4,591,230
නිදහස් කරන ලද ආදායම මත බදු			59,510	(1,091)
වර්ථමාන ආදායම් බදු වියදම			**6,449,427**	4,590,140

			ලංකා ලුණු සමාගම	
			2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
			රු. '000	රු. '000
මෙහෙයුම්වලින් බදු පෙර ගිණුම්කරණ ලාභය/ (අලාභය)			915,699	39,117
බදකරණය සඳහා අනුමත කලනොහැකි වියදම්			(76,796)	130,363
බදකරණය සඳහා අනුමත කලහැකිවියදම්			–	281,779
වසර සඳහා හිමිකම (මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%)			–	–
බදු අලාභ ප/ගෙ			(222,280)	(302,371)
බදු අලාභ ඉ/ගෙ			–	(222,280)
ව්‍යාපාර ආදායම මත බදු කළහැකි ලාභය			616,623	–
පොළි ආදායම මත බදු කළහැකි ලාභය			126,590	22,256
ශුද්ධ බදුකළහැකි ලාභය/ (අලාභය)			**743,213**	22,256
වර්ථමාන බදු වියදම				
01/01/2022 සිට 30/06/2022 දක්වා				
ව්‍යාපාර අදායම මත අදායම් බදු	308,312	18%	55,496	5,341
ආයෝජන ආදායම මත ආදායම් බදු	63,295	24%	15,191	–
01/07/2022 සිට 31/12/2022 දක්වා				
ව්‍යාපාර අදායම මත අදායම් බදු	308,312	30%	92,493	–
ආයෝජන ආදායම මත ආදායම් බදු	63,295	30%	18,989	–
වර්තමාන ආදායම් බදු ගාස්තු			**182,169**	5,341
විලම්බිත ආදායම් බදු				
විලම්බිත බදුකරණ අයකිරීම / (ප්‍රතිවර්ථනය)			31,598	7,802
ආදායම් ප්‍රකාශය තුල වාර්තාකළ ආදායම් බදු වියදම			**213,767**	13,144

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	සටහන	සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
		රු. '000	රු. '000	රු. '000	රු. '000
18 FVTPL මූල්‍ය වත්කම්					
ප්‍රකාශිත කොටස් ආයෝජනය (වෙළෙඳ)		2,887,168	3,622,159	2,887,168	3,622,159
		2,887,168	3,622,159	**2,887,168**	3,622,159
19 පරිපාලිත සමාගමේ ආයෝජන					
ලංකා ලුණු සමාගම		–	–	470,961	470,961
		–	–	470,961	470,961
20 වෙනත් විස්තරාත්මක ආදායම් තුළින් සාධාරණ අගයට (FVOCI) මූල්‍ය වත්කම්					
ප්‍රකාශිත කොටස් ආයෝජනය - දිගුකාලීන		8,440,195	10,316,891	8,440,195	10,316,891
ප්‍රකාශිත නොකළ කොටස් ආයෝජනය		3,908	2,931	3,908	2,931
ප්‍රකාශිත ඒකක		202,475	241,671	202,475	241,671
පොරොන්දු නෝට්ටු		12,174	12,174	12,174	12,174
අඩුකලා: පොරොන්දු නෝට්ටු මත හානිකරණය		(12,174)	(12,174)	(12,174)	(12,174)
		8,646,578	10,561,493	**8,646,578**	10,561,493
21 ක්‍රමක්ෂය පිරිවැයට ගෙවා ආ මූල්‍ය වත්කම්					
භාණ්ඩාගාර බැඳුම්කර		408,626,726	352,543,991	408,626,726	352,543,991
භණ්ඩාගාර බිල්පත්		22,152,226	–	22,152,226	–
ප්‍රකාශිත - ණයකර		7,177,346	7,378,301	7,177,346	7,378,301
අඩුකලා - ණයකරමත අපහායනය		(84,052)	(8,897)	(84,052)	(8,897)
ස්ථාවර තැන්පතු		1,716,541	29,007,972	552,554	28,492,037
අඩුකලා: ස්ථාවර තැනපතු මත අපහායනය		(295)	–	(295)	–
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම		1,987,586	3,454,220	1,987,586	3,454,220
ප්‍රකාශ නොකළ ණයකර		2,232,315	2,232,315	2,232,315	2,232,315
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු යෝජනා ක්‍රමයේ තැන්පතුව		374,800	396,162	374,800	396,162
අඩුකලා: රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතුව මත අපහායනය		(1,284)	(353)	(1,284)	(353)
එන්ඩීබී යෝජනා ක්‍රමයේ තැන්පතුව		682,188	810,226	682,188	810,226
අඩුකලා: එන්ඩීබී තැන්පතුව සඳහා අපහායනය		**(835)**	(397)	**(835)**	(397)
කාර්ය මණ්ඩල ණය					
විශේෂ ණය		36,483	28,708	36,483	28,708
විශේෂ ආපදා ණය		360,150	311,110	305,453	307,380
උත්සව අත්තිකාරම්		527	403	527	403
විශේෂ උත්සව ණය		1,212	1,074	1,212	1,074
විශේෂ අත්තිකාරම්		34	2,514	34	2,514
වාහන ණය		265,506	284,628	265,506	284,628
ගංවතුර සහන ණය		–	5	–	5
		445,527,175	396,441,984	**444,308,492**	395,922,319
22 වෙනත් වත්කම්					
උපචිත ආදායම	22.1	–	–	–	
ලැබීම් හා පෙර ගෙවීම්	22.2	3,277,006	3,165,656	3,190,888	3,112,767
තොග	22.3	566,315	244,236	15,248	7,057
		3,843,321	3,409,892	3,206,136	3,119,825
22.1 උපචිත ආදායම					
ලැබියයුතු පොළිය		24,966	24,966	24,966	24,966
අඩුකලා: අඩමාන ආදායම සඳහා වෙන්කිරීම්		**(24,966)**	(24,966)	**(24,966)**	(24,966)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	සටහන	රු. '000	රු. '000	රු. '000	රු. '000
22.2 ලැබීම් හා පෙර ගෙවීම්					
වෙළෙඳ ණයගැතියෝ		72,149	26,686	-	-
ලැබිය යුතු බදු මුදල්		-	16,642	-	-
ලැබිය යුතු දායක මුදල්		2,999,668	2,722,723	2,999,668	2,722,723
මුදල් ඇණවුම් පාලනය		3,209	4,123	3,209	4,123
තැපැල්මුද්‍රණ යන්ත්‍ර අග්‍රිමය		427	97	427	97
විවිධ ණය ගැතියෝ		13,515	216,646	13,515	216,646
අවිනිශ්චිත		-	52	-	52
පෙර සේවකයන්ගෙන් අයවිය යුතු මුදල්		2,531	2,293	2,531	2,293
ආරක්ෂිත තැන්පතුව		6,572	5,359	6,572	5,359
පෙර ගෙවීම්		45,640	30,172	23,796	20,611
කාර්ය මණ්ඩල පෙර ගෙවුම් ණය පිරිවැය		131,828	125,439	131,828	125,439
ලැබියයුතු ලාභාංශ		-	-	7,875	-
අත්තිකාරම් ගෙවීම		1,466	15,424	1,466	15,424
		3,277,006	3,165,656	**3,190,888**	3,112,767
22.3 තොග					
පොදු ලුණු තොග		325,486	152,272	-	-
ආර්ටිමිය (Artimea Stock) තොග		652	139	-	-
නොනිමි වැඩ		44,484	25,491	-	-
පාරිභෝගික භාණ්ඩ සහ අමතර කොටස		1,800	149	-	-
ලිපිද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ		192,311	64,603	13,666	5,475
පුස්තකාලය		272	272	272	272
නිවාඩු නිකේතන ඉන්වෙන්ට්‍රිය		1,310	1,310	1,310	1,310
		566,315	244,236	**15,248**	7,057

23. දේපළ, පිරිවැය සහ උපකරණ

23.1 සමූහය

රු. '000

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	ඉඩම්	ගොඩනැගිලි	මොටර් වාහන	පරිගණක උපාංග	ලිබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	බදු අයිතිය මත ගොඩනැගිලි	යන්ත්‍ර උපකරණ	කල්බදු කළ මොටර් වාහන	භාරකාර සේවා වත්කම්		සංවර්ධන කාර්යයන්	ඉදිරියට කරගෙන යන ඉදිකිරීම්	එකතුව
									නොමේරූ වගාවන්	මේරූ වගාවන්			
පිරිවැය													
2020 ජනවාරි 1 දිනට ශේෂය	20,000	38,526	442,148	223,223	207,571	599,751	276,558	48,544	11,618	19,035	317,293	26,646	2,230,914
එකතුකිරීම්	–	–	18	11,250	12,496	12,860	2,263	–	–	–	8,957	(25,389)	22,455
ගැලපීම්	–	–	–	–	272	–	–	–				–	272
අපහරණයන්	–	–	(290)	–	(3,849)		(1,964)	–	–	–	–	–	(6,103)
ප්‍රත්‍යාගණන/ මාරු කිරීම	–	–	10,014		–			(10,014)		–	–		–
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	–	–	–	(3,039)	(676)	–							(3,715)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**38,526**	**451,891**	**231,434**	**215,814**	**612,612**	**276,857**	**38,530**	**11,618**	**19,035**	**326,250**	**1,257**	**2,243,823**
2021 ජනවාරි 1 දිනට ශේෂය	20,000	38,526	451,891	231,434	215,814	612,612	276,857	38,530	11,618	19,035	326,250	1,257	2,243,823
එකතුකිරීම්	–	–	9,370	15,481	15,120	298	23,531		–		–	300	64,099
ගැලපීම්	–	–	–	–	–	–	–	–	–		–	–	–
අපහරණයන්	–	–	–	–	(36)	–	–	–	–	–	–	–	(36)
ප්‍රත්‍යාගණන/ මාරු කිරීම	–	–	25,693	–	–	–	–	(25,693)	–	–		–	
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම		–	–	–	–	–	–	(4,904)	–	(28,159)		–	(33,063)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**38,526**	**486,954**	**242,011**	**202,739**	**612,909**	**300,388**	**12,837**	**11,618**	**19,035**	**326,250**	**1,556**	**2,274,823**
2022 ජනවාරි 1 දිනට ශේෂය	20,000	38,526	486,954	242,011	202,739	612,909	300,388	12,837	11,618	19,035	326,250	1,556	2,274,823
2022 ජනවාරි 1 දිනට සමුච්චිත ක්ෂයවීම්		(1 4,906)	(185,508)	(164,967)	(68,983)	–	3,493	–	–	–	–	–	(430,870)
එකතුකිරීම්	–	–	–	86,863	18,071	93			–		–	11,882	116,910
ගැලපීම්		–	17,946	–	–	–	–	(12,837)	(543)	(209)	–	–	4,357
අපහරණයන්		–	(1,438)	(174)	(3,547)	(16)	(9,241)		–	–	–		(14,416)
ප්‍රත්‍යාගණන/ මාරු කිරීම	–	–	–	–	–	–	–	–	–	–	–	(5,283)	(5,283)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**23,620**	**317,954**	**163,733**	**148,280**	**612,987**	**294,641**	**–**	**11,075**	**18,826**	**326,250**	**8,156**	**1,945,521**

ලිඛිත ප්‍රකාශන සඳහා සටහන්

රු '000

සමූහය 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	ඉඩම්	ගොඩනැගිලි	මොටර් වාහන	පරිගණක උපාංග	ලීබඩු සවිකිරීම් හා කාර්යාලීය උපකරණ	බදු අයිතිය මත ගොඩනැගිලි	යන්ත්‍ර උපකරණ	කල්බදු කළ මොටර් වාහන	භාරකාර සේවා වත්කම්		සංවර්ධන කාර්යයන්	ඉදිරියට කරගෙන යන ඉදිකිරීම්	එකතුව
									නොමේරූ වගාවන්	මේරූ වගාවන්			
සමුච්චිත ක්ෂය කිරීම													
2020 ජනවාරි 1 දිනට ශේෂය	-	11,703	241,829	115,140	132,865	135,570	159,962	17,908	-	1,459	154,709	-	971,147
වසර සඳහාවූ ක්ෂය අයකිරීම	-	1,559	46,709	36,538	13,983	14,996	23,837	4,173	-	381	55,833	-	198,008
අපහරණයන්	-	-	(269)	-	(3,212)	-	(1,814)	-	-	-	-	-	(5,295)
මාරු කිරීම	-	-	6,427	-	-	-	-	(6,427)	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-	-	-	(892)	(1,052)	-	-	-	-	-	-	-	(1,944)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**13,262**	**294,696**	**150,786**	**142,584**	**150,566**	**181,985**	**15,655**	**-**	**1,839**	**210,542**	**-**	**1,161,916**
2021 ජනවාරි 1 දිනට ශේෂය	-	13,262	294,695	150,786	142,585	150,566	181,985	15,655	-	1,839	210,542	-	1,161,916
වසර සඳහාවූ ක්ෂය අයකිරීම	-	1,644	35,788	16,691	- 13,232	15,272	22,707	3,685	-	443	53,439	-	162,900
අපහරණයන්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
මාරු කිරීම	-	14,533	-	-	-	-	-	(14,533)	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-	-	-	(2,510)	(21,456)	-	-	-	-	-	-	-	(23,966)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**14,906**	**345,016**	**164,967**	**134,361**	**165,838**	**204,692**	**4,806**	**-**	**2,282**	**263,981**	**-**	**1,300,849**
2022 ජනවාරි 1 දිනට ශේෂය	-	14,906	345,016	164,967	134,361	165,838	204,692	4,806	-	2,282	263,981	-	1,300,849
2022 ජනවාරි 1 දිනට සමුච්චිත ක්ෂයවීම්	-	(14,906)	(198,619)	(164,967)	(63,093)	15,276	23,245	1,284	-	- 377	27,972	-	(373,432)
වසර සඳහා ක්ෂයවීම් ගාස්තු	-	591	26,189	28,500	6,832			(6,090)	-	(25)	-	-	55,997
මාරුකිරීම	-	-	(1,438)	-	(2,078)	(2)	(8,171)	-	-	-	-	-	(11,689)
අපහරණයන්	-	-	-	(29)	(7)	-	-	-	-	-	-	36)	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**591**	**172,586**	**28,500**	**78,100**	**181,114**	**227,937**	**(0)**	**-**	**2,634**	**291,953**	**-**	**971,689**
ශුද්ධ පොත් අගය													
2021 ජනවාරි 1 දිනට	20,000	25,264	157,195	80,648	73,229	462,045	94,872	22,875	11,618	17,195	115,708	1,257	1,081,908
2021 දෙසැම්බර් 31 දිනට	20,000	23,620	141,937	77,044	68,378	447,071	95,696	8,031	11,618	16,752	62,269	1,556	973,974
2022 දෙසැම්බර් 31 දිනට	**20,000**	**23,030**	**145,368**	**135,233**	**70,180**	**431,873**	**66,703**	**0**	**11,075**	**16,192**	**34,297**	**8,156**	**973,832**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

23.2 මණ්ඩලය

රු '000

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	පරිගණක උපාංග	ලීබඩු හා වෙනත් උපකරණ	එකතුව
2020 ජනවාරි 1 දිනට ශේෂය	**20,000**	**38,526**	**313,993**	**223,223**	**119,438**	**715,180**
එකතුකිරීම්	-		-	11,250	6,418	17,668
ගැලපීම්	-		-	-	272	272
අපහරණයන්	-		-		(36)	(36)
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-		-	(3,039)	(676)	(3,715)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**38,526**	**313,993**	**231,434**	**125,416**	**729,369**
2021 ජනවාරි 1 දිනට ශේෂය	**20,000**	**38,526**	**313,993**	**231,434**	**125,416**	**729,369**
එකතුකිරීම්	-	-	-	15,481	4,212	19,693
ගැලපීම්	-	-	-	-	-	-
අපහරණයන්	-	-	-	-	(36)	(36)
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-		-	(4,904)	(28,159)	(33,063)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**38,526**	**313,993**	**242,011**	**101,433**	**715,963**
2022 ජනවාරි 1 දිනට ශේෂය	**20,000**	**38,526**	**313,993**	**242,011**	**101,433**	**715,963**
2022 ජනවාරි 1 දිනට සමුච්චිත ක්ෂයවීම		(14,906)	(213,498)	(164,967)	(68,983)	(462,353)
එකතුකිරීම්	-	-	-	86,863	13,021	99,885
ගැලපීම්	-	-	-	-	-	-
අපහරණයන්	-	-	-	(174)	(79)	(254)
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**20,000**	**23,620**	**100,495**	**163,733**	**45,393**	**353,241**
සමුච්චිත ක්ෂයවීම්						
2020 ජනවාරි 1 දිනට ශේෂය	-	11,703	147,442	115,140	76,682	350,967
වර්ෂය සඳහා ක්ෂයවීම් ගාස්තු	-	1,559	37,172	36,538	7,586	82,855
අපහරණයන්	-	-	-	-	(12)	(12)
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-	-	-	(892)	(1,052)	(1,944)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**13,262**	**184,614**	**150,786**	**83,204**	**431,866**
2021 ජනවාරි 1 දිනට ශේෂය	**-**	**13,262**	**184,613**	**150,786**	**83,205**	**431,866**
වර්ෂය සඳහා ක්ෂයවීම් ගාස්ත	-	1,644	28,885	16,691	7,234	54,453
අපහරණයන්	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
ප්‍රග්ධනිකරණ ප්‍රතිපත්ති වෙනස්කිරීම මත බලපෑම	-	-	-	(2,510)	(21,456)	(23,966)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**14,906**	**213,498**	**164,967**	**68,983**	**462,353**
2022 ජනවාරි 1 දිනට ශේෂය	**-**	**14,906**	**213,498**	**164,967**	**68,983**	**462,353**
2022 ජනවාරි 1 දිනට සමුච්චිත ක්ෂයවීම්	-	(14,906)	(213,498)	(164,967)	(68,983)	(462,353)
වසර සඳහා ක්ෂයවීම් ගාස්තු	-	591	20,099	28,500	6,832	56,022
අපහරණයන්	-	-	-	(29)	(7)	(36)
ප්‍රත්‍යාගණන	-	-	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**591**	**20,099**	**28,471**	**6,825**	**55,986**
ශුද්ධ පොත් අගය						
2021 ජනවාරි 1 දිනට	20,000	25,264	129,379	80,648	42,212	297,503
2021 දෙසැම්බර් 31 දිනට	20,000	23,620	100,495	77,044	32,450	253,610
2022 දෙසැම්බර් 31 දිනට	**20,000**	**23,030**	**80,396**	**135,262**	**38,568**	**297,256**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	සටහන්	රු. '000	රු. '000	රු. '000	රු. '000
24 කල්බදු දේපල					
පිරිවැය					
ජනවාරි 1 දිනට		20,910	20,910	–	–
එකතු කිරීම්		–	–	–	–
දෙසැම්බර් 31 දිනට		20,910	20,910	–	–
සමුච්චිත ක්‍රමක්ෂය					
ජනවාරි 1 දිනට ශේෂය		18,819	18,122	–	–
වසර සඳහා අයකිරීම		697	697	–	–
දෙසැම්බර් 31 දිනට ශේෂය		19,516	18,819	–	–
දෙසැම්බර් 31 දින ශුද්ධ පොත් අගය		**1,394**	2,091	**–**	**–**
25 අස්පෘශ්‍ය වත්කම්					
ජනවාරි 1 දිනට ශේෂය		4,238	1,039	4,238	1,039
එකතු කිරීම්		–	3,199	–	3,199
වසර තුළ ක්‍රමක්ෂය		267	–	267	–
රජයේ ප්‍රදානයෙන් ලද පරිගණක මෘදුකාංග	24.1	4,512	–	4,512	–
දෙසැම්බර් 31 දිනට ශේෂය		**9,017**	4,238	**9,017**	4,238
25.1 රජයේ ප්‍රදානයෙන් ලද පරිගණක මෘදුකාංග					
කාලපරිච්ඡේදය ආරම්භයේදී ශේෂය		–	–	–	–
එකතු කිරීම		6,768	–	6,768	–
ක්‍රමක්ෂය කිරීම		(2,256)	–	(2,256)	–
කාලපරිච්ඡේදය අවසානයේදී ශේෂය		**4,512**	**–**	**4,512**	**–**
26 ආයෝජන දේපල					
ජනවාරි 1 දිනට ශේෂය		4,587,406	4,587,406	4,587,406	4,587,406
දෙසැම්බර් 31 දිනට ශේෂය		**4,587,406**	4,587,406	**4,587,406**	4,587,406

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

27 පොළිය දරණ ණය ගැනීම් ලංකා ලුණු සමාගම

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2022 දෙසැම්බර් 31 දිනට			2021 දෙසැම්බර් 31 දිනට		
	1 වසරක් තුළ නැවත ගෙවිය යුතු ප්‍රමාණය	1 වසරකින් පසු නැවත ගෙවිය යුතු ප්‍රමාණය	එකතුව	1 වසරක් තුළ නැවත ගෙවිය යුතු ප්‍රමාණය	1 වසරකින් පසු නැවත ගෙවිය යුතු ප්‍රමාණය	එකතුව
	(රු. '000)	(රු. '000)	(රු. '000)	(රු. '000)	(රු. '000)	(රු. '000)
මූල්‍ය කල්බදු	–	–	–	1,831	0	1,831
බැංකු අයිරා	11,049	–	11,049	3,073	–	3,073
	11,049	–	11,049	4,904	0	4,904

28 ප්‍රදාන සහ සහනාධාර

	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	රු. '000	රු. '000
කාලපරිච්ඡේදය ආරම්භයේදී ශේෂය	–	–
එකතු කිරීම්	6,768	–
ක්‍රමක්ෂය කිරීම	(2,256)	–
කාලපරිච්ඡේදය අවසානයේදී ශේෂය	4,512	–

	ලුණු සමාගම					
	අයඩයිට් පිරියත	ගොඩනැගිල්ල	පොම්පාගාරය	මෝටර් රථ	එකතුව 2022	එකතුව 2021
	රු. '000	රු. '000	රු. '000		රු. '000	රු. '000
පිරිවැය						
ජනවාරි 1 දිනට	19,515	41,124	1,387	6,500	68,527	68,527
දෙසැම්බර් 31 දිනට	19,515	41,124	1,387	6,500	68,527	68,527
ක්‍රමක්ෂය						
ජනවාරි 1 දිනට	19,515	14,993	509	175	35,192	33,954
වසර තුළ ප්‍රතිවර්ථනය	–	1,028	35	650	1,713	1,238
දෙසැම්බර් 31 දිනට	19,515	16,021	543	825	36,905	35,192
ලියාහල අගය						
දෙසැම්බර් 31 දිනට	–	25,103	844	5,675	31,622	33,335

		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
		රු. '000	රු. '000	රු. '000	රු. '000
29 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම					
ජනවාරි 1 දිනට ආරම්භක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම		476,249	513,974	236,877	286,616
පොළී පිරිවැය		24,872	22,929	24,872	22,929
පවත්නා සේවා පිරිවැය		61,844	28,017	46,018	10,639
ගෙවූ ප්‍රතිලාභ		(41,338)	(43,675)	(37,159)	(38,309)
ආයුගණක බැඳීම් ලාභය/ (අලාභය)		(55,129)	(44,997)	(55,129)	(44,997)
දෙසැම්බර් 31 දිනට අවසන් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම		**466,499**	476,249	**215,479**	236,877
30 ප්‍රවර්ථන බදු බැරකම්					
දළ බදු වගකීම්		6,449,427	4,590,140	6,449,427	4,590,140
(-) ඇස්තමේන්තුගත ආදායම් බදු ගෙවීම		(2,688,549)	(2,240,242)	(2,688,549)	(2,240,242)
(-) පෙර වර්ෂයේ (ඉක්මවන)/කාලය ආරම්භයේදී		(59,510)	–	(59,510)	–
දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු		**3,701,367**	2,349,898	**3,701,367**	2,349,898
31 වෙනත් වගකීම්					
ගෙවිය යුතු ගිණුම් සහ විවිධ ණය හිමියෝ	31.1	542,592	7,148,941	107,206	6,930,925
		542,592	7,148,941	**107,206**	6,930,925

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා		සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
		2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
		රු. '000	රු. '000	රු. '000	රු. '000
31.1 ගෙවිය යුතු ගිණුම් හා විවිධ ණය හිමියෝ					
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	31.1.1	433,169	216,674	-	-
ගෙවූ හිමිකම් සහ ප්‍රතිලාභ මත රඳවාගත් බදු		2,151	1,812	2,151	1,812
හිමිකම් මත ගෙවිය යුතු මුද්දර බදු		1,114	829	1,114	829
ගෙවියයුතු ලාභාංශ		2,217	-	6,740,731	6,739,389
නොගෙවූ චේතන		60	60	60	60
ගෙවිය යුතු මුද්දර බදු		89	106	89	106
ගෙවියයුතු සේවක අර්ථසාධක අරමුදල		12,616	19,775	12,616	19,775
ගෙවිය යුතු සේ නි භා අරමුදල		1,673	2,373	1,673	2,373
විවිධ ණයහිමියෝ		44,230	118,726	44,230	118,726
ආපසු ලැබුණු ප්‍රතිලාභ (චෙක්පත්)		2,470	2,691	2,470	2,691
ආපසු ලැබුණු ප්‍රතිලාභ (සුභසාධන)		891	2,494	891	2,494
ආපසු ලැබුණු ප්‍රතිලාභ (ස්ලිප්)		12,246	12,105	12,246	12,105
නොගෙවූ මරණ ප්‍රතිලාභ		21,432	21,695	21,432	21,695
ගෙවිය යුතු එකතු කල අගය මත ගෙවිය යුතු බදු		401	401	401	401
ඉල්ලුම් නොකළ ශිෂ්‍යත්ව		-	-	1,270	1,270
නොසැසඳෙන ශේෂ		523	456	523	456
පුස්තකාල අරමුදල		58	53	58	53
සේ නි භාර අරමුදලේ සමාජීය වගකීම් ව්‍යාපෘති		207	207	207	207
ආපසු ගෙවිය යුතු තැන්පතු		60	-	60	
ආරක්ෂිත තැන්පතු - රථගාල		6,862	6,164	6,862	6,164
වැටුප් පාලනය		189	-	-	189
වැටුප් අවකරණ නිශ්කාෂණය		91	18	91	18
කලින් ගෙවූ ආදායම		30	109	30	109
		542,592	7,148,941	**107,206**	6,930,925

31.1.1 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු

	ලුණු සමාගම	
	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්		
ගෙවිය යුතු වෙළඳ ශේෂයන්	122,790	30,681
ගෙවිය යුතු ලුණු ප්‍රවාහන ගාස්තු	3,079	4,118
ගෙවිය යුතු තැන්පතු	64,775	61,402
සාමාජ ආරක්ෂණ බදු	8,822	
ගෙවිය යුතු බිම්කුලිය	7,268	4,374
මූල්‍ය නොවන වගකීම්		
උපචිත වියදම්	124,134	48,307
වෙනත් ගෙවිය යුත	26,206	18,600
ගෙවිය යුතු එකතුකල අගය මත බදු	37,261	10,358
ගෙවිය යුතු දිරිදීමනා	473	473
කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල්	38,361	38,361
	433,169	216,674

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

32 විලම්භිත බදු වගකීම්

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	ලුණු සමාගම			
	බදු අරමුණු සඳහා ප්‍රාග්ධන දීමනා	නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්	බදු අලාභවලට ආරෝපිත විලම්බිත බදු	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
2021.01.01 දිනට	109,208	(40,925)	(17,000)	51,283
වසර සඳහා ලාභය හෝ අලාභයට අයකිරීම(බැර)	(7,035)	(2,162)	17,000	7,802
2022.01.01 දිනට	102,172	(43,087)	-	59,085
වසර සඳහා ලාභය හෝ අලාභයට අයකිරීම(බැර)	63,817	(43,087)	(32,219)	59,085
2022.12.31 දිනට	**165,989**	**(75,306)**	**-**	**90,684**

විලම්භිත බදු වගකීම	(165,989)	(102,172)
විලම්භිත බදු වත්කම	75,306	43,087
උපයෝජනය නොකළ ව්‍යාපාර අලාභය ඉ/ගෙ	-	-
ශුද්ධ විලම්භිත බදු වගකීම	**(90,684)**	**(59,085)**


	සමූහය		සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	රු. '000	රු. '000	රු. '000	රු. '000
33 ප්‍රතිපාදන				
විගණන ගාස්තු ගෙවීම් සඳහා ප්‍රතිපාදන	3,000	4,367	3,000	4,367
සේවක අනතුරු වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමය සඳහා පුතිපාදන	800	2,000	800	2,000
ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන	294	241	294	241
නිවාඩු මුදල් ගෙවීම සඳහා ප්‍රතිපාදන	20,703	20,446	20,703	20,446
තැපැල් ගාස්තු ගෙවීම සඳහා ප්‍රතිපාදන	43	136	43	136
උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම සඳහා ප්‍රතිපාදන	147,156	120,216	147,156	120,216
5 වසර ශිෂ්‍යත්ව ගෙවීම සඳහා ප්‍රතිපාදන	235,305	180,600	235,305	180,600
	407,301	328,007	**407,301**	328,007

34 සාමාජික අරමුදල

	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය	
	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31
	රු. '000	රු. '000
ජනවාරි 1 දිනට ආරම්භක සාමාජික අරමුදල් ශේෂය	406,288,901	375,215,484
පෙර වසරේ දායක මුදල් ගැලපීම	6,737,463	(4,750)
ලද දායක මුදල්	34,642,546	29,686,853
දායක මුදල් ආපසු ගෙවීම	(25,019,411)	(19,789,249)
සාමාජික අරමුදල් ශේෂය මත පොළිය	12,679,221	11,553,085
ලාභාංශ	24,301,886	9,627,478
දෙසැම්බර් 31 දිනට අවසන් සාමාජික අරමුදල් ශේෂය	**459,630,606**	406,288,900

2022.12.31 දිනට සාමාජික අරමුදල් ශේෂයෙන් රු.මිලියන 290 ක මුදලක් එක් එක් සාමාජික ගිනුම් වෙත වෙන් කිරීමට නොහැකිවූ මුදලකි.

අතිරේක තොරතුරු



විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ්/එෆ්/ඊටීඑෆ්/1/2022/10 } ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

සභාපති,
සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලය.

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සහ එහි පරිපාලිතයෙහි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ "මණ්ඩලය" සහ එහි පරිපාලිතයෙහි "සමූහය" 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් 1981 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සේවායෝජකයින් 3,912කට අදාලව 2023 අප්‍රේල් 28 දිනට අයකරගෙන තිබූ එකතුව රු.මිලියන 581.35 ක දායක මුදල් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතේ 16(3) වගන්තිය ප්‍රකාරව ඒ ඒ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර නොකර වෙනත් තාවකාලික ගිණුම්වල රඳවා තබාගෙන පැවතුණි. මේ තුළ වසර 07ත් 41 ත් අතර කාලයක සිට පැවත එන ශේෂය රු.මිලියන 97.12 ක් විය.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(3) වගන්තිය ප්‍රකාරව යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් අධිකරණ කටයුතු මගින් 1985 සිට 2022 වර්ෂය දක්වා අයකරගෙන තිබූ රු.මිලියන 1,511.14 ක වටිනාකම වූ දායක මුදල් හා අධිභාර මුදල් වලින් රු.මිලියන 71.25 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට පරිගණක පද්ධතියට අනුව සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වල බැර නොකළ ශේෂය රු.මිලියන 781.05 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 34 යටතේ එම ශේෂය රු. මිලියන 290 ක් ලෙස හෙළිදරව් කර තිබුණි.

(ඈ) මණ්ඩලය වෙත ප්‍රේෂණය කරනු ලබන දායක මුදල් හා අධිභාර මුදල් වලින් සේවායෝජක ආයතනය නිශ්චිතව හඳුනාගත නොහැකි ලැබීම් වාර්තා කිරීම සඳහා වෙනම ගිණුමක් (V999) පවත්වාගෙන යනු ලබන අතර එම ගිණුමෙහි 1982 සිට 2022 වර්ෂය දක්වා කාලය තුලදී එසේ ලද රු.මිලියන 7.59 ක ශේෂයක් දක්නට ලැබුණි. මෙම ශේෂය තුල 1982 සිට 2006 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු.මිලියන 6.22 ක හඳුනාගත නොහැකි ලැබීම් ශේෂයක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

1.3 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත [illegible] ලදී.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වග කිව යුතුය.

  විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරනලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ) යන නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැරයම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මු. රෙ. 394	නිකුත් කර මාස 6 ඉක්මවූ මුළු වටිනාකම රු.මිලියන 1.9 ක් වූ අවලංගු වෙක්පත් 107 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (I) දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 ත් සංශෝධිත ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10 වන වගන්තිය. සමාලෝචිත වර්ෂයේදී ණය ලිපිගොනු 67 කට අදාලව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී අදාළ නිලධාරීන්ට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය රු.මිලියන 16.75 ක් වුවද, චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව රු.මිලියන 41.23 ක් එනම් රු.මිලියන 24.48 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

එක් ප්‍රසම්පාදනයක් ලෙස සැලසුම් නොකර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ප්‍රකාරව ජාතික තරඟකාරී මිල ක්‍රමය අනුගමනය කර වඩාත් තරඟකාරී මිල ගණන් ලබාගතයුතු වුවද අවස්ථා 04 කදී මිල සැදහුම් ක්‍රමය අනුගමනය කර වටිනාකම රු.මිලියන 41.57 ක් වූ ලැප්ටොප් පරිගණක 205 ක් මිලදී ගැනීම සිදු කර තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වටිනාකමින් අඩු මිලදී ගැනීම් සඳහා මිල සැදහුම් ක්‍රමය අනුගමනය කල යුතු වුවත් මේ සඳහා තෝරගත් ප්‍රසම්පාදන ක්‍රමය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

3. වෙනත් කරුණු

(අ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වගන්තිය ප්‍රකාරව අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමින්, අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි වර්ෂයකට සියයට තුනකට නොඅඩු යම් අනුපාතික පොලියක් එකී වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට බැර කළ යුතු වුවද, ඉකුත් වර්ෂ 5 කට අදාලව මණ්ඩලයේ ආයෝජන ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහල ගොස් ඇති නමුත්, සාමාජික ප්‍රතිලාභ මට්ටම වැඩිකිරීම සම්බන්ධයෙන් කළමනාකරණය කටයුතු කර [illegible] 1981 [illegible] සාමාජිකයන්ට [illegible] 3 ක ප්‍රතිලාභ [illegible] තිබුණි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

(ආ) අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබාගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, එකී ලාභාංශ අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට බැර කරනු ලැබිය යුතු බව 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 14 වන වගන්තියේ සඳහන් වේ. මණ්ඩලයේ සාමාජිකයන් සඳහා බෙදා වෙන් කල හැකි ලාභය 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සැසදීමේදී සියයට 181 කින් ඉහළ ගොස් ඇති නමුත් සාමාජිකයන් සඳහා ලබාදෙන ප්‍රතිලාභ ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමකින් ඉහළ දැමීම සම්බන්ධයෙන් මණ්ඩලය අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) දැනට ඇවර කරමින් පවතින සමාගමක පොරොන්දු නෝට්ටුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 12.17 ක් හා ණයකරවල ආයෝජනය කර තිබූ රු.මිලියන 7.45 ක් පිළිවෙලින් 2002 හා 2007 වර්ෂවලදී උපලබ්ධි විය යුතුව තිබුණි. තවද, වනික් සමාගමෙහි ණයකරවල ආයෝජනයෙන් 2006 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු පොළී ආදායම් රු.මිලියන 15.21 ක් හා පොරොන්දු නෝට්ටුවල ආයෝජනයෙන් අයවිය යුතු පොළි ආදායම් රු. 367,724 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පැවතියද 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඈ) වර්ෂ ගණනාවක සිට වැවිලි සමාගමකින් ලැබිය යුතුව පැවති ණයකර පොළී මුදල් වලින් තවදුරටත් ලැබිය යුතු රු.මිලියන 9.39 ක මුදල 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඉ) මණ්ඩලය රජයේ සුරැකුම්පත්වල අරමුදල් ආයෝජනය කරන ප්‍රධාන පෙලේ ආයතනයක් වුවද සුරැකුම්පත් වෙන්දේසි වලදී සෘජුවම මිල ගණන් ඉදිරිපත් කිරීමේ පහසුකම (Direct Bidding Facility) ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබාගෙන නොතිබුණි. 2016 අගෝස්තු 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාථමික ගනුදෙනුකරුවකු (Primary dealer) ලෙස ලියාපදිංචි වන ලෙසට නියෝග කර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එසේ සිදුකර නොතිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,107 ක් සහ තත්‍ය ප්‍රමාණය 923 ක් වූයෙන් පුරප්පාඩු 184 ක් විය. ඒ තුළ ඉහළ කළමනාකරණයට අයත් තනතුරු නාම 39කට අදාල පුරප්පාඩු 70 ක් ද, කළමනාකරණ මට්ටමේ තනතුරු නාම 08 කට අදාල පුරප්පාඩු 84 ක් විය.

(උ) මණ්ඩලයට අයත් නවම මාවතෙහි පිහිටි ඉඩමක පවත්වාගෙන යනු ලබන රථගාලෙන් 2023 අප්‍රේල් 26 දිනට ලැබීමට තිබූ රු.මිලියන 1.73 ක ලැබිය යුතු ශේෂය තුල රු. 455,308 ක මුදලක් අක්‍රිය ආයතන 58 කට අදාලව අයකරගත නොහැකි ශේෂයක් නිරීක්ෂණය විය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

(ඌ) උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ගෙවීම් කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට වෙන්කළ ශේෂය වූ රු.මිලියන 147.16ක තුළ 2019 සහ 2020 වර්ෂවලට අදාලව වෙන්කළ පිළිවෙලින් රු.මිලියන 0.12 ක් හා රු.මිලියන 3.04 ක් තවදුරටත් නිරවුල් කිරීමට පැවතුණි.

(එ) වර්ෂ 1994 සිට 2014 වර්ෂය දක්වා පහ වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ක්‍රමය යටතේ ශිෂ්‍යයන් 73 දෙනෙකු සඳහා නොගෙවූ රු.මිලියන 1.27 ක මුදල අදාල ශිෂ්‍යත්වලාභීන්ට නොගෙවා සමාලෝචිත වර්ෂය තුළදී ආදායමට බැර කර තිබුණි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 2022 දෙසැම්බර් 31 දිනට පහ වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ගෙවීම් කිරීම සඳහා වෙන්කළ ශේෂය වූ රු.මිලියන 235.3 තුළ 2020 හා 2021 වර්ෂවලට අදාලව පිළිවෙලින් වෙන්කළ රු.මිලියන 0.075 ක්, රු.මිලියන 13.6 ක් මුදල් තවදුරටත් නිරවුල් කිරීමට පැවතුණි.

(ඒ) 2022 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 13 ක සිදුකර තිබූ ආයෝජනයන්ගේ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 909.89 ක්වූ කොටස් සඳහා 2022 වර්ෂයේ ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. ඉන් සමාගම් දෙකක් 2015 සිට 2022 වර්ෂය දක්වා නොකඩවා ලාභාංශ ලැබී නොතිබුණු අතර සමාගම් 11 ක් සඳහා 2015 – 2022 දක්වා කාලයට වරින් වර ලාභාංශ කොටසක් පමණක් ලැබී තිබුණි.

(ඔ) මණ්ඩලය විසින් සමාගමක සිදුකරන ලද කොටස් මිලදී ගැනීම් පරීක්ෂාවේ දී 2021 සහ 2022 වර්ෂවලදී පිළිවෙලින් කොටස් 7,106,832 ක සහ කොටස් 615,542 ක ආයෝජනය කර තිබුණි. එම සමාගමෙහි පසුගිය වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේ දී 2017, 2019 සහ 2021 වර්ෂයන්හි දී අලාභ ලැබූ ආයතනයක්ව තිබියදීත් ඒ පිළිබඳව අවධානය යොමු නොකර 2021 සහ 2022 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 64.01 ක් සහ රු.මිලියන 4.99 ක් වැය කර කොටස් මිලදී ගැනීම සිදුකර තිබුණි. තවද, 2022 දෙසැම්බර් විගණන දිනය වන විට මෙම සමාගම කොටස් වෙළඳපොල නීතිරීති වලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් watch list යටතේ දක්වා තිබුණි.

(ඕ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022 වර්ෂයේ පැවැත් වූ වෙන්දේසි අවස්ථා 23 ක දී ඉදිරිපත් කල කාණ්ඩ අංක අතුරින් භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ අංක 28 ක් සඳහා මණ්ඩලය මඟින් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඉන් කාණ්ඩ අංක 12 ක් සඳහා ඉදිරිපත් කල ලංසුවලින් සියයට 50 කට වඩා ලංසු ප්‍රතික්ෂේපවී තිබුණි. එමඟින් අරමුදල් බැඳුම්කර වෙන්දේසියට ඉදිරිපත් කර ඉහළ ඵලදායකට ආයෝජනය කිරීමට තිබූ අවස්ථා අහිමි කර ගෙන තිබූ බව නිරීක්ෂණය විය. මෙහි දී මණ්ඩලයේ GS Committee මඟින් ලංසු ප්‍රතික්ෂේපවීම් පරීක්ෂාවේදී සාධක සලකා බලා තිබුණද, පවත්නා වෙළඳපොළ තත්ත්වයන් ඉක්මවා ඉහළ ඵලදා අනුපාතයකට යාම නිසා මෙසේ ලංසු ප්‍රතිග්‍රහණය අවම වීමටද හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2022

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ලෙස සාමාජිකයන් 1,207 කට අදාලව රු.මිලියන 21.43 ක් ගෙවිය යුතුව පැවතුණි. 1995 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ මියගිය පුද්ගලයන්ට අදාලව ගෙවිය යුතු මරණ ප්‍රතිලාභීන්ගේ කාල විශ්ලේෂණය තුළ වසර 07 ත් 20 ටත් වැඩි කාල පරාසයට අයත් ප්‍රතිලාභීන් 786 කට ගෙවිය යුතු මරණ ප්‍රතිලාභ මුදල රු.මිලියන 8.87 ක් විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 1981 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාලව 2022.12.31 දිනට සේවායෝජකයින් 5,341ක ගෙන් අයකර ගෙන තිබූ රු.මිලියන 781.05ක දායක මුදලින් රු.මිලියන 208.45ක දායක මුදලක් 2023.05.31 දින වනවිට විභජනය කර ඇත. ඒ අනුව තවදුරටත් සේවායෝජකයින් 3,782ක ගෙන් අයකර ගත් රු.මිලියන 572.59ක් සාමාජිකයින් සඳහා විභජනය කලයුතුව ඇත.

වර්ෂය	2022/12/31(රු)	2023/05/31(රු)	ප්‍රගතිය(රු)
1981-2015	97,121,814.00	81,277,523.16	15,844,290.84
2016	19,308,442.00	15,326,037.93	3,982,404.07
2017	33,304,876.00	27,700,283.63	5,604,592.37
2018	54,305,961.00	47,890,315.68	6,415,645.32
2019	80,420,152.00	67,301,477.80	13,118,674.20
2020	142,869,009.00	112,636,870.90	30,232,138.10
2021	353,718,850.00	220,463,387.22	133,255,462.78
එකතුව	781,049,104.00	572,595,896.32	208,453,207.68

(ආ) විගණන විමසුමෙහි සඳහන් විභජනය නොවූ රු.71,248,517ක් වූ මුදල රු.34,231,401ක් වශයෙන් නිවැරදි විය යුතුය. විස්තර පහත දැක්වේ.

	වර්ගීකරණය	වටිනාකම (රු)	ලිපිගොනු සංඛ්‍යාව	ඇමුණුම	වෙනත් කරුණු
1	සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට දැනටම බැර වී ඇති මුදල් (Allocated)	8,726,401.92	31	01	මෙම මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 (3) වගන්තිය ප්‍රකාරව මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර ඇත. එම නිසා විමසුමෙහි සඳහන් විෂයගත කාරණාවට අදාල නොවන බව නිරීක්ෂණය වේ.
2	අධිකරණයේ ඉල්ලීම පිට නැවත අධිකරණයන්ට යොමු කර ඇති වෙනත් ආයතන වලට අදාල මුදල් (Refunded)	1,576,757.12	34	02	මෙම මුදල් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16(1) වගන්තිය යටතේ අදාල සේවායෝජකයන් විසින් තම සේවා නියුක්තියන් වෙනුවෙන් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට ගෙවා ඇති මුදල් නොවන බැවින් පනතේ 16(3) වගන්තිය යටතේ අරමුදලෙහි සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුම්වලට බැර කල යුතු මුදල් නොවේ. එබැවින් එම තොරතුරු වලට අදාල මුදල් ප්‍රමාණය, විගණන විමසුමෙහි සඳහන් විෂයගත කාරණාවට අදාල නොවන බව නිරීක්ෂණය වේ.
3	චෙක්පත් අගරු වීම හේතුවෙන් නැවත අධිකරණයට යොමු කර ඇති මුදල් (Returned Cheques)	308,000.00	01	03	
4	මණ්ඩලයේ නඩු වලට වැඩිපුර මුදල් ගෙවා ඇති බැව් අධිකරණයන්ට දැනටමත් ලිඛිතව දැනුම් දී ඇති සහ අදාල කරුණු තහවුරු කරගෙන මෙතෙක් අධිකරණ යෙන් ඉල්ලීමක් ඉදිරිපත් නොවූ මුදල් (Over Payments)	18,283,624.38	358	04	

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

5	මණ්ඩලයේ නඩු වලට අදාල නොවන බැව් අධිකරණයන්ට දැනටමත් ලිඛිතව දැනුම් දී ඇති සහ අදාල කරුණු තහවුරු කරගෙන මෙතෙක් අධිකරණයෙන් ඉල්ලීමක් ඉදිරිපත් නොවූ මුදල් (To be Refunded)	4,663,057.26	60	05	
6	එකම ලිපිගොනුවක කොටසක් විභජනය (Allocated) කර ඇති සහ ශේෂය වැඩිපුර ගෙවා ඇති මුදලක් (Over Payments) ලෙස නිරීක්ෂණය වන ලිපිගොනු	2,225,077.87 (Allocated) 1,234,197.45 (Over Payments)	08	06	
	මෙම වර්ගීකරණයට අයත් 1 සිට 6 දක්වා කාණ්ඩවලට අදාල මුළු මුදල රු.	37,017,116.00	492		

මෙකී රු.මිලියන 34.23ට අදාල විස්තර පහත දැක්වේ.

	රු.මිලියන
නව පරිගණක පද්ධතිය ක්‍රියාත්මක වීමට පෙර කාලසීමාවට අදාලව එහෙත් විස්තර සොයා ගත නොහැකි පැරණි ලිපිගොනුවලට අදාල	18.28
ප්‍රාදේශීය කාර්යාල විසින් මෙතෙක් බැර විස්තර පිළියෙල කර නොමැති හා සාමාජික ගිණුම්වලට බැර නොවූ	15.95
	34.23

(අ) 1981 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය සඳහා 2021 දෙසැම්බර් මස 31 දිනට පෞද්ගලික ගිණුම්වලට විභජනය නොවූ සම්පූර්ණ මුදල රු.මිලියන 781.05ක් වුවද මණ්ඩලයේ ව්‍යාපාර ස්වභාවය මත ආසන්නතම වර්ෂ දෙකක කාලසීමාව තුල (එනම් 2020 සහ 2021 වර්ෂවල) සාමාජික මුදල් විභජනය 2022 සහ 2023 වර්ෂය වලදී සිදුකරනු ලබයි. එබැවින් සත්‍ය වශයෙන්ම ප්‍රායෝගිකව ගැටළු මත විභජනය නොවූ සාමාජික මුදල් වනුයේ 2019 වර්ෂයට පෙර ලද සාමාජික මුදල් වේ.

ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 34 යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත්තේ එලෙස දීර්ඝකාලීන සත්‍ය වශයෙන්ම ප්‍රායෝගික ගැටළු ඇති ශේෂවල වටිනාකම වේ. අවශ්‍ය වේ නම් විභජනය නොවූ සාමාජික මුදල්වල මුළු වටිනාකම හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමු.

(ඇ) අප මණ්ඩලයේ බැංකු ගිණුම්වලට මණ්ඩලයේ දැනුවත්වීමකින් තොරව සේවායෝජකයින් සිදුකර තිබූ බැරකිරීම් වලට අදාල තොරතුරු හඳුනා ගන්නා තෙක් පවත්වාගෙන යාම වෙනුවෙන් ඇ 999 හා ඇ 100 නමින් අවිනිශ්චිත ගිණුම් දෙකක් පවත්වාගෙන යනු ලබන අතර එම ගිණුම් යටතේ 2022.12.31 දිනට හඳුනා නොගත් ගෙවීම්වල වයස් විශ්ලේෂණයක් පහතින් දක්වමි.

අංක	කාලසීමාව	වටිනාකම
01	2006 හා ඊට පෙර කාලයන් වලදී සිදුකරන ලද ගෙවීම්	6,219,198.51
02	2020 සිට 2022 දක්වා සිදුකර ඇති ගෙවීම්	1,301,334.77

මෙම රු.6,219,198.51 ක් වූ මුදලට අදාල තොරතුරු සොයාගත නොහැකි බැවින් පරිගණක පද්ධතිය තුල අගුලු දැමීමටත්, ඉතිරි රු.1,301,334.77ක් වූ මුදලින් රු.600.132.72ක් මේ වනවිට නිරවුල් කරගෙන තිබෙන අතර, ඉදිරි රු.701,202.05ක් වූ මුදල ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

2.2.2

(අ) මේ සම්බන්ධයෙන් පත්‍රිකාවක් 2023.03.29 දින පැවති විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර, එහි නිර්දේශ මත 2023 අප්‍රේල් මස මාසික ගිණුම්වල නිවැරදි ලෙස ගලපන ලදි. ඒ සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ද ඉදිරිපත් කර ඇත.

(ආ)

i. සමස්ත මණ්ඩලය සඳහා වූ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ඉක්මනින් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ.

ii. මෙම ආයතනය මණ්ඩලයක් වන බැවින් විශේෂ ආපදා ණය සම්බන්ධව මූලික කරුණු ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව සකස් කර මණ්ඩලීය විධිවිධාන හා චක්‍රලේඛ අංක 08/1994 දරන 1994.06.01 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපරිම ණය සීමාව සියළු දීමනා සහිතව මාස 12ක වැටුප ලෙස සැලකීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. එසේ වුවත් 2022 වර්ෂයේදී PED 3/2022 චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම ණය සමාලෝචනය කර මේ වනවිට මෙම ණය මුදල රු.250,000/-ක උපරිම සීමාවට යටත් කර ඇත.

2.2.4 ලැප්ටොප් පරිගණක 228ක් මිළදී ගැනීම සඳහා 2021 ජනවාරි මස 03 වන දින කටයුතු ආරම්භ කල අතර, “දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව” යටතේ සිදුකරන ලදි. නමුත් 2021 දෙසැම්බර් මස වනවිට ලැප්ටොප් පරිගණක 90ක් පමණක් සපයන ලදි. ඒ අනුව නියමිත කාලය තුල ටෙන්ඩරයට අදාල භාණ්ඩ සැපයීම නිසිලෙස නිම කිරීමට සැපයුම්කරු අපොහොසත් වී ඇත. රටේ පැවති කොරෝනා වසංගතය, ආර්ථික ගැටළු, ආනයන සීමා හේතුවෙන් භාණ්ඩ සැපයීමට ඇණවුම් ලබාදුන් සමාගම අපොහොසත් විය. තත්වය එසේ තිබියදී නැවත වරක් අයහපත් ආර්ථික වාතාවරණයක් තුල නැවත දීර්ඝ කාලයක් වැයවන ටෙන්ඩර් ක්‍රියාවලිය තුලින් සාර්ථක ප්‍රතිඵල අත්නොවන බව වෙළඳ පොළ විශ්ලේෂණයකින් තහවුරු විය.

මෙවැනි තත්වයක් තුල මණ්ඩලයේ ලැප්ටොප් පරිගණක අවශ්‍යතාවය සපුරා ගැනීමට වෙළඳපොළ පිරික්සීමේදී අනාවරණය වූයේ සෑම කීර්තිමත් සන්නාම යටතේම ලැප්ටොප් පරිගණක විකිනීමේ සමාගම් සතුව පරිගණක යම් ප්‍රමාණයක් බැගින් පවතින නමුත් රටේ පවතින අධික ඉල්ලුම හමුවේ එම ලැප්ටොප් පරිගණක අත්පිට මුදලට විකිණීමට වැඩි ප්‍රවණතාවයක් දක්වන බවය. තවද ක්ෂණිකව මිළ වෙනස් වන වෙළඳපොළක් තුල දීර්ඝකාලීන ලංසු වලංගුභාවය සඳහා මිළ ගණන් ඉදිරිපත් නොවන බවය. (ජාතික තරඟකාරී මිළ ක්‍රමය සඳහා දින 91ක් තමන් සතු භාණ්ඩ ඉදිරිපත් කරන මිළට ලබාදීමට සැපයුම්කරු බැඳී සිටී).

වෙළඳපොළ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගැනීමේදී අදියර කිහිපයකින් මිළට ගැනීම් කටයුතු කිරීම තුලින් වඩා ඉක්මනින් මිළට ගැනීමේ හැකියාව මෙන්ම මණ්ඩලයේ අරමුණු ඉටු කිරීමේ කටයුතු බරපතල ගැටළු වලින් තොරව කර ගැනීමේ හැකියාව පවතින බව තහවුරු විය. මිළ සැසඳුම් ක්‍රමය (Shopping Method) නිර්වචනය කිරීමේදී එය සාමාන්‍යයෙන් පහසුවෙන් මිළදී ගතහැකි භාණ්ඩයක් යනුවෙන් සඳහන් කර ඇත. ඒ අනුව තොග පවතින ස්ථානයකින් ලැප්ටොප් පරිගණක මිළදී ගැනීම මෙම ක්‍රමය යටතේ සිදුකිරීමට හැකියාව පවතී. ඒ අනුව එක් අවස්ථාවක රු. මිලියන 10ට නොවැඩි වන පිළිගත් සන්නාම දරන ලැප්ටොප් පරිගණක මිළදි ගැනීමට කටයුතු කරන ලදි.

ඒ අනුව අදියර කිහිපයකින් වෙන් වෙන් අවස්ථාවලදී මිළ සැසඳුම් ක්‍රමය අනුගමනය කරමින් ලැප්ටොප් ව්‍යාපාරයේ නියැලී සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවන ලද අතර, මෙයට හොඳ ප්‍රතිචාරයක් දක්වමින් ප්‍රමුඛ පෙළේ ආයතන කිහිපයකින් තරඟකාරී මිළ ගණන් ඉදිරිපත් කර තිබේ.

ඒ අනුව මාස 08ක් වැනි කෙටි කාලයක් තුලදී ලැප්ටොප් 205ක් වැනි ප්‍රමාණයක් මිළදී ගැනීමට හැකි වූ අතර, තරඟකාරී මිළ ගණන් යටතේ එවකට පැවති හොඳම (මුදලේ වටිනාකම - Value for Money) මිළකට මිළදී ගැනීමට හැකියාව ලැබිණ. තවද HP, ACER, DELL වැනි ලෝ පතළ ප්‍රසිද්ධ ලැප්ටොප් පරිගණක ශ්‍රී ලංකාවේ පිළිගත් අබාන්ස්, මෙට්‍රොපොලිටන් සහ සොෆ්ට්ලොජික් යන ආයතන වලින් ඔවුන් සතුව පැවති තොග වලින් මිළදී ගැනීමට හැකි විය.

එසේ සිදුනොකර ලැප්ටොප් පරිගණක 205ක් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතේ ජාතික තරඟකාරී මිළ ගණන් කැඳවීම සිදුකලේ නම්, එම ක්‍රියාවලියට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් සේ.නි.හා.අ.මණ්ඩලයට මූල්‍යමය අවාසියන් මෙන්ම නිසිකලට භාණ්ඩ නොලැබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලට සැලකිය යුතු බාධාවන් සිදුවීමට ඉඩ තිබුණි.

03. වෙනත් කරුණු

(අ) හා (ආ)

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව 3% නොඅඩු වාර්ෂික පොළී අනුපාතිකයක් සාමාජිකයින්ගේ පෞද්ගලික ගිණුමට බැර කල යුතු වන අතර 14 වන වගන්තිය ප්‍රකාරව ලාභාංශ ගෙවිය යුතුය. පූර්ව පස් වසරක ආයෝජන ආදායම, සාමාජික අරමුදල, බෙදිය හැකි ලාභය, පොළී හා ලාභාංශ ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	ආයෝජන පොළී ආදායම (රු)	සාමාජික අරමුදල (රු)	පොළී 3% (රු)	බෙදිය හැකි ලාභය (රු)	ලාභාංශ	
					%	(රු)
2018	28,301,818	306,454,810	8,434,536	14,850,912	6.00	16,869,072
2019	31,554,779	339,244,338	9,423,454	16,098,044	5.00	15,705,756
2020	33,397,541	375,215,484	10,422,652	3,1480,627	5.00	17,371,087
2021	34,095,154	406,288,900	11,553,085	32,662,961	4.50	16,366,867
2022	46,316,209	459,630,606	12,679,221	41,793,547	5.75	24,301,886

මේ අනුව ආයෝජන ආදායම ඉහළ යාමට සමගාමීව සාමාජික අරමුදල ද 150% කින් වර්ධනය වී තිබීම හේතුවෙන් 3% ක් වූ පොළී ප්‍රතිශතය වැඩි වී නොතිබුණද, 3% ක් වශයෙන් ගෙවන ලද පොළී මුදල 150% කින් වර්ධනය වී තිබුණි.

එලෙසින්ම ලාභාංශ ප්‍රතිශතය වර්ධනය වී නොතිබුණද, ලාභාංශ වශයෙන් ගෙවනු ලැබූ මුදලද 144% කින් වර්ධනය වී තිබුණි. මේ අනුව ප්‍රතිශතයන් වර්ධනය වී නොතිබුණද, සාමාජිකයාට ලබාදුන් ප්‍රතිලාභ, ආදායමට හා බෙදිය හැකි ලාභයට සමගාමීව වර්ධනය වී තිබෙන බව දන්වනු කැමැත්තෙමි.

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

(ඇ) මෙම සමාගම ඇවරකිරීම සඳහා තෙවන පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීම මත ඇවරකරුවෙකු පත්කරන ලෙස අධිකරණයෙන් නියම කෙට ඇත. ඇවරකිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු මණ්ඩලයට අයකර ගතහැකි මුදල් ප්‍රමාණයක් නිබෙද යන්න හා අයකර ගතහැකි මුදල් ප්‍රමාණය පිළිබඳ නිශ්චිත නිගමනයකට පැමිණිය හැක. එම නීතිමය කටයුතු මෙතෙක් නිම වී නැත.

(ඈ) මෙම සමාගම රජයට සම්බන්ධ සමාගමක් වන අතර, මෙම හිඟ පොළී මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සමාගම සමඟ 2023.03.09 සාකච්ඡාවක් පවත්වන ලදි.

ඒ අනුව සමාගම විසින් එම සමාගමේ වර්තමාන මූල්‍ය තත්වය සැලකීමේදී මෙම පොළී මුදල් පියවීම සඳහා යම්කිසි කාලයක් ගතවිය හැකි බවත්, මේ පිළිබඳව අදාල රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම හිඟ පොළී පියවීම පිළිබඳව ඉදිරි සැලසුමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව පැවසූ අතර, ඒ පිළිබඳව පසු විපරම් කර එම යෝජනා ඉදිරිපත් වීමෙන් පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබේ.

(ඉ) මෙම පහසුකම ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට පවතින දුෂ්කරතා, දූරිමට සිදුවන ප්‍රාග්ධන වියදම් සීමා, නව බඳවා ගැනීම්වලට පවතින සීමා, පවතින වැටුප් පරිමාවන් යටතේ එම ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් දක්ෂ නිලධාරීන් බඳවා ගැනීම, රඳවා ගැනීම සහ නැවත බඳවා ගැනීමට ඇති අපහසුව සහ මීට අදාල අනිකුත් යටිතල පහසුකම් සපයා ගැනීමේ පවතින ගැටළු වැනි කරුණු සලකා බැලීමේදී මෙම කාර්යය ඉටුකිරීම දුෂ්කරව පවතී. එබැවින් මෙවැනි කරුණු සලකා බලා මෙම පහසුකම වර්තමානයේ රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මගින් කිසිදු වියදමකින් සහ අමතර සේවකයින් යෙදවීමකින් තොරව ලබා ගනී. එම තත්වය තවදුරටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතී.

(ඊ) මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු පිරවීමට අදාලව අදියරෙන් අදියරමහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන කටයුතු කරමින් සිටී. මේ වනවිට රජය මගින් බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් සියලුම පුරප්පාඩ සඳහා කඩිනමින් බඳවා ගැනීමට නොහැකි වී ඇති අතර, මණ්ඩලයේ කටයුතු බිඳවැටීමකින් තොරව පවත්වා ගෙන යාමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියට යොමු කිරීමට කටයුතු කෙරේ.

(උ) 2023.05.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අක්‍රීයව පැවති ආයතන 58කට අදාල රු.455,308/25ක මුදල කපා හැරීමට අනුමැතිය ලබාදී ඇත.

(ඌ) 2022.12.31 දිනට උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර ක්‍රමය සඳහා වෙන් කල ශේෂය ලෙස සඳහන් රු.මිලියන 147.156 පහත සඳහන් පරිදි සකස් වී ඇත.

2022 වර්ෂය සඳහා රු.මිලියන 60 ක් ද, 2021 වර්ෂය සඳහා රු.මිලියන 84 ක් ද, වශයෙන් ඉහත වර්ෂ දෙක සඳහා වෙන් කල ශේෂයට අමතරව 2020 ට අදාලව තවදුරටත් නිරවුල් කලයුතු ශිෂ්‍යයින් 253ක් වෙනුවෙන් රු.මිලියන 3.036 සහ 2019ට අදාලව ශිෂ්‍යයින් 10 දෙනෙකු වෙනුවෙන් නිරවුල් කලයුතු රු.120,000/-ක් ලෙස මුළු වෙන් කල ශේෂය වන රු.මිලියන 147.156 වේ.

2022 වර්ෂයට අදාලව උසස් පෙළ විභාගය 2023 ජනවාරි මස පැවැති අතර, මේ වනවිටත් ප්‍රතිඵල නිකුත් වී නොමැත.

2021 වර්ෂයට අදාලව උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන ලද්දේ 2022 අගෝස්තු මාසයේ බැවින් ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව අයදුම්පත් භාරගෙන 2023 මැයි මස 31 වනවිට ලැබුණු අයදුම්පත් 6,495 අතුරින් අයදුම්පත් 4,809ක් සඳහා රු.12,000/- බැගින් රු.මිලියන 57.71 නිරවුල් කර ඇත.

2020 වර්ෂයට අදාලව නිරවුල් කලයුතු රු.120,000/- ට අදාල අයදුම්පත් වල අඩුපාඩු ගෙන්වා ගැනීමට අදාල සාමාජිකයින් ලියාපදිංචි තැපෑල මගින්, දුරකතනය මගින් හා වට්ස්ඇප් මගින් දැනුවත් කිරීම් සිදුකලද යහපත් ප්‍රතිචාර නොලැබුණ නිසා තවදුරටත් නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට 5 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ක්‍රමය යටතේ වෙන්කල ශේෂය වූ රු.මිලියන 235.3 තුල 2022 වර්ෂය සඳහා වෙන් කල මුළු ප්‍රමණය රු.මිලියන 135 (ශිෂ්‍යයින් 9,000 සඳහා රු.15,000/- බැගින්) අන්තර්ගත වන අතර 2021 වර්ෂය සඳහා තවදුරටත් නිරවුල් කලයුතු රු.මිලියන 13.6 ක් සහ 2020 සඳහා තවදුරටත් නිරවුල් කලයුතු රු.75,000/-ක් වශයෙන් ඉහත රු.මිලියන 253.3 සකස් වී ඇත.

2022 වර්ෂයට අදාලව 2023.03.10 දින වනවිට අයදුම්පත් කැඳවා අවසන් කර ඇති අතර අයදුම්පත් වල දත්තයන් පරිගණක ගත කරමින් පවතී.

2021 වර්ෂයට අදාලව 2022.12.31 දිනට වෙන්කල ශේෂයෙන් ශිෂ්‍යයින් 605ක් සඳහා රු.මිලියන 9.075 මුදලක් නිරවුල් කර ඇති අතර ඊට අමතරව ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීමෙන් පසුව ලැබුණු අයදුම්පත් 24 සඳහා රුපියල් 288,000/- ප්‍රමාණයක් 2023.05.31 දිනට ගෙවා ඇත. තවද ඉහත වෙන්කල ශේෂය සඳහා මේ වනවිට ප්‍රතික්ෂේප කල අයදුම්පත් 246කට අදාලව රු.මිලියන 3.69ක් අන්තර්ගත බැවින් 2021 වර්ෂයට අදාලව තවදුරටත් නිරවුල් කලයුතු මුදල රු.835,000/-ක් දක්වා අඩු වී ඇත.

5 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර ක්‍රමය යටතේ 2020 වර්ෂයට අදාලව වෙන් කල රු.මිලියන 0.075ක මුදල නිරවුල් කිරීම සඳහා අදාල හිමිකම්ලාභීන්ගේ මූලික ලේඛණවල පවතින අඩුපාඩු සපුරා ගැනීමට ලියාපදිංචි තැපෑල මගින්, දුරකතනය මගින් හා වට්ස්ඇප් මගින් දැනුවත් කිරීම සිදුකලද යහපත් ප්‍රතිඵල නොලැබුණ නිසා තවදුරටත් නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

(ඒ) සමාගම් 13 අතරින් සමාගම් 3ක් සඳහා 2023 ජූනි මස වනවිට ලාභාංශ වශයෙන් රුපියල් මිලියන 49.2ක් ලැබී ඇත. එම සමාගම් 13 අතරින් අනෙකුත් සමාගම්වල කොටස් සඳහා එම සමාගම්වල ලාභදායී තත්වයන් යටතේ ඉදිරියේදී ලාභාංශ ප්‍රකාශයට පත් කරනු ඇතැයි අපේක්ෂා කරමු.

(ඔ) මණ්ඩලයේ කොටස් ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමේ පරමාර්ථයෙන් එම වසරේ රෝහල් ක්ෂේත්‍රයේ පැවති පිබිදීම සහ අධික ඉල්ලුම හේතුවෙන්ද, ඉදිරියේදී ඇතිවිය හැකි වර්ධන අවස්ථා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2021 වසරේ අගභාගයේදී රෝහල් ක්ෂේත්‍රයට අදාල නවලෝක සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් 0.5% ක පමණ වන කොටස් ප්‍රමාණයක ආයෝජනය කරන ලදි. මෙම ආයෝජනය දිගුකාලීන (Long Term) ආයෝජනයන් ලෙස සිදුකර ඇත.

විගණන විමසුමේ සඳහන් පරිදි 2020/2021 ගිණුම් වර්ෂයේදී නවලෝක රෝහල් සමාගම අලාභ තත්වයක් පෙන්නුවද, නවලෝක රෝහල් සමූහය වශයෙන් ගත් කල 2020/2021 මූල්‍ය ප්‍රකාශණවල ලාභදායී තත්වයක්

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

පෙන්වා ඇත. එමෙන්ම නවලෝක රෝහල් සමාගමේ පරිපාලිත සමාගම් 4 හි ම 100% අයිතිකාරිත්වය නවලෝක රෝහල් සමාගම සතු වන බැවින්ද, එම පරිපාලිත සමාගම් 4ම රෝහල් ක්ෂේත්‍රයට අදාල සමාගම් 4 ක් වන බැවින් ද, එම සමාගමේ ආයෝජනය වෙනුවෙන් නවලෝක රෝහල් සමූහයේ මූල්‍ය ප්‍රතිඵල පාදක කර ගැනීම සිදුකර ඇත. එමෙන්ම නවලෝක රෝහල් සමාගමේ අනාගත ක්‍රියාකාරිත්වය ගැනද සැලකිල්ලට ගන්නා ලදි. එලෙසම 2021/2022 වර්ෂයේ අන්තර් මූල්‍ය වාර්තාවල අඛණ්ඩ ලාභදායිත්වයක් පෙන්වා ඇති අතර, ඒ වාර්තා පදනම් කරගෙන ආයෝජනය සිදුකර ඇත. එහෙත් 2021/2022 මූල්‍ය වර්ෂයේ වාර්ෂික මූල්‍ය වාර්තාවල ආදායම් බදු නැවත ගැළපීම් හේතුවෙන් නවලෝක රෝහල් සමූහයේ අලාභ තත්වයක් පෙන්නුවද එම වාර්තා ප්‍රකාශයට පත් කරනු ලබන්නේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස දී වන අතර, 2022 මාර්තු මාසයෙන් පසු මණ්ඩලය නවලෝක රෝහල් සමාගමේ ආයෝජනය කර නැත. 2022 වසර අවසන් වනවිට මෙම සමාගමේ මුළු ආයෝජනය 0.58 %ක ප්‍රතිශතයකි.

(ඕ) ඉදිරිපත් වූ අවස්ථා 28න්, 12ක් පමණක් 50% ට වඩා අඩු සාර්ථකත්වයක් ගෙන තිබුණද, 50%ට වඩා සාර්ථකත්වය ලැබූ අවස්ථා 16 සළකා බැලීමේදී සමස්ථයක් වශයෙන් සාර්ථකත්වය ලැබූ අවස්ථා ගණන 57%ක ප්‍රතිශතයක් ලෙස නිරීක්ෂණය වේ. එමෙන්ම විමසුමේ සඳහන් අවස්ථා 12 තුළින් 43% කට වඩා සාර්ථක වූ අවස්ථා 02කුත්, 21% - 43% ත් අතර සාර්ථක වූ අවස්ථා 03කුත් නිරීක්ෂණය වේ. එම අවස්ථා 12න් එක අවස්ථාවක එනම් 2022.07.11 පැවති වෙන්දේසියේදී මණ්ඩලය විසින් අවස්ථා 02කට ලංසු ඉදිරිපත් කළ අතර, එහි සමස්ථ සාර්ථකත්වය 85% කි. මෙහිදි ඉදිරිපත් වූ අනෙක් කාණ්ඩයේ රු.මිලියන 5,160ම, 100%ක සාර්ථකත්වයක් යටතේ ආයෝජනය කරන ලදී. එම සාර්ථකත්වයෙන් ලබා ගත් කාණ්ඩ සඳහා අදාල කර ගත්තේද අනෙක් කාණ්ඩය සඳහා අදාල කරගත් උපක්‍රමය වේ. එසේම වෙන්දේසියට ඉදිරිපත් කරන ලද කාණ්ඩ අංක 28න් 50% කට වැඩි සාර්ථකත්වයක් ඇති කාණ්ඩ අංක 16 තුළ ලංසු වලින් පළමු අවස්ථාවේදීම 95% - 100% අතර සාර්ථක වූ අවස්ථා 07ක් වන අතර, ඒ තුළ 100% ක් සාර්ථක වූ අවස්ථා 05ක් ඇත. එමෙන්ම 73% - 95% ත් අතර සාර්ථක වූ අවස්ථා 07ක් විය.

එසේම විගණන විමසුමේ පෙන්වා දී තිබූ කාණ්ඩ අංක 12න්, Phase II යටතේ වෙන්දේසිවලට ඉදිරිපත් කරන ලද සමාන කාණ්ඩ 02 කට අයත් ලංසු 100% ක සාර්ථකත්වයක් ද, සමාන කාණ්ඩය මත Window පහසුකම යටතේ ඉදිරිපත් කරන ලද අවස්ථා දෙකකදී එක් ලංසුවක් 100% ක් වශයෙන් ද, තවත් ලංසුවක් 53% ක් වශයෙන් ද සහ වෙනස් කාණ්ඩ 03ක් යටතේ ඉදිරිපත් කරන ලද ලංසු වලින් 100% ක සාර්ථකත්වයක් ද ලඟා කරගත හැකි විය. එසේම මෙම අවස්ථා 12න් තවත් එක් අවස්ථාවකදී Phase II හා Window පහසුකම යටතේ ආයෝජනය කර සමස්ථ වෙන්දේසියේ 60%ක සාර්ථකත්වයක් ලඟා කර ගන්නා ලදී. ඒ අනුව වෙන්දේසියකදී සාර්ථකත්වය මැන බැලීමේදී එහි පළමු අවස්ථාවේ ප්‍රතිග්‍රහණය වන ලංසු පමණක් නොව Phase II සහ Window යන අවස්ථාවලදී ද ප්‍රතිග්‍රහණය වන වටිනාකම් ද සැළකිල්ලට ගෙන සමස්ථයක් ලෙස මැන බැලීම වඩාත් නිවැරදි ක්‍රමවේදය බව අපගේ අදහසයි.

ඉහත පැහැදිලි කර ඇති ආකාරය අනුව විගණන විමසුමේ පෙන්වා දී ඇති කාණ්ඩ අංක 12න් පළමු අවස්ථාවේ අඩු ප්‍රතිග්‍රහණයක් වූ ලංසු නැවත බොහෝ අවස්ථාවල Phase II හෝ Window පහසුකම යටතේ ඉදිරිපත් කර බර තැබූ සාමාන්‍ය සඵලතා පොළී අනුපාතය (Weighted Average Yield) යටතේ වැඩි මුදලක් නැවත ආයෝජනය කිරීමට අවස්ථාව උදාවිය. මෙය බැඳුම්කර වෙන්දේසි සඳහා ඉදිරිපත් වීමේදී සිදුවන සාමාන්‍ය ක්‍රියාවලියකි.

බැඳුම්කරවල ආයෝජනවලදී සෑමවිටම ඉහළ ඵලදා අනුපාතයක් ලබා ගැනීමට උත්සාහ කරයි. ආයෝජනවලදී ඵලදා අනුපාතය ඉහළ යන තත්වයක් යටතේ ඉහළින් ලංසු ඉදිරිපත් කිරීම උපක්‍රමශීලි වේ. මේ ආකාරයට අනිකුත් අවස්ථා-වලදී කටයුතු කිරීමේදී සාර්ථක ප්‍රතිඵල ඇතිකර ගෙන තිබේ. පූර්ව නිගමනයන් යටතේ වෙන්දේසිවලට සහභාගි වන අතර, සමහර අවස්ථාවලදී එය 50%ට අඩු අවස්ථා ලෙස වාර්තා වීම වෙළඳපොළ ක්‍රියාකාරිත්වයට ආවේණික වූ තත්වයකි.

එසේම සමහර අවස්ථාවලදී මහ බැංකුව විසින් වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලංසු වටිනාකමට වඩා අඩු අගයක් පිළිගන්නා අතර, එවැනි අවස්ථාවලදී ද මණ්ඩලය අපේක්ෂිත අනුපාත මත ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතික්ෂේප වීමේ වැඩි සම්භාවිතාවක් පවතී. උදාහරණ ලෙස 2022.02.11 LKB 01031L016 (30%), 2022.03.11 LKB 01031L016 (68%), 2022.07.11 LKB 00425F013 (89%) වශයෙන් ලංසු ප්‍රතික්ෂේප වී ඇත. සමහර අවස්ථාවලදී විශාල ප්‍රමාණයේ තරඟකාරී අයදුම්කරුවන්ගේ අනපේක්ෂිත හැසිරීම් මතද අප අපේක්ෂා කරන ප්‍රතිඵලයට බලපෑමක් ඇති කරනු ලැබේ. වෙන්දේසියට ඉදිරිපත් වීමේදී මුළු වෙන්දේසියම ගැන සිතා පූර්ව සැළැස්මකට අනුව ගතයුතු ක්‍රියාමාර්ග සහිතව ඉදිරිපත් වන අතර බොහෝ අවස්ථාවල ලංසු ඉදිරිපත් කිරීමට සිදුවන්නේ ඉතාමත් අවිනිශ්චිත වෙළඳපොළ තත්වයක් යටතේය. එවැනි අවස්ථාවල ලංසු ඉදිරිපත් කිරීම ඉතාමත් අභියෝගාත්මක තත්වයකි.

ඒ අනුව ලංසු සඳහා ඵලදා අනුපාතය-න් තීරණය කිරීම සමස්ථ වෙළඳපොළේ හැසිරීම, ප්‍රාථමික තැරැව්කරුවන්ගේ තොරතුරු, ද්විතියික වෙළඳපොළේ හැසිරීම, අනිකුත් ආයෝජකයින්ගේ සහභාගිත්වය, ආර්ථිකයේ තත්වය, කමිටුවේ පුරෝකථන සහ ඉහළ කළමණාකාරිත්වයේ ද අනුමැතියට යටත්ව පූර්ව සැළසුමකට අනුව කරනු ලබන ක්‍රියාවලියකි.

භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළේ පොළී අනුපාත ඉහළයාමේ ප්‍රවණතාවක් පවතින තත්වයක් තුළ ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන සැමවිටම අපේක්ෂිත ඵලදා අනුපාතයක් ලබා ගැනීමේ අරමුණෙන් ලංසු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පළමු අවස්ථාවේ වෙන්දේසියෙන් ප්‍රතික්ෂේප වන ලංසු මහ බැංකුව විසින් හඳුන්වා දී ඇති Phase II හෝ Window පහසුකම මගින් සාමාන්‍ය බර තැබූ සඵල පොළී අනුපාතය (Weighted Average Yield) යටතේ ආයෝජනය කර, හැකි සෑමවිටම උපායමාර්ගිකව සාර්ථකත්වයක් ලඟාකර ගතහැකි විය.

2022 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලිය නිරීක්ෂණ

(ඔ) හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට (2022.12.31 දිනට) ශේෂය රු.21,432,228/11ක් වේ. (සාමාජිකයින් 1207ක් සඳහා) සාමාජිකයන්ගේ මරණයෙන් පසු එකී සාමාජිකයාගේ ප්‍රතිලාභ සඳහා එක් අයෙකුට වඩා හිමිකම්ලාභීන් සිටින බවට තීරණය වන අවස්ථා පවතී. එකී හිමිකම්ලාභීන් සියළුදෙනාම එකවර ඉදිරිපත් නොවීම (එනම් සමහර හිමිකම්ලාභීන් විදේශගතව සිටීම) සහ ඇතැම් අයට ප්‍රමාණවත් ලිඛිත තොරතුරු (සහතිකපත් කඩිනමින් ඉදිරිපත් නොකිරීම) ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවයන් නිසා ඔවුන්ගේ කොටස්, මණ්ඩලයේ ගිණුමේ රඳවාගෙන, ලේඛණ ඉදිරිපත් කර ඇති අයගේ හිමිකම් කොටස් පමණක් ගෙවීම් කිරීමට කටයුතු කිරීම වර්තමානයේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග වේ.

ඒ අනුව 2023 ජනවාරි සිට 2023.06.05 දක්වා මරණ ප්‍රතිලාභ හිමිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා රු.207,612/79ක මුදලක් හිමිකරුවන් 05 දෙනෙකු වෙත ගෙවා ඇති අතර 2023.06.05 දිනට හිමිකරුවන්ට ගෙවීමට ඇති වගකීමේ වටිනාකම එම මුදලින් රු.21,224,615/32ක් වේ. (මරණ ප්‍රතිලාභ හිමිකරුවන් 1202)

මැතිවරණ කොමිසන් සභාව සහ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හරහා තොරතුරු ලබාගෙන, ලිපි මගින් සහ දුරකතන මගින් සාමාජිකයන් දැනුවත් කර මුදල් ගෙවීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.

ඉහත ගිණුම් ශේෂයට අදාල සාරාංශගත සටහන පහත දැක්වේ.

	අයදුම්පත් සංඛ්‍යාව	මුදල (රු)
2021.12.31 ශේෂය	1,169	21,695,321.62
2022 වර්ෂයේ නිදහස් කලා	(29)	(2,676,754.08)
	1,140	**19,018,567.54**
2022 වර්ෂය තුල රඳවා ගැනීම්	67	2,413,660.57
2022.12.31 දිනට ශේෂය	1,207	21,432,228.11
2023 වර්ෂයේ නිදහස් කලා	(05)	(207,612.79)
2023.06.05 දිනට	**1,202**	**21,224,615.32**

අත්සන් කළේ

ඩී එල් පී රෝහණ අභයරත්න
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය



EMPLOYEES' TRUST FUND BOARD
19 - 23 Floors, "MEHEWARA PIYESA",
P.O.Box 807, Kirula Road, Narahenpita, Colombo 05.
Tel: 011 7747201 Fax: 011 2503917 Email: finance@etfb.lk Web: www.etfb.lk